

SL-Unlimited

# 1

ඉස්තෝප්පුව දෙසින් ආ අඩි හඬට හැරිසන් ජයසුන්දර අවදි වූයේය. විවෘත කර තිබූ කවුළුවෙන් ආ ආලෝකය මඳ නිසා තමාට වෙනදාට වඩා නින්ද ගියාදැයි සැකයක් ඔහුට ඇති විය. කවුළුව වෙත පැමිණි ඔහු එය හොඳට ඇර මිදුල දෙස බැලුවේය. තවමත් හොඳින් හිරු පායා ඇතත් එතරම් දැඩි රශ්මියක් ඔහුට දැනුනේ නැත.

ඔහු තම අත් ඔරලෝසුව දෙස බැලුවේය.

"නෑ.. ඒ තරම් නින්ද ගිහින් නෑ.. තාම හතරයි" ඔහු තමාටම කියා ගත්තේ ය.

මිදුල පුරා වැවී ඇති විශාල මාර ගස් කිහිපය නිසා දැඩි තාපයක් නිවස තුළ සිටින විට නොදැනේ. සිසිල් සුළං රැල්ලක් ඔහුගේ ගත දැවටුණි. මිදුලට ගොස් පුවත්පත බලන්නට සිතක් ඔහුට ආවේ පුරුද්ද නිසා විය යුතුය.

සෑම සෙනසුරාදා දිනයකම දිවා ආහාරය ගත් පසු මඳ වේලාවක් ඇඳට වී සිටීමට ඔහු කුඩා කල සිටම පුරුදු වී සිටියේය. නිවසෙහි සිටින විටත්, නේවාසිකාගාරයේ නැවතී ඉගෙන ගත් කාලයේදීත් ඔහු සෙනසුරාදා දිනය ගත කළේ එලෙසය. දැන් දැන් පෙරට වඩා ඔහුට තම ජීවිතය පිළිබඳ සිහිවටන සිතට නැගේ. ඒ තමා විශ්‍රාම ගන්නා වයස ළං වී ඇති නිසා වත්දැයි ඔහුට විටෙක සිතුනි.

"සර්ට තේ එකක් ගේන්නදැ"යි ඔහු පුවත්පත අතට ගෙන මිදුලට බහින විට සිරිසේන ඇසුවේ ය.

"හොඳයි සිරිසේන."

වයස අවුරුදු හතලිස් පහක් පමණ වන සිරිසේන එතරම් උස පුද්ගලයෙකු නොවූවත්, ඔහුට තිබුණේ සවිමත් සිරුරකි. සිරිසේනගේ දෙමව්පියෝ හැරීගේ පියාට සේවය කළහ. දැන් සිරිසේන ඔහුට සේවය කරයි. රාජකාරිය සඳහා, හැරී සමඟ, ඔහු ගිය ගිය හැම තැනටම ගිය සිරිසේන ද විවාහයක් ගැන සිතුවේ නැත. තමා අවිවාහකව සිටියදී ඒ ගැන සිරිසේන උනන්දු කිරීමේ සිතක් හැරීටද ආවේ නැත. කුඩා කල සිටම හැරී සමඟම සිටි ඔහු, හැරීගේ ඕනෑ එපාකම් හොඳින් දනී.

www.sinhalelibrary.com
SL-Unlimited

හැරී මිදුලෙහි අඹ රුක් සෙවණෙහි වූ ලෑලි පුටුවෙහි අසුන් ගත්තේය. එතැනම වූයේ කුඩා පොකුණකි. එහි වූ පිපුන නෙළුම් මල් දෙස මඳ වේලාවක් බලා සිටි හැරී පුවත්පත කියවීමට පටන් ගත්තේය.

ඔහු මේ පුවත්පත බලනුයේ දෙවන වතාවටය. උදෑසන අවදි වී මුහුණ කට සෝදා ගන්නා හැරී කරන පළමු කාර්යයද එයයි. එවිට ඔහු කියවන්නේ රටේ සිදු වී ඇති අපරාධ හා මංකොල්ල කෑම් පිළිබඳවය. දැන් කියවන්නේ ඉතුරු වූ දේශපාලනික හා ශාස්ත්‍රීය තොරතුරුය.

අපරාධ කරුවන් නීතියේ රැහැනට අසු කර ගැනීමට, තම කාර්යාංශයට අයත් පොලිස් නිලදරුවන් යෙදවීම ඔහුගේ රාජකාර්යයයි. වයඹ පළාතේ පොලිස් අධිකාරීවරයා වූ හැරිසන් ජයසුන්දරට, ඔහු යටතේ සේවය කරන කවුරුත් කැමතිය. ඒ ඔහු පොලිස් කොස්තාපල් වරයාගේ සිට තමා සමීපයේ සිටින සෑම කෙනෙකුටම හොඳින් සලකන බැවිනි. රාජකාර්ය කිරීමේදී උස් පහත් භේදයක් ඔහුගේ නැත. ඔවුන්ගේ දේශපාලන ප්‍රතිපත්ති, ධනය, නිලය, බලය ඔහු ගණන් නොගනී. ඉතින් එබඳු පුද්ගලයකුට රාජකාර්ය කිරීම පහසු නොවේ. අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කර ගැනීම එතරම් අපහසු නැත. අපහසු වන්නේ ඔවුන් නීතියේ රැහැනින් රිංගා යාම වැළැක්වීමයි. සමහර විටෙක මැති ඇමතිවරුන්ට පවා කාරණා පැහැදිලි කර දීමට ඔහුට සිදුවේ. එහෙයින් හැකි පමණ හොඳින් තම රාජකාර්ය ඉටුකරන පොලිස් නිලධාරීන් අතලොස්සෙන් කෙනෙකු හැටියට ඔහු ප්‍රසිද්ධ වී සිටියේය.

ඔහු මුදලට ගැනීමට තැත් කළ කූට ධනපති ව්‍යාපාරිකයෝ බොහෝ සිටියහ. එහෙත් උඩරට වලව් පෙළපතකට නෑ කම් කිවූ ඔහු, ඔවුනට ගොදුරු වූයේ නැත. පරම්පරාවෙන් හිමි වූ, සැලකිය යුතු වස්තු සම්භාරයක් ඔහු සතු විය. එනිසා මුදලට යටවීමට තරම් හේතුවක්ද ඔහුට නොවීය.

හැම විටම රාජකාර්ය මුල් තැනෙහි ලා කටයුතු කළ ඔහුට සතුරන් නොසිටියේද නොවේ. එහෙත් ඔහු බිය කුමක්දැයි හඳුනන කෙනෙකු නොවේ. එනිසා සමහර දිනෙක දුරකතනයෙන් එන මරණීය තර්ජන වලට පවා ඔහු සවන් දුන්නේ සිනහ සෙමිනි.

"තමුසේ සෙල්ලම් කරන්නේ මාරයත් එක්ක කියලා හිතා ගන්නවා," වරෙක දුරකතනයෙන් ඔහුට තර්ජනයක් එල්ල විය.

"මං අවුරුදු තිහක් විතර කාලේ එක තමයි. මට එක හොඳට පුරුදු සෙල්ලමක්" ඔහු සිනහසෙමින් පිළිතුරු දුන්නේය.

රජයට අයත් වනාන්තරයක අනවසරයෙන් දැව කැපූ කිහිප දෙනෙකු පසු ගිය දිනෙක පොලිසිය මගින් කරන ලද මෙහෙයුමකදී අත් අඩංගුවට ගෙන තිබුණි. ඔවුන් වහා නිදහස් කර දමන ලෙසට පළාතේ මන්ත්‍රී වරයා තමන්ට අණ දුන් බව මෙහෙයුම කළ පොලිස් පරීක්ෂකවරයා හැරීට දැනුම් දුන්නේය.

"මේ වැටලීම එස්. පී. ජයසුන්දරගේ නියමයකින් කරපු එකක්. ඒ නිසා එස්. පී. මහත්තයත් එක්ක මේ ගැන කතා කරන්න කියලා මං කිව්වා" පොලිස් පරීක්ෂකවරයා වැඩිදුරටත් කියා සිටියේ ය.

හැරීට කතා කළේ ඒ මන්ත්‍රීවරයා නොවේ. ඇමතිවරයෙකි. ඉතා හිතවත් ලෙස සැප දුක් විමසූ ඇමතිවරයා "හැරී අපට පොඩි උදව්වක් කරන්න ඕනේ. ඔයාලගේ කට්ටියක් වැටලුමක් කරලා අපේ මිනිසුන් කීපදෙනෙක් අත් අඩංගුවට අරගෙන. ඒ අය අපට බැඟෑලා වැඩ කරපු අය. ඒ ගොල්ලන්ව නිදහස් කරලා යවන්න" යනුවෙන් ඉල්ලීමක් කළේ ය.

"ඒක පුළු වැඩක් සර්. මං ඒක කරන්නම්. හැබැයි සර් මට පොඩි උදව්වක් කරන්න ඕනේ."

"කියන්න හැරී. හැරී කියන ඕනම දෙයක් කරන්නම්."

"සර් පාර්ලිමේන්තුවට පනතක් ගෙනත් සම්මත කරලා දෙන්න පක්ෂයේ කෙනෙක් අනවසරයෙන් රක්ෂිත වනාන්තරවල දැව කපන එක වරදක් නොවෙයි කියලා. ඉන් පස්සේ මං ඒ අයව නිදහස් කරලා යවන්නම්."

"දඩ්ස්" හා රිසීවරය පහත ගෙලූ ඇමතිවරයා ගන්නා ඊළඟ පියවර කුමක්දැයි හැරී හිතුවේ නැත.

හැබැවින්ම ඔහුට මෙයේ කොන්ද කෙලින් තබාගෙන රැකියාව කිරීමට හැකියාව තිබුණේ ඔහුට නෑදෑ වූ හා හිතවත් වූ ඇමති වරුන්ද මන්ත්‍රීවරුන්ද ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සිටි බැවිනි. මෙවැනි සිදුවීම් නිසා සතුරන් වැඩිවන බව හැරී දැන සිටියත් හැමවිටම තම රාජකාරිය නිසි අයුරින් කිරීමට ඔහු උත්සාහ කළේය.

වරෙක ඔහුට ඉතාම හිතවත් වූ ඇමතිවරයෙකු හැරීට කතා කළේ ය.

"හැරී, මේ වැඩේ කෙරෙන්නම ඕනේ. ඔයාලට පොඩි වැරදීමක් වෙලා තියෙන්නේ. ඔය පොලීසියට අල්ල ගත්ත මිනිහා මගෙ දකුණු අත වගේ. මිනිහව එළියට දාන්න" ඔහු ඉල්ලා සිටියේය.

"මං හිතන්නේ ඔබතුමාටයි වැරදීම වෙලා තියෙන්නෙ. ඔබතුමාලා මට බලතල දීලා තියෙන්නෙ. වැරදි කාරයන් අල්ලලා උසාවියට

www.sinhalelibrary.com
SL-Unlimited

ඉදිරිපත් කරන්න විතරනේ. අල්ලා ගත්තු අයව නිදහස් කරන්න බලය තියෙන්නේ උසාවියට තමයි. ඔබතුමා රාජනීතිඥ වික්ටර් ප්‍රනාන්දුට කතා කරලා බලන්න. මිනිහා ඒ වැඩ වලට හරි දක්ෂයා" යී හැරී ඔහුගේ සහ පවුලේ අයගේ සැප දුක විමසා කතාව නිම කළේ ය.

එහෙත් සෑම අවස්ථාවකම එසේ හිතට එකඟව රාජකාරිය කිරීමට ඔහුට ඉඩ ලැබුණේ නැත. උඩින් එන බලපෑම් දැඩි වූ විට ඔහු අතින් රිංගා ගිය අපරාධකරුවන් කිහිප දෙනෙකුද නැත්තේ නොවේ. එබඳු අවස්ථාවලදී තම නිලධාරීන්ට රාජකාරිය කිරීමේදී පැන නගින දුෂ්කරතා අවබෝධ කරදීමට ඔහුට සිදුවේ.

"සමහර වෙලාවලට ඉහලින් එන නියෝග වලට අපට ඔළුව පහත් කරන්න සිද්ධ වෙනවා. ඒත් අපි පුළුවන් තරම් ඔළුව කෙලින් කරගෙන වැඩ කරන්න බලමු. මං ඉහළ ට්‍රිවියටත් කිව්වා. දැන් ඔය අයට අවවාද කරලා යන්න දෙන්න. ආයෙත් අහුවුණොත් බූරුලක් දෙන්නේ නැති බව කියන්න" පරාජය භාර ගන්නා හැරී පවසයි.

මෑතක සිට එල්ලවන දේශපාලන බලවතුන්ගේ දැඩි බලපෑම් නිසා, හැරී රාජකාරිය කළේ ඉතා අපහසුවෙනි. ඔහු හා කතා කර වැඩක් කර ගත නොහැකි වන බලවන්තයින් ඔහුගේ ගෝලයන් ලවා ඒ වැඩ කර ගැනීමට පුරුදු වී ඇත. එය නතර කිරීමේ හැකියාව හැරීට තිබුණා නමුත් ඔහු එසේ කළේ නැත.

"පැන්ෂන් ගන්න තව තියෙන්නේ අවුරුදු දෙකයි. දැන් ඉතිං වැඩ කළා ඇති. අපෙන් හරියට වැඩ ගන්න පාලකයන්ට අවශ්‍ය නැත්නම්, නිකං හිත කෝප කරගන්නේ ඇයි?" යනුවෙන් දැන් ඔහු සිතන්නට පුරුදුව සිටී.

සිරිසේන ගෙන ආ තේ කෝප්පය පානය කර හමාර කළ හැරී යලි පුවත්පත බලන්නට විය. ආණ්ඩුවේ ඇතැම් අයගේ ක්‍රියා කලාපය නිසා, නීතිය හා සාමය ආරක්ෂා කිරීමට පොලිසියට අපහසු වන බවට චෝදනා කර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු විසින් ලියන ලද ලිපියක් කියවූ ඔහුට සිනහවක් පහළ විය.

"මේ කියලා තියෙන හැම දෙයක්ම ඒ ගොල්ල බලයේ ඉන්න කාලයේ කළා. එදා ඒවා වැරදි හැටියට ඒ ගොල්ලන්ට පෙනුනේ නෑ. දැන් ඒ ගොල්ල අපට කියනවා අපි හරියට රාජකාරිය කරන්නේ නෑ කියලා" ඔහු තමාටම කියා ගත්තේය.

"සර් සුද්දෙක්ගෙන් කෝල් එකක්" සිරිසේන ඔහු වෙත එමින් කීවේය.

SL-Unlimited

"සුද්දෙක්ගෙන්?" යැයි ප්‍රශ්න කරමින් පුවත්පත එහෙනම තියන්නට හැර ඔහු නිවස දෙසට ගමන් කළේ ය.

ඒ තානාපති කාර්යාලයකින් උත්සවයකට සහභාගී වීමට ගෙනෙන ආරාධනයක් වන්නට ඇතැයි ඔහු සිතුවේය. ඒවායින් නම් ඔහුට අඩුවක් නැත.

ඔහු රිසීවරය අතට ගත්තේය.

"මට මිස්ටර් හැරී ජයසුන්දරට කතා කරන්න පුළුවන්ද?" එහා පැත්තේ සිටි පුද්ගලයා ඉංග්‍රීසියෙන් විමසුවේය.

"ඔව් මේ හැරී තමයි කතා කරන්නේ?"

"අංකල්ව මාව අඳුන ගන්න පුළුවන්ද?" සුද්දෙක් ලෙසින්ම පළමුව කතා කළ ඔහු, ඒ ටික කීවේ සිංහලෙනි. එහෙත් ඒ කටහඬ ඔහුට හුරු නැත.

"ම්.. මට අඳුන ගන්න අමාරුයි."

"මං පැට්‍රික්."

"පැට්‍රික්? පැට්‍රික්?" ඒත් ඔහු දන්නා පැට්‍රික් කෙනෙක් ගැන මතකයක් ඔහුට ආවේ නැත.

"ඇයි අංකල්? ගිය අවුරුද්දේ මාර්තු මාසේ අපේ ගෙදරත් ආවේ?"

එම වසරේ මාර්තු මස ඔහු සම්මන්ත්‍රණයකට සහභාගිවීමට එංගලන්තයට ගිය බැව් පමණක් හැරීට මතක් විය.

"මං නෙල්සන්ගේ පුතා. පැට්‍රික් සූරියබණ්ඩාර." තමා හඳුනා නොගත් බව වටහා ගත් ඒ කතා කළ පුද්ගලයාම ඔහු කවුදැයි හඳුන්වා දුන්නේ ය.

"ඔහ්.. මට සමාවෙන්න පැට්‍රික්. මං හිතුවේ නැහැ ඔයා මෙහෙම මට කතා කරයි කියලා. අම්මයි අප්පච්චියි සනීපෙන් ඉන්නවද?"

ඊට පිළිතුරක් නොදුන් ඔහු මඳ වේලාවක් නිහඬව සිට ගලිත කතා කළේ ය.

"අංකල්. මං මේ නිවාඩුවකට ලංකාවට ආපු ගමන්. මං දැන් ඉන්නේ යුරෝපා හෝටලයේ. මට වැදගත් වුවමනාවකට අංකල් මුණගැහෙන්න ඕනේ."

"පුතා අප්පච්චිලත් එක්කද ආවේ?"

"නෑ මං තනියම ආවේ. මට අංකල්ව වහාම හමුවෙන්න ඕනේ?"

www.sinhalaelibrary.com
SL-Unlimited

"ඉතිං දැන් එන්නකො පුතා. මොකට ඔය හෝටල් වල නැවතුනාද? ඔය තියෙන දෙයක් අරගෙන මෙහාට එන්න. සල්ලි තියෙන පලියට නාස්ති කරන්න එපා."

"අපොයි එතකොට අංකල්ට කරදරයක්නේ."

"මොන කරදරයක්ද? මම මේ තනිකඩයා. මේ ගෙදර දහදොලොස් දෙනෙක්ට වුනත් නවතින්න ඉඩ තියෙනවා. පිස්සු නැතුව මෙහාට එන්න මගේ ඇඩ්‍රස් එක දන්නව ද?"

"නෑ. අංකල්ගෙ ෆෝන් නම්බර් එකත් මං හරි අමාරුවෙන් හොයාගත්තේ."

හැරී තම නිවසෙහි ලිපිනය කීවේය.

"තියෙන ඔක්කොම දේවල් අරගෙන එන්න. නිකං හෝටල් වලට බිල් ගෙවන්න ඕන නැහැ."

"මං ටික දවසක් ලංකාවෙ නැවතිලා ඉන්න කියල හිතාගෙනයි ආවේ."

"ඒකට මක් වෙනවද? අවුරුද්දක් දෙකක් වුනත් මෙහෙ නතර වෙලා ඉන්න පුළුවන්. අප්පච්චිලා හෙම හොඳින් ඉන්නවද?"

"අපි ඇවිල්ලම කතා කරමු අංකල්. මං දැන්මම එනවා."

"කිසි ප්‍රශ්නයක් නෑ. ගෙදර ආරක්ෂක නිලධාරීන් දෙන්නෙක් ඉන්නවා. මං ඒ අයට ඔයා ගැන කියන්නම්. කොහොමද ඔයා එන්නෙ? මං මගේ කාරෙක එවන්නද?"

"එපා අංකල්. මං කාර් එකක් හයර් කළා. එහෙනං මං එනවා."

හැරී ඉන් පසු ආරක්ෂක නිලධාරීන්ට පැට්‍රික් සූරියබණ්ඩාර නම් හිතවතෙකු තමා හමුවීමට පැමිණෙන බවත්, ඔහුට නිවසට ඒමට ඉඩ දෙන ලෙසටත් දැනුම් දුන්නේ ය.

"සිරියේන අද එංගලන්තෙ ඉඳලා මගෙ හොඳ හිතවතෙකුගේ පුතෙක් එනවා. ඒයට කෑම ලෑස්ති කරන්න ඕන. හැබැයි සුද්දන්ගේ තාලෙ කෑම."

"හරි සර්" කියා සිරියේන නිවස තුළ සිට පිළිතුරු දුන්නේ ය.

"සිරියේන කෑමට ඉස්සර වෙලා ඒ මහත්තයට ඉන්න කාමරයක් පිළියෙල කරන්න ඕන."

සිරියේන අත පිස දමමින් ඔහු වෙත පැමිණියේ ය.

"මොන කාමරේද සර්?"

"මැද කාමරේ හොඳයි. ටිකක් අස්පස් කරලා දාලා අලුතෙන්

www.sinhalalibrary.com
SL Unlimited

දොර ජනෙල් රෙදි දාලා තියන්න. ඒ මහත්තයා තව ටිකකින් මෙහාට එවි."

හැරී ජයසුන්දර අඹතුරු සෙවනෙහි වූ පුටුවෙහි නැවත දිග හැරුණේය. මෙවර ඔහු පුවත්පත දෙස බැලුවේ නැත. නිවසට ඇතුළුවන ප්‍රධාන දොරටුව වෙත, ඔහු මඳ වේලාවක් බලා සිටියේය. අතීත මතක සටහන් රැසක් මතකයට ගෙන, සිය නිවසට අද දින පැමිණෙන අමුත්තාට ඉහළින්ම සංග්‍රහ කිරීම තම යුතුකම ලෙස ඔහු සැලකුවේය. ඒ පසුගිය වසරේ ලන්ඩන් නුවර සිටි කාලයේ, තම හිත මිතුරු නෙල්සන් කළ සංග්‍රහයට පිළිතුරක් වශයෙන් පමණක්ම නොවේ. ඒ එන අමුත්තා පාසැල් වියේ පටන්ම තම හොඳම මිතුරා වූ නෙල්සන් සූරියබණ්ඩාරගේ පුතණුවන් වන හෙයිනි.

"නෙල්සන්ට මාස හතර පහකින්ම කතා කරන්නත් බැරි වුණා. එයත් මට කතා කළේ නෑ. මොකද දන්නේ නෑ පැට්‍රික්ගේ මේ ගමන ගැන නෙල්සන් මට කිව්වේ නැත්තේ? ඔය පැට්‍රික් ලංකාවට එනවමයි. ඉතිං ඇයි එයා තනියම ලංකාවට එන්න හිතුවේ? සමහරවිට නෙල්සන්ට හොරෙන්ද දන්නේ නෑ ඔය එන්නේ. නෑ එහෙම වෙන්න බෑ. එහෙනම් එයා මාව හම්බ වෙන්න එන්නේ නෑ."

ඔහුගේ මතකය ලන්ඩන් නුවර ඔහු ගත කළ දින කිහිපය වෙත ඇදී ගියේය.

●●●

ගුවන් තොටුපළ වෙත පැමිණ සාදරයෙන් ඔහු පිළිගත් නෙල්සන් තම නිවාසය වෙත ඔහු කැඳවාගෙන ගියේය. නෙල්සන් සිය පුතණුවන්ට හැරී හඳුන්වා දුන්නේ මෙසේය.

"පුතා දන්නවනේ? මං මෙහේ ඉන්නකොට ඉඳලා හිටලා හරි යාලුවෙක් ගැන කියන කොට කියන්නේ හැරී.. හැරී.. කියලානේ. ආන්න ඒ හැරී තමයි මේ ඉන්නේ. මට ඉන්න එකම මිත්‍රයා."

විශාකා ද හැරී පිළිගත්තේ ඉතා සතුටිනි.

"කෑමට වෙලා තියෙන නිසා අපි තේ එකක් බොමු." මඳ වේලාවක් කතා කරමින් සිටි ඇය කීවා ය.

"ඔන්න අපේ පැට් ඔයාගේ අඩිපාරේ යන්න හදනවා" සංග්‍රහය පැවැත්වෙන අතර නෙල්සන් කීවේ ය.

"ඒ කියන්නේ?"

"පැට්‍රික් මෙහේ පොලිසියට බැඳුනානේ. ස්කොට්ලන්ඩියාඩ් එකට. එයා පොඩි කාලෙ ඉඳලම කිය කිය හිටියේ පොලිස්

SL-Unlimited

කාරයෙක් වෙන්න ඕනෙ කියලා. කොල්ලගෙ ආසාවගෙ කියලා මාත් ඒකට ඉඩ දුන්නා. අපේ අප්පච්චි වගේ වෙන්න මට ඕන කමක් තිබුණේ නෑ."

විශාකා නෙතින් කළ සංඥාව හැරී දුටුවේය. තම පවුල්වල ඌදවිය පිළිබඳව පුතා ඉදිරිපිට කිසිවක් කතා නොකරන බව පසු දිනක විශාකා හැරීට කීවා ය.

"පුතා. පුතාගෙ රැකියාව ගැන උපදෙසක් දෙන්න මට දැනුමක් නෑ. දැන් මේ ආපු එකත් වෙලා හැරී අංකල්ගෙන් හොඳ උපදෙසක් ඔයාට ගන්න පුළුවන්. පුතා මොන රැකියාව කළත්, ඒක නිවැරදිව කරනවා දකින්නයි මට ඕනේ."

"අංකල් ගැන ගොඩාක් දේවල් මට අප්පච්චි කියලා තියෙනවා. දැන් අංකල්ට පොලිසියේ වැඩකරලා අවුරුදු තිහක විතර අත්දැකීම් තියෙනවනෙ" ඔහුගේ උපදෙස බලාපොරොත්තුවෙන් පැට්‍රික් කතා කළේ ය.

හැරී පැට්‍රික් දෙස හොඳින් බැලුවේ ය. ඔහුට තිබුණේ කඩවසම් සිරුරකි. අඩි හයක් හෝ ඊට මඳක් ඔහු උස ඇතැයි හැරී සිතුවේ ය. උසට සරිලන සවිමත් සිරුරක්ද ඔහුට විය. ඒ හැමටම වඩා හැරීගේ සිත් ගත්තේ ඔහු සිංහල කතා කළ ආකාරයයි. ඔහු ලංකාවේ වසන සිංහලයකුසේම හොඳින් සිංහල වචන උච්චාරණය කරමින් කතා කරයි. ඔහු ඒ දැනුම ලැබුවේ විශාකාගෙන් බව පසු දිනක ඇය කීවා ය.

●●●

"කතා කරන්න විතරක් නොවෙයි. පුතාට හොඳට සිංහල ලියන්නත්, කියවන්නත් පුළුවන්" ඇය එදින කීවා ය.

"ඔව් අංකල්. මං සුනේත්‍රා නොහොත් අවිචාර සමය, ගම්පෙරලිය, ගොළු හදවත වගේ පොත් කියවලා තියෙනවා. මං හරි ආසයි ලංකාවෙ අය ගත කරන සැහැල්ලු ජීවිතයට. හෝ මේ අම්මයි අප්පච්චියි මට ලංකාවේ ඉන්න නෑදෑයෝ ගැන කිසි දෙයක් කියන්නෙ නැහැ."

"අපි එහෙම නොකියන්නේ හේතුවක් ඇතුව පුතා."

"මොකක්ද ඒ හේතුව?"

"ඒක අපි පස්සේ දවසක කියන්නම්කො" කී විශාකා, කතා කළ මාතෘකාව වෙනස් කළ හැටි හැරීට සිහිපත් විය.

●●●

www.sinhalalibrary.com
SL-Unlimited

"හොඳයි මං පුතාගෙන් ප්‍රශ්නයක් අහන්නම්. පුතා මැරෙන්න බය ද?" අවවාදයක් දීමට පෙර හැරී විමසුවේ ය.

"නෑ. මං මැරෙන්න බය නෑ."

"එහෙම නම් ඔයාට මේ රාජකාරිය කරන්න පුළුවන්. හැම ප්‍රශ්නයකදීම තමුන්ගේ වාසිය ගැන නොහිත, රාජකාරියට මුල්තැන දීලා හිතන්න ඕනේ. අපේ රාජකාරියේ හැටියට අපි පැය විසිහතරම වැඩ. ඒ කියන්නේ නිවාඩුවක් ගත කරන වෙලාවක හරි, නිවාඩු පිට ඉන්න දවසක හරි, නීතිය හෝ සාමය කඩ කරන කෙනෙක් දැක්කොත්, වහාම එයාව නීතියේ රැහැණට අහුකර ගන්න අපි පසුබට වෙන්න තරකයි. අම්මා තාත්තා ළඟ ඉන්නවා කියලා, බිරිඳ දූ දරුවෝ ළඟ ඉන්නවා කියලා, ඒක අතපසු කරන්න හොඳ නෑ. ඒක තමයි අනෙක් හුඟක් රස්සාවලුයි අපේ රස්සාවෙයි අතර තියෙන වෙනස."

"බොහොම ස්තූතියි. මම ඒ අවවාදය පිළිගන්නවා. මං හිතනවා මට අවංක පොලිස් නිලධාරියෙක් වෙන්න පුළුවන් කියලා."

ඒ කාලය තුළ නෙල්සන් හමුවීමට පැමිණි මිත්‍රයන්ගෙන් අඩුවක් නම් හැරී දුටුවේ නැත.

"ඔයා මාව පවුලේ විදුවියට් අඳුන්නලා දුන්නේ මට ඉන්න එකම මිත්‍රයා කියලා. ඒත් මට පේන හැටියට මෙහේ ඉන්න හැමෝම ඔයා එක්ක මිත්‍රයි වගේ."

"මිත්‍රයෝ. පිස්සු. මුංගේ තියෙන්නේ දැන ඇඳුනුම් කමක් විතරයි. කිසිම මිත්‍ර කමක් නෑ. මෙහේ ඇවිල්ලා කාලා බීලා, නටලා, කතා බහ කරලා යනවා. අපිත් ඌංගේ ගෙවල් වල ගිහින් කාලා බීලා නටලා එනවා. ඒත් මුං යාළුවෝ කියලා මං හිතන්නේ නෑ."

"ඒ මොකද එහෙම කියන්නේ?"

"මය එන අයගෙන් වැඩි දෙනෙක් එන්නේ අපේ අඩුපාඩු මොනවද කියලා බලලා යන්න. එහෙම අඩුවක් අහු වුනොත් එහෙම ඒක හතර වටේටම පතුරවලා අරිනවා. එක දෙක කරලා කියන්නේ. මං මෙහේ ආවට පස්සේ ලංකාවට ගියේ එක සැරයයි නේ" නෙල්සන්ගේ මුහුණ අඳුරු විය. ඔහු කතාව මදකට නතර කර දිගු සුසුමක් හෙළුවේ ය. ඒ ඔහුට ඔහුගේ ලංකා ගමන හා ඊට සම්බන්ධ සිදුවීම් දාමය සිහිවීම නිසා විය යුතු යැයි හැරීට සිතුනි.

"ඉතිං හැරී. ඒක මෙහේ ඉන්න සමහර දෙනෙක්ට ප්‍රශ්නයක්. මුං ඒකට කතාවක් හදලා මං ලංකාවේ ඉන්දැදී ලොකු මුදල් වංචාවක් කරලා මෙහාට පැනලා ආපු කෙනෙක් කියලා" ඔහු සිනහසෙන්නට විය.

SL-Unlimited

"මෙහේ ඉන්නවා ආරි කියලා අපි ටිකක් දන්න කෙනෙක්. මිනිහා හැම අවුරුද්දකට දෙතුන් වතාවක් ලංකාවට ගිහින් එනවා. ඒ මනුස්සයට මොකක් හරි හේතුවක් ඇතිනේ එහෙම යන්න. මුං එයාට කතාවක් හදලා ලංකාවේ හොර ගෑණියෙක් ඉන්නවා, ඒ නිසයි නිතරම ලංකාවට යන්නේ කියලා. ඉතිං බලන්න හැරී. මේ අපි වටකරගෙන ඉන්න යාළුවන්ගේ හැටි තමයි. අපිත් ඉතින් අපේ පාළුව ඇර ගන්න මේ අයව ආශ්‍රය කරනවා."

ඒ සිටි සති දෙකේම නෙල්සන් පවුලේ අය ගැන ඇසුවේ නැත. ඒ නිසා හැරී ඒ අය පිළිබඳව කියන්නට ගියේ ද නැත.

සමහර දිනෙක නෙල්සන් නිවසට එන්නේ හොඳටම රෑ බෝ වූ පසුය. එවැනි දිනක හැරීට රාත්‍රී භෝජනය සූදානම් කිරීමට විශාකා සූදානම් වුවත් එසේ නොකරන ලෙස කියා හැරී ඇය හා අල්ලාප සල්ලාපයෙහි යෙදෙයි. නිවසෙහි සිටියහොත් පැට්රික්ද ඒ සාකච්ඡාවට එකතු වෙයි. හැරී තමා ලද අත්දැකීමක් තවත් රසවත් කර ඔවුනට පවසයි. වරෙක දරුණු මංකොල්ල කරුවකු අත් අඩංගුවට ගැනීමට ගිය විටක ලද ත්‍රාසජනක අත්දැකීමක් ඔහු විස්තර කළේ ය.

"ඔන්න පුතා. දැක්කා නේද පුතාගේ රස්සාවේ තියෙන බැරෑරුම් කම? ඔයා හැම දෙයක් ගැනම සැහැල්ලුවෙන්නේ හිතන්නේ" කතාව අවසානයේදී විශාකා පැට්රික්ට කීවා ය.

"මෙහේ නම් අපේ රටේ වගේ බය වෙන්න ඕන නැහැ. නීතිය සල්ලි වලට ගන්න බැහැනේ. අපි අපේ ජීවිත පරදුවට තියලා ගිහිං මිනීමරුවෝ, මංකොල්ල කාරයෝ අල්ලා ගන්නවා. එහෙම කරලා අල්ල ගත්තු අයව නිදහස් කරලා අරින්න කියලා උඩින් නියෝග එනවා. අපේ පාලකයෝ දැන ගන්න ඕනේ එහෙම කරන එකේ තියෙන භයානක කම. පොලීසියෙන් නීතිය හරියට ක්‍රියාත්මක වුණේ නැති වුණාම, මිනිස්සු නීතිය අතට ගන්න බලනවා. ඒක හරිම භයානකයි."

"දැන් මෙහෙත් මාෆියා කාරයෝ බෝවෙගෙන එනවා. අපේ බොස්ටත් මෑතදී ටෙලිෆෝන් එකෙන් මරණීය තර්ජනයක් කරලා තියෙනවා, ඒ ගොල්ලන්ගේ වැඩ වලට ඇඟිලි ගහන්න ආවොත් බලාගෙනයි කියලා. දැන් හැම තැනම ජාවාරම් කාරයෝ රජ වෙලා."

"ඒ වුණාට අපේ රටේ වගේ, ඉහළ ඉන්න අයගේ සහයෝගය ඒවට ලැබෙන්නේ නැහැනේ."

"තව ටික කාලයක් යනකොට ඒකත් වෙන්න බැරි නෑ හැරී."

●●●

SL-Unlimited

හැරීට තම මිතුරා හා පාසලේ නේවාසිකාගාරයේ ගත කළ දවස් සිහි විය. නෙල්සන්ට ඉගෙන ගැනීමට තිබුණේ පුදුම දක්ෂකමකි. ඔහු කිසි විටෙක විභාගයකට කියා අමුතුවෙන් පාඩම් කළේ ද නැත. ගුරුවරයකුගේ මුවින් ගිලිහෙන වදන්, අද කාලයේ පරිගණකයක තැන්පත් වනවා සේම ඔහුගේ මොළයෙහි තැනක, සදාකාලිකව නොමැකෙන සේ තැන්පත් වී ඇත. ඉතින් නැවත පොතක් බලන්නට වෙන්නේ එහෙමත් වෙලාවකය. ඔහුගේ මේ හැකියාව මිතුරන් පමණක් නොව ගුරුවරුන්ද මවිතයට පත් කර තිබුණි.

දිනක් හැරී ධම්මපද ගාථාවක් කටපාඩම් කරමින් සිටියේ ය. පසු දින එය කටපාඩමින් අසන බව ගුරුවරයා කියා තිබුණි. ඔහු හත් අට වතාවක්ම "නහි වෙරේන වේරානි .." යනුවෙන් කනට ඇසෙන්නට කියමින් එය පාඩම් කරන්නට විය.

"මොකක්ද බං? දැන් කී පාරක් උඹ ඕක කිව්වද? තාම ඕක පාඩම් නැද්ද?" ඔහු අසළ ඔමා නවකතා පොතක් කියවමින් සිටි නෙල්සන් ඇසුවේ ය.

"හොඳයි පණ්ඩිතයා. පුළුවන් නම් ඒක කියපං?"

නෙල්සන් ඒ ගාථාව මතකයෙන් කීවේය.

"උඹ එහෙනම් ඕක කලින් පාඩම් කරලා තියෙන්න ඇති. ඇත්තටම නෙල්සන් කී පාරක් මේ ගාථාව කියෙව්වද?"

"මං නං ඒක පාරක්වත් ඕක කියෙව්වෙ නෑ. දැන් උඹ හත් අට වතාවක්ම හිරිය පුප්පාගෙන ඕක කියෙව්වානේ. ඉතිං ඒක ඒ තරම් කනට ඇහුනාම ඕනම බූරුවෙකුට මතක හිටිනවානේ."

"ඒක ඇත්ත නෙල්සන්" හැරී ප්‍රතිප්‍රහාරයක් දීමට සූදානම් විය.

"අවාසනාවකට මං බූරුවෙක් නොවෙයි නේ."

ඉගෙන ගැනීමට පමණක් නොව තර්ක කර ජය ගැනීමටද නෙල්සන් තරම් ජගතෙකු පාසලේ නොවීය. ඉහළ පන්ති වලදී ඔහු පාසලේ විවාද කණ්ඩායමේ නායකයා ලෙස වසර කිහිපයක්ම කටයුතු කළේ ය. ඔහුගේ විවේක කාලය වැඩිපුර පුස්තකාලයේම ගත කළ හෙයින් ඔහුට ඕනෑම විෂය බාහිර දෙයක් ගැන වුවත් කතා කිරීමේ මනා හැකියාව තිබුණි.

හැරී ඉගෙන ගන්නවාට වඩා ප්‍රිය කළේ ක්‍රීඩා කිරීමටය. ක්‍රිකට් සහ හොකී සෙල්ලම් කිරීමට ඔහුට තිබුණේ පුදුම හැකියාවකි. ඔහු ඒ තරඟ සඳහා පාසල නියෝජනය කළ ප්‍රබලයෙකු විය. වරෙක ඔහු ක්‍රීඩා කරන අයුරු බලා සිටි නෙල්සන් මෙසේ කීවේ ය.

"මට නම් උඹ ගැන හරි පුදුමයි හැරී. ඔය තරම් සංයමයකින්

SL Unlimited

ක්‍රිකට් ගහන්න පුළුවන් උඹට, ඇයි ඒ තරම් හොඳට ඉගෙන ගන්න බැරි? පොතක ලියවිලා තියෙන දේවල් මතක තියා ගන්නවට වැඩිය ඕක කොයි තරම් අමාරුද? උඹට කොහොමද තේරෙන්නේ මේ විදිහට බෝලයක් එනකොට මේ විදිහට පාරක් මේ පැත්තට ගහන්න ඕනේ කියලා. ඇස්, අතපය, සිහිය ඔය ඔක්කොම එක තත්පරයක් ඇතුළත, එකම දේකට යොමු කරන එක කොයි තරම් අමාරු වැඩක් ද? උඹ කොයි තරම් අපූරුවට ඒ වැඩේ කළා ද?" ඔහු හැරීගේ ක්‍රීඩා කෞශල්‍යය වර්ණනා කළේ ය. හැරී හා නෙල්සන් අතර මිත්‍ර දම වැඩි වූයේ ඉන් අනතුරුව බව හැරීට හොඳට මතකය.

පාසලේ සිටි සෑම සිසුවකුම නෙල්සන් හා හිතවත්ව කතා බහ කළත්, ඔහු මග හරින ශිෂ්‍යයකු සිටින බව දුටු හැරී පුදුමයට පත් විය. ඔහු තම පන්තියේම ඉගෙන ගත් ශ්‍රී ලාල් ඒකනායකය.

"ඇයි නෙල්සන් උඹ ශ්‍රී ලාල් එක්ක තරහා?" හැරී නෙල්සන්ගෙන් විමසුවේ ය.

"ඌත් එක්ක මගේ කිසිම තරහක් නෑ."

"මං උඹලා දෙන්නා කතා කරනවා කිසි දවසක දැකලා නෑ. මං ශ්‍රී ලාල් එක්ක කතා කර කර ඉන්නකොට උඹත් මාව මග ඇරලා යනවා."

"මෙතනේ හැරී ඒකට හේතුව? එයා මගේ ඥාති සොහොයුරෙක්. එයාගේ අම්මා, අපේ අප්පච්චිගේ එකම සහෝදරිය. ඉඩම් පළිහිඩිවිවකට ඒ දෙන්නා තරහා වෙලා."

"ඉතින් ශ්‍රී ලාල් උඹට වරදක් කරලා තියෙනවද?"

"නෑ. ශ්‍රී ලාල් මට කිසි වරදක් කරලා නෑ."

"එහෙනම් ඇයි ඌ එක්ක තරහා වෙලා ඉන්නේ? කතා නොකරන්නේ?"

"මම කීප දවසක්ම ශ්‍රී ලාල්ට කතා කරන්න උත්සාහ කළා. ඒත් මිනිහා තමයි මාව මග අරින්නේ. මං මොනවා කරන්නද?"

පසුව හැරීගේ මැදිහත් වීම නිසා ඔවුහු මිත්‍රයින් බවට පත් වූහ.

උසස් පෙළ විභාගය ඉහළින්ම සමත් වූ නෙල්සන් වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වී අධ්‍යාපනය ලැබීමට තමා ගත් තීරණයට තම පියා තදින්ම එරෙහි වූ බව, හැරී හමු වූ විටෙක කීවේ ය.

"මට නම් හරිම පුදුමයි. උඹ ඔච්චර ඉහළින් පාස්වෙලා වෛද්‍ය විද්‍යාලයට තේරුණාම ඇයි අප්පච්චිට කේන්ති යන්නේ?"

SL Unlimited

"අප්පච්චිට ඕනේ මං ඇඩ්වකේට් කෙනෙක් වෙනවා දකින්නලු. මට ඇඩ්වකේට් කෙනෙක් වෙන්න ඕනේ නෑ කියලා මං කිව්වා. මට ඕනේ දොස්තර කෙනෙක් වෙන්න. අසරණ රෝගීන් සුවපත් කරන්න. මම එහෙම කිව්වාම අප්පච්චි මොකක්ද දන්නවද කිව්වේ?"

"මොනවද අප්පච්චි කිව්වේ?"

"ඇයි පුතා? පුතාට ලැජ්ජ නැද්ද ඔය ගස් ගඳ ගහන එවුන් ගාවට ගිහින් ඊන්ට බෙහෙත් කරන්න කියලා. මං බෙහෙත් කරන්නේ අසනීප වෙලා ඉන්න රෝගීන්ට. ඒ අය ගාව ගස් ගඳ තිබුණත්, මහනෙල් මල් සුවඳ තිබුණත් මට කමක් නෑ කියලා මං කිව්වා. එතකොට අප්පච්චිට තවත් නැග්ගා."

"අම්මා මොකද කියන්නේ?"

"අපේ අම්මද? අපේ අම්මා අප්පච්චිට විරුද්ධව වචනයක් වත් කතා කරන්නේ නැහැනේ. අප්පච්චිව කේන්ති කරන්නේ නැතිව, ඒ කියන විදිහට වැඩ කරන්න කියලා කෙඳිරි ගානවා. මං හින්දා අපේ පරම්පරාවේ නම්බුව නැති වෙයිලු. ඊලව් නම්බුව" නෙල්සන් කෝප වී ඇති අයුරු හැරී පළමු වතාවට දුටුවේ එදා ය.

හැරී ඒ දිනවල සිටම නෙල්සන් කවුදැයි හඳුනාගෙන සිටියේය. යමක් නිවැරදි යැයි සිතුනහොත්, අම්මා අප්පා නොව ඊට ඉහළ කෙනෙකු කීවත් ඔහුගේ තීරණය වෙනස් කරන්නේ නැත. එහෙත් ඔහුගේ පියා ඒ බව අවබෝධ කර ගත්තේ ඒ සිද්ධියෙන් පසුව ය.

"බැරිම තැන අප්පච්චි කිව්වා අපේ ගමේ රෙදි අපුල්ලන එකාගේ පුතත් වෛද්‍ය විද්‍යාලයට තේරිලා. ඌත් එක්ක එකට ඉගෙන ගන්න මං කැමතිද කියලා. තව කවුරු දොස්තර කෙනෙක් වෙන්න ඉගෙන ගත්තත් මට කමක් නෑ. මට ඕනේ දොස්තර කෙනෙක් වෙන්න. මං එක්ක ඉගෙන ගන්න අයගේ තරාතිරමවත්, එයාලා එක්ක ආශ්‍රයක් වත් මට ඕනෙ නෑ කියලා මම කිව්වා."

ඉන්පසු නෙල්සන් ඔහුට මුණ ගැසුනේ වැඩිදුර අධ්‍යාපනය පිණිස එංගලන්තයට යාම වෙනුවෙන් පැවැත් වූ ප්‍රිය සාදයේදීය. හැරී පසෙකට කැඳවූ නෙල්සන් මෙසේ කීවේ ය.

"මම වෛද්‍ය විද්‍යාලයට යන තීරණය වෙනස් නොකරන බව තේරුණාම අප්පච්චි මට කිව්වා, උඹට ඔය මහ ලොකු දොස්තර විභාගේ කරන්නම ඕනේ නම් එංගලන්තෙට ගිහින් ඒක කරලා වරෙන්. මට බෑ උඹ මේ ගමේ එකාලත් යන විස්ස විජ්ජාලයක ඉගෙන ගන්නවා දකින්න කියලා. මටත් ඕනේ දොස්තර කෙනෙක් වෙන්නනේ හැරී. ලංකාවේදී හරි එංගලන්තෙදී හරි කියලා මට ප්‍රශ්නයක් නෑ.

SL-Unlimited

අප්පච්චිට වියදම් කරන්න පුළුවන් නම් මං යනවා. එච්චරයි."

පසු කලෙක එංගලන්තයට ස්ථිර පදිංචිය සඳහා නෙල්සන් ගිය පසු හැරීගේත් නෙල්සන්ගේත් මිත්‍රත්වය අඩු නොවුවත් ඔවුන්ගේ ඇසුර අඩු විය. මාස තුන හතරකට වතාවක් කෙරෙන ලිපි ගනුදෙනුවකටත්, ඉඳහිට කෙරෙන දුරකතන සංවාදයකටත් එය සීමා විය.

එංගලන්තයට පදිංචියට ගිය පසු නෙල්සන් ලංකාවට පැමිණියේ එක වතාවකි. ඒ ආ වතාවේදී ඔහු ඉල්ලූ උදව්ව කිරීමට නොහැකි වීම ගැන හැරී දුක් විය. සැබැවින්ම ඔහු ඒ උදව්ව කිරීමට සෑම උත්සාහයක්ම ගත්තත්, එය සාර්ථක කර ගැනීමට ඔහුට හැකි වුයේ නැත.

## 2

ආරණ්‍යක නිලධාරියා තම නිවසට ඇතුළුවන ද්වාරය විවෘත කරනු හැරී දුටුවේය. ඒ තුළින් වාහනය පදවාගෙන ආ තරුණයා ඉතා සුහද සිනහවක් පා පෝටිකෝව යට එය නතර කළේය. මීට දෙවසරකට පමණ පෙර දුටු, ඒ කඩවසම් තරුණයා, ඉතා අගනා ඇඳුමින් සැරසී සිටියේය. හැරීට තවමත් ඒ මුහුණ හොඳින් මතකය. නෙල්සන් තරුණ කාලයේත් ඒ වගේම ය. එහෙත් ඔහුට ඇත්තේ තමාට වඩා තම සොහොයුරු විල්සන්ගේ රුව යැයි නෙල්සන් කියයි. එහි ද ඇත්තක් ඇත. නෙල්සන් හා විල්සන් දෙදෙනා පෙනුමෙන් බොහෝ දුරට එක සමාන විය.

"අංකල්" කියා ඉතා මිත්‍රශීලී සිනහවක් පාමින් හැරී වෙත පිය නැගූ පැට්‍රික් ඔහු ශිෂ්ටාචාර කළේ ය.

"මට හරියට සන්තෝෂ හිතුනා ඔයා දැක්කාම. දැන් ගජ ඉලන්දාරියෙක් නේ. මං කියපු දේ තේරුණා ද?"

"ඔව් අංකල් මට තේරුණා. අජේ අම්මත් මට ඉලන්දාරියා කියලා සමහර විට කතා කරනවා. ඒත් මම තාම දැරියක් ඉල්ලන්නේ නෑ."

"සිරිසේන.. සිරිසේන.. මේ මහත්තයාගේ බෑග් එක ගන්න."

"නෑ නෑ අංකල් මේක බර නෑ. මං අරගෙන එන්නම්" කියා

SL-Unlimited

පැට්රික් කීවද්ද ඔහු වෙත ආ සිරිසේන හිස පහත් කර ඔහුට ආචාර කර බෑගය ඔසවා ගෙන ඔහුට ඉස්සර විය. ඔවුහු සිරිසේන පසු පස ගමන් කරන්නට වූ හ.

"පුතා ලංකාවට ආ ගමන කරදරයක් වුණේ නෑ නේද?"

"නෑ අංකල්. ඩිරෙක්ට් ෆ්ලයිට් එකක් නේ."

"ඔයා කවද්ද ලංකාවට ආවේ?"

"දැන් දවස් දෙකක් වෙනවා."

"ඇයි ඉතිං මට මීට ඉස්සර වෙලා කතා කළේ නැත්තේ?"

"මං හුඟාක් හිතුවා අංකල්. මං හුඟාක් හිතුවා. මට ඕනේ වුණේ මං ආ කාරිය තනියම කරගන්න බලන්නයි. ඒත් මගේ උත්සාහය හරි ගියේ නෑ. ඊට පස්සේ තමයි මං හිතුවේ අංකල්ට කතා කරන්න ඕනේ කියලා."

"මොකක්ද ඔයා තනියම කරන්න හදපු රාජකාරිය?"

"ඒක දිග කතාවක් අංකල්. රාජකාරියකට වඩා ඒක මගේ කාරියක්."

"හොඳයි. ඔයා එහෙනම් ඇඳුම් මාරු කරලා, වොෂ් එකක් දාගෙන එන්න."

තමාට පිටු පා යන පැට්රික් දෙස බලා සිටි ඔහුගේ දෑගෑත බිඳුයන් ඔරලෝසුවේ හයේ කණිසම නාද වන විටය.

"පුවෘත්ති" ඔහුට කියවුණේය. වහා ගුවන් විදුලි යන්ත්‍රය වෙත ගිය ඔහු එය ක්‍රියාත්මක කළේ ය. ඊට යවන් දීම ඔහුගේ නිහඬ දින චර්යාවේ තවත් කොටසකි.

ජනාධිපතිතුමිය සහභාගී වූ උත්සවයක තොරතුරු පළමුව ඉන් කියැවුණි. උතුරේ පවතින යුධ තත්වය ගැන පුවත් කෙටියෙන් ඉන් පසු වාර්තා කෙරිණි.

"අද ඒ තරම් වැදගත් සිදුවීමක් නෑ" යන සිතුවිල්ල ඔහුගේ සිතෙහි පැන නැගුණි. එහෙත් ඔහුට ඉතා හුරු පුරුදු නමක් ගුවන් විදුලියෙන් ප්‍රචාරය වුයෙන්, ඔහුගේ දෙසවන් වහාම ගුවන් විදුලි පුවෘත්ති ප්‍රකාශය කෙරෙහි යලි යොමු විය.

"ඝාතකයකු විසින් ගෙල සිර කර එල්ලා තිබූ ඔහු, රෝහල වෙත ගෙන එන විටත් මිය ගොස් සිටි බව රෝහල් ආරංචි මාර්ග පවසයි. පොදු පෙරමුණෙහි ප්‍රබල ආධාර කරුවකු වූ සාම විනිසුරු සුරනිමල වාසලමුදලි මහතාගේ මරණය පිළිබඳ අපක්ෂපාති පරීක්ෂණයක් වහාම පවත්වන ලෙස පොලිස්පති තුමා නියෝග කර ඇත."

www.sinhalalibrary.com
SL Unlimited

"තවත් එක්කෙනෙක් ඉවරයි. ඊළඟට කාව බිල්ලට ගනීවිද? විල්සන්.. විල්සන්.. උපාසකයෙක් වගේ හිටිය විල්සන් .. මේක කවදද ඉවර වෙන්නෙ?"

ඒ සමගම ඔහුගේ සිරුර පුරා විදුලියක් දුව යන්නා සේ ඔහුට දැනුණි.

"එතකොට පැට්රික්ගේ පැමිණීමයි, මේ මිනීමැරුමයි අතර සම්බන්ධයක් තියෙන්න පුළුවන්ද? එයා ඇවිත් දවස් දෙකක් වෙනවා කිව්වා."

මහනුවර පොලිසියට කතා කර ඒ පිළිබඳව වැඩි විස්තර දැන ගැනීමේ ආශාවක් ඇති වුවත්, මේ මොහොතේ එසේ නොකිරීමට ඔහු ඉටා ගත්තේ ය. මෙතෙක් කාලයක් නීතිය මුල් තැනෙහි ලා, හැදෑ හිත මිතුරු කම් දෙවන තැනෙහි ලා කටයුතු කළ ඔහුට, තව දුරටත් එසේ කළ හැකි ද? තම මිතුරු නෙල්සන් වෙනුවෙන් වත්.. ඔහු දෙලොවක් අතර මැදිවිය. තව අවුරුදු දෙකයි විශ්‍රාම යන්න තියෙන්නේ. මං හිතන්නේ අද හෙටම විශ්‍රාම යන්න ඉල්ලුවොත් හොඳයි කියලා" ඔහු තමාටම කියා ගත්තේ ය.

●●●

සරමකින් හා බැනියමකින් සැරසී පැමිණි පැට්රික් ඔහුගේ උරහිසට තට්ටු කරන තුරුම ඔහු ඊළඟට ගන්නා පියවර කුමක්දැයි සිතමින් සිටියේ ය.

"අංකල් බර කල්පනාවක වගෙයි."

හැරී නැවත පියෙවි ලෝකයට පිවිසියේ ය.

"ඇත්තටම පැට්රික්. ඔයා ලංකාවට ආවේ කවදා ද?"

"මං පෙරේදා තමයි ලංකාවට ආවෙ" පැට්රික් පිළිතුර දුන්නේ විමතියෙනි. ඔහු වඩාත්ම විමතියට පත් වූයේ හැරී එය ඇසූ ආකාරය නිසාත්, ඔහුගේ මුහුණේ වූ පෙනුමත් නිසා ය.

"මෙච්චර දවස් කොහේද හිටියේ?"

"මං හිටියේ යුරෝපා හෝටලයෙනේ."

"එහාට වෙලා මොනවද කළේ?"

"මං මගේ වැඩේ කොතනින් පටන් ගන්නදැයි හිත හිත හිටියා. වැඩේ පටන් ගන්න ක්‍රමයක් ක්‍රියාත්මක කළා. ඒක හරි ගියේ නෑ. ඉන් පස්සේ ගන්න පියවරක් මට හිතා ගන්න බැරි වුණා. මං හිතන්නේ ඒවට දවස් දෙකක් වැඩි නෑ කියලා. ඒ අතරතුර හිතට සහනයක් ලබාගන්න තවත් වෙලාවල බීච් එකට ගියා. ඇයි අංකල් මේ මගේ

දිහා සැකෙන් වගේ බලන්නේ?"

"නෑ නෑ එහෙම එකක් නෑ. ඉතින් මෙහෙන් ඇවිත් ඉඳ ගන්නකෝ" කියමින් හැරී පැට්රික් සමඟ විසිත්ත කාමරයට පිවිසියේය.

"ඉතිං කියන්න පැට්රික්. ඔයා කොයි වගේ උදව්වක්ද මගෙන් බලාපොරොත්තු වෙන්නේ?"

පැට්රික් දිග සුසුමක් හෙළුවේ ය.

"මට මගේ නෑදෑයෝ හොයා ගන්න ඕනේ. මගේ අම්මයි අප්පච්චියි එංගලන්තෙට වෙලා හිටියට ඒ අය අහසින් කඩා වැටිච්ච අය නොවෙයි නේ. ඒ හොල්ලු මට කිසිම දාක මගේ නෑදෑයෝ ගැන කියලා නෑ. ලංකාවේ කවුරු හරි ගැන කතා කළා නම්, ඒ අංකල් ගැන තමයි. මට උදව් කරන්න. අංකල් ඒ අය ගැන දන්නවා ඇති නේ?"

"ඇයි පැට්රික් ඔයාට එක සැරේටම නෑදෑයෝ මතක් වුණේ? ඇරත් මගෙන් ඒ ගැන අහනවට වඩා ඔයාගේ දෙමව්පියන්ගෙන් ඒ ගැන ඇහුවා නම් නේද හොඳ?"

පැට්රික් මඳ වේලාවක් බැස ගිය හිරු නිසා රත් පැහැ ගැන්වී ඇති ආකාශය දෙස බලා සිටියේ ය.

"දැන් මං කාත් කවුරුවත් නැති කෙනෙක්. මට දැන් නෑදෑයින් ගැන අහන්න අංකල් ඇර වෙන කෙනෙක් නෑ."

"පැට්රික්. ඔයා විහිළු කරනවද?"

"නෑ. මං කරන්නේ විහිළුවක් නොවෙයි."

"ඇයි? ඇයි? නෙල්සන්ටයි විශාකාටයි අනතුරක් වුණා වත් ද?"

"මගේ රස්සාව ඒ දෙන්නගෙම ජීවිත බිලි ගත්තා අංකල්."

"නෑ..ය්..?"

පැට්රික් ගේ රත් පැහැ ගැන් වී තිබූ දෙනෙත් දෙස හැරී විස්මයෙන් ශුන්‍යව බලා සිටියේ ය.

"මට තේරෙන්නේ නෑ පැට්රික්. ඔයා මොනවද මේ කියන්නේ?"

"මගෙන් පළිගන්න හිටිය සතුරෙක්, මගේ දෙමව්පියන්ගේ ජීවිත විනාශ කළා."

තමා මෙතෙක් නොදත් කුමක්දෝ භයානක සිදුවීමක් සිදු වී ඇති බව හැරී වටහා ගත්තේ ය.

"එතකොට නෙල්සනුයි, විශාකායි දැන් ජීවතුන් අතර නෑ?"

"ඔව්. ඒක වෙලා දැන් මාස අටක් විතර වුණා. ඊට පස්සේ

මට මගේ රක්ෂාව කරනවා නිසා එදිනෙදා කෙරෙන කටයුතු කරන්නේ කොහොමද කියලවත් හිතා ගන්න බැරි වුණා. බලන බලන අත මගේ අම්මයි අප්පච්චියි ඉන්නවා. ඒ දෙන්නගෙන් තොර ජීවිතයක් මට තිබුණේ නෑ. එහෙම එකක් ගැන මං හිතුවෙත් නෑ. මට ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් දිග නිවාඩුවක් දුන්නා. ඒත්.. ඒත්.. මනුස්සයෙක් කොහොමද තනියම ජීවත් වෙන්නේ? කොයි තරම් රටේ ලෝකේ සෙනග හිටියත්, තමුන්ගෙයි කියලා කෙනෙක් නැතුව කොහොමද ජීවත් වෙන්නේ? මං අන්තිමට හිතා ගත්තා ලංකාවට ඇවිත් මගේ නෑදෑයෝ හොයා ගන්නවා කියලා. මං පහුගිය දවස් ටිකේම කළේ ටෙලිෆෝන් ඩිරෙක්ටරියක් අරගෙන ඒකෙ හිටිය සූරියබණ්ඩාර කියලා නම තිබුණ අයට කතා කරපු එක තමයි. ඒ කාටවත් නෙල්සන් සූරියබණ්ඩාර කියලා එංගලන්තෙ පදිංචි වෙලා ඉන්න කෙනෙක් නෑදෑයො වෙන්නෙ නෑ. ඉතිං ඊට පස්සේ තමයි මං හිතා ගත්තේ අංකල්ගෙ උදව්ව ඉල්ලන්න කියලා. අංකල් අප්පච්චිගෙයි අම්මගෙයි නෑදෑයො ගැන හොඳට දන්නවා ඇති නේ?"

"අපොයි ඔව්. මං ඒ අය ගැන ඕනෑවටත් වැඩිය දන්නවා. ඒත්.. ඒත්.. ඒ ගැන කියන්න ඉස්සර වෙලා පුතා මට කියන්න නෙල්සන්ටයි විශාකාටයි උනේ මොකක්ද කියලා? ඇයි ඔයා ඒ වගක් මට දැනුම් දුන්නෙවත් නැත්තෙ?"

"ඒ දවස්ටික කොහොම ගත කළාද කියලා කියන්න මං වත් දන්නේ නෑ අංකල්. අප්පච්චිගේ යාළුවෝ තමයි අවසාන කටයුතු කළේ. මං ඒවට සහභාගි වුණා විතරයි. සුමාන දෙක තුනකට පස්සේ තමයි මං ටික ටික යථා තත්වයට පත් වුණේ. ඒත් මට හිත එකලස් කරගෙන වැඩක් කරන්න බෑ."

"ඔයාගේ හිතට වදයක් නොවෙයි නම් මං කැමතියි එයාලට වුණ දේ දැන ගන්න."

මේ වෙලාවේ සිරිසේන තේ බඳුන රැගෙන විත් ටීපෝව මත තැබුවෙන් පළමුව තේ කෝප්පයක රස විඳීමට කළ ආරාධනය පැට්රික් පිළිගත්තේ ය. තේ කෝප්පය පිළියෙල කර අතට ගත් පැට්රික් ඒ අවාසනාවන්ත සිදුවීම මෙලෙස විස්තර කරන්නට විය.

●●●

"අංකල් දන්නවනේ මං පොලිසියේ මත්ද්‍රව්‍ය නාශක අංශයේ වැඩ කරපු බව. මං බොහොම උනන්දුවෙන්, බොහෝම ආසාවෙන් මගේ රාජකාරිය කළා. මං බය නැතුව ඉස්සරහට ගිහින් කුඩු ජාවාරම් කාරයින් එක්ක හැප්පිලා ටිං අත්අඩංගුවට ගත්තා. මගේ වැඩ ගැන පැහැදුන ඉහළ නිලධාරීන් මට උසස් වීම් පිට උසස් වීම

දෙන්න වුණා."

"මීට මාස දහයකට විතර උඩදී මට ලොකු රාජකාරියක් පැවරුණා. අපට මුලදී මුලදී අහු වුණේ පොඩි ජාවාරම් කාරයින් තමයි. ඒ අයට වඩා ජයට බිස්නස් එක කරගෙන යන ලොකු ජාවාරම් කාරයින් අල්ලන එක තමයි මට පැවරුණ රාජකාරිය. ඒ සඳහා පොලිස් නිලධාරීන් විසි දෙනෙකුගේ සහාය මට ලැබුණා. වැඩේ කරන්න අපට මාස හයක් කල් දුන්නා. ඒ දවස්වල මං අපේ කට්ටියත් එක්ක එකතුවෙලා දිවා රෑ නොබලා හොඳ සැලැස්මක් හදලා ඒක ක්‍රියාත්මක කළා. අපේ සමහරු සාමාන්‍ය මිනිසුන් විදිහටත්, සමහරු කුඩු කාරයින් විදිහටත්, සමහරු ජාවාරම් කාරයින් විදිහටත් ලොකු රඟපෑමක් කළා. සමහරුන්ට හරි කෑමක් බීමක් නැතිව අඟුපිල්වල පවා ගත කරන්න සිද්ධ වුණා. ඊට ඊට පුළුවන් වෙච්ච වෙලාවලට ඒ අය මට ඔත්තු සපයනවා. මම තමයි සැලැස්ම මෙහෙයවීමත්, සම්බන්ධීකරණයත් කළේ. අපට මාස තුනක් හතරක් විතර යනකොට ලොකු ජාවාරම් කාරයින්ගේ විස්තරත්, ජාවාරම කෙරෙන ආකාරය පිළිබඳ විස්තරත් සෑහෙන ප්‍රමාණයක් එකතු කරගන්න පුළුවන් වුණා. ඊට පස්සේ පොලිසි කිහිපයක ආධාරය ඇතිව එක දවසක් තුළ වැටලීම් කිහිපයක් කරලා පෝලන්තයෙන් එංගලන්තයට ගෙන ආ මත්ද්‍රව්‍ය විශාල තොගයකුත් එක්ක ඒකට සම්බන්ධ වෙලා හිටිය හෝරු මෝරු හාල්මැස්සන් ඔක්කොම අත්අඩංගුවට ගත්තා. සමහරු අල්ලගන්න ලේසි වුණේ නෑ. වෙඩි හුවමාරු කරගන්නත් වුණා. අපෙත් තුන් හතරදෙනෙක්ට තුවාල සිද්ධ වුණා. ඒත් කොහොම හරි අවසානයේදී ඒ අයව නීතිය ඉස්සරහට ගෙනත් දඬුවම් ලබාදෙන්නට අපට හැකි වුණා."

"මේ දවස්වල මට ටෙලිෆෝන් එකෙන් හරියට තර්ජන ආවා. ඉස්සරත් ඉඳහිට එකක් දෙකක් ආවා. නමුත් මේ සිද්ධියෙන් පස්සේ මට දවසකට තර්ජන තුන හතර එන්න වුණා. ඒත් ඒ කිසිම තර්ජනයක් මං ගණං ගත්තේ නෑ. මීට මාස හතරකට විතර උඩදී මං කාර්යාලයට ගිහින් එනකොට මගේ කාරෙකට වෙඩි වරුෂාවක් එල්ල වුණා. ඒත් වාසනාවකට වගේ මට අනතුරක් වුණේ නෑ. මං ඒකෙන් තේරුම් ගත්තා අර මට ආපු තර්ජන නිකං පුහු ඒවා නොවෙයි කියලා. අපේ දැලට අහු නොවුණ කෙනෙක්, එහෙම නැත්නම් අපෙන් ඉදිරියට තර්ජනයක් වෙයි කියලා හිතන කෙනෙක්, බයවෙලා මේක කරන බවයි මං තේරුම් ගත්තේ."

"මේ දවස්වල මං ගෙදරින් ඈත් වෙලයි පදිංචි වෙලා හිටියේ. ඒත් මං පුළුවන් වුණ හැම සති අන්තයකම ගෙදර එනවා."

SL-Unlimited

"පුතා පරිස්සමින් වැඩ කරන්න. ගින්දරත් එක්ක සෙල්ලම් කරන කොට අත පිච්චෙන්න පුළුවන් බව මතක තියා ගන්න" අම්මයි අප්පච්චියි මට නිතර අවවාද දෙන්න වුණා. මමත් හිටියේ ඇත්තටම හොඳ හෙවිල්ලෙන්. මං නැවතිලා හිටිය ගෙදරට ආරක්ෂක සංඥා ක්‍රමයක් පවා මං සවි කර ගත්තා. ඒකට අහු නොවී බළලෙකුටවත් වත්තට රිංගන්න පුළුවන් කමක් තිබුණේ නෑ."

"දැන් මං මේ කියන සිද්ධිය වුණේ දැනට මාස තුනකට විතර ඉස්සර වෙලා. යාළුවෙක්ගේ ගෙදර පාටියකට යන්න මං ලෑස්ති වෙවී හිටියා. එතකොට හැන්දෑවේ පහ පසු වුණා විතරයි. ඒ වෙලාවේ මට කෝල් එකක් ආවා. ඒක අම්මගෙන්."

"පුතා අද රෑ ඔයා ගෙදර ඉන්න එපා. අපේ ගෙදර එන්න" අම්මා කිව්වා.

"ඇයි අම්මේ?"

"නෑ. දැන් ටිකකට ඉස්සර වෙලා මට කෝල් එකක් ආවා" අම්මා කතා කළේ හති දමමින්. අම්මා හොඳටම බය වෙලා ඉන්න බව මට තේරුණා.

"කතා කරපු කෙනාට තිබුණේ මේ රටේ මිනිස්සු කතා කරන ඇක්සන්ට් එක නොවෙයි. එක්කෝ ඉන්දියන් මිනිහෙක්. එහෙම නැත්නම් පකිස්තාන් කාරයෙක්."

"ඉතිං අම්මේ මිනිහා කිව්වෙ මොනවද?"

"මිස්ටර් සූරියබණ්ඩාරට අද ගෙදර ඉන්න එපා කියන්න" කියලයි මිනිහා කිව්වේ. මං ඇහුවා කවුද කතා කරන්නේ කියලා. එයා කිව්වා මට නම කියන්න බෑ. ගැබැයි අපට තියෙන හිතවත් කමටයි මේ කියන්නේ කියලා. එහෙම කියලා මිනිහා ලයින් එක කට් කළා. පුතා කෝකටත් අද ඔය ගෙදර නිදා ගන්න එපා. අපේ ගෙදරට එන්න අපහසු නම් ළඟ තියෙන හෝටලයක නතර වෙන්න."

"හොඳයි අම්මේ" කියලා මං උත්තර දුන්නා. ඊට පස්සේ අම්මගෙයි අප්පච්චිගෙයි දුක සැප විමසලා මං කතාව නතර කළා.

"ඊට පැයකට විතර පස්සේ මගේ මොබයිල් ෆෝන් එකට ආයෙමත් සැරයක් අම්මා කතා කළා.

"පුතා දැන් කොහේද ඉන්නේ?" අම්මා අර මුලින් වගේම කලබලෙන් ඇහුවා.

"මං යාළුවෙක්ගෙ ගෙදර පාටියකට ඇවිත් ඉන්නේ. ඇයි අම්මා කලබලෙන් වගේ කතා කරන්නේ?"

SL-Unlimited

"දැන් ටිකකට ඉස්සරවෙලා අප්පච්චි ගෙදර ආවෙ. එයා හැම දේම සුළුවට හිතනවා. අප්පච්චිට ගෙදර ආ ගමන් කෝල් එකක් ආවා. එයාම තමයි ඒකට උත්තර දුන්නේ. එයා උත්තර දෙනකොට මං එයා දිහා බැලුවා. එයාගේ පෙනුම ඒතරම් හොඳ නෑ. එයා දෙතුන් පාරක්ම ඇහුවා කවුද කතා කරන්නේ, කාටද කතා කරන්න ඕනේ කියලා. අන්තිමට එයා දඩස් ගාලා ෆෝන් එක තියලා "කවුද බූරුවෙක් අනේ" කියලා මට කිව්වා. මං ඇහුවා මොනවද එයා කිව්වෙ කියලා. "මේ කතා කරන්නේ උඹේ මාරයා. උඹ කරපු හපන්කම් වලට වන්දි ගෙවන්න දැන් සූදානම් වෙයන්" කියලා කිව්වලු. එයාට නම් හිනා. පුතා ඒ වුණාට පරිස්සමින් ඉන්න. අද ගෙදර යන්න එපා. එදා රෑ හෝටලේක නවතින බවට අම්මාට පොරොන්දු වෙලා මං කතාව නතර කළා."

"එදා පාටිය ඉවර වෙනකොට මධ්‍යම රාත්‍රියත් පහුවෙලා. මං හොඳ සූදානමින් තමයි ගෙදර ගියේ. අම්මට පොරොන්දුවක් දුන්නත් පිට තැනක නවතින්න මට හිතුනේ නෑ. කී දවසක් නම් එහෙම කරන්නද? ගෙයි වත්තට කාරෙක ගත්තට පස්සේ බය වෙන්න දෙයක් නැති බව මං දන්නවා. හැම තැනම ආරක්ෂක සංඥා පුවරු සවි කරලා."

"රෑ වෙලා නින්දට ගිය නිසා උදේ මට ඇහැරුණේ ටිකක් ප්‍රමාද වෙලා. ඒ අවදි වුණෙත් ටෙලිෆෝන් එක, එක දිගටම රිං වුණු නිසා."

"සුභ උදෑසනක් වේවා!" එහා පැත්තෙන් කතා කරපු ඉන්ස්පෙක්ටර් ග්‍රැහැම් ආච්බෝල්ඩ් කිව්වා. එයා මං ළඟින් ඇසුරු කරපු මගේ හොඳ හිතවතෙක්.

"උදේන්ම අශුභ ආරංචියක් දෙන්නයි මට කතා කරන්න වුණේ" එයා කිව්වා. අපි අර කරපු වැටලීම් වලදී තුවාල වුණ පොලිස් නිලධාරියෙක්ගේ තත්වය බරපතලයි කියලා මට කලින් දවසේ පාටියේදී ආරංචි වෙලා තිබුණා. ඉතිං මං හිතුවා එහෙනම් එයා ඉවර වෙන්න ඇති කියලා. මට එයාගේ පවුලේ උදවිය ගැන කනගාටුවකුත් ඇති වුණා.

"ඒත් මට ලැබුණේ මං හීනෙකින්වත් බලාපොරොත්තු නොවුණු ආරංචියක්. මගේ අම්මයි අප්පච්චියි ඝාතකයෙකුගේ වෙඩි පහරට ලක්වෙලා මිය ගිහින් කියලයි එයා මට කිව්වෙ. මම විනාඩි තුන හතරක්ම කිසිම දෙයක් කර කියා ගන්න බැරිව ගොළු වෙලා හිටියේ ඒක අදහා ගන්න බැරි වුණ නිසයි. එයා තව මොනවද කිව්වා. නමුත් ඒ කිසි දෙයක් මට දැන් මතක නෑ."

SL-Unlimited

"මම ගෙදර ගියේ කොහොමද කියලා මට මතක නෑ. ඒ වෙනකොටත් ඒ දෙන්නාගේ මළ සිරුරු රෝහලට අරගෙන ගිහින්."

"එළියවත පාන්දර අල්ලපු ගෙදර මිස්ටර් ජොන්සන්ට අපේ ගෙදර පැත්තෙන් වෙඩි හඬ දෙකක් ඇහිලා තියෙනවා. එතකොට එයා කවුළුවෙන් අපේ ගෙදර දිහා බලලා තියෙනවා. ඉන් පස්සේ තව වෙඩි හඬක් ඇහුනාලු. ඉන් ටික වෙලාවකට පස්සේ, කළුපාට ඇඳුම් ඇඳ ගත්තු ඉන්දියානු හැඩ රුව ඇති දෙන්නෙක් ගෙදර ඉස්සරහ දොරින් එළියට එනවා එයා දැක්කලු. ඒ ආපු දෙන්නා සැකෙන් වගේ වට පිට බලලා ගේට්ටුවෙන් එළියට ඇවිත් ඒ ළඟ නවත්තලා තිබුණ වාහනයකට ගොඩ වෙලා පැනලා ගිහින් තියෙනවා. ඒ ගැන සැක ඇති කරගත්තු මිස්ටර් ජොන්සන් පොලීසියට ඒ වෙලාවෙම දැනුම් දුන්නාලු."

"හෙට කවුරුහරි ඇතුළු වෙන හඬ අම්මට ඇහෙන්න ඇති. ඒක බලන්න එයා සාලයට ආවා වෙන්න පුළුවන්. එයාට වෙඩි වැදිලා තියෙන්නෙ එතනදියි. මුල් වෙඩිල්ල පපුවට. අනික ඔළුවට. මීටර් හතරක පහක තරම් දුරක ඉඳලා වෙඩි තියලා තියෙන්නේ. ඉස්සරහින් වෙඩි තියලා තිබුණ නිසා අම්මා එයාගේ මාරයව දකින්න ඇති. අප්පච්චිට නම් ඇඳ ළඟටම ගිහින් එක වෙඩි පාරක් ඔළුවට තියලා තියෙනවා. එයා තද නින්දේ ඉන්න ඇති. අප්පච්චිට නින්ද ගියාම බෝම්බයක් පිපුරුණත් ලේසියෙන් අවදි වෙන්නේ නෑ. ඒ අප්පච්චිගේ හැටි."

"මගෙන් පළිගන්න බැරි වුණා තැන ඒ පාහරයෝ මගේ දෙමව්පියන්ගේ ජීවිත බිලිගත්තා" කී පැට්රික් දිග සුසුමක් හෙළුවේ ය. මෙතෙක් වෙලා නිහඬව එම කතාවට සවන් දීගෙන සිටි හැරී සිය මිතුරු යුවළට වූ දේ අසා බලවත් සේ කම්පාවට පත් විය.

"පුතා මට හරිම කනගාටුයි වෙලා තියෙන දේට" ඔහු සිය ශෝකය පැට්රික් වෙත පළකර සිටියේ ය.

"මුළු ලෝකෙම එක තැනක නතර වෙලා වගේ මට දැනුණේ. මට වැඩට යන්න හිතක් ආවේත් නෑ. පස්සේ මං ඉන්න තතුවේ දැකලා මගේ මිත්‍රයින් කීප දෙනෙක් මාව මානසික වෛද්‍යවරයෙක් ළඟට එක්කරගෙන ගියා. ඒ වෛද්‍යවරයා මට අවුරුද්දක් විතර විවේක ගන්න කියලා උපදෙස් දුන්නා. ලෝකේ වටේ රවුමක් ගිහින් එන්න. ගෙදර ඉන්න එපා. ගෙදර ඉන්න කොට, මේ රටේ ඉන්න කොට, අතීතය මතක් වෙනවා. ඒක අමතක කරන්න තියෙන හොඳම බේත තමයි රටි රටවල සංචාරයක් කරලා එන එක" එයා කිව්වා. දොස්තරගේ වාර්තාව බලලා මට අවුරුද්දක නිවාඩුවක් ලැබුණා.

www.sinhalalibrary.com
SL-Unlimited

මගේ රස්සාව නිසා මෙහෙම දෙයක් වෙයි කියලා මට හිතුනා නම් මං කවදාවත් පොලිසියට බැඳෙන්නේ නෑ. අංකල් අවුරුදු තිස් ගානක් තිස්සෙම ඔය රස්සාව කොහොම කරනවද කියලා මට හිතා ගන්න බෑ."

"දැන් කාලේ, අපට අපේ රස්සාවල් කරන එක පහසු නෑ පුතා. ඒත් මීට අවුරුදු දහයකට පහළොවකට ඉස්සර අපේ රටෙත් මේ තරම් ප්‍රශ්න තිබුණේ නෑ. ඒ ඇරුණාම තාම අපේ රටේ අපරාධ කාරයෝ ඒ තරම් සංවිධානය වෙලා නෑ. ඒත් තව ඉස්සරහට මොනවා වෙයිද දන්නේ නෑ. ඉතිං පොලිසියට මිනීමරුවන් අල්ලගන්න පුළුවන් කමක් ලැබුණේ නැද්ද?"

"ඒ මිනීමැරුමට දවස් තුනහතරකට විතර ඉස්සර වෙලා ඒ පැත්තේ ගැවසුන බව කියන ඉන්දියන් පෙනුම ඇති දෙන්නෙක් ගැන පොලිසියට ඔත්තුවක් ලැබිලා තිබුණා. එතකොට මිනීමැරුමට යොදා ගත්ත වාහනේ ඊට කි.මී. විස්සක් විතර දුර දුම්රිය නැවතුම් පළක් අසල නවත්තලා තිබිලා පොලිසියට හමු වුණා. ඒකේ අයිති කාරයා එදා හවස එයාගේ වාහනේ හොරකම් කරගෙන ගිහින් කියලා පොලිසියට පැමිණිල්ලකුත් දාලා තියෙනවා. ඒ නිසා හොරකම් කර ගත්තු වාහනයක් මේ මිනීමැරුමට යොදා ගත්තු බව සැක කරන්න පුළුවන්. කාරෙකේ තිබුණ ඇඟිලි සලකුණු කිහිපයක්, අපේ ගෙදර දොරේ තිබුණ ඇඟිලි සලකුණුවලට සමාන වුණ නිසා මිනීමරුවා යයි සැක කරන්න පුළුවන් කෙනාගේ ඇඟිලි සලකුණු පොලිසියට ලැබිලා තියෙනවා. ඒ ඇරෙන්න වෙන සාර්ථක ප්‍රතිඵලයක් ලබා ගන්න බැරි වුණා."

"හොඳයි පුතා. මේක හරිම කනගාටුදායක සිද්ධියක්. ඉතිං කියන්න. ඔයාට මගෙන් ඕන කරන උදව්ව මොකක්ද?"

"අංකල්" ඔහු හැරී ඇමතුවේය. ඒ මුහුණෙහි අනාගත බලාපොරොත්තු රැසක් ගොනු වී ඇති බව හැරී දුටුවේ ය.

"අංකල්ට කරන්න පුළුවන් ලොකුම උදව්ව තමයි මං කලින් ඉල්ලුවේ. මෙහේ ඉන්න මගේ නෑදෑයින් කවුද කියලා මට අඳුන්නලා දෙන්න. මං ආවේ ඒගොල්ල හොයාගෙන. මං කොහොමද කාත් කවුරුවත් නැති අසරණයෙක් වගේ ජීවත් වෙන්නේ?"

"පැට්‍රික්. ඔයා ඔයාගේ නෑදෑයො ගැන කිසිම දෙයක් දන්නේ නැද්ද? ඔයාගේ දෙමව්පියෝ ඒ ගොල්ල ගැන කිසිම දෙයක් කියලා නැද්ද?"

"නෑ. එහෙම කියලා තිබුණා නම් මං කෙලින්ම ඒ ගොල්ල හොයාගෙන යනවනේ."

SL Unlimited

"ඔව් පැට්රික් මම මුලින් හිතුව විදිය වැරදියි. ඔයාගේ දෙමව්පියෝ ඔයාට නෑදෑයො ගැන මීට කලින් කියලා තිබුණා නම් ඔයා කවදාවත් මේ ගමන එන්නේ නෑ."

"ඇයි අංකල් එහෙම කියන්නේ?"

"ඒ අය ගැන හොයන්න මහන්සි වෙන්න එපා පුතා. ඔය සැනසීමෙන් ගෙවන ජීවිතය, ඊට වඩා දහස් ගුණයක් හොඳයි කියලා ඔයාට තේරේවි."

"ඇයි අංකල් එහෙම කියන්නේ? මගේ අම්මයි අප්පච්චියි තනියම එංගලන්තෙට වෙලා හිටිය හේතුව මට හිතා ගන්න පුළුවන්. ඒ දෙන්නා තනි කැමැත්තට දෙමව්පියන්ගේ විරෝධතාවය මැද විවාහ වෙන්න ඇති. තනියම ජීවත් වුණත් ඒ දෙන්නාට ඒ දෙන්නත් මාත් හිටියා. ඒත් දැන් මට? මට දැන් කවුද ඉන්නේ? මොන හේතුව නිසා මගේ දෙමව්පියෝ නෑදෑයන්ගෙන් ඈත් වෙලා හිටියත් දැන් ඒ දේ වෙලා අවුරුදු විසිපහක් විතර වුණානේ. මං හිතන්නේ දැන් නම් ඒ ගොල්ල අතර ඒ අමනාපකම් නැතුව ඇති."

"ඔව්. මම අද හවස නිව්ස් ඇහුවේ නැත්නම් එහෙම වෙන්නත් පුළුවන් කියලා මට කියන්න තිබුණා. ඒත් දැන් නම් මට ඒක කියන්න බෑ."

"අද නිව්ස් වලට? ඇයි අපේ පවුලේ අයගේ ආරාවුලක් ගැන නිව්ස් වලට කිව්වද?"

"ඔයාගේ මහප්පාව, ඒ කියන්නේ අම්මාගේ වැඩිමහල් සොහොයුරාව ඊයේ රෑ මරලා දාලා."

"ආ.. කවුද කවුද.. අංකල් ඒක කරන්න ඇත්තේ?"

"ඒක අබිරහසක් පුතා. මං හිතන්නේ නෑ ඒකත් හොයා ගන්න පුළුවන් වේවි කියලා."

"එහෙනම් ඒක හුඟක් දුර දිග ගිය එකක් වගෙයි. එහෙනම් අංකල්ට පුළුවන්ද මගේ අම්මගෙයි අප්පච්චිගෙයි පවුල්වල විස්තර කියලා දෙන්න. එතකොට මං අහසින් කඩං වැටුණ කෙනෙක් නොවෙයි කියලවත් මට දැනෙන එකක් නෑනේ."

"ඔව් ඔව්. ඒ විතරක් නොවෙයි. මේ විදියට තනිවෙලා ඉන්න එක කොයි තරම් හොඳද කියලත් ඔයාට තේරේවි. මං මේ කියන විස්තර සමහර දෙයක් මම දැකපුවා. සමහරක් මට තොල්සන් කියපුවා. සමහර දේවල් පුවත්පත් වලින් මං කියවපු දේවල්. මං මේ විස්තර කියන්නේ ඔයාට දැන ගන්න ආසයි කියපු නිසයි. එහෙම නැතුව කාටවත් අගෞරව කරන අදහසක් මගේ නෑ පුතා."

SL-Unlimited

හැරිසන් හර්බර් ගැසී පුටුවෙහි හිඳ ගත්තේ ය. පැට්‍රික් ගේ දෙනෙත් දීප්තියෙන් බබලන්නට විය. සැබවින්ම ඒ විස්තරය දැන ගැනීමට ඔහුගේද ඇත්තේ කිව නොහැකි තරම් ආශාවකි.

●●●

"පුතාගේ අප්පච්චිට විල්සන් කියලා සහෝදරයෙකුයි, මියුරියෙල් කියලා සහෝදරියකුයි හිටියා. විල්සන් නෙල්සන්ට වඩා අවුරුදු හයක් විතර බාලයි. මියුරියෙල් ඊට වඩා තවත් අවුරුද්දක් බාලයි."

"ඔයාගේ සීයා, හෙක්ටර් උඩරට, ධනවත් රදළ පරම්පරාවකින් පැවත එන කෙනෙක්. ඒ පළාතේ මිනිසුන් ප්‍රිය නොකරන පුද්ගලයෙක් හිටියානම් ඒ හෙක්ටර් තමයි. දුප්පත් මිනිස්සු තලාපෙලා දාලා, ඒ මිනිසුන් සතු දේපල තමන්ට අයිති කර ගන්න උත්සාහ කරන, වග නපුරු මිනිහෙක් හැටියට තමයි හෙක්ටර් ප්‍රසිද්ධ වෙලා හිටියේ. එයා ධන බලය, මැර බලය යොදවලා දුප්පත් මිනිසුන්ට හරියට හිරිහැර කළා. එයාගේ පරම්පරාවේ මීමුත්තෙක් දෙවෙනි රාජසිංහ, ඒ කියන්නේ ඉස්සර ලංකාවේ හිටිය රජකෙනෙක්ගේ හමුදාවේ සේවය කරලා තියෙනවා. ත්‍රිකුණාමලේ තිබුණ ලන්දේසි බලකොටුවට පහර දීලා ඒක විනාශ කරපු හටනේදී එයා දක්වපු දක්ෂකම් නිසා රාජසිංහ රජතුමාගෙන් තානාන්තර ලබලා තියෙනවා. "රන්දෙණිගල සිංහයා" කියලා ආරූඪ නාමයකුත් එයාට ලැබිලා තියෙනවා. හෙක්ටර් වචන දහයක් කතා කළොත් ඉන් පහක්වත් පරම්පරාවේ වර්ණනා තමයි."

"කොයිතරම් ඉඩකඩම් දේපල තිබුණත්, එයාගේ තන්හාවේ අඩුවක් තිබිලා නෑ. තමන්ට හිටිය එකම සහෝදරිය හා මස්සිනා එක්ක දේපල වලට නඩු කියපු නිසා නෑදෑයෝ අතර පවා එයා ගැන ඒ තරම් මනාපයක් තිබිලා නෑ. ඒ නිසා වෙන්න ඇති එයාගේ නෑදෑ ආශ්‍රයක් කොහෙත්ම තිබුණේ නැත්තේ. ආච්චිත් සීයට බයයි. එයාට විරුද්ධව වචනයක් වත් කතා කරන්නේ නෑ."

"නෙල්සන්, හෙක්ටර්ගේ පුතෙක් කියලා, නෙල්සන් ගැනත්, හෙක්ටර් ගැනත් දන්න කෙනෙක්ට හිතන්න අමාරුයි. ඒ දෙන්නගේ තිබුණේ පරස්පර විරෝධී අදහස්. නෙල්සන් කාටත් කතා කළේ ආදරෙන්, කරුණාවෙන්. ඒ නිසා නෙල්සන්ට ගමේ මිනිසුන් හරි කැමතියි. හෙක්ටර් කරන වැඩවලට විරුද්ධව වචනයක් හරි කතා කළා නම් ඒ නෙල්සන් තමයි."

"නෙල්සන් වෛද්‍ය විද්‍යාලයට යන්න සමත් වෙච්ච වෙලාවේ තාත්තයි, පුතයි හැප්පුනා. හෙක්ටර් කැමති වුණේ නෑ, එයාගේ පුතා

SL-Unlimited

රටේ සාමාන්‍ය පවුල්වල අයගේ දරුවොත් එක්ක ඉගෙන ගන්නවා දකින්න. ඒත් නෙල්සන්ට දොස්තර කෙනෙක් වෙන්නම ඕනෙයි කියපු නිසා හෙක්ටර් එයාව එංගලන්තෙ වෛද්‍ය විද්‍යාලයකට දැම්මා. අභිමානය රැක ගන්න හෙක්ටර් එහෙම දෙයක් කළාට, නෙල්සන් මට පස්සේ දවසක කිව්වා අප්පච්චිට අයිති වෙලා තිබුණ වත්තක් නෙල්සන්ගේ වියදම් නිසා විකුණන්න වුණ බව."

"නෙල්සන් දොස්තර විභාගය ඉහළින්ම සමත්වෙලා, ලංකාවට ආවා. එයාගේ පළමු පත්වීම ලැබුණේ මහනුවර රෝහලට. එයා ලෙඩුන් පරීක්ෂා කරන්නේ බොහොම ආදරෙන් ඔවුන්ට කතා කරමින්. ඒ නිසා වෙන්න ඇති, ඒ කාලේ එයාගෙන් බෙහෙත් ගත්තු අය කියන්න වුණා, දොස්තර හාමු ලෙඩ ඇහුවත් සනීප වෙනවා කියලා. සමහරු කියනවා දොස්තර හාමු අතින් ඇල්ලුව ගමන් ටියා වැහැලා ගියා කියලා. කොහොම වුණත් එයාගේ කීර්තිය මහනුවර විතරක් නොවෙයි, ඒ අවට ගම්මාන වලත්, රන්දෙණිගල ප්‍රදේශයෙත් ඉතා ඉක්මනින් පැතිර ගියා."

"එදා හැන්දෑවේ හෙක්ටර් පුරුදු විදිහට එයාගේ ගෙදර වත්තේ ඇවිදිමින් ඉන්නවා. ඉර බැහැගෙන යන වෙලාව නිසා පරිසරයත් හරිම සුන්දරයි. ඔය අතරේ තමන්ගේ නිවස දිහාවට එන පිරිසක් දැකලා හෙක්ටර් පුදුම වුණේ ඒ අතර ගමේ පන්සලේ ලොකු හාමුදුරුවොත්, නම්බුකාර විදිහට ගමේ හිටපු තුන් දෙනෙකුත් හිටපු නිසයි. පන්සලත් එක්ක ඉඩමකට නඩු කියලා තිබුණ නිසා ඒ දවස්වල ලොකු හාමුදුරුවොත් හිටියෙ හෙක්ටර් එක්ක අමනාපයෙන්."

"කොහොම වුණත් ඒ අය තමන්ගේ නිවසට එන එක ගැන හෙක්ටර් සන්තෝස වුණා. ඉදිරියට ගිහින් ඒ අය පිළිගෙන, ගෙදරට කැන්දන් ඇවිත් හොඳට සංග්‍රහ කළා. ටික වෙලාවක් එහෙම කතා කර කර ඉන්නකොට තමයි හෙක්ටර්ට තේරුණේ ඒ අය ඇවිත් තියෙන්නේ තමන් හමුවෙන්න නොවෙයි කියලා."

"වලව්වේ හාමුට කියන්න, අපේ දොස්තර හාමු අපේ ගමට ලොකු නම්බුවක්. අපි කොතෙකුත් දොස්තර ගොල්ලලා දැකලා තියෙනවා, ඒත් නෙල්සන් හාමු වගේ ජීවකයෙක් දැකලා නෑ. ඒ වගේ ආදරෙන් ලෙඩ්ඩුන්ට කතා කරලා, සුව දුක් විමසලා, බෙත් හේත් කරන ජීවකයෙක් මේ අහල රෝහලක තියා ලංකාවේ කිසිම රෝහලක ඉන්නවද දන්නේ නෑ."

"ඒ ආපු හැම කෙනෙක්ම නෙල්සන්ව වර්ණනා කරනවා. හාමුත් හිනාවෙවී බොහොම සන්තෝසයෙන් ඒවා අහගෙන ඉන්නේ ගම්මු තමා ගැන තියෙන තරහ මරහ පුතා නිසා හේදිලා යන එක ගැන හිතමින්."

SL-Unlimited

"ඉතින් අපේ හාමුදුරුවොයි, මේ පිරිසයි සකහනියේ මෙහේ ආවේ ඕවා මට කියලා යන්නද?" තවමත් ඒගොල්ල ආපු කාරණාව මොකක්ද කියලා තේරුම් ගන්න බැරුව හෙක්ටර් ඇහුවා.

"අපි ආවේ නෙල්සන් හාමු මුණ ගැහිලා යන්න. ළඟදීම නගරසභා චන්දෙ තියෙනවනේ. නෙල්සන් හාමු වගේ කෙනෙක් අපේ ගමෙන් ඉදිරිපත් වෙනවා නම් මේ පළාතට ලොකු සේවයක් කරන්න පුළුවන්."

"ඒ ආපු පිරිස කාලෙකට පස්සේ වලව්වේ හාමු හිනාවෙනවා දැක්කා. එයා ලෙහෙසියෙන් හිනාවෙන පුද්ගලයෙක් නොවෙයි. හෙක්ටර්ගෙ ඒ හිනාව හද පතුලෙන්ම ආපු එකක්. එදා හෙක්ටර්ට නෙල්සන් ගැන ලොකු ආඩම්බරයක් ඇති වුණා. නගරසභා චන්දෙන් දිනලා, මහනුවර නගරාධිපති විදිහට එයාව තෝරා ගන්නා හැටි හෙක්ටර්ගේ හිතේ ඇඳිලා ගියා. ඉන් පස්සේ මහ චන්දෙටත් ඉදිරිපත් වෙලා ඇමති වරයෙක් හැටියට වැඩ කරන හැටි එයාට මැවිලා පෙනුනා. එයාට ලොකු ආඩම්බරයක් ඇති වුණා. තමන්ගේ ලොකු පුතා, පරම්පරාවට ලොකු ගෞරවයක් ගෙනෙන හැටි මතක් වෙලා හෙක්ටර් තනියම හිනාවෙනවා."

"අපේ පරම්පරාවේ අයට රාජ්‍ය සභාවල සේවය, මැති ඇමති සභාවල සේවය නොපුරුදු දෙයක් නොවෙයිනේ අපේ හාමුදුරුවනේ" හෙක්ටර් නිරහංකාර වෙන්න බලාගෙන බොහොම හිතවත විදියට කියනවා.

"එදා දෙවෙනි රාජසිංහ රජ්ජුරුවන්ගේ දවසේ "රන්දෙණිගල සිංහයා" කියලා මේ සිරි ලංකාවේ පරසිද්ද වෙච්ච අපේ ඒ මී මුත්තාගේ ඉඳන්, අපේ පරම්පරාවේ අය කී දෙනෙක් නම් රාජ්‍ය සභා වල, ඇමති සභාවල සේවය කරලා ඇත් ද? ඒත් මට තියෙන එකම ප්‍රශ්නේ අපේ පුතා ඕකට කැමති වෙයිද කියන එක."

"වලව්වේ හාමු කැමති නම් දොස්තර හාමු කැමති කරගන්න එක අපට බාර දෙන්න" හාමුදුරුවොත්, හාමු එක්ක තිබුණ පරණ අමනාපකම් හිතෙන් ඉවත් කරගෙන කතා කරනවා.

"ඔය වෙලාවේ තමයි නෙල්සන් ගෙදර ආවේ. කාරෙක පෝටිකෝව යට නතර කරලා තමුන්ගේ පියා සමග කවදාවත් නොදුටු තරම් පිරිසක්, කවදාවත් නොදුටු තරමේ ලෙන්ගතු කමකින් කතා කරනවා දැක්කාම එයාට පුදුම හිතුනා."

"පුතා මේ හාමුදුරුවොත් එක්ක ගමේ ප්‍රභූ ගොල්ල ඇවිත් තියෙන්නෙ පුතාට කතා කරලා යන්න" හාමු බොහොම ගරු සරු බවක් පෙන්නලා කිව්වා.

SL-Unlimited

"නෙල්සන් වැඩිය පන්සලට ගිහිං පුරුද්දක් තියෙන කෙනෙක් නොවෙයි. ඒ වුණත් ආගම දහමට ලැදි පුද්ගලයෙක්. නෙල්සන් හාමුදුරුවන්ට වැඳලා එකත් පස්ව හිටියා. හාමුදුරුවො තමන් ආපු කාරණය නෙල්සන්ට කිව්වා.

"අනේ හාමුදුරුවනේ, ඕවා මට පුරුදු වැඩ නොවෙයි නේ" නෙල්සන් ගත් කටටම කිව්වා.

"එහෙම කියන්න එපා පුතා. පුතා දන්නවනේ, අපි රන්දෙණිගල සිංහයාගේ පරම්පරාවෙන් පැවත එන උදවිය. අපේ පරම්පරාවේ අය ඉස්සර රජවරුන්ට රට පාලනය කරන්න නොයෙකුත් විදියට අවවාද අනුශාසනා කරලා තියෙනවා. ඒ නිසා තාන්න මාන්න, ගරු නම්බු නාම ලබා ගෙනත් තියෙනවා. පුතාගේ ඇඟේ තියෙන්නෙත් ඒ අයගේම ලේ බව අමතක කරන්න එපා."

"මහත්තයෝ. මහත්තයා වගේ මිනිසුන්ට ආදරෙන් සලකන අය තමයි රජවාසලට යන්න ඕනේ. මහත්තයා වගේ අයට දුප්පතාගේ දුක තේරෙනවා. දැන් බලන්න මහත්තයා. අපේ ගමට කොයි තරම් අඩුපාඩු තියෙනවද? හදිසියකට කෙනෙක්ට අසනීපයක් වුණොත් එහෙම මහනුවරටම යන්න එපැයි බෙහෙතක් හේතක් ගන්න. අහල පහලක දිස්පෙන්සරියක්වත් තියෙන එකක් යැ. මහත්තයා වගේ කෙනෙක් නගර සභාවට තේරුණොත්, මේ ගමට දිස්පැන්සරියක්වත් ලබාගන්න පුළුවන්නේ."

"එතකොට හෙක්ටර්ගේ මූණ ටිකක් ඇඹුල් වුණා. එයා කැමති වුණේ නෑ පුතා ගමේ ඉන්න දුප්පත් මිනිස්සුන්ට ළං වෙනවා දකින්න. එයාට ඕනේ වුණේ ගමට රටට කරන සේවය මොකක් වුණත්, තව ගරු නම්බු නාම ටිකක් අරගෙන පරම්පරාවේ වරුගෙ වැඩි කර ගන්න. ඒත් ඒ කියන ඒවා කෙරෙන්න තව ගොඩක් කල් තියෙන නිසා එයා නිස්සද්දවම හිටියා."

"ගමේ හිටපු මෙම්බර්, ග්‍රාම සේවක, ලොකු ඉස්කෝලේ මහත්තයා, තම තමුන්ව අඳුන්නලා දීලා නෙල්සන්ට නොයෙකුත් විදිහට කාරණා පැහැදිලි කරලා දුන්නා. අවසානයේදී නගරසභා චන්දෙට ඉදිරිපත් වෙන්න නෙල්සන් කැමති වුණා."

"නෙල්සන්ගේ පවුලේ කෙනෙක්ම නොවුණත් ඒ වලව්වේ හිටපු තව කෙනෙක් ගැන නොකියම බෑ. එයා තමයි ඩික්කුං කියන වලව්වේ සේවකයා. මිනිහා කාත් කවුරුවත් නැති අසරණයෙක්. මිනිහගේ අම්මත් කාලයක් වලව්වේ වැඩ කරලා තියෙනවා. ඩික්කුංට වයස අවුරුදු හතරක් විතර ඇතිලු එයාගේ අම්මා නැති වෙන කොට. යන්න එන්න තැනක් නැතිව හිටි ඩික්කුං වලව්වටම ඉන්න වුණා.

හෙක්ටර්, වලව්වේ හිටපු අනික් සේවකයින්ට වඩා ඊක්කුංට ආදරෙන් සැලකුවා. ඒකට මිනිස්සු නොයෙකුත් කට කතා පතුරුවලා තිබුණා. ඒවා කොයිතරම් දුරට ඇත්තද කියන්න මම නම් දන්නේ නෑ. ඒ කොහොම වෙතත් වලව්වේ හිටපු සේවකයින්ගෙන් ඉස්කෝලෙකට ගිහිං ඉගෙන ගන්න වාසනාව තිබුණේ ඊක්කුංට විතරයි. ඊක්කුං නෙල්සන්ට වඩා අවුරුදු දෙකක් වයසින් බාලයි. නෙල්සන් ඉගෙන ගත්තේ කොළඹ පෞද්ගලික පාසලක, නේවාසිකව. නිවාඩු කාලෙට එයා ගෙදර ආවාම ඊක්කුං වලව්වේ වැඩ වලින් නිදහස් වෙනවා. නෙල්සන් එක්ක සෙල්ලං කරන්න, එයාගේ ඕන එපාකම් පිරිමහන එක තමයි ඊක්කුංට තිබුණේ. මල්ලියි නංගියි එක්ක නෙල්සන්ගේ තිබුණ වයස පරතරය නිසා නෙල්සන් ඒ අයට වඩා ඊක්කුංට සමීප වෙලා හිටියා. ඊක්කුං වුණත් නෙල්සන්ට හරි ආදරෙයි. නෙල්සන් කිව්වේ මොකක්ද, ඒක හරිද වැරදිද, ඒකෙන් ඇති වන ප්‍රතිඵලය මොකක්ද කියලා නොබලා ඒ වැඩේ කරනවා."

"නෙල්සන් දොස්තර විභාගේ පාස්කරලා ආවා. ඊට පස්සේ නෙල්සන් යන හැම තැනකටම එයාගේ සෙවනැල්ල වගේ ඊක්කුං යනවා. එහෙම යන්න හෙක්ටර්ගෙන් නියෝගයකුත් ලැබිලා තිබුණා. නෙල්සනුත් පාළුව යනනත් එක්ක පස්ස සීට් එකේ ඊක්කුංව දාගෙන ඉස්පිරිතාලෙට යනවා. ඊක්කුංට ඉස්පිරිතාලේ ඇටෙන්ඩන්ට් කමක් අරං දෙන්න නෙල්සන් හිතුවා. ඒත් ඒකට ඊක්කුං කැමති වුණේ නෑ."

"අනේ හාමු. මට සමහර ලෙඩ්ඩු දැක්කාම කලන්තෙ හැදෙනවා. මං ඒ වැඩේට ආස නෑ" ඊක්කුං කිව්වා."

"දවසක් ඊක්කුං එක්ක පාළු පිට්ටනියක් ගාවට ආපු නෙල්සන් ඒ හරියේ කාරෙක නතර කළා. ඊක්කුංටත් කාරෙකෙන් බහින්න කියලා, නෙල්සන් ගෙදරින් එනකොට හදාගෙන ආපු "එල්" බෝඩ් දෙක කාරෙක ඉස්සරහත් පස්සෙත් ගැහුවා. එයාගේ ඔළුවේ ලොකු ප්ලෑන් එකක් තියෙනවා. ඒත් ඊක්කුංට නම් හාමු මොනවා කරන්න හදනවාද කියලා තේරුමක් නෑ."

"බෝඩ් දෙක ගැහුවට පස්සේ ඊක්කුංට කාර් එකට නගින්න කියලා නෙල්සන් කිව්වා."

ඊක්කුං පුරුදු විදිහට පස්ස සීට් එකට නගින්න සූදානම් වුණා.

"නෑ නෑ ඉස්සරහ සීට් එකෙන් ඉඳගන්න, ඩ්‍රයිවින් සීට් එකෙන්."

ඊක්කුං අන්ද මන්ද වෙලා බලං ඉන්නවා.

"මට තේරෙන්නේ නෑ හාමු. මම එතන ඉඳ ගත්තාම හාමු වාහනේ එලවන්නේ කොහොමද?"

SL-Unlimited

"මං නොවෙයි වාහනේ එළවන්නේ. උක්කුං තමයි ඒක කරන්නේ."

"අනේ හාමු මං වාහන එළවන්න දන්නේ නෑනේ."

"දන්නේ නැති නිසා තමයි උක්කුං මං "එල්" බෝඩ් දෙකක් දෙපැත්තේ ගැහුවේ. උක්කුංට වාහන එළවන හැටි මං දැන් උගන්නනවයි හදන්නේ. කාරෙකට නගින්න."

නෙල්සන් මුලින් කියපු වචන ටික සාමාන්‍යයෙන් හිතවත්ව කතා කරන විදිහට කිව්වත්, අන්තිම වචන ටික කිව්වේ ටිකක් හඬ උස්සලා, විධානයක් කරන හැටියට. ඉතින් උක්කුංට ඒකට විරුද්ධ වෙන්න බෑ.

"නෙල්සන් මිනිහට වාහන පදවන හැටි උගන්වන්න වුණා. මුලදී බොහොම බයෙන් එළවන්න පටන් ගත්තත්, ටික වෙලාවක් යනකොට එයාගේ හිතේ තිබුණ බය පහ වෙලා ගිහින් පොඩි ආඩම්බරේකුත් හිතට ඇවිල්ලා."

"උක්කුං හොඳට ඩ්‍රයිවින් ඉගෙන ගන්න ඕනේ. එතකොට උක්කුං තමයි මගේ ඩ්‍රයිවර්. මට යන්න වෙන හැම තැනකටම උක්කුංට මාව අරගෙන යන්න වෙනවා. කැමතියි නේද?"

"මේ මොනවා කියනවද හාමු. මට ඕනෙත් හාමු යන යන තැන හෙවනැල්ල වගේ ඉන්න තමයි. මං හාමුට කියන්නයි හිටියෙත්. හාමු බැඳපු දාකට හාමු ඉන්න ගෙදරට මාව එක්කරගෙන යන්න."

"එහෙනම් උක්කුං පුංචි මැණිකෙට කිව්වෙ, එයා බැඳපු දාකට එයා ඉන්න තැනකට එක්කං යන්න කියලා."

"ඒ මං.. මං.. " උක්කුං තතමනවා.

"හාමු මාව ගත්තෙ නැත්නම් තමයි මං පුංචි මැණිකේ ගාවට යන්නේ" මිනිහා අන්තිමට කිව්වා. "පුංචි මැණිකේ කියලා මේ දෙන්නා කතා වුණේ නෙල්සන්ගේ නංගි මියුරියෙල් ගැනයි. එතකොට එයාට වයස අවුරුදු දාහතක් දහඅටක් විතර ඇති. හරි ලස්සන හුරු බුහුටි කෙල්ල".

"මේ වෙලාවේ නෙල්සන්ගේ නංගියි, මල්ලියි ගැනත් යමක් කියන්න ඕනේ. ඒ දෙන්නම ඉගෙන ගත්තේ මහනුවර පෞද්ගලික පාසල් දෙකක. ඒ දෙන්නත් නේවාසිකව ඉගෙන ගත්තා. ඒ වුණත් ඒ දෙන්නා හැම සති අන්තයකම ගෙදර එනවා. ඒ දෙන්නා අතර පුදුම බැඳීමක් තිබුණා. නෙල්සන් එක්ක ඒගොල්ලන්ගේ තිබුණේ වැඩිහිටියෙකුත් පුංචි ළමයි දෙන්නෙකුත් අතර තිබුණා වගේ සම්බන්ධයක්."

"උක්කුං නෙල්සන්ට සමීප වෙලා හිටියා වගේම, ඒ දෙන්නටත්

SL-Unlimited

බොහොම සමීප වෙලා හිටියා. ඒ දෙන්නගේ ලෝකයට ටික්කුං වීරයෙක්. නිවාඩු සෙනසුරාදා ඉරිදා දවස් දෙකේ ඒ ගොල්ල ටික්කුං එක්ක ගම වටේ ඇවිදින්න යනවා. ඒ දෙන්නා පළමු වතාවට පන්සලට එක්කරගෙන ගියෙත් ටික්කුං තමයි. පන්සලේ නායක හාමුදුරුවන්ට ඒ දරුවෝ දෙන්නා දැක්කාම හරියට සන්තෝෂ හිතුනා. ඒ දෙන්නව එක්කරගෙන ඇවිත් ටික්කුං පිනක් කර ගත්තු බව කිව්ව හාමුදුරුවෝ ධර්මපාල ජාතක කතාව ඒ දෙන්නට කියලා දුන්නා. ඒක විල්සන්ගේ හිතට හොඳට කා වැදුනා. එයා නෙල්සන්ටත්, හෙක්ටර්ටත් වඩා බොහොම වෙනස් පුද්ගලයෙක්. පොඩි කාලේ ඉඳලම වැඩි සද්ද බද්දයක් නෑ. "හොඳ නෑ කරන්න" කියලා යමෙක් යමක් කිව්වොත් ඒක කවදාවත් කරන්නෙ නෑ. කිසිම වෙලාවක, කිසිම හේතුවක් නිසාවත් කාගෙවත් හිත රිදෙන වැඩක් එයා කරන්නෙ නෑ. ඉස්කෝලේ ළමයිනුත් එයාට "උපාසක" කියලා තමයි නම දාලා තියෙන්නේ. ඉන් පස්සේ විල්සන් දවස් කීපයක්ම ටික්කුං එක්ක පන්සලට ගියා. හාමුදුරුවොත් එයාලට බණ කතා කියලා දුන්නා. ඒත් මියුරියෙල් ඒ ගැන අප්පච්චිට කිව්වාම අප්පච්චි නීතියක් දැම්මා ඉඳලා හිටලා ගියාට නිතරම වගේ පන්සලට යන්න එපා කියලා. ඒ ටිකක් හරි ඉඩ දුන්නෙ පුංචි පුතාගේ හිත පෑරෙයි කියලා."

"මියුරියෙල් මේ කාටත් වඩා වෙනස්. තාත්තා වගේ නපුරු ගතිගුණ නොතිබුණාට තාත්තාගේ තිබුණ ඒ අභිමානය එයාගේ තිබුණා. කිසිම වෙලාවක එයාලට නොගැලපෙනවයි කියලා හිතෙන කෙනෙක් එක්ක කතාවට යන්නෙත් නෑ. හිතග වෙන්න යන්නෙත් නෑ. ගම වටේ ඇවිදින්න ගියත් ටික්කුං එක්ක ඇරෙන්න වෙන කා එක්කවත් හිනා වෙන්නෙවත්, කතා කරන්නෙවත් නෑ. ඒ දෙන්නම හිතාගෙන හිටියේ ටික්කුංට කරන්න බැරි වැඩක් මේ ලෝකෙ නෑ කියලා."

"දවසක් ටික්කුං එක්ක ඒ වත්ත පහල තිබුණ කැලෑවේ ඒ දෙන්නා ඇවිදිනවා. ඒ කැලෑවේ තියෙන හිඹුටු, මාදං, ජේර කකා යන අතර පඳුරක් අස්සේ හැංගිලා හිටිය හාවෙක් පැනලා දුවනවා පුංචි මැණිකේ දැක්කා."

"අනේ ටික්කුං මට අර හාවා අල්ලලා දෙන්න" පුංචි මැණිකේ කිව්වා. ඒ වෙලාවේ නම් හාවා අල්ලගන්න ටික්කුංට බැරි වෙලා තියෙනවා. ඒත් දවස් හතර පහකට පස්සේ පැය ගානක් ඒ කැලෑවේ රැකගෙන ඉඳලා උගුලක් අටවලා හාවා අල්ලගෙන, රිබන් පටි අන්දලා ගෙදර ආවාම පුංචි මැණිකෙට දීලා තියෙනවා."

"ටික්කුංට බොහොම ස්තූතියි. මටත් ඒ හාවා ගැන වගක් මතක තිබුණේ නෑ. ටික්කුංට කොහොමද ඒක මතක හිටියේ?"

"පුංචි මැණිකේ කියන හැම දෙයක්ම මට මතකයි. මං ආසයි පුංචි මැණිකේ කියන ඕනම දෙයක් කරන්න" යටහත් පහත්ව ටික්කුං කියනවා.

"ඒ කියන්නේ පුංචි මැණිකේ ලිඳට පනින්න කිව්වොත් ඒකත් කරනවා කියලද?" විල්සන් ඇහුවා.

"ඔව්"

"කාව හරි මරන්න කිව්වොත් ඒකත් කරනවද?" මියුරියෙල් ඇහුවා.

ටික්කුං අසරණ වෙලා.

"ප්‍රාණඝාතය අකුසල කර්මයක්නේ පුංචි මැණිකෙ."

මියුරියෙල් හිනාවෙනවා.

"හොඳයි අපි දැන් මේ කැලේ ඇවිදින කොට නයෙක් මගේ පස්සෙන් එලෝගෙන එනවා. එතකොට ටික්කුං නයා මට දෂ්ට කරනකම් බලාගෙන ඉන්නවද?"

"අපොයි නෑ. මං ඉස්සරහට පැනලා නයාට මට දෂ්ට කරන්න ඉඩ දෙනවා."

"එතකොට ඌ ටික්කුංට දෂ්ට කරලා ඉවරවෙලා මටත් දෂ්ට කරයිනේ."

ටික්කුංගේ ඇස් දෙක රතුවෙලා. මූණත් රෞද්‍රවෙලා.

"හැබෑ නේන්නම් පුංචි මැණිකේ කියන කතාව. මං ඌව කෑලි කෑලි වලට කපලා දානවා."

මියුරියෙල් තාමත් හිනාවෙනවා.

"ප්‍රාණඝාතය අකුසල කර්මයක් ටික්කුං" එයා හිනාවෙමින් කියනවා.

"පුංචි මැණිකෙත් හරි කතා තමයි කියන්නේ" ටික්කුං අසරණ වෙලා කියනවා.

"දැන් ඉතිං මං ආයි අර කතාව නවත්තපු තැනට යන්නං."

"ටික්කුංට ඩ්‍රයිවින් උගන්වන බව දැනගත්තාම, හෙක්ටර් හුඟක් සතුටට පත් වුණා. ඒ ටික්කුං ඩ්‍රයිවින් ඉගෙන ගන්න හින්දම නොවෙයි. හෙක්ටර් දැන් දන්නවා නෙල්සන් කොහේ ගියත් එතන ටික්කුං ඉන්නවා කියලා."

"හෙක්ටර් හැම තිස්සෙම නෙල්සන් ගැන හිතුවේ හිතුවක්කාර, නොමඟ යන්න පුළුවන්, දඩබ්බර පුතෙක් විදිහට. ඉතින් එයා බයෙන් හිටියේ නෙල්සන් නුසුදුසු තැනකට පැරෙහයි කියලා. දැන් ටික්කුංටත්,

නෙල්සන් යන හැම තැනටම යන්න ඉඩ ලැබෙන නිසා, ඒ යන එන තැන්වල තොරතුරු තමන්වත් දැන ගන්න ලැබෙන නිසයි හෙක්ටර් වැඩියතම සතුටු වුණේ."

●●●

"එදා නෙල්සන් ඉස්පිරිතාලේ ඉඳලා එනකොට ඇඳිරි වැටිලා. වලව්වට යන පාරට හරවන කොටම එයා දැක්කා කවුද මනුස්සයෙක් ගිනි හුලකුත් අරගෙන කලබලේට දුවගෙන එනවා.

"කවුද ඊක්කුං මේ ගිනි හුලකුත් අරගෙන කලබලෙන් මේ පැත්තට දුවගෙන එන මනුස්සයා?"

ඊක්කුං එයාව අඳුන ගත්තේ එයා කාරෙක ළඟට ආවාට පස්සේ. ඊක්කුං එයාට ලං කරලා කාරෙක නැවැත්තුවා.

"ආ.. මේ ප්‍රුවානිස් මාමානේ. කොහේද මේ කලබලේට දුවන්නේ?"

"කෙලීට හොඳටම උණ ඊක්කුං පුතේ. මං මේ කෙලීව ඉස්පිරිතාලෙටවත් අරං යන්න කළුබණ්ඩෙගේ කාරෙක අරගෙන එන්න යනවා."

"ප්‍රුවානිස් කාරෙකට නගින්න. මං එන්නම් දුවගේ අසනීපය බලන්න."

"හාමු මහත්තයෝ.. අපි.. අපි.." ප්‍රුවානිස් කියන්න යන්නේ මොකක්ද කියලා නෙල්සන් දන්නවා. පැට්රික් අහලා ඇතිනේ කුලභේදය කියන එක. ඒක ඒ පළාත්වල ඒ කාලේ සෑහෙන තදට තිබුණ දෙයක්."

"ප්‍රුවානිස්ට කාරෙකට නගින්න කියලයි මං කිව්වේ!"

"ඒක විධානයක්. ප්‍රුවානිස්ට ඒකට එරෙහි වෙන්න බෑ. එයා කාරෙකේ පස්ස දොර ඇරියා."

"ප්‍රුවානිස් මාමේ. ඔය ගිනි හුල විසි කරලා දාලා කාරෙකට නගින්න."

"මගෙත් සිහියක හැටි" කියලා ගිනිහුල බිම ගහලා නිවලා පැත්තකට දාපු ප්‍රුවානිස් කාරෙකේ ඉඳ ගත්තා."

"මොකක්ද ප්‍රුවානිස් දුවට තියෙන අසනීපය?"

"දැන් දවස් තුන හතරක ඉඳලා උණ හාමු මහත්තයා. වෙද මහත්තයාගෙන් බේත් ගත්තට අඩුවක් උණේ නෑ. කෑම කන්නත් බෑ. වමනෙත් කරනවා."

"කාරෙක ප්‍රුවානිස්ගේ ගේ ගාව නතර කළා. නෙල්සන් කොහේ ගියත් එයාගේ වෙද නලාවයි හදිසියකට අවශ්‍ය කරන බේත් පෙත්

www.sinhalalibrary.com
SL-Unlimited

තියෙන බෑග් එකයි අරගෙන යනවා. කාරෙක නැවැත්තුවට පස්සේ ටික්කුං ඒ බෙත් බෑග් එක අතට ගත්තා."

"මං කෙල්ව ඉස්තෝප්පුවට අරගෙන එන්නම් හාමු මහත්තයා" කියලා පුවානිස් ගෙට දුවන්න හැදුවා.

"ඕන නෑ පුවානිස්. කෙල්ලට අසනීපයි කිව්වනේ. මං කාමරේට ගිහින් බලන්නම්."

ටික්කුං ඉස්සර වුණා. පුවානිස් කට ඇරගෙන බලාගෙන හිටියා.

"අපේ ගෙවල්වලට හාමු මහත්තයලා වගේ... "

"යමු යමු කියලා පුවානිස්ගේ කතාවටත් බාධා කරපු නෙල්සන් ඒ කිසි දෙයක් ගණං නොගෙන ටික්කුං පස්සෙන් ගේ ඇතුළට ගියා."

"නෙල්සන් කාමරේට යන කොට ලෙඩා කෙඳිරි ගාමින් කාමරේ ඉන්නවා. කාමරේට ඇතුළුවුනේ එයාගේ අප්පච්චි කියලා එයා හිතන්න ඇති."

"අනේ අප්පච්චී.. මට නං ඉන්න බෑ" කියලා එයා දොර පැත්තට හැරුණා. කාමරේට ඇතුළුවුණේ දොස්තර හාමු බව පෙනුනාම එයා එක සැරේටම ඇඳෙන් ඉඳගත්තා. ඇඳෙන් බහින්නත් හැදුවා. ඒ නෙල්සන්ට තිබුණ ගෞරවේට. ඒ ගෙවල් වලට කිසිමදාක වලව්වක කෙනෙක් ඇතුළු වෙලා නෑ."

"හා හා නැගිටින්න එපා. ඔහොම ඉන්න" කියලා නෙල්සන් ලෙඩාගේ නළලට අත තියලා පරීක්ෂා කරන්න පටන් ගත්තා.

"මේ ළමයට හොඳටම උණනේ. මෙච්චර උණ වැඩි වෙන කල් මොකද ගෙදර තියාගෙන හිටියේ?" කියලා නෙල්සන් පුවානිස්ගෙන් සැරෙන් ඇහුවත් ඒකට උත්තරයක් බලාපොරොත්තු වුණේ නෑ.

"ඊට පස්සේ තවත් ටිකක් ලෙඩාව පරීක්ෂා කරලා බලලා බෑග් එකෙන් බෙහෙත් වගයක් අරගෙන පුවානිස්ට දීලා ඒවා පාවිච්චි කරන හැටිත් කියලා දුන්නා."

"බය වෙන්න දෙයක් නෑ පුවානිස්. දුවට ඩෙංගු උණ. මේ දවස්වල ඕක හැම තැනම වගේ තියෙනවා. මං කියපු විදියට බෙහෙත් පාවිච්චි කරන්න. දවස් දෙක තුනක් යනකොට සනීප වෙයි."

"නෙල්සන් ටික්කුං එක්ක මිදුලට බැස්සා. වලව්වේ දොස්තර හාමු පුවානිස්ගේ ගෙදරට ඇවිත් තියෙන ආරංචියට සෑහෙන පිරිසක්, ඒ අරුමේ දැක ගන්න එතනට රොක් වෙලා හිටියා. නෙල්සන් ඒ කිසි දෙයක් නොදැක්ක ගානට කාරෙකේ වාඩිවුණා. ටික දුරක් නිහඬව කාරෙක පදවගෙන ආපු ටික්කුං සතුටු හිනාවක් පෑවා."

www.sinhalalibrary.com
SL-Unlimited

"හාමු මහත්තයා. හාමු මහත්තයා ඒ කළ වැඩෙන් කවදාවත්ම හම්බ නොවෙන චන්ද තුන්හාරසීයක් අපේ පැත්තට වැටුණා. දැන් ඉතිං හාමු මහත්තයා දිනන එක කාටවත් නවත්වන්න බෑ."

"නෙල්සන් ඒකට කිසිම උත්තරයක් දුන්නේ නෑ. එයාගේ හිතේ පුවාතීස් කෙනෙක්වත් චන්දයක්වත් නෑ. ඒ වෙනුවට හිතට කවදාවත ඇති නොවුන හැඟීමක් ඇති වෙලා."

"ලස්සන කෙල්ල. ලස්සන අහිංසක ඇස් දෙක.. " නෙල්සන් හිතනවා.

●●●

"මේ කාලේ වෙනකොට නෙල්සන් මාසෙකට දවසක් හරි දෙකක් හරි පන්සලට යන්න පුරුදු වෙලා හිටියා. එදාත් එයා වෙනදා වගේ පන්සලට ගිහින් ලොකු හාමුදුරුවොත් එක්ක ටික වෙලාවක් කතා කර කර ඉඳලා, ගෙදර එන්න හැරුණා. එතකොට එයා දැක්කා මෙතෙක් දවසක් එයාගේ හදවතට වරින් වර හොරෙන් ඇතුළුවන ඒ රූපය ඇති රූමතිය, එයාගේ යෙහෙළියකුත් එක්ක පන්සලට ඇවිත් ඉන්නවා. නෙල්සන්, නොදැනිම ඒ පැත්තට ඇදිලා ගියා. උක්කුං ගේ හිතට බයක් ඇති වුණා."

"හාමු අපි ගෙදර යමු" කියලා උක්කුං කිව්වත් ඒක නෙල්සන්ට ඇහුනේ නෑ.

නෙල්සන් ඒ ගෑණු ළමයා ළඟට යනකොට එයාගේ යෙහෙළිය එයාගෙන් ඈත්වෙලා ගිහින්.

"දැන් ඔයාට හොඳට සනීපයි නේද?" නෙල්සන් ඇහුවා.

"ඔව් හාමු. හාමු මහත්තයා නලලට අත තියලා උණ බලන කොට මට ලොකු සනීපයක් දැනුනා. මං හිතන්නේ මට සනීප වුණේ ඒ වෙලාවේ."

"නෙල්සන්ට ඒ වෙලාවේ ඒ ළමයාට කියන්න හිතට ආපු එක කිව්වේ නැලු. ඒත් පස්සේ දවසක මට ඒක කිව්වා."

"ඔයාගේ නලලට අත තියපුවාම ඔයාට සනීප වුණා. ඒත් ඒ වෙලාවේ ඉඳලා මගේ හිත ලෙඩ වෙලා."

නෙල්සන් ආයෙමත් දොස්තර වුණා.

"ඉතිං මං දීපු බෙහෙත් බිව්වේ නැද්ද?" නෙල්සන් එහෙම ඇහුවේ ටිකක් සැරෙන් වගේ.

"බෙහෙත් බිව්වා හාමු මහත්තයා" එයා ඒ ටික කිව්වේ බයෙන් පැකිලෙමින්. හරියට ගුරුවරයකුට වරදක් කරලා අහුවුන ගෝලයෙක්

www.sinhalalibrary.com
SL-Unlimited

වගේ.

"හාමු මහත්තයා. අද හැරී මහත්තයා එනවා කිව්වා නේද? මෙලහකටත් එයා වලව්වට ඇවිත් හාමු එනකල් බලාගෙන ඇති."

"මං එහෙනම් එන්නම්" කියලා නෙල්සන් ආපහු එන්න හැරුණේ හරිම අකමැත්තෙන්. වෙන කරන්න දෙයක් නොතිබුණ නිසා.

"හාමු මහත්තයාට බොහෝම පින් මාව සනීප කළාට."

නෙල්සන් ආපහු හැරිලා ඒ ලස්සන ඇස් දෙක දිහා ටික වෙලාවක් බලාගෙන හිටියා. ටික වෙලාවක් නෙල්සන් දිහා බලාගෙන හිටපු ඒ කෙල්ලගේ මූණ ජම්බු ගෙඩියක් වගේ රතු වුණා. ඇස් දෙක බිමට හැරවුණා. නෙල්සන් වලව්වට ගියා.

●●●

නෙල්සන් අප්පච්චිගේ හැටි දන්න නිසා බොහොම කල්පනාවෙන් තමයි වැඩ කළේ. දවසක් හවස් වරුවක එයා මාව හමුවෙන්න ආවා. ඒ දවස්වල මං වැඩ කළේ පේරාදෙණිය පොලීසියේ. මං නැවතිලා හිටියේ පොලිස් නිවාසයක.

"හැරී...ත්" කියලා මට ආමන්ත්‍රණය කරපු එයා ඉස්තෝප්පුවේ තිබුණ ඇඳි පුටුව උඩ දිගෑදුනා. නෙල්සන්ගේ මුහුණෙන් මට තේරුණා එයා ලොකු ප්‍රශ්නෙකට මැදි වෙලා ඉන්න බව. එයාගේ ඉරියව් බොහොම නොසන්සුන්. මං එයාට වතුර වීදුරුවක් ගෙනත් දුන්නා.

"මේවායින් වැඩක් නෑ. නැද්ද ඇඟ රත්වෙන ජාතියේ මොකවත් එහෙම?"

මං බියර් බෝතලයක්, වීදුරු දෙකකුත් එක්ක අරගෙන ඇවිත් එයා ඉඳගෙන හිටපු පුටුව ළඟ තිබුණ ටීපෝව උඩින් තිබ්බා. එයා බෝතලෙන් වීදුරු දෙක පුරවන්න වුණා. ඊට පස්සේ මට "චියර්ස්" කියලා එක හුස්මට අර බීර වීදුරුව බීගෙන බීගෙන ගියා.

"ඇයි බං? මොකද මේ උඹ අද අමුතු?" කියලා ටික වෙලාවකට පස්සේ මං ඇහුවා.

"හැරී.. ඉස්සර අපි ඉස්කෝලෙ යන කාලේ ආදරය, ප්‍රේමය කියන දේවල් ගැන කතා කරපු හැටි උඹට මතකද? වතාවක් ඩිබේට් එකකදී මං ඒ ගැන ඉදිරිපත් කරපු තර්ක ඔයාට මතකද? සාලිය කුමාරයා රජ කමට පයින් ගහලා, චණ්ඩාල කෙල්ලක් එක්ක දීග ගිය එක ගැන මං එදා කතා කළේ හිතට වහල් වෙලා කරපු මෝඩ කමක් හැටියට. එංගලන්තෙ රජ්පුරුවෝ කළේත් මෝඩ කමක් කියලා එදා මං කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කරලා ඒ ඩිබේට්ස් වලින් දින්නා.

SL-Unlimited

ඒත් මං දැන් දන්නවා ඒ රජවරු, කුමාරවරු එහෙම කළේ ඇයි කියලා. මට දැන් ඒක හොඳට තේරෙනවා."

"නෙල්සන් මට කියපු ඒ දෙයින් මං තේරුම් ගත්තා එයා සා එක්ක හරි ප්‍රේම සම්බන්ධයක් ඇති කරගෙන තියෙන බව. ඒ එක්කම එයාගේ ප්‍රේමවන්තිය පවුලට නොගැලපෙන කෙනෙක් බවත් මං තේරුම් ගත්තා. ඒ ගැන එයාගෙන් ඇහුවාම තමයි මට අර පුවානිස්ගෙ දුවගේ විස්තරේ කිව්වේ."

"නෙල්සන්. එදා උඹ කියපු දේවල් වැරදි නෑ. ඒ ඔක්කොම හරි. අදයි උඹට වැරදිලා තියෙන්නේ. ඇයි එදා හිතපු විදිහට අද හිතන්න බැරි?"

"මට ඒක කරන්න බෑ බං. මං එයා ගැන නොහිතා ඉන්න කොයි තරම් උත්සාහ කළාද? එච්චර මහන්සි වෙලා එයා අමතක වුණා කියලා හිතාගෙන වෙන වැඩක් පටන් ගන්න කොට හීන්න ආයිම සැරයක් එයාගේ රූපය මගේ මනසේ ඇඳෙනවා. මට එයාව අමතක කරන්න බෑ හැරී. මං මොකද කරන්නෙ? මගේ හිත හැදෙන්න මොනවා හරි කියපං."

මට නෙල්සන් ගැන ලොකු කනගාටුවක් ඇති වුණා. පොඩි කාලේ ඉඳං හැම දෙයක්ම අතට පයට ලැබුණ නෙල්සන්, ගුරුවරුන්ගේ ආදර ගෞරවය දිනාගෙන අති දක්ෂ විදියට ඉගෙන ගත්තු නෙල්සන්, පුංචි කාලේ ඉඳලම වෛද්‍යවරයෙක් වෙන්න සිහින මවමින්, ඒ සිහිනය සැබෑ කර ගත්තු නෙල්සන්, පාසලට, ගමට, පවුලට කීර්තියක් අරං දුන්න නෙල්සන්, සමාජයේ ඉහළම තැනකට යන්න හැම පහසුකමක්ම, හැම හැකියාවක්ම තියෙන නෙල්සන්, අද කාත් කවුරුවත් නැති අසරණයෙක් වගේ මගේ නිවහනට වැටිලා මගෙන් උදව් ඉල්ලනවා.

"නෙල්සන්. හදවතට වහල් වෙලා වැඩ කරන්න එපා. බුද්ධිය හරි විදිහට මෙහෙයවලා ප්‍රශ්නවලට උත්තර හොයපං. උඹ ඩොක්ටර් කෙනෙක්. ඉතින් උඹේ අනාගත සහකාරියත් උගත්, යමක් කමක් ඇති කෙනෙක් වුනොත් තමයි ගැලපීමක් ඇති වෙන්නේ. මං ඔයාට මෙහෙම පැහැදිලි කිරීමක් කරන්නම්. මිනිහෙක්ගේ ජීවිතේ ඉතාම වැදගත් අවස්ථා දෙකක් තියෙනවා. පළමු වැදගත් අවස්ථාව තමයි මවකගේ කුසයෙන් මවකගේ ආදරය, සෙනෙහස, ලබාගෙන උපදින එක. ඊළඟ වැදගත් අවස්ථාව තමයි විවාහය. මේ අවස්ථා දෙකම හරිම වැදගත්. ජීවිතේ තුනෙන් දෙකක්ම ගෙවෙන්නේ විවාහයෙන් පස්සේ නිසා ඒක හරිම වැදගත් අවස්ථාවක්. මේ අවස්ථා දෙකෙන් පළමුවැන්න අපට පාලනය කරන්න බෑ. ඒත් දෙවෙනි එක අපට පාලනය කරන්න

පුළුවන්. ඒ තීරණය තියෙන්නේ අපේ අතේ. වැරදි තීරණයක් ගත්තොත් අපි විනාසයි. දැන් බලපං. උඹට නොකිව්වට පහුගිය අවුරුදු දෙකක් විතර මාත් ඔය දුක වින්දා. මාත් දුප්පත් කෙල්ලකට ආදරේ කළා. ඒත් මං දැනගෙන හිටියා මගේ අප්පච්චී කවදාවත් ඒකට කැමති වෙන්නේ නෑ කියලා. ඒ කෙල්ලත් මට කැමැත්තෙන් හිටියා. ඒත් මං මගේ අදහස එයාට කිව්වේ නෑ. ඒ කෙල්ල දැන් බැඳලා. මං තාමත් ඒකිට ආදරෙයි. ඒ ආදරේ මං හදවතේ කොනක තෙරපගෙන, තදකරගෙන ඉන්නවා. මං දන්නවා. ඒ ආදරේ මගේ හිතේ තියෙන කල් මට වෙන කෙනෙකුට ආදරේ කරන්න බෑ. මට වෙන කෙනෙක්ව බඳින්න බෑ. ඒත් මං සන්තෝස වෙනවා වැරදි තීරණයක් අරගෙන පස්සෙදි පසුතැවිලි වෙනවට වැඩිය මේ විදිහට හරි තීරණයක් අරගෙන ඉන්න එක හොඳයි කියලා. එතකොට ඒ දුක විඳින්නේ එක්කෙනයි. මං විතරයි. වැරදි තීරණයක් ගත්තොත් කී දෙනෙක් දුකට පත් වෙයිද? උඹ අප්පච්චී ගැන දන්නවනේ. ඇරත් උඹ මට වඩා ඥානවන්තයි. දැඩි අධිෂ්ඨාන ශක්තියක් තියෙන උඹට ඒක ලේසියෙන්ම කරන්න පුළුවන්."

"නෙල්සන් පුටුවෙන් නැගිටලා ඇවිත් මාව බදා ගත්තා."

"උඹ හරි. උඹ හරි. ඒක තමයි මං කරන්න ඕනේ. ඇත්තටම මේ වගේ සුළු සිද්ධිවලින් අපි කලබල වෙන්න හොඳ නෑ. ලස්සන විතරක් බලලා අනාගතය ගැන තීරණයක් ගන්න එක මෝඩ කමක්. උඹට බොහොම ස්තූතියි හැරී."

ඊට පස්සේ නෙල්සන් යථා තත්වයට පත් වුණා. පරණ පුරුදු විදිහට අපි රටේ ලෝකේ දේවල් ගැනයි, පාසැල් මිතුරන් ගැනයි කතා කර කර හිටියා. නෙල්සන් ගෙදර ගියේ පැයක් විතර එහෙම ඉඳලා. ඒ යනකොට එයා අර පරණ, අපි හොඳින් දැකලා පුරුදු නෙල්සන්. මට ලොකු සතුටක් ඇති වුණා.

ඊට පහුවෙනිදත්, කලින්දා ආ වෙලාවට වගේම ආයිත් නෙල්සන් මගේ නිවහනට කඩාගෙන වැදුනා. කලින්දා වගේම ඇඳ පුටුවට වැටුනේ "හැරී..ශ්" කියාගෙන.

"හැරී.. උඹ ඊයේ කියපු කතාව හරි නෑ" එයා කිව්වා.

"මොකක්ද මං කියපු වැරදි කතාව?"

"උඹ කිව්වා අපේ ජීවිතේ වැදගත් අවස්ථා දෙකක් තියෙනවා. එකක් නං අපට පාලනය කරන්න බෑ. ඒත් දෙවෙනි එක අපට පාලනය කරන්න පුළුවන් කියලා."

"ඉතිං මොකක්ද ඒකේ තියෙන වරද?"

SL-Unlimited

"අපේ උත්පත්තිය සිද්ධ වෙන්නේ අපි කලින් ආත්ම භවයෙදී මරණ මංචකයෙදී පහළිංවෙන චිත්තනය උඩ. හොඳ සිතුවිල්ලකින් මරණයට පත් වුනාම හොඳ තැනක උපදිනවා. අපේ හාමුදුරුවො දවසක් කරපු ධර්ම දේශනාවක් මට මතක් වුනා. හාමුදුරුවො කිව්වේ එහෙම තමයි."

"හරි ඉතිං ඒක එහෙම උනයි කියමුකො. ඒ වුනාට අපි දෙවෙනි වැදගත් අවස්ථාව වන විවාගය මෝඩ විදියට කරගන්න නරකයි. ඒක හොඳින් කල්පනා කරලා කරන්න ඕනේ."

"නෑ හැරී. මං හිතන්නේ ඒකත් අපි පෙර ආත්මයක පතාගෙන ආපු හැටියට වෙන දෙයක්. මං එංගලන්තේ ඉගෙන ගන්න කොට මාත් එක්ක යාළු වෙන්න හදපු කෙල්ලො කීප දෙනෙක්ම හිටියා. ඒත් ඒ කාටවත් මගේ හිත ගියේ නෑ. සමහර කෙල්ලෝ ඉටි රූප වගේ ලස්සනයි. ඉතිං එහෙමනම් ඒ කාටවත් හිත නොගිහින් මේ කෙල්ලට මගේ හිත ගියේ ඇයි? මං ඒ ගැන රෑගේ රෑ හුඟක් කල්පනා කළා. මං හිතන්නේ මේ කෙල්ල මං ආත්ම ගාණක් තිස්සේ අපුරු කරගෙන ආපු කෙල්ලක් කියලා. මං පතාගෙන ආපු කෙල්ලක් කියලා. ඒක නිසා තමයි මට එයාව අමතක කරන්න බැරි."

"බුරුවෝ. උඹට ඔළුවක් නැද්ද? ඕකටම වහ වැටිලා ඉන්නේ, උඹ ආලයෙන් අන්ධ වෙලා නිසා. දැන්වත් හොඳ සිහියෙන් පොඩ්ඩක් හිතලා බලපන්" මං කිව්වේ හොඳටම කේන්තියෙන්.

"නෙල්සන් මගේ දිහා බැලුවේ හරිම අහිංසක විදියට. මට එයා ගැන දුකකුත් ඇති වුනා."

"නෙල්සන් එහෙනම් මං මේ අහන ප්‍රශ්නෙට උත්තර දීපන්. උඹ අද ලොකු මිනිහෙක් වෙච ඇත්ත. ඒත් තාමත් උඹට ආදරේ කරන අම්මා කෙනෙක්, අප්පා කෙනෙක් ඉන්නවා. දරුවෙකුට වැඩියම ආදරේ කරන්නෙ කවුද? රටේ ලෝකේ ඉන්න ගෑනු මිනිස්සුද? එහෙම නැත්නම් තමුන්ගේ දෙමව්පියොද? අනෙක් නැදෑ හිතවත්තුද?"

"අම්මා තාත්තා තරම් දරුවෙකුට ආදරේ කෙනෙක් තවත් මේ ලෝකේ නෑ හැරී" නෙල්සන් එක එල්ලේම උත්තර දුන්නා.

"ඔව් නෙල්සන්. අනික් හැම කෙනෙක්ම අනෙකෙක්ට ආදරේ කරන්නෙ ආත්මාර්ථකාමීත්වය නිසා. එයාගෙන් යමක් බලාපොරොත්තුවෙන්. ඒත් දෙමව්පියො එහෙම නෑ. දරුවෙක් අසනීපයෙන් ඉන්නකොට, රෑ නිදිමරාගෙන හැම කැපකිරීමක්ම කරන්න මැලි නොවන්නේ දෙමව්පියො තමයි. මුළු ලෝකයම තමුන්ට එරෙහි වෙලා ආවත්, තමුන් පිහට වෙලා, "මගේ පුතා අහිංසකයි, මගේ පුතා නිර්දෝෂයි" කියලා කියන්නෙ දෙමව්පියෝ විතරයි. දරුවෙක් මොන වරදක් කළත්, ඒක

හිතින්ම ඒකට සමාව දෙන්නෙ දෙමව්පියො විතරයි. ඉතින් එහෙම දෙමව්පියන්ගේ හිතට වේදනාවක් ඇති වෙන බව දැන දැනත් ඔය වගේ දෙයක් කරන්න එපා නෙල්සන්. පොඩ්ඩක් හිතලා බලන්න. කොයි වෙලාවෙද ඔයාගේ දෙමව්පියො ඔයාට වරදක් කරලා තියෙන්නෙ? ඒ ගොල්ල ඔයා වෙනුවෙන් කොයි තරම් කැප කිරීම් කරලා තියෙනවද? දේපලවලට ඔය තරම් කැදර ඔයාගේ අප්පච්චී, ඔයා රට යවලා උගන්වන්න, ඉඩ කඩම් කීපයක්ම විකුනුවානේ. ඉතිං ටිකක් ඒ අය ගැනත් හිතලා බලන්න නෙල්සන්."

"නෙල්සන්ගේ මූහුණ ආයෙමත් ආලෝකමත් වුණා. අර කනගාටුදායක, මුසල පෙනුම එයාගෙන් ඈත් වුණා. එයා ආයෙමත් සැරයක් මාව බදා ගත්තා."

"උඹ හරි හැරි. උඹට බොහොම ස්තූතියි. උඹ වගේ යාළුවෙක් මට ලැබුණේ පෙර කරපු පිනකට වෙන්න ඕනේ" එයා කිව්වා. ඊට පස්සේ සන්තෝසෙන් හිනාවෙලා, පොඩි අඩියකුත් ගහලා නෙල්සන් පිටවෙලා ගියා."

"ඊට පහුවෙනිදත් ඒ වෙලාවට නෙල්සන් ආපහු එවි කියලා මගේ හිත මට කිව්වා. ඒත් එහෙම වුණේ නැහැ. මං ඒ ගැන සන්තෝස වුණා. නෙල්සන් හොඳටොම හරි හිත හදාගත්ත ඇතිය කියලා මං හිතුවා."

"ඒත් ඉන් දවස් දෙකකට විතර පස්සේ මගේ ඒ හිතුවිල්ල වැරදි බව මට ඒත්තු ගියා. එදාත් එයා මගේ නවාතැනට ආවා. ඒ වුණාට වෙනදා වගේ කනස්සලු ස්වභාවයක් ඒ මූහුණේ තිබුණේ නැහැ."

"ඔයා කියපු හැම දෙයක් ගැනම මං හොඳට හිතුවා හැරී. මට පහුගිය දවස් දෙකේම හරියට නින්දකුත් නෑ. ඊයේ රෑ මං තීරණයක් ගත්තා. ඊට පස්සේ මට හොඳට නින්ද ගියා."

"මොකක්ද උඹ ගත්තු තීරණය?"

"මං තීරණය කළා මේ කෙල්ල හමුවෙලා කෙලින් කතා කරන්න. මං එයාගෙන් අහනවා "මං ඔයාට කැමතියි, ඔයත් මට කැමතිද?" කියලා."

"එතකොට උඹෙ දෙමව්පියෝ? අර මං කියපුවා? ඒවා නිකංම නිකං පුහු දේවල් කියලද උඹ හිතන්නේ?"

"හැරී කියපු ඔක්කොම ඇත්ත. ඒ වුණාට ප්‍රේමය කියන එක ඒ ඔක්කොටම වඩා බලවත්. ඒක තේරුම් ගන්න හරි අමාරුයි. උඹ කිව්වත් දරුවෙක් මොන වරදක් කළත්, දෙමව්පියෝ ඒකට සමාව

SL-Unlimited

දෙනවා කියලා."

"ස්..ම්.. ඒකත් එහෙමයි නේද? ඉතින් ඒක උඹේ වාසියට පෙරළගන්නද හදන්නේ?"

"නෑ. මං ඒක මගේ වාසියට ගන්නේ නෑ. ඒත් මං හිතනවා මගේ අම්මයි අප්පච්චියි මට දවසක ඒකට සමාව දේවි කියලා. මට එයා නැතිව ජීවත් වෙන්න බෑ හැරී. එයාගෙන් තොර අනාගතයක් ගැන මට හිතන්න බැරි තරමට මං එයාට හොඳටෙම ඇබ්බැහි වෙලා."

"හොඳයි. ඒ වුණාට ඒ කෙල්ල උඹට කැමතිද නැද්ද කියලා උඹ දන්නේ නැහැනේ."

"එයා මට අකමැති නම් මට හිත හදා ගන්න පුළුවන්. එතකොට මට එයාව අමතක කරනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් නැහැනේ."

"ඉතිං ඔය සිද්ධිය වෙලා මාස දෙක තුනක්ම ගියා. අපි කීප දවසක්ම ටෙලිෆෝන් එකෙන් කතා බහ කළා. හැබැයි අර ප්‍රේම සම්බන්ධය ගැන එයා මොකුත් කිව්වේ නෑ. ඉතිං මං හිතුවා ඒ කෙල්ල තෙල්සන්ට අකමැති වෙන්න ඇති කියලා."

"හදිසියෙන්ම වාගේ දවසක් මට තෙල්සන් කතා කළා."

"හැරී ලබන බ්‍රහස්පතින්දාට මං වෙනුවෙන් නිවාඩුවක් ගන්න පුළුවන්ද?"

"හා.. මං ඒක කරන්නම්. ඇයි මොකුත් ප්‍රශ්නයක්ද?"

"ඒවායින් නම් අඩුවක් නෑ. මට කියන්න ගොඩක් දේවලුත් තියෙනවා. එහෙනම් අපි බ්‍රහස්පතින්දාට හමුවෙමු. මං උඹේ නවාතැනට එනවා."

"එහෙම කියලා එයා කතාව නැවැත්තුවා. එයා කතා කරපු වැරැරුම් ස්වරූපයෙන් මං තේරුම් ගත්තා එයාට මට කියන්න සැඟෙන්න දේවල් ඇති බව. මං ඉතින් බ්‍රහස්පතින්දා දවස නිවාඩු ගත්තා."

"මං එයා එනතුරු එදා උදේ සූදානමින් හිටියේ. කිව්වා වගේම වෙලාවට එයාගේ කාරෙක ගේට්ටුවෙන් ඇතුළු වෙනවා මං දැක්කා. ඊක්කුං තමයි වාහනේ පදවාගෙන ආවේ. ඒත් වෙනදා ඉස්සරහ සීට් එකේ ඉඳගෙන, මාව දැක්ක ගමන් අත වනන තෙල්සන් මං දැක්කේ නෑ. ඒත් පස්ස සීට් එකක හිටිය කෙනෙක් මට අත වනන කොට තමයි මං දැක්කේ තෙල්සන් අද ඇවිත් තියෙන්නේ පස්සේ සීට් එකේ කියලා. එයා ජනේලේ හොඳට ඇරියට පස්සේ තමයි මං දැක්කේ

www.sinhalalibrary.com
SL-Unlimited

එයාව ආරූඪ වෙලා හිටපු ලස්සන ගෑණු ළමයා. මගේ පපුව හෝස් ගාලා පත්තු වුණා. මං එයාට දීපු අවවාද කිසි එකක් වැඩ කරලා නෑ. හැම දේම වෙන්නේ කර්මය අනුව කියලා මං හිත හදා ගත්තා. හැබැයි එයාගේ දෙමව්පියන්ට එහෙම ලේසියෙන් හිත හදා ගන්න බැරි බව මං දන්නවා."

"වෙන කවුරුවත් ගෙදර නෑ නේද?" කාරෙකෙන් බහින ගමන් නෙල්සන් ඇහුවා.

"මායි සිරිසේනයි විතරයි ඉන්නේ."

"බහින්න" එයා කාරෙකේ හිටපු ගෑණු ළමයට කිව්වා.

"මේ අර කියපු ගෑණු ළමයද?"

"ඔව්. මේ එයා තමයි. මට බනින්න එපා හැරී. එයා නැතිව මට ඉන්න බෑ" නෙල්සන් මගේ කනට කරලා කිව්වා.

"එයා මටූ ගෑණු ළමයව අඬුන්නලා දුන්නා. මං ඒ දෙන්නත් එක්ක ගේ ඇතුළට ගියා. ඒ ළමයත් බොහොම චකිතයකින් වගේ තමයි හිටියේ."

"මං එයාව බඳින්න තීරණය කළා හැරී. උඹ එන්න ඕනේ මා එක්ක කොළඹ කච්චේරියට යන්න. උඹ මගේ විවාහයට සාක්ෂිකාරයෙක් වෙන්න ඕනේ."

"මොනවා කරන්නද කියලා මට හිතා ගන්න බැරි වුණා. පුතාට මං ඇත්තම කියන්නම්. එදා නෙල්සන් ගත්තු ඒ තීරණය හරිය කියලා මං හිතුවේ නෑ. ඒත් මට ඒ වෙලාවේ අකමැත්තෙන් හරි සාක්ෂිකාරයෙක් වෙන්න වුණා. මගේ ඇඟ හිතල වුණා."

"ඇයි හැරී? ඒක උඹට කරන්න බැරිද?"

"නෙල්සන්. මං අපේ මිත්‍රකම වෙනුවෙන් ඒක කරනවා. උඹ හොඳට හිතලා බලලනේ මේ තීරණය ගන්න ඇත්තේ. මං උඹේ සතුට නැති කරන්නේ නෑ."

"දැන් ඔය වැඩේට සාක්ෂිකාරයො දෙන්නෙක් ඕනේ නේද?" කියලා මං ඇහුවේ තවත් කාව හරි එක්කරගෙන යන්න සූදානමින්."

"ඔව් දෙන්නෙක් ඕනේ. උක්කුං තමයි අනික් එක්කෙනා."

"දැන් බැඳලා ඉවරවෙලා මොනවද කරන්නේ?"

"මං යන ගමන් කියන්නම්. මට උඹට කියන්න ගොඩාක් දේවල් තියෙනවා."

"මං ලැහැස්ති වෙලා එයාලත් එක්ක කොළඹ ආවා. නෙල්සනුත්, ඒ ගෑණු ළමයාවත් කොළඹට එනතුරු කතා කළේ නෑ. දෙන්නම

www.sinhalaelibrary.com
SL-Unlimited

හිටියේ ලොකු පඹගාලක පැටලිලා ඉන්න විදිහට."

"විවාහය ලියාපදිංචි කළාට පස්සේ අපි දවල් කෑමට පළමු පෙළේ හෝටලයකට ගියා. ටික්කුංටත් අපි එක්ක එකට ඉඳගෙන කෑම කන්න නෙල්සන් කතා කළා. ඒත් එයා ආවේ නෑ. ඒ කෑම කන අතරතුර නෙල්සන් මට කිව්වා එයාගේ අනාගත සැලසුම්."

"මෙහෙම තීරණයක් ගන්න වෙච්ච එක ගැන මං හරියට කනගාටු වෙනවා. ඒත් මේක ඇරෙන්න ගන්න පුළුවන් වෙන කිසිම තීරණයක් නෑ. කාලයත් එක්ක අපේ පවුල්වල ඇතිවුණ ඒ තුවාල වේලිලා යාවි. එදාට මං කවුරු එක්කත් සමාදානෙන් ඉන්න බලනවා. එතෙක් මං හිතා ගත්තා රට දාලා යන්න."

"එයා ඔරලෝසුව දිහා බැලුවා."

"අපිට කෑම කාලා ටික වෙලාවක් ඉන්න පුළුවන්. ෆ්ලයිට් එක තියෙන්නේ පහයි කාලට විතර. කටුනායක යන්නත් පැයක් විතර යාවිනේ."

"ඒ කියන්නේ නෙල්සන් අදම රට දාලා යනවද?"

"ඔව් හැරී. සාලිය කුමාරයා අශෝකමාලාව විවාහ කර ගත්තාම එයාට නැති වුණේ රජකම විතරයි. ඒත් අපට හිටිය රටත් අහිමි වෙනවා. අපි එංගලන්තෙට යනවා. මං ඔක්කොම ලෑස්ති කරලයි තියෙන්නේ. අන්තිම මොහොත වෙනකල් ඒ ගැන නොකියා හිටියාට අමනාප වෙන්න එපා. මං ගිහින් වෙච්ච දේවල් ඔක්කොම ඔයාට ලියලා එවන්නම්."

"ඊට පස්සේ අපි ඔක්කොම පින්තූර ගන්න ස්ටූඩියෝ එකකට ගියා. එතැන වැඩිය ප්‍රමාද නොවී, පින්තූර කීපයක්ම අරගෙන අපි කටුනායක බලා පිටත් වුණා."

"සමුගන්න වෙලාවත් ළං වුණා. ටික්කුං නෙල්සන් ළඟ දණ ගහන්න හදන කොට නෙල්සන් එයාව බදා ගත්තා."

"මං කවදාවත් ටික්කුං මගේ සේවකයෙක් කියලා හිතුවේ නෑ. පුංචි කාලේ ඉඳලම මගේ සෙවනැල්ල වගේ, මගේ සහෝදරයෙක් වගේ, මගේ පස්සෙන්ම හිටියා. මට ඒ කිසි දෙයක් අමතක නෑ."

"ටික්කුංගේ ඇස් වල කඳුලු පිරිලා. එයා මොනවා හරි කියන්න උත්සාහ ගත්තා. ඒත් කටින් පිට වුණේ හාමු මහත්තයා.. හාමු මහත්තයා.. කියන එක විතරයි."

"මට හාමු කියන්න එපා ටික්කුං. අපි දෙන්නගේ තියෙන්නේ බොහොම සුළු වෙනසයි."

SL Unlimited

"එහෙම කියන්න එපා හාමු" උක්කුංගේ කටට පණ ටිකක් ඇවිත්.

"මහත්තයා බොහොම වැදගත් පවුලක, උගත් දොස්තර මහත්තයෙක්."

"උක්කුං. මුළු ගමම දන්න රහසක් තියෙනවනේ. ඒක උක්කුං දන්නවා. මාත් දන්නවා. අපි දෙන්නගෙ තියෙන්නේ බොහොම සුළු වෙනසයි. අපි දෙන්නගේ අම්මලා වෙනස්. එච්චරයි."

"එහෙම කියලා නෙල්සන් මා ගාවට ආවා."

"හැරී. උඹ වගේ මිත්‍රයෙක් මට හිටිය එක ගැන මං හරි සන්තෝස වෙනවා. අපි ආයෙමත් දවසක හමුවෙමු. එතෙක් ආයුබෝවන්!" මාත් එයාට සුභ පැතුවා.

"ගෑනු ළමයත් මට වඳින්න ඇදුවා. මං එයාට අතට අත දීලා සුභ පතලා, දැන් ඉතිං මේ විදියට ආචාර කරන්න පුරුදු වෙන්න කියලා විහිළුවකුත් කළා."

"එයා උක්කුංගෙන් සමු ගනිද්දී ඉකි බිඳින්න වුණා."

"නංගී. අපේ දොස්තර හාමු මහත්තයව හොඳින් බලාගන්න. මේ මහත්තයා රත්තරන් කඳක්. සූරියබණ්ඩාර පරපුරට පායපු රිදී තාරුකාව."

"උක්කුං අයියේ. මං මගේ මහත්තයාව ජීවිතේ පූජාකරලා හරි රැක ගන්නවා. මට මහත්තයව ඉර හඳ වාගේ විශ්වාසයි. අයියා කරපු උදව්වත් මං අමතක කරන්නේ නෑ."

"ඊට පස්සේ ඒ දෙන්නා ළං වෙලා, අත්වලින් අල්ලගෙන නොපෙනී යනතුරුම අපි බලාගෙන හිටියා."

"එතකොට ඒ ගෑනු ළමයා තමයි මගේ අම්මා?"

"ඔව් පැට්රික්. ඒ තමයි විශාකා. ඔයාගේ අම්මා."

"අම්මා අප්පච්චිට හරිම ආදරෙන් හිටියේ. කවදාවත් අප්පච්චිගේ හිත රිදෙන දෙයක් කළෙත් නෑ. කිව්වෙත් නෑ. අප්පච්චිත් එහෙම තමයි."

"ඔව්. මං ඒක දන්නවා."

"අංකල්. ඉතිං දැන් ඔය සිද්ධි වෙලා අවුරුදු විසිපහක්, තිහක් විතර වුණානේ. මං හිතන්නේ නෑ තාමත් ඒ සීයලා, මාමලා, නැන්දලා අප්පච්චිත් එක්ක තරහෙන් ඉඳීවි කියලා. ඒ සිද්ධිය එතැනින් ඉවර වුණානේ?"

www.sinhalaelibrary.com
SL-Unlimited

"ඔව් පැට්‍රික්. ඒ සිද්ධිය එතනින් ඉවරවුණා තමයි. ඒ කතාවත් එතනින් ඉවර වුණා. ඒත් ඊට පස්සේ තව කතාවක් පටන් ගන්නවා. ඒක හරිම බිහිසුණු කතාවක්. බොහොම අභිරහස් කතාවක්."

●●●

"ඊට සති තුන හතරකට විතර පස්සේ මට නෙල්සන්ගෙන් දිග ලියුමක් ලැබුණා. ඒකේ තිබුණ විස්තර මට මතක හැටියට කෙටියෙන් ඔයාට කියන්නම්. එතකොට ඔයාට නෙල්සන් ලංකාවේ ගත කළ අවසන් දින කීහිපය ගැන වැටහීමක් ලැබේවිනේ."

"ඒ දවස්වල විශාකා මැහුම් ඉගෙන ගන්න නුවර පන්තියකට යනවා. නෙල්සන් එතෙන්ට ගිහිං එයාව හම්බවෙලා තියෙනවා. එයා විශාකාට අත වනලා කතා කළාම විශාකා එයා ළඟට ආවා."

"ඇයි හාමු?" කියලා එයා අහිංසක විදිහට ඇහුවා.

"මට ඔයාට කියන්න යමක් තියෙනවා. මා එක්ක පොඩ්ඩකට එන්න පුළුවන්ද?"

"විශාකා බය වුනා. ඒත් නෙල්සන්ට තියෙන ගෞරවය නිසා එයා ආවා. එදා නුවර වැව වටේ ඇවිදින ගමන් නෙල්සන් එයාගේ ආදරේ විශාකාට ප්‍රකාශ කරලා තියෙනවා."

"අනේ පුංචි හාමු. වලව්වේ හාමුදුරුවෝ මේ වගක් දැන ගත්තොත් එහෙම අපට විතරක් නොවෙයි හාමුටත් හොඳක් වෙන්න දෙන එකක් නෑ. අපි කාටත් දඬුවම් කරාවි. අපේ අප්පච්චිලටත් දඬුවම් කරාවි."

"ඔයා නැතිව මට ජීවත් වෙන්න බෑ විශාකා. මං මගේ පණටත් වඩා ඔයාට ආදරෙයි. මං මේක හොඳට හිතලා ගත්ත තීරණයක්. ඔයත් ගෙදර ගිහිං හිතන්න. මට අද වචනයක් කියන්න එපා. මං ලබන සතියෙත් මේ වෙලාවටම පන්තිය ගාවට එන්නම්. එදාට ඔයාගේ තීරණය මට කියන්න."

"විශාකාටත් එයාගේ ආදරේ ප්‍රතික්ෂේප කරන්න බැරි තත්වයක් තිබිලා තියෙන්නේ. එයා ඒ වචනේ දුන්න දවසේ නෙල්සන් ඉඳලා තියෙන්නේ රටක් රාජ්‍යයක් දිනා ගත්ත රජෙක් වාගේ. කොහොම හරි මේ දෙන්නා සැරින් සැරේට නුවර වැව ගාවදී, මාලිගාව ළඟදී හමුවෙන එක වලව්වට ආරංචි වෙලා තියෙනවා. ඒක දැන ගත්තාම හෙක්ටර්ට හොඳටම තරහා ගිහිං."

"පුතා. අපි පුතා ගැන ලොකු බලාපොරොත්තු ඇතුවයි ඉන්නේ. රත්දෙණිහල සිංහයාගෙන් පැවතෙන අපේ පරම්පරාවේ නමට කැළලක් වෙන වැඩක් පුතා නොකරාවි කියලා අපි හිතනවා" මුල් දවසේ

SL-Unlimited

අප්පච්චි කියලා තියෙන්නෙ එච්චරයි.

"පුතා මේ ගමේ ..... කෙල්ලෙක් එක්ක සම්බන්ධකමක් තියෙනවා කියලා කතාවක් තියෙනවා. ඒක ඇත්තද?" අම්මා ඊට පස්සේ දවසක ඇහුවලු.

"ඔව් ඒක ඇත්ත" තාත්තට උත්තර දෙනවට වඩා අම්මට උත්තර දෙන එක නෙල්සන්ට ලේසියි. ඒ නිසා ඕන දේකට මූණ දෙන්න බලාගෙන නෙල්සන් ඇත්තම කිව්වා.

"පුතා අප්පච්චිගේ හැටි දන්නවනේ. ඔය වගේ වැඩක් කරනවා කියා හිතන්නවත් එපා. පුතාගේ නංගියි මල්ලියි ගැන හිතලා වැඩ කරන්න. පුතා ඔය වගේ දේවල් කරන කොට අපි කොහොමද රෙදි ඇඳගෙන පාරට බහින්නේ?"

"ඒ අවවාද වලින් ඵලක් නොවුන බව ටික දවසක් යනකොට එයාලට තේරෙන්න ඇති."

"පාරට බහින්න විදිහක් නෑ ඒක එකාලයේ කතන්දර නිසා" නෙල්සන්ට මොකුත් නොකියා, ඒත් එයාටත් ඇහෙන්න එක්ක හෙන්වර් මැණිකෙට කිව්වා. නෙල්සන් ඒ කියපු දේ නෑහුණා වගේ හිටියලු.

"පුතාට දොඹෙතැන්න වලව්වෙන් කටයුත්තක් මං ලෑස්ති කරලයි තියෙන්නේ. හරි වැදගත් මිනිස්සු. අපේ පවුලට හැම අතින්ම ගැලපෙනවා. පවුලේ එකම දුරුවා. ඉටි රූපයක් වගේ හැඩයි. අනිද්දට අපි එහේ එනවා කියලා මං කිව්වා. එදාට පුතා නිවාඩුවක් අරගෙන අපිත් එක්ක යන්න එන්න ඕනේ."

"අප්පච්චී මිනිස්සුන්ට නිකං කරදර කරන්න එපා. මං විවාහය ගැන තීරණයක් අරගෙන ඉවරයි."

"පුතා. රට හිනස්සන වැඩ කරන්න එපා. පුවානිසාගේ කෙල්ල බඳින්නද උඹ හිතාගෙන ඉන්නේ?"

"ඔව්"

"ඈයි පරයෝ? තෝව මං මගේ ඉඩකඩං විකුණලා, රට යවලා ඉගැන්නුවේ ඔය වගේ නින්දිත වැඩක් කරන්නද? තොට මළවත් නැද්ද?"

"අප්පච්චිගේ ඇස් දෙක ලොවි ගෙඩි දෙකක් වගේ රතු වෙලා. එයා ඒ තරං තරහෙන් ඉන්නවා නෙල්සන් කිසිම දවසක දැකලා නෑ. තව දුරටත් අප්පච්චිව තරහ කරවන්න හිතුන නැති නිසා නෙල්සන් නිස්සද්දව හිටියා."

"ඔය වගේ ආදර කැක්කුම් තරුණ හිත් වල ඇති වෙනවා,

www.sinhalalibrary.com
SL Unlimited

හොඳ බැඳපු මිනිස්සුන් ඔය වෙන ගෑණු පස්සේ යන්නේ. ඒ වුණාට ටිකී ඔය අදහස හිතෙන් අයින් කරගන්න ඕනේ."

"අප්පච්චී ඒ තරම් ඉක්මනට තරහව යටපත් කර ගත්තේ කොහොමද කියලා නෙල්සන්ට හිතා ගන්න බෑ. තදට හිටියොත් නෙල්සනුත් ඒ වගේම තදට හිටීවි කියලා අප්පච්චී හිතුවද දන්නේ නෑ."

"අම්මා ආයාචනා කරපු නිසාත්, අප්පච්චීව තවත් කේන්ති කරවන්න නොහිතපු නිසාත් නෙල්සන් දයඹිතැන්න වලව්වට ගියා. ඒ වුණාට හිත ගිය තැන මාලිගාවතේ පුතා. නෙල්සන්ට ඒ ළමයා සුදුද කළුද කියලාවත් මතක නැලු."

"ඊට පසුවෙනිදා අම්මා ඇහුවලු ඒ ළමයා ගැන මොකද කියන්නේ කියලා. නෙල්සන් ඒකට අකමැති බව කිව්වලු. එතකොට අම්මා ඇහුවලු ඒ ළමයාගේ තියෙන අඩුපාඩු මොනවද කියලා."

"ඒ ළමයාගේ තියෙන අඩුපාඩු වලින් මට වැඩක් නෑ අම්මේ. මං විශාකාව බඳින්න තීරණය කරලයි ඉන්නේ. මට තවත් කරදර කරන්න එපා."

"නෙල්සන් ඒක කියපුවාම අම්මා අඬන්න වුණාලු."

"පුතේ. ඒ වැඩේ නම් කරන්න එපා. ඊට හොඳයි මාව මරලා දානවානං. පුතා අප්පච්චීගේ හැටි දන්නේ නැද්ද? අප්පච්චීව මිනී මරුවෙක් කරන්නද පුතා හදන්නේ? පුතා එහෙම දෙයක් කළොත් අප්පච්චී ඔය පවුල්වල එකෙක් ඉතුරු කරන එකක් නෑ."

"ආදරය අන්ධයි කියලා මං අහලා තියෙනවා හැරී. මට දැන් ටික ටික ඒ මුල් දවස්වල නොතේරුණ දේවල් තේරෙන්න පටන් අරගෙන තියෙනවා. ඒත් දැන් මට ඉස්සරහට තියපු අඩිය පස්සට ගන්න බෑ. වෙන ඕනම දේකට මූණ දෙන්න මං හිතුවා."

"අම්මා තාත්තා විතරක් නොවෙයි, නංගීත් මට ඇනුම් පද කියන්න පටන් අරගෙන."

"නංගීගේ කාමරේට කිළිටු ඇඳුම් අරගන්න ගිය රත්සිනාහාමිට නංගී බැන්නා. ඒත් ඒක වැදුනේ මටයි."

"රත්සිනා. ඕවා ඔහොම තියන්න. ඕවා දැන් පිට කාටවත් අරං ගිහිං හෝදන්න දෙන්න ඕනේ නෑ. ළඟදීම කෙනෙක් මෙහාට එනවලු. අපට එයාට දීලා ඕවා හෝදවන්න පුළුවන්."

"තව පුරටත් මේක දුරදිග යන එක නවත්වන්න තියෙන්නේ එකම එක විදිහයි. මං ගත්තේ ඒ තීරණය තමයි හැරී. විශාකාව

ඒකට කැමති වුණා. මං ඉතුරු කර ගත්ත සෑහෙන මුදලක් මට තිබුණා. මං වැඩි දුර ඉගෙන ගන්න කියලා එංගලන්තයේ විශ්ව විද්‍යාලයකට ලිව්වා. හිතුවටත් වඩා ඉක්මනට මට ඒකට අවස්ථාව ලැබුණා. ඒ පාර තමයි මං හදිසියෙන්ම වගේ විශාකාත් එක්ක විවාහ වෙලා මෙහාට ආවේ. මං ලංකාවේ හිටියානම් මට කොහොම වෙනත් විශාකාට නම් අප්පච්චිගෙන් ගැලවීමක් නොවෙන බව මං දන්නවා. ඒ නිසා තමයි මේ වගේ තීරණයක් ගන්න මට සිද්ද වුණේ."

"ඕන්න ඔය වගේ දේවල් තමයි ඒ ලියුමේ තිබුණේ. ඒත් ඒ ලියුම මට ලැබෙන කොට මෙහේ ලොකු කලබගෑනියක් වෙලා. ඒක පටන් ගත්තේ නෙල්සන්ලා මෙහෙන් පිටත් වුණු දවසෙමයි."

"නෙල්සන් විශාකා එක්ක රට ගිය බව කියන්න පැවරිලා තිබුණේ ටික්කුංටයි. ඒත් ටික්කුංට ඒක කියන්න දිව නැමෙන්නේ නෑ කියලා, පුළුවන් නම් මට ඒ බව කියන්න කිව්වා. වැඩේ කොහොම හරි කෙරෙන්න ඕන නිසා මං ඒක බාර ගත්තා."

"මං එයාලාගේ ගෙදරට ෆෝන් කළා. අම්මා තමයි උත්තර දෙන්න ආවේ. එයාලාගේ සැප දුක විමසලා මං එයාට කිව්වා නෙල්සන් මට දැනට මිනිත්තු පහකට විතර කලින් කටුනායක ගුවන් තොටුපලේ ඉඳලා කෝල් එකක් දුන්නා. ගෙදර අයට හොරෙන් ඒ වගේ යන්න යෑම ගැන එයා කනගාටු වෙන බවත්, ඒත් මේ රටේදී විශාකා එක්ක විවාහ වෙන්න බැරි නිසා වෙන කරන්න දෙයක් නැති බවත් එයා කී බව මම කිව්වා. ඒ ගැන දෙමාපියන්ගෙන් සමාව අයැද සිටින බවත් එයා කිව්වා. ඒත් මට ඒ ටික ඉවර වෙන කල් කියන්න වුණේ නෑ. එයාගේ අම්මා අඬා වැටෙන්න පටන් ගත්තා."

"අයියෝ.. දෙයියනේ.. මේ මොන විපැත්තියක්ද වුණේ? ඇයි පුතේ උඹ අපේ මූණේ දැලි ගෑවේ.. දැන් ඉතිං අපි ඉඳලා මොකටද?... " ඔය වගේ එයා විලාප දෙන කොට මට ඒක අහගෙන ඉන්න බැරි වුණා. මම රිසීවරය තිබ්බා. ඒත් මගේ හිත තිබුණේ රන්දෙණිගල වලව්ව ගැනයි. දැන් මොන ජංජාලයක් වෙයිද කියලා මං හිතන්න වුණා."

"ඒදාම හවස තරහෙන් වියරු වුණ හෙක්ටර්, තුවක්කුවත් අරගෙන පුවාහිස්ගෙ ගෙදරට යන්න හදනකොට මැණිකෙයි, වලව්වේ සේවකයොයි බොහොම අමාරුවෙන් එයාව නතර කරගෙන තියෙනවා; තරහා වැඩි කමට හෙක්ටර් ගෙදර බඩු පොළොවේ ගහමින් කෝපය තුනී කරගන්න උත්සාහ කරලා තියෙනවා."

"ඒදාම රෑ කවුදෝ පිරිසක් ගිහින් පුවාහිස්ගේ ගෙට ගිනි තියලා. පුවාහිස් කියන්නේ මහ ලොකු සල්ලි කාරයෙක් නොවෙයි

ගෙයි. ගිනි ඇවිලිලා විනාශ වෙලා යන්න තරම් බඩුවක් මුට්ටුවක් මිනිහට තිබුණේ නෑ. මිනිහට සම්පතකට යමක් තිබුණා නම් ඒ දරු සම්පතම තමයි. මිනිහා දරුවන් හත් දෙනෙක්ගේ තාත්තා කෙනෙක්. එයාගේ බිරිඳ අටවෙනි දරුවා බිහි කරන වෙලාවේ ඒ දරුවත් එක්කම පරලොව ගිහිං තියෙනවා. එදා ඉඳලා ඒ දරු පවුල රැක ගන්න පුවානිස් නොවිඳපු දුකක් නෑ. ලොකු පුතා සුරනිමල යාන්තම් අවුරුදු පහළොවක් වෙන කොට මාතර පැත්තේ කඩේක වැඩට ගිහිං තියෙනවා. මිනිහා බොහෝම ධෛර්යය සම්පන්න පුද්ගලයෙක්. හම්බ කරපු හැම සතයක්ම ඉතුරු කරගෙන මිනිහා වැල්ලවාය පැත්තේ කඩයක් දමාගෙන තියෙනවා. ඒ පැත්තෙන්ම කටයුත්තක් කරගත්තු සුරනිමල තමයි ඒ පවුලට තිබුණ ලොකුම හයිය. කඩේ ටික ටික දියුණු වෙන කොට ගමේ කොලු රැනට එකතුවෙලා හොම්බ යන්න ගිය එයාගෙ මල්ලි නන්දනවත් කඩේ වැඩට උදව්වට අරගෙන ගියා. මේ කලබල වෙන කොට ඒ දෙන්නා හිටියේ වැල්ලවායේ. බාල පුතාලා තුන් දෙනා පුවානිස් එක්ක පන්සලට ගිහින්. විශාකා නෙල්සන් එක්ක ගිහිං. ගෙදර හිටියෙ අවුරුදු විස්සක විතර වයස තුන්වෙනි පුතා මාතුපාල. එයා කොයි වෙලාවෙත් හිටියේ ගෙදර. මන්ද බුද්ධික, අංග විකල දරුවෙක්. දරුවා කොයි වගේ වුණත් කොයි අම්මටත් අප්පටත්, දරුවෙක් තරම් වටින වස්තුවක් නෑනේ. ඒ දරුවටත්, අනෙක් දරුවන්ට වගේම පුවානිස් ආදරෙන් හිටියේ."

"පන්සලේ ඉන්න පුවානිස්ට ආරංචි වුණා තමුන්ගේ ගෙට ගිනි තියලා කියලා. එයාට එක පාරටම මතක් වුණේ අර අබ්බගාත දරුවාව."

"අනේ මගේ රත්තරන් පුතේ.. " කියාගෙන එයා ගේ දිහාවට දුවනවා. පුතාලා තුන් දෙනාත්, තවත් ඒ වෙලාවේ පන්සලේ හිටපු පිරිසකුත් එයා පස්සෙන් දුවනවා. ගේ වටේට ගමේ මිනිසුන් කීප දෙනෙක් රැස් වෙලා "අනේ අපොයි" කියලා නිකටවල අත් ගහගෙන බලාගෙන ඉන්නවා.

"මගේ රත්තරන් පුතේ" කියලා දුවගෙන ආපු පුවානිස් කවුරුවත් නොහිතපු විදිහට අර ගිනි ඇවිලෙමින් තියෙන ගේ ඇතුළට පැන්නා. මිනිස්සු "එපා එපා පුවානිස්" කියලා කෑ ගැහුවා. ළමයි "අනේ එපා එපා අප්පච්චී" කියලා කෑ ගැහුවා. ඒත් ඒ කිසිම දෙයක් පුවානිස්ට ඇහෙන්නෙ නැතුව ඇති.

මඳ වෙලාවකට කතාව නැවැත් වූ හැරී දිග සුසුමක් හෙළුවේය.

"පුවානිස්ට ආපහු එන්න ලැබුණේ නෑ. ගින්දර අඩු වෙගෙන එනකොට ගමේ මිනිස්සු ගිනි නිවලා ඇතුළට ගිහිං තියෙනවා.

SL Unlimited

පුතාවත් බදාගෙන හිටි පුවානිස්ගෙත්, ඒ දරුවගෙත් පිලිස්සුන සිරුරු තමයි එයාලට දැක ගන්න ලැබුණේ."

"පොලිසියෙන් ඇවිත් ඒ ගැන පරීක්ෂණයක් කළා. කොහොම ගිනි ඇවිලුනාද කියලා හොයා ගන්න බෑ. වලව්වට තියෙන බයට ගමේ කිසි කෙනෙක් සාක්ෂි දෙන්න ඉදිරිපත් වෙන්නේ නෑ. ආරංචිය ලැබිලා සුරනිමල නන්දනත් එක්ක ගමට ආවා. සුරනිමල, තාත්තට හරි ආදරෙන් හිටියා. පුංචි මල්ලිලා තුන්දෙනාත් බදාගෙන එයා අඬනවා. එයාට වෙන කරන්න දෙයක් තිබුනේ නැතුව ඇති."

"අයියා එහෙම වේදනාව තුනී කරගන්න හදන අතර, මල්ලි නන්දන, වේදනාව නිවෙන්න කියලා මොනවදෝ බීලා ඇවිත් "මං තොපෙන් පළිගන්නවා වලව්වේ හාමු. මං තොපෙන් පළිගන්නවා. මං එහෙම කළේ නැත්නම් මට ඉපු ඉපු කියලා කතා කරපල්ලා" කියලා බෙරිහන් දෙනවා. වලව්ව ඉස්සරහටත් ගිහින් එහෙම බෙරිහන් දෙන්න වුණා. ගමේ මිනිස්සුන්ට මිනිහව ඇදගෙන එන්න පුළුවන් කමක් තිබුනෙත් නෑ. වලව්වේ හාමු තුවක්කුවත් අරගෙන එනවා එයා දැක්කා. නන්දන එයාගේ බැනියම ගලොලා පපුව ඉස්සරහට දාලා "තියපන් යකෝ මගේ පපුවට" කියලා කිව්වලු. ඊත් වලව්වේ සේවකයෝ ඇවිත් හාමුව වලව්වට ඇදගෙන ගියාලු."

"යකෝ තෝ අපේ නිවහනට ගිනි තියලා අපේ අප්පච්චිවයි මල්ලිවයි පුච්චලා මරලා දාලා අපිව ගමෙන් පන්නන්න වෙන්න ඇති හදන්නේ. තොට දවසක ඒකට වන්දි ගෙවන්න වේවි. මං තොපිව වලව්වෙන් පන්නලා දානවා. තොපේ වලව්වේ දවසක මං රජවෙනවා" කියලා වහසි බස් දොඩන නන්දනව එතනින් ගොලවන්න පුළුවන් වුනේ සුරනිමලට තමයි. මොන තරම් චණ්ඩියා වුණත් මිනිහා අයියට බයයි. ඇත්තම කියනවා නම් ඒ බය නොවෙයි. ගෞරවය. ඒ පවුලේ කවුරුත් සුරනිමලටයි එයාගේ බිරිඳ රම්නාවත් ගරු කළා. මල්ලිවත් නිහඬ කරලා සුරනිමල පොලිසියට ගියා."

"පොලිසියෙන් ඇහුවලු සැක කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවද කියලා."

"වලව්වේ හාමු. ඔය වගේ බලු වැඩක් කරන්න පුළුවන් ගමේ ඉන්න එකම එකා තමයි වලව්වේ හාමු" සුරනිමල කිව්වා.

"හොඳයි ඔප්පු කරන්න සාක්ෂි තියෙනවද?" පැමිණිල්ල ලියා ගත්තු රාළහාමි ඇහුවලු.

"ඇයි හාලෝ. ඔප්පු කරන්න සාක්ෂි තියෙනවා නම් මං තමුසෙන්ට එනවැයැ. ඒක එතනින්ම ඉවර කරලා දාලා යනවනේ. තමුසෙලා මොකටද මෙතන ඉන්නේ. ඒවා හොයලා බලලා සාධාරණය ඉෂ්ට

SL-Unlimited

කරන්න නොවෙයිද?" මිනිහා මහ සද්දෙන් කතා කරලා තියෙනවා. කවුරුත් කියන්නේ සුරනිමල බොහොම නිවිච්ච පැත්තපත් පුද්ගලයෙක් කියලා. හැබැයි එදා මිනිහා පොලිසියෙන් ගිහින් තියෙන්නේ තරහෙන් වෙව්ලමින්."

"පොලිසිය තියෙන්නේ රටක, ගමක නීතිය, සාමය ආරක්ෂා කරන්න යුක්තිය ඉෂ්ට කරලා දෙන්න. පොලිසියෙන් ඒ වැඩේ කෙරෙන්නේ නැත්නම් අපට නීතිය අතට ගන්න වෙනවා" කියලා තමයි එයා අන්තිමට කියලා තියෙන්නේ.

"පොලිසිය ඒ ගැන පරීක්ෂණ පැවැත්තුවා. ඒත් කිසිම කෙනෙක් සාක්ෂි දෙන්න ඉදිරිපත් නොවුන නිසා ඒක නොවිසඳුන අපරාධ ගොන්නට එකතු වුණා."

"මේ සිද්ධි වෙන කොට ලියුරියෙල් කලා උපාධිය කරන්න පේරාදෙණි විශ්ව විද්‍යාලයට තේරිලයි හිටියේ. විල්සන් අප්පච්චිගේ සිහිනය සැබෑ කරන්න නීති විද්‍යාලයේ ඉගෙන ගන්නවා."

"ඔය සිද්ධිවලින් පස්සේ පීමාවතී ලෙඩ වුණා. හෙක්ටර්ගෙන් අර කලින් තිබුණ ජොප්ප් ගතිය නැතිව හෝන්දු මාන්දු විදිහට තමයි කල් ගත කළේ. මැණිකෙව සනීප කරන්න දන්න දන්න හැම ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් ගාවටම ගියා. බලිතොවිල් කළා. ඒත් හිත ලෙඩ වුණාම ඒක සනීප කරන්න පුළුවන් ජීවකයෙක් හොයා ගන්න අමාරුනේ."

"ඊළඟ අවුරුද්දේ මහ ඡන්දය තිබ්බා. ඒකෙන් හෙක්ටර් උදව් කළ පක්ෂය අන්ත විදිහට පරාද වුණා. ඒ නිසා වලව්වේ පිරිහීම තවත් ශීඝ්‍ර වුණා."

"හෙක්ටර් බලහත්කාරයෙන් අයිති කරගත්තු ඉඩකඩම්වලට අයිතිය ඉල්ලලා මිනිස්සු නඩු මගට බහින්න වුණා. ඒ අයට එහෙම කරන්න යොමු කළේ, ඒ වෙන කොට ලක්ෂෙට කෝඩි දමාගෙන හිටපු සුරනිමල මුදලාලි තමයි. එයාගේ ධන බලයට දැන් දේශපාලන බලයත් එකතු වෙලා. අවුරුදු දෙකකින් ලොකු පෙරළියක් වෙලා. වලව්ව පැත්තට හිටිය චන්ඩි ටික දැන් සුරනිමලගේ පැත්තේ. ඇත්තම කියනවා නම් ඒ චන්ඩි ටික හිටියේ වලව්ව පැත්තේ නොවෙයි. සල්ලි තිබුණ, බලය තිබුණ පැත්තෙයි."

"ඔහොම කාලයක් ගියා. 1971 අවුරුද්දේ අප්‍රේල් මාසේ ආණ්ඩුවට විරුද්ධව, ලංකාවේ වාමාංශික පෙරමුණක් කැරැල්ලක් ගැහුවා. ඒ කාලේ රටේ තැන තැන පොඩි පොඩි කලබල තිබුණා. විශ්ව විද්‍යාලත් වැහුවා. ලියුරියෙල් ගෙදර ආවා. ඒත් කොළඹ හිටිය විල්සන්ට ගෙදර එන්න බැරි වුනේ මේ සිද්ධි ඉතා ඉක්මනට ඇති වුණ නිසාත්, අල්ලර්

SL-Unlimited

නීතිය නිසාත් තමයි."

"රන්දෙණිගල වලව්වට හොරු පැනලා පුංචි මැණිකෙව පැහැරගෙන ගිහිල්ලා කියන ආරංචිය ලැබුණු ගමන්ම මං ඒ ගැන විභාග කරන්න ගියා. මහ රෑ ආපු මැරවරයින් කිහිප දෙනෙක් දොරත් කඩාගෙන වලව්වට ඇතුළුවෙලා තියෙනවා. එතකොට ගෙදර ඉඳලා තියෙන්නේ වලව්වේ පවුලේ තුන්දෙනයි. ගෙදර වැඩට හිටපු ගැහැනු කෙනෙකුයි විතරයි. මුහුණු ආවරණය කරගෙන, කළුපාට ඇඳුම් ඇඳගෙන ආපු මිනිස්සු "හෝ ජේද්ද මහ ලොකු වලව්වෙ හාමු, දුප්පතුන්ව සූරගෙන කන වලව්වේ හාමු" කියලා හෙක්ටර්ව අල්ලගෙන පහරදීලා තියෙනවා. එයාව බේරගන්න මැදට පැනපු අසනීපෙන් හිටිය මැණිකෙටත් පාරවල් කීපයක් වැදිලා තියෙනවා. මේ වෙනකොට මියුරියෙල්ට හොඳටම නින්ද ගිහිල්ලා තියෙන්න ඇති. ගෙදර කලබලේ ඇහිලා එයා අවදිවෙලා. මියුරියෙල්ට තේරෙන්න ඇති හොරු ගෙට පැනලා කියලා. එයා ඒ පැත්තට දුවගෙන ඇවිත් තියෙන්නේ අප්පච්චිගේ තුවක්කුවත් අරගෙන. ඒක අරගෙන ආවාට පාවිච්චි කරන හැටි එයා දන්නේ නෑ. මංකොල්ල කාරයෝ තුවක්කුව දැක්කාම බයවෙලා පැනලා යාවි කියලා එයා හිතන්න ඇති. ඒත් හැඩි දැඩි මිනිහෙක් ඒක උදුරගන්න හදනකොට එයා තුවක්කු කඳෙන් ඌට ගහලා තියෙනවා. එතකොට එතන හිටපු එකෙක් එයාව උස්සගත්තලු. "මිතුන් ඔක්කොම ගැටගහලා වරෙල්ලා. අපිට මේකි හොඳයි" කියලා කණ්ඩායමේ නායකයා වගේ හිටපු කෙනෙක් කිව්වලු. ඉතින් ඒ හොරු හැමෝගෙම අත පය බැඳලා, කාමරේකට දාලා දොරවලුත් වහලා දාලා, මියුරියෙල්වත් අරං ගිහිං."

"ඊට පසුවෙනිදා වත්තේ වැඩට එන මිනිහෙක් ඇවිත් හෙක්ටර්ලව බේරගන්න කල් වෙච්ච කිසිම දෙයක් ගමේ අය දන්නේ නෑ."

"දුව පැහැරගෙන ගිහිං බව දැනගත්තාම හෙක්ටර් වේදනාව, ලජ්ජාව දරාගන්න බැරිව තුවක්කුවෙන් එයාටම වෙඩි තියාගෙන මැරිලා. ඒක දැකපු මැණිකෙත් වහබීලා මැරිලා."

"අපි ගෙදර යනකොට ඒක අමු අපායක්. වැඩකාර ගෑණියි, වත්තේ වැඩ කරපු මිනිහයි ඇරුණාම වෙන කිසිම කෙනෙක්, කිසිම දෙයක් කියන්න ඉදිරිපත් වුණේ නෑ. මේක නම් පුදුම රටක් පුතා. ඉතින් අපි කොහොමද මේ රටේ නීතියයි සාමයයි ආරක්ෂා කරන්නේ. කාටද මේ රටේ නීතියයි සාමයයි ආරක්ෂා කරන්න ඕනේ? මිනිස්සුන්ට ඒකේ අවශ්‍යතාවයක් නැද්ද?"

"අපි සුරනිමල ගැනයි, නන්දන ගැනයි සැක කළා. හේතුවකට තිබුණේ පරණ කෝන්තරේ මිසක් කවුරුවත් දීපු ඔත්තුවක් හෙම නොවෙයි. සුරනිමල එදා රෑ බිස්නස් වැඩකට කොළඹ ගිහින්. ඇල්බර්

SL-Unlimited

නීතිය නිසා ගමට එන්න විදිහක් නැතිව, කොළඹ හෝටලයක නතරවෙලා තියෙනවා. ඒ නැවතිලා හිටපු හෝටලයේ බිලකුත් එයා ඉදිරිපත් කළා."

"නන්දන යාළුවො සට්ටියක් එක්ක ඊට දින කීපයකට කලින් වන්දනාවේ ඇවිත් තියෙනවා. ඔය සිද්ධිය වුණ දා රෑ පොලිසියෙන් විශේෂ බලපත්‍රයකුත් අරගෙන නුවරින් පිටත්වෙලා තියෙනවා. ඒ ගොල්ල එදා රෑ කතරගම හෝටලයක නැවතිලා හිටිය බව ඔප්පු කරන්න බිල්පත් හා සාක්ෂි ඉදිරිපත් කළා. ඒත් රන්දෙණිගලදී ඔය වගේ වැඩක් කරලා කතරගමට යන්න පුළුවන් කම තියෙන නිසා අපි පුළුවන් තරම් මිනිහා ගැන හෙවිල්ලෙන් හිටියා. ඒත් හරි ඔත්තුවක් හොයා ගන්න බැරි වුණ නිසා ඒ පරීක්ෂණයත් එතනින් නතර කරන්න අපට සිද්ධ වුණා."

"අප්පච්චිගෙයි, අම්මගෙයි අවමඟුලට සහභාගිවෙන්න නෙල්සන් ආවෙ තනියමයි. එයා විල්සන් එක්ක කතා කරන්න උත්සාහ කළත්, විල්සන් වුවමනාවෙන්ම එයාව මග ඇරියා. අඩු තරමෙන් නෙල්සන් දිහා බැලුවෙවත් නෑ. "මේ ඔක්කොම වුණේ උඹ නිසානේ" කියන හැඟීම විල්සන්ගේ හිතේ තියෙන්න ඇති."

"විල්සන් හිටියේ බොහෝම මලානික වෙලා, මොනවා කරනවාද කියලවත් හිතා ගන්න බැරි තත්වයකයි. එහෙම හිටියත් අයියගෙන් උදව්වක්, උපකාරයක්වත් ගන්න එයා හිතුවෙ නෑ. මැණිකෙගෙ සහෝදරයාගේ පුතා, ශ්‍රී ලාල් තමයි අවමඟුල් කටයුතු වලදී මුල් තැන අරගෙන කටයුතු කළේ. ශ්‍රී ලාල්ගේ දෙමව්පියො දෙන්නා හදිසි අනතුරකින් මැරුණාම ඒ අවමඟුලට හෙක්ටර් සහභාගි නොවුනත් ඒ වෙලාවේ ශ්‍රී ලාල් ඒ දෙන්නා වෙනුවෙන් කෙරෙන්න ඕන හැම කටයුත්තක්ම හොඳින් කළා."

"ආරංචිය ලැබිලා ටික්කුං ගමට ඇවිල්ලා හිටියා. නෙල්සන්ව දැක්කාම ටික්කුං එයාව බදාගෙන අඬන්න වුණා. පස්සේ සුරනිමල හමුවෙන්න ටික්කුං එක්ක නෙල්සන් ගිහින් තියෙනවා. නෙල්සන්ව දැක්කාම සුරනිමල "එන්න එන්න හාමු" කියලා කතා කළත්, රම්‍යා, ඒ කියන්නේ සුරනිමලගේ බිරිඳ "අ.. " කියලා කෙල පාරක් ගහලා තමයි එයාව පිළිගෙන තියෙන්නේ."

"හාමු මහත්තයා මොකද මේ අපේ ගෙවල් පැත්තේ?"

"මං ආපු කාරණාව සුරනිමල දන්නවනේ. සුරනිමල හොඳ මනුස්සයෙක් කියලා මං අහලා තියෙනවා. ඒ නිසාමයි මං මේ ගමන ආවේ. මට මගේ නංගිව හොයා ගන්න උදව් කරන්න."

"ඇයි පොලිසි තියෙන්නේ ඕකටනේ. තමුසේ හිතුවද මේක පොලිසියක්

කියලා" ගේ ඇතුලේ ඉඳන් රමනා කෑ ගැහුවා.

"රමනා. ඔයා කලබල නොවී ඉන්න" කියලා පූරනිමල සන්සුන්ව කිව්වා.

"හාමු මහත්තයා. ඔයාගේ නංගිව හොයන්න මං කොහොමද උදව් කරන්නේ? මං එයාව පැහැරගෙන ගියේ නෑනේ. මගේ නංගිව පැහැරගෙන ගිය වෙලාවේ මං ඔය හාමු වගේ නංගිව හොය හොයා එක එක්කෙනාගේ ගෙවල් ගානේ රස්තියාදු වුණෙත් නෑ. පොලීසියට කිව්වෙත් නෑ. වෙච්ච පාඩුව අපටමයි කියලා ඉවසගෙන හිටියා. හාමු මහත්තයා කලබල නොවී ගෙදර යන්න. එහෙම නැත්නම් හාමු මහත්තයා අඳුනන පොලිසියේ ලොකු මහත්තුරු ඉන්නවනේ. ඒ අයට කියලා නංගි ගැන හොයලා බලන්න."

"අනේ මුදලාලි. ඒ දැරිවි හරි අහිංසකයි. මුදලාලිට හිතුනොත් පුළුවන් වෙයි ඒ දැරිවිව හොයා ගන්න උදව් කරන්න" උක්කුං පින්සෙන්දු වුණා.

"වලව්වේ කවු කාපු බත් බැලයා. උක්කුං කෝ උඹෙ එදා තිබුණ ගෙම්බර?" රමනා කෑ ගැහුවා.

"වලව්වේ හාමු, අපේ තාත්තව පුච්චලා මරපු දවසෙත් අපි ගිහිං කිව්වේ පොලිසියට. අපට වෙන කියන්න කෙනෙක් හිටියේ නෑ. ඒ ගොල්ල පුළුවන් හැටියකට ඒ පරීක්ෂණ කටයුතු කළා. හාමුත් ගිහිං ඒ පොලිසියටම කියන්න. ඒ ගොල්ල පුළුවන් හැටියට කටයුතු කරාවි" කියලා පූරනිමල දොර වැහුවා.

"මාත් පුළුවන් තරම් උත්සාහ කළා මියුරියෙල් ගැන තොරතුරක් හොයා ගන්න. එක පැත්තකින් ඒක මගේ රාජකාරියේ කොටසක්. අනෙක් පැත්තෙන් එයා මගේ හොඳම මිත්‍රයාගේ සහෝදරිය."

"නන්දනත් එක්ක සම්බන්ධකම් පවත්තපු මැර කල්ලියක් ගැන අපට ආරංචියක් ලැබුණා. ඒ අනුව අපි පොඩි සෝදිසියක් කළා. ඒත් අපට හරි ආරංචියක් ඒකෙන් ලබාගන්න බැරිවුණා. ඒක හැබැයි අපේ පොලිසියේ අදක්ෂකමම නොවෙයි. අපට ඉහළින් ආපු දේශපාලන බලපෑම් ඒකට හේතු වුණා. ඒ එක්කම මහජන සහයෝගය නොලැබීමත් තව හේතුවක්."

"ඒ සිද්ධියෙන් පස්සේ නෙල්සන්ගේ ලංකාවත් එක්ක තිබුණ සම්බන්ධකම් ඔක්කොම ඈත වුණා. එයා යනකොට කියලා ගියේ "හැරී. මං ආයේ නම් ලංකාවට අඩිය තියන්නේ නෑ" කියලා. ඒ එක්කම පූරනිමලත්, ඊට වැඩියෙන් රමනාත් එයාට කතා කරපු විදිහ ගැන කලකිරීමකට වඩා කෝපයකුත් එයාගේ තිබුණා."

"ඉන් පස්සේ රත්දෙණිගල වලව්ව පාලුවට ගියා. විල්සන් කොළඹ කාමරයක නැවතිලා අධ්‍යාපන කටයුතු කරගෙන යන්න වුණා. මම එයාට ආර්ථික අතින් උදව් කරන්න ඉදිරිපත් වුණත් එයා ඒක ප්‍රතික්ෂේප කළා. එයාට අප්පච්චිගේ සමහර ගතිගුණ තිබුණා. කාටවත් යටවෙන්න කැමති නෑ. හැබැයි එයාගේ මූණ දිහා බලපුවාම අර සිද්ධී නිසා එයා කොයිතරම් කම්පාවට පත්වෙලා ඉන්නවද කියන එක තේරුම් ගන්න පුළුවන්. එයාගේ මූණේ කිසිම වෙලාවක හිනාවක් මතුවෙනවා මං දැකලා නෑ. ඇත්තට ම වෙච්ච දේවල හැටියට කොහොම හිනාවෙන්නද?"

"ඔහොම කාලයක් ගියා. 1977 මහ මැතිවරණය පවත්වන්න ඔන්න මෙන්න කියා තිබියදී රම්‍යාව ගහක එල්ලලා මරලා දාලා තියෙනවා. එයා පක්ෂයේ තරුණ සමිතියක් පිහිටුවන්න ගිය වෙලාවක ඒක වෙලා තියෙන්නේ. සුරනිමල ඒ ගැන සැකය යොමු කළේ විරුද්ධ පක්ෂයේ ආධාර කාරයින් පිරිසක් වෙත තමයි. පොලිසිය ඒ අයව අත්අඩංගුවට අරගෙන පරීක්ෂණ පැවැත්වුවත් ඒ අය නිදොස් බව ඔප්පු වුණායින් නිදහස් කරලා යැව්වා."

සැකකාර පුද්ගලයා අවුරුදු 27-28 වගේ පෙනුම තියෙන අඩි පහමාරකට වඩා ටිකක් උස, පැහැපත් වර්ණයෙන් යුත් කඩවසම් පුද්ගලයෙක් කියන එක තමයි පොලිසියට ලැබුණ ඔත්තුවලින් තීරණය වුණේ. ඉතින් එහෙම පුද්ගලයින් කොච්චර ඉන්න පුළුවන්ද?"

"ආ.. මට තව එකක් කියන්න අමතක වුණා. රම්‍යාගේ කරේ "රත්දෙණිගල ව්‍යාඝ්‍රයා" කියලා ලියපු බෝඩ් එකක් එල්ලලා තිබුණා. එයාව දරුණු විදිහට වධ දුන් බවට සලකුණු තිබුණා. ඇඟෙන් ගලාගෙන ගිය ලේ වලින් බෝඩ් එක තැවිලා තිබුණත්, ඒ අකුරු කියවන්න පුළුවන්කම තිබුණා."

"ඊට අවුරුදු දෙකකට විතර පස්සේ සුරනිමලගේ සහෝදරයෙක්ව එයාගේ මඟුල් දවසේ මධුසමය ගත කරපු හෝටලයේ එල්ලා මරලා තිබුණා. එයාගේ කරෙත් අර බෝඩ් එක එල්ලලා තිබුණා. හැබැයි රම්‍යාගේ සිරුරේ තිබුණා වගේ වද දීපු ලකුණු කිසිවක් එයාගේ ඇඟේ තිබුණේ නෑ."

"ඒ මරණය ගැන සැකපිට ඒ ගෑණු ළමයව බලන්න හිටියා කියපු තරුණයෙක් අත්අඩංගුවට ගත්තා. ඒත් ඔහුට විරුද්ධව සාක්ෂි නොතිබුණ නිසා ඔහු නිදහස් කරලා අරින්න පොලිසියට සිද්ද වුණා."

"ඒ ගැන පරීක්ෂා කරපු පොලිස් නිලධාරීන් නන්දනගෙන් අහලා තියෙනවා සැක කරන්න පුළුවන් පුද්ගලයෙක් ඉන්නවද කියලා."

"වැඩේ කරපු මිනිහා අපි දන්නවා. ඔගොල්ල මහත්මී වෙන්න

එපා. අපි මිනිහා ගැන බලාගන්නම් කියලා නන්දන කිව්වාලු. වෙනත් කිසිම ඔත්තුවක් නොලැබුණායින්, ඒ පරීක්ෂණයත් එතනින් අවසාන වුණා."

"ඉන් පස්සේ විශේෂ සිදුවීමකින් තොරව කාලයක් ගත වෙලා ගියා. දැන් සුරනිමල ධනවත් වෙළඳ ව්‍යාපාරිකයෙක්. නන්දන එයාගේ සහායකයා. ආරක්ෂකයා. එයාලට අයිති පෙහෙකම්හල් කීපයක්ම තිබුණා. සුරනිමලට වඩා නන්දනගේ ක්‍රියාපටිපාටියම තමයි එයාගේ දියුණුවට හේතු වුනේ. මිනිහා පිළි මාරු කරන්න දක්ෂයා. ආණ්ඩුවක් පෙරළෙන්න යනවානම් මිනිහට ඒක හොඳට ඉවෙන් දැනෙනවා. ඒ නිසා මිනිහා හැමදාම ඉන්නේ දිනන පැත්තේ. ඒ වගේම මිනිහට හිතවත් චණ්ඩි කීප දෙනෙකුත් හිටිය නිසා දේශපාලකයින් වෙනුවෙන් මැර බලය පාවිච්චි කරන්න මිනිහා පසුබට වුනේ නෑ. හැබැයි ඒවායින් වැඩි වාසි ලබාගත්තේ සුරනිමල තමයි."

"ඔය කාලේ දවසක් මට සුරනිමලව අහම්බෙන් වගේ හමු වුණා. මාව දැක්කාම පරණ හිතමිත්‍රයෙක් දැකපු කෙනෙක් වගේ සුරනිමල මා ගාවට ඇවිත් කතා කළා."

"කොහොමද සර් වාස දේශං"

"වරදක් නෑ. සුරනිමල මුදලාලිට දැන් බොහොම ජය පාටයි."

"ඔව් සර්. අපි මේක හරියට පාවිච්චි කරනවා" එයා මළවට ඇඟිල්ලකින් තට්ටු කරමින් කිව්වා.

"එතකොට අපි හැමදාම දිනනවා. ඒක නොවෙයි සර්. සර්ලට තාම ව්‍යාඝ්‍රයා අල්ලාගන්න බැරි වුණා නේද?"

"කොහේ අල්ලන්නද? හරි ඔත්තුවක් අපට ලැබුණේ නැනේ."

"සර්ලා ව්‍යාඝ්‍රයා හොයන්න මහන්සි වෙන්න එපා. සර්ලට ඌව කවදාවත් අල්ලගන්න ලැබෙන්නේ නෑ" කියලා මිනිහා මට පල් හිනාවකුත් දැම්මා.

"ඒ මොකද ඒ?"

"අපි එයාව පරලොව යවලා ඉවරයි සර්" කියලා මට සුභ පතලා සුරනිමල මගෙන් සමුගත්තා.

"සුරනිමලගේ එක මල්ලි කෙනෙක්, ඒ ගොල්ල මුලදී පටන් ගත්තු වැල්ලවායේ දාපු කඩේ කරගෙන යනවා. එයාගේ නම සනත්. දවසක් මං පත්තරේ දැක්කා එයාවත් කඩේ බාල්කයක එල්ලලා මරලා දාලා තියෙන බව. මේක වුනේ 87-88දී විතර. සුරනිමලටත්, පවුලේ ඉතුරු අනෙක් අයටත් ඒ නිසා නැවත වතාවක් බයෙන් ඉන්න

SL-Unlimited

ගේතුවක් ඇති වුණා. එයාගේ කරෙත් "රන්දෙණිගල විනාශකයා" කියන බෝඩ් එකක් එල්ලලා තිබුණා."

"සුරනිමලලා හිතාගෙන ඉඳලා තියෙනවා, ඒ ගොල්ල විනාශකයා අල්ලලා විනාශ කළා කියලා. නමුත් ඒ සිතුවිල්ල මේ මරණයත් එක්කම යට යන්න ඇති. ඒ බෝඩ් එකේ තිබුණ අකුරුයි, කඩේ සමහර තැනකින් ලබා ගත්තු ඇඟිලි සලකුණුත්, අර කලින් කළ මිනී මැරුම් වල ඒවාට සමාන වුණා. මේ මරණ ඇත්තටම සුරනිමලගේ පවුලේ ජීවිතයට තර්ජනයක් වුණා වගේම පොලීසියේ අපටත් ලොකු අභියෝගයක් වුණා."

"ඔය මරණය වුණ කිට්ටුව වෙලාවකදී ගිය මෝටර් සයිකලයක හඬක් ඇහුණ අයත් ඉඳලා තියෙනවා. ඇරත් ඒ කඩේ තිබිලා තියෙන්නේ ප්‍රධාන පාරක් ළඟ. ඉතින් ඒ වෙලාවේ ගිය ලොරි කිහිපයකුත් තිබිලා තියෙනවා. ඒ එක්කම ඒ වෙලාවේ ගමන් කළ ලොරියක රියදුරකු සාක්ෂි දෙන්න පොලීසියට ඇවිත් හිටියා."

"රෑ එකට විතර, අඩි පහමාරක් විතර උස පුද්ගලයෙක් ඔය කඩේ හරියෙදී මගේ ලොරියට අත පෑවා. මං ලොරිය නැවැත්තුවාම මට කිව්වා හම්බන්තොට යන අන්තිම බස් එක මිස් වුණා. ඉතිං කඩේ මුදලාලිත් එක්ක ටිකක් කතා කර කර හිටියා. මුදලාලිත් නිදා ගන්න ගියා කියලා එයා කිව්වා. ඔය වගේ රෑට ලොරි වලට අත පාලා යන අය අනන්තවත් ඉන්න නිසා ඒ ඩ්‍රයිවර් එයා ගැන කිසි සැකයක් ඇති කර ගෙන නෑ."

"ඒ මනුස්සයා ගැන ඊට වඩා තොරතුරක් හොයා ගන්න බැරි වුණා. ඉතිං ඒකත් අර කොච්චදුන අභිරහස් මිනීමැරුම් ගොඩටම එකතු වුණා. හැබැයි අපට අවශ්‍ය කරන අරමුදල් රජයෙන් ලබා දුන්නා නම්, ඒ වෙනුවෙන් තව කාලයක් වැය කරන්න ඉඩ දුන්නා නම් මේ හැම එකක්ම අපට විසඳගන්න තිබුණා."

"1989 වර්ෂයේ මේ රටේ භීෂණ සමයක් තිබුණා. ඒ කාලේ දවසක මට සුරනිමල හමුවුණා. එයා ටිකක් සැරෙකත් බයෙන් වගේ ඉන්න බව මට තේරුණා."

"සර් අපට මරණීය තර්ජන එල්ල වෙලා තියෙනවා. ඒත් අපි ඒවට බය නෑ" සුරනිමලගේ මල්ලි නන්දන කිව්වා.

"විනාශකයා ඉවරයි කියලා තිගොල්ල කිව්වා නේද? ඉතිං කවුද ඔයාලට තර්ජනය කරන්නේ?" කියලා අහන්න මට හිතුනා. ඒ වුණත් ඒකෙත් පොලීසියේ අපේ පැත්තෙන් බාල වෙන නිසා මං එහෙම ඇහුවේ නෑ.

SL-Unlimited

"ඒ පවුලේ හිටියා බාලයා තමයි නිමලසිරි. එයා නම් ඇඳුම් පිටරට යවන අයගේ වාර්ෂික සම්මන්ත්‍රණයට සහභාගි වෙන්න කොළඹ ආවා. සාමාන්‍යයෙන් සුරනිමල තමයි ඒකට සහභාගි වෙන්නේ. නිමලසිරි ඒකට සහභාගි වෙලා තියෙන්නේ සුරනිමලට පෞද්ගලික හේතුවක් මත එදා ඒකට සහභාගි වෙන්න බැරි වුණ නිසා. නමුත් නිමලසිරි එදා ගෙදර ගිහින් නෑ. සුරනිමලයි නන්දනයි කලබල වෙලා එයාව හොයලා තියෙනවා. හොරණ පැත්තේ වත්තක රබර් ගහක එයාව එල්ලලා මරලා. හොරණ පොලීසියෙන් පරීක්ෂණ කටයුතු කළත් ඒකත් කවුරු කළාද කියලා හොයා ගන්න බැරි වුණා. එයාගේ කැරත් "රන්දෙණිගල වනාඝ්‍රයා" කියන පුවරුව තිබිලා තියෙනවා."

"ඊට පස්සේ දැන් මේ සුරනිමලගේ මරණය සිද්ධ වෙලා" හැරී සිය කතාව අවසාන කළේ ය.

"අංකල්. මට නම් මේ සිදුවීම් වැල හිතා ගන්නත් අමාරුයි. මෙහෙම අපරාධ වැලක්, අවුරුදු විස්සක විතර කාලයක් තිස්සේ පොලිසියට අහුනොවී කරගෙන යන එක ලේසි පාසු වැඩක් නොවෙයි නේ."

"ඔව් පැට්‍රික්. ඒ නිසා තමයි මං හිතාගෙන ඉන්නේ මේ පරම පාපී පුද්ගලයෙක්ගේ වැඩක් කියලා. මේකට හවුල් කාරයෙක් හිටියනම් කොයි වෙලාවක හරි එයාගේ කටින් හරි ඕක එළියට එන්න ඉඩ තියෙනවා. ඇරත් අර බෝඩ් වල තිබුණ අකුරුවල සමානකම් ඒ මරණ සිදුවුණ තැන්වලින් ලබාගත්තු ඇඟිලි සලකුණු, මේ ඔක්කොමල සමානකම් තියෙනවනේ. ඉතිං මං හිතන්නේ මේක පාපී පුද්ගලයෙක්, බොහොම හොඳින් සැලසුම් කරලා, කාලය අරගෙන කරන දෙයක් කියලා."

"ඔව් එහෙම වෙන්නත් පුළුවන්. ඒ අතරම ඉතා දැඩි බැඳීමෙන් ඉන්න කිහිප දෙනෙකුත් එකතු වෙලා ඔය වගේ වැඩක් කරාවා වෙන්නත් පුළුවන්."

"දැන් පැට්‍රික් මොකද හිතන්නේ? ඔය වාතාවරණය යටතේ නෑදෑයින් හමුවෙන්න කැමතිද? ඒ නෑදෑයො ඔයාව කොයි විදිහට පිළිගනීවි කියලද ඔයා හිතන්නේ?"

"අංකල් මුලදී කියපු කතාව හරි. මට ඔය නෑදෑයින්ගෙන් වැඩක් නෑ."

"එහෙනම් පැට්‍රික් අපි කෑම කාලා ඉඳිමු. ඔයාට ඔයාගේ )ළ නිවාඩුවම මෙහේ ගතකරලා යන්න පුළුවන්. පුංචි වුණාට අපේ රට බලන්න ඕන තැන් අනන්තවත් තියෙනවා. මං ඔයාට ඒ ඇම

www.sinhalebooks.com
SL-Unlimited

තැනකටම වගේ යන්න අවස්ථාව හදලා දෙන්නම්."

●●●

රාත්‍රී ආහාරයෙන් පසුවද හැරී හා පැට්රික් මද වේලාවක් සුහද සාකච්ඡාවක යෙදී සිටියහ. ඔවුන්ගේ කතාබහට පසුබිම් වූයේ "රන්දෙණිගල වනාශ්‍රයා" හා සම්බන්ධ ඝාතනයන්ය. මේ වෙලාවේ දුරකතනය නාද විය. සිරිසේන ඊට පිළිතුරු දෙන්නට යනු ඔවුහු දුටුවහ.

"සර්ට ඇමතිතුමා කතා කරනවා" මද වේලාවකින් ඔවුන් වෙත පැමිණි සිරිසේන කීවේය.

"ඇමතිතුමා කතා කරනවා නම් මොකක් හරි ලොකු ප්‍රශ්නයක් තමයි" කියමින් හැරී ඊට පිළිතුරු දීමට ගියේ ය.

මිනිත්තු හතරකට පහකට පමණ පසු ඔහු නැවත පැමිණියේ ය. ඔහුගේ මුහුණේ වූයේ බැරෑරුම් බවකි. ඔහු නැවත පුටුවෙහි ඉඳගත් නමුත් පැට්රික් එහි සිටින බවක් වත් ඔහුට මතක තිබුණේ නැත. ඔහු බිත්තිය දෙස බලාගෙන කල්පනා සාගරයේ කිමිදෙමින් සිටින්නට විය.

"ඇයි අංකල්? ලොකු ප්‍රශ්නයක් ද?"

"ඇමතිතුමා සුරනිමලට වෙච්ච දේ ගැන හොඳටම කම්පා වෙලා. සුරනිමල, ඔය ඇමති තුමාගේ පක්ෂයේ කිහිප දෙනෙක්ටම බලයට එන්න වියදම් කරලා තියෙනවා. අවුරුදු විස්සකුත් ගිහින් තාම වනාශ්‍රයාව අල්ලා ගන්න බැරි වුණේ මොකද කියලා මගෙන් අහනවා. මං කිව්වා අපට අවශ්‍ය කරන අරමුදල් ලැබුණානම් මෙලහකටත් අපි වනාශ්‍රයා කොටු කරගෙන ඉවරයි කියලා. ඒ පාර ඇමතිතුමා කිව්වා ඕන කරන අරමුදල් ඇති තරම් දෙන්නම්, මට මාසයකින් වනාශ්‍රයාව අල්ලලා නීතිය ඉදිරිපිටට ගේන්න කියලා. අවශ්‍යනම් ස්කොට්ලන්ඩියාඩ් එකෙන් වුණත් උදව් ගන්නලු."

"ඉතිං අංකල් වැඩේ බාර ගත්තද?"

"මං වැඩේ බාර ගන්න බැම කිව්වා පැට්රික්. ඒත් ඇමතිතුමා කියනවා එයා පොලිස්පති එක්කත්, ඇමති මණ්ඩලයේ කිහිප දෙනෙක් එක්කත් මේ ගැන කතා කළාලු. ඒ ගොල්ලන්ගේ මතය නම් මේකට සුදුසුම පුද්ගලයා මම බවයි. මට ඉතිං වැඩේ බාර ගන්න වුණා."

ඔහු පැට්රික් දෙස එක එල්ලයේ මද වේලාවක් බලා සිටියේ ඔහුගේ දෙනෙත් කියවන්නාට මෙනි.

"පැට්රික්, ඔයාට බැරිද මේක විසඳගන්න මට පොඩි සපෝට් එකක් දෙන්න."

www.sinhalalibrary.com

SL-Unlimited

"අංකල්ට කිව්වාම මොකද, මේ කතාව දැනගත්ත වෙලේ ඉඳලම මගේ හිත වැඩ කරන්නේ කවුද මේ වනාඥයා කියන එක ගැන තමයි. මං අංකල්ට ඕන සපෝට් එකක් දෙන්නම්."

"එහෙනම් මේ පරීක්ෂණ කණ්ඩායමේ සම්බන්ධීකරන නිලධාරියා පැට්රික්. ඔයාට මේ වගේ දේවල් පිළිබඳව ස්කොට්ලන්ඩ්යාඩ් එකේදී ලබා ගත්තු අත්දැකීම් උපයෝගී කරගන්න පුළුවන් වේවි. මේ පරීක්ෂණයට ඔයාට ඕන කරන පිරිස මට කියන්න. මං ඒ ඔක්කොම ලබා දෙන්නම්."

"අංකල්ගේ සහාය මට දිගටම ඕන වෙනවා. අංකල් මේ පවුල්වල ටිදවිය ගැන දන්න දේවලුත් තියෙනවානේ."

"හොඳයි පැට්රික්. දැන් රෑත් වුණානේ. එහෙනම් මේ කේස් එක ගැන ඔයාට දැන් සාමාන්‍ය දැනුමකුත් තියෙන නිසා ගත යුතු පියවර ගැන ඔයා සැලැස්මක් හදන්න. හෙට අපි ඒ ගැන සාකච්ඡා කරලා ඕන තීරණ අරගමු. ඊට පස්සේ ක්‍රියාත්මක වෙමු."

•••

පසු දින හවස් වරුවේ හැරී ජයසුන්දර ඇමති වරයාට කතා කොට ඔහු හමුවීමට අවස්ථාවක් ලබා ගත්තේය. පැට්රික්ද සමග ඇමතිවරයා හමුවීමට ගිය හැරී, ඔහුට පැට්රික් හඳුන්වා දුන්නේය.

"මේ මගේ ඥාති පුත්‍රයෙක්. එස්. බී. පැට්රික්. පැට්රික් ස්කොට්ලන්ඩ්යාඩ් එකේ තමයි වැඩ කරන්නේ. නිවාඩුවකට ලංකාවට ආපු ගමන්. සිංහලත් හොඳින් දන්න නිසා මට හිතෙනවා අපේ කටයුතු වලට පැට්රික් හවුල් කර ගන්න."

ඊට ඇමතිවරයාගේද පූර්ණ අනුමැතිය ලැබුණි. අපරාධ විමර්ශන අංශයේ සම්පූර්ණ සහයෝගය ඔවුනට ලබා දෙන ලෙසට නියෝගයක් පසු දිනයෙහිම නිකුත් කරන බැව් කී ඇමති වරයා, ඒ සඳහා අවශ්‍යවන මුදල්ද ලබා දෙන බවට පොරොන්දු විය.

"පැට්රික්ගේ සහායට තව දෙතුන් දෙනෙක්වත් ඕනෑ වෙයි කියලා මං හිතනවා. ඒකට සුදුසු අය කවුද කියලා මට කියන්න. මං ඒ අයව මේ පරීක්ෂණයට අනුයුක්ත කරන්න නියෝගයක් යවන්නම්."

"ඇමතිතුමාලා මේ විදියට සහයෝගය දක්වනවා නම් අපට මාසයක් යන්න ඉස්සරවෙලා වනාඥයා කොටු කර ගන්න බැරි වෙන එකක් නෑ. ඒත් මට තව එකම එක ඉල්ලීමක් කරන්න තියෙනවා. අපේ පරීක්ෂණ කටයුතු වලට කිසිම විදියකට, කිසිම කෙනෙකුට බලපෑමක් ඇති කරන්න දෙන්න එපා."

"මම ඒ පොරොන්දුව දෙනවා. හැරී මේ පරීක්ෂණ කටයුතු

නිදහසේ කරගෙන යන්න. කවුරුහරි කෙනෙක් මේ කටයුතුවලට බාධා කරනවා නම් මට කියන්න. මං ඒ කිසි දේකට ඉඩ දෙන්නේ නෑ" ඇමති වරයා පොරොන්දු වුයේය.

## 3

පොලිස් දෙපාර්තමේන්තුවට අයත් නිළධාරී නිලනිවාසයක් බම්බලපිටියෙහි ඩික්මන් පාරෙහි විය. කාලයක් තිස්සේ වසා දමා තිබූ මෙම නිවස අපරාධ විමර්ශණ අංශය විසින් "රත්දෙණිගල ව්‍යාපෘතිය" කොටුකර ගැනීමේ කාර්යාලය ලෙස හැරී වෙත ලබා දෙන ලදී.

හැරීගෙන් ලබාගත් ආරංචිද, මාර්ග සිතියම්ද, ලංකාවේ නගර දැක්වෙන සිතියම්ද අධ්‍යයනය කළ පැට්‍රික් තම ව්‍යායාමය සඳහා සුදුසු ලෙස සකස් කළ සැලැස්මක් හැරී වෙත ඉදිරිපත් කළේ ය. ඊට හැරී ජයසුන්දරගේ අනුමැතිය ලැබුණි.

සැලසුම දියත් කිරීමට අඟහරුවාදා වන විට ඔවුනට හැකියාව ලැබුණි. එදින හැරීට මෙන්ම පැට්‍රික්ටද කාර්යය බහුල දිනයක් විය. ඒ උදෑසන ඔවුන්ගේ මෙහෙයුම සඳහා අවශ්‍ය වූ රහස් පොලිස් නිළධාරීන් දෙදෙනා කාර්යාලයට කැඳවා ඔවුනොවුන් අඳුන්වා දුන්නේය.

"දැන් මම එක එක්කෙනාට අයිති කාර්යයන් මොනවද කියලා පැහැදිලි කරලා දෙන්නම්. පැට්‍රික් තමයි මේ හැම එකක්ම සම්බන්ධීකරණය කරන්නේ. ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි, මේ පරීක්ෂණ කටයුතු සඳහා අපට සහාය වීමට ස්කොට්ලන්ඩ්යාඩ් රහස් ඔත්තු සේවයෙන් පැමිණි කෙනෙක් තමයි පැට්‍රික්. එයා එංගලන්තයේ ඉපදුන සිංහලයෙක්. හොඳට සිංහල කතා කරන්න පුළුවන්. ඉදිරි වැඩකටයුතු විස්තර කරන්න මං පැට්‍රික්ටම බාර දෙනවා."

"බොහොම ස්තූතියි. ඉස්සෙල්ලම මං කියන්න ඕනේ අපට කරන්න තියෙන කාර්යය ඉතා භාර දූර එකක් කියන එක. ඒ වුණත් හරි ක්‍රියාපිලිවෙතක් අනුගමනය කරනවා නම් ඕනෑම භාරදූර කාර්යයක් පහසුවෙන් කරගෙන යන්න පුළුවන්. ඒ නිසා අපි හැමතිස්සෙම, වැඩේ කෙරෙන්න ඕන පහසු විදිය හොයා ගෙන ඒ අනුව ක්‍රියාත්මක වෙන්න ඕනේ."

www.sinhalalibrary.com
SL-Unlimited

"ඔය දෙන්නාටම ජංගම දුරකතන අපි ලබා දෙනවා. මේ ෆෝන් වල මගේ අංකය සඳහන් කරලා තියෙනවා. මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා නම් පහසු මුල්ම අවස්ථාවේ මට කතා කරන්න. එතකොට ඊළඟට ගත යුතු පියවර ගැන උපදෙස් මම දෙන්නම්. මුලින්ම ඔය දෙන්නට භාර දෙන්නේ, එක එක අංශ වලින් මේ ප්‍රශ්නය දිහා බලලා අවබෝධයක් ලබා ගන්න ඕන කරන විස්තර දැන ගන්නයි. මේ ප්‍රශ්නයට මුල්වුණ හේතුව හරියට දැන ගන්න ඕනේ. සමහර විට එක හේතුවක් නිසා මේ මිනීමැරීම් සිදුවෙන්න ඇති. එහෙම නැත්නම් මේ මිනීමැරුම් වලට හේතු කිහිපයක් තියෙන්නත් ඇති."

"පරීක්ෂණ කටයුතු කෙරීගෙන යනකොට හැකි තරම් රහසිගතව ඒ සියල්ල සිදු කරන්න ඕනේ. සමහරවිට යමෙකුට ඔයාලා ගැන සැකයක් ඇති වෙන විදියේ දෙයක් වෙන්න පුළුවන්. ඔයාලත් සුපරීක්ෂාකාරීව වැඩ කරන්න. ජීවිතයට තර්ජනයක් ඇති වෙන බව පෙනෙනවා නම් පළිමුවෙන්ම ආරක්ෂා වෙන්න පියවර ගන්න. ඊට පස්සේ මට දැනුම් දෙන්න. වැඩේ කරන්න බැරි වුණා කියලා කනගාටු වෙන්න එපා. අපට වෙනත් සැලැස්මක් ක්‍රියාත්මක කරන්න පුළුවන්."

"මේ මිනී මැරුම් හැම එකක්ම සමාන වගේ අපට පෙනෙන්නේ "රත්දෙණිගල විනාශකයා" කියන පුවරුවක් මිය ගිය හැමකෙනාගෙම ශරීර වල එල්ලා තිබීමත්, ඒ ලියා තිබුණ අකුරු එකම පුද්ගලයෙකුගේ ලෙස පෙනී යාමත්, ඒ හැම දෙනාවම එල්ලා මරා තිබීමත්, මිය ගිය අය එකම පවුලක සහෝදරයින් වීමත් තමයි. අපි හොඳට මතක තියා ගන්න ඕන දෙයක් තියෙනවා. ඕවා එක්කෙනෙක් කළා වෙන්නත් පුළුවන්. කිහිප දෙනෙක් එකතු වෙලා කළා වෙන්නත් පුළුවන්."

"මිනිහෙක් තව කෙනෙකුව හේතුවක් නැතුව මරන්නේ නැහැ. එක්කෝ තමන්ගේ ගැලවීමට, පළිගැනීමකට, ඔහු සතු දෙයක් පැහැර ගැනීමට තමයි කෙනෙක් එහෙම කරන්නේ. හදිසි කෝපයක් නිසාත් කෙනෙක්ව මරන්නත් පුළුවන්. හැබැයි එතකොට ඔහොම එල්ලලා මරන්නේ නෑ."

"මම ජයන්තට පවරන කාර්යය තමයි සුරනිමලගේ මරණය ඇරුණාම, අනෙක් හැම මරණයක් පිළිබඳවම පොලිස් පරීක්ෂණ වාර්තා ලබා ගෙන ඉදිරිපත් කරන එක. සාක්ෂි දීපු සැම අයෙකුගේම වැදගත් තොරතුරු හා දෙන ලද සාක්ෂි, මරණ පරීක්ෂණ වාර්තා, පොලිසිය මගින් සොයා ගත්තු දේවල් මේ වගේ මරණයට සම්බන්ධ හැම වාර්තාවක්ම ඉදිරිපත් කරන්න. මං හිතනවා ජයන්තට දවස් දෙකකින් මේ වැඩේ කරන්න පුළුවන් වේවි කියලා."

SL Unlimited

"හෙට සුරනිමලගේ ආදාහනය සිදුවෙනවා. විමලසිරි මේ අවමඟුලට සහභාගි වෙන්න ඕනේ. සුරනිමල මුදලාලිගෙන් මොකක්හරි ලොකු උදව්වක් ලබාගත්තු කෙනෙක් විදිහට රඟපාන්න බලන්න. කැපී පෙනෙන්න යන්න එපා. පුළුවන් කමක් තියෙනවා නම් හත් දවසේ දානේ දෙනකම්ම එහේ රැඳෙන්න බලන්න. අවමඟුලට සහභාගී වෙන අය සුරනිමලට හරි, ඒ පවුලේ කාට හරි හිටි හතුරන් ගැන කියනවා නම් ඒවා හොඳින් සටහන් කරගන්න."

ඔවුන් පිට වී ගිය පසු පැට්‍රික් හැරී දෙසට හැරුණේ වැඩේ හොඳට ගියා දැයි දැන ගන්නට මෙනි.

"වැඩේ හොඳට ගියා පැට්‍රික්. ඒත් මේ පරීක්ෂණ කටයුතු වලට තව කෙනෙක් හිටියා නම් හොඳයි කියලා මං හිතනවා. පැට්‍රික් හොයන්න ඕනම කරන පුද්ගලයෙක්ව අමතක කළා කියලා මට හිතෙනවා."

"නෑ නෑ අංකල්. මං හිතුවා අංකල්ටත් ඒක තේරුම් යාවි කියලා. අපි විල්සන් ගැන හොයන්න ඕන නමයි. මං ඒක අමතක කළේ නෑ. මට හිතුනා ඒකට සුදුසුම පුද්ගලයා මම කියලා. අංකල් මොකද හිතන්නේ?"

"බොහොම හරි පැට්‍රික්. බොහොම හරි."

"මං එහෙනම් දැන්මම ඒ කටයුතු පටන් ගන්නවා. අංකල් ගෙන් තමයි මට මුලින්ම ඒ ගැන විස්තර ලබා ගන්න ඕනේ. විල්සන් සම්බන්ධයෙන් අංකල් දන්න හැම දෙයක්ම මට කියන්න. ඊට පස්සේ මම එයා ගැන හොයලා බලන්නම්."

"හොඳයි මං දන්න දේවල් මම කියන්නම්."

"මට අවසාන වතාවට විල්සන් මුණගැහුණේ හෙක්ටර්ගේ අවමඟුල් උත්සව දිනයේදී. නොදන්න ලෝකෙක අතරමං වුණ කෙනෙක් විදිහට, කරන්න ඕනේ මොකක්ද කියලා තීරණයක් ගන්න බැරි වුණ කෙනෙක් විදිහට එයා කතා කළේ. ඕනම උදව්වක් කරන්න සූදානම් බව ඒ වෙලාවේ මං එයාට කිව්වා."

"ශ්‍රී ලාල්, ඒ කියන්නේ නෙල්සන්ගේ ඥාති සහෝදරයා, මේ සිද්ධි වෙනකොට නීති විද්‍යාලයේ දේශකයෙක් විදියට වැඩ කරනවා. මං එයාගෙන් වරින්වර විල්සන් පිළිබඳව විමසා බැලුවා. ශ්‍රී ලාල් කියපු හැටියට අර සිද්ධියෙන් පස්සේ විල්සන් කොළඹ ඇවිත් පුරුදු විදිහට නීති විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන්න පටන් අරගෙන තියෙනවා. එයා එක්ක කතා කරපු හැම අවස්ථාවකම වගේ ශ්‍රී ලාල්ට එයාගේ හිත ඇතුලේ කැකෑරෙන වේදනාව තේරුම් ගන්න පුළුවන් වෙලා

තියෙනවා. මං කලිනුත් කිව්වනේ මියුරියෙලුයි, විල්සනුයි අතර හරිම කිට්ටු බැඳීමක් තිබුනා කියලා. ඉතින් ඒ තරම් කිට්ටුවෙන් හිටිය තමන්ගේ සහෝදරියට වෙච්ච දේත්, දෙමව්පියන්ට වෙච්ච දේත් අමතක කරන එක ලෙහෙසි පහසු වැඩකුත් නොවෙයිනේ."

"ශ්‍රී ලාල් වතාවක් එයාට මුදලින් උදව් කරන්න හදලා තියෙනවා. ඒත් විල්සන් ස්තූති කරලා ඒක ප්‍රතික්ෂේප කළාලු. තමන්ගේ වියදම හොයාගන්න විල්සන් ප්‍රයිවට් කොම්පැනියක පාට් ටයිම් කරන්න රස්සාවක් හොයා ගත්ත බවත්, ඒ ලැබෙන මුදල ඔහුට ප්‍රමාණවත් බවත් විල්සන් කිව්වලු."

"කොළඹ කාමරයට නවතින්න ගියාට පස්සේ විල්සන් රන්දෙණිගල වලව්වට ගිහින් නෑ. එයා ඇත්තටම කොහොමද ඒ ගෙදරට යන්නේ. සුන්දර ළමාවියේ සිහිවටන ඒ ගෙදර, වත්ත, ප්‍රදේශය පුරාම පැතිරිලා තියෙන බව ඇත්ත. ඒත් ඒ හැම එකක්ම යටපත් කරගෙන මතුවෙන්නෙ එක්තරා රාත්‍රියක සිදුවුණ ඛේදවාචකයක්. ඒක දකින්න, ඒක මතකයට නගන්න ඔහු කැමති නොවෙන්න ඇති. ඉතිං කොහොමද රන්දෙණිගල වලව්වට ආයෙත් යන්නේ. වලව්වත් ටිකෙන් ටික පාලුවට යන්න වුණා."

"හෙක්ටරගෙත්, සුධර්මාගෙත් ඇන්මාගේ දානේ ශ්‍රී ලාල් මූලිකත්වය අරගෙන වලව්වෙම පැවැත්තුවා. ඊට සතියකට විතර කලින් එයා විල්සන්ටත් ඒ බව දැනුම් දීලා, මිනිස්සු හත්අට දෙනෙක් දමලා වලව්වත්, ඒ අවට වත්තත් සුද්ද පවිත්‍ර කරලා දැම්මා. ශ්‍රී ලාල්ම තමයි විල්සන්ව දානේ ගෙදරට කැඳවාගෙන ගියෙත්. දානයේ කටයුතු ඉවර වුණාම ශ්‍රී ලාල් විල්සන්ව එදා රෑ ගතකරන්න රජමල්වත්ත වලව්වට එක්කරගෙන ගිහින් තියෙනවා. ඒක තමයි ශ්‍රී ලාල්ගේ ගෙදර."

"ඊට පහුවෙනිදා විල්සන් කොළඹ යන්න සූදානම් වෙමින් ඉන්නකොට මියුරි, ඒ කියන්නේ ශ්‍රී ලාල්ගේ බිරිඳ රන්දෙණිගල වලව්ව පාලුවට යනවා දකින්න තමන් අකමැති බව කිව්වලු."

"විල්සන් මල්ලි ඒ වලව්වේ පදිංචි වෙන්න අකමැති බව අපි දන්නවා. ඒ වුණත් ඒක පාලුවට අරින්න හොඳ නෑනේ. මල්ලි වගේම, ශ්‍රී ලාලුත් ඉපදිලා තියෙන්නේ ඒ ගෙදරම තමයි. අපි මල්ලිට ලක්ෂ දෙකක් දෙන්නම්. රන්දෙණිගල වලව්ව අපට විකුණන්න."

"අක්කේ. මට ඒ මුළු දේපලම අයිති වෙන්නේ නෑ. ඒකෙන් තුනෙන් පංගුවයි මට අයිති."

"කමක් නෑ. අපි වලව්වේ මුළු වටිනාකමම මල්ලිට දෙන්නම්. අනෙක් අය කවදා හරි ඇවිත් අයිතිවාසිකම් ඉල්ලුවොත් අපි ලක්ෂ

දෙක අරගෙන එයාට වලව්ව බාර දෙන්නම්."

විල්සන් ශ්‍රී ලාල් දිහාත්, මයුරි දිහාත් වරින්වර බැලුවලු.

"අක්කේ, මං ඒ වලව්වේ තාම දුරටත් ඉන්න අකමැති එක ඇත්ත. ඒ වුණාත් අප්පච්චි හැමදාම කිව්වේ, තියෙන දේ වැඩි දියුණු කරගෙන ජීවත් වෙනවා මිසක් විකුණගෙන කන්න හොඳ නෑ කියලා. ඇරත් කවදා හරි දවසක අම්මගෙයි අප්පච්චිගෙයි සොහොන බලන්න යන්න කියලත් තියෙන්නේ ඔය වලව්වටමනේ."

"මල්ලිට කැමති වෙලාවක ඒකට අවසර තියෙනවා. ආයෙ අපෙන් අවසර ගන්න ඕනෙත් නෑ. ඒක අපි පරම්පරාවෙන් පිට යන්න දෙන්නෙත් නෑ."

"මට සමාවෙන්න අක්කේ. දැන්මම ඒ ගැන තීරණයක් ගන්න මට බෑ."

"ඒ දෙන්නගේ හිත ඒ සිද්ධියෙන් ටිකක් පෑරුනත්, ඒ බවක් නොඅඟවා ඒගොල්ල කතා කළා."

"අපට වලව්වේ අයිතිය නැති වුණාට කමක් නෑ. අඩුගානේ මුරකාරයෙක් දාලා වත්ත පිටියවත් පාලුවට යන එක නවත්තගන්න අපි කැමතියි. ඒකට යන වියදමත් අපි දරන්නම්. මල්ලී මොකද කියන්නේ?"

"ඒකට මගේ කිසිම අකමැත්තක් නෑ. ඒ යන වියදමත් මං දවසක අක්කලාට ගෙවන්නම්."

"ඊට මාස ගාන හතරකට විතර පස්සේ විල්සන් කලබලෙන් වගේ ශ්‍රී ලාල් හම්බ වෙන්න ගිහින් තියෙනවා. විල්සන්ගේ හිතේ තියෙන නොසන්සුන් බව එයාලට පැහැදිලිව දැකගන්න පුළුවන් වුණාලු. ඒ වුණත් ඒ ගැන විමසන්නේ නැතුව ඒ ගොල්ල සතුටු සාමීචියේ යෙදුනා."

"දවල් කෑමෙන් පස්සේ තමයි විල්සන් ආපු කාරණය එයාලට කියලා තියෙන්නේ."

"අක්කේ. මං වලව්ව විකුණන්න තීරණය කළා."

"විකුණන්න? කාටද විකුණන්නේ?" ශ්‍රී ලාල් කලබලෙන් ඇහුවා.

"පිටකාටවත් ඒක විකුණන්න මම කැමති නෑ. අයියලට ගානක් කියන්නත් මට බෑ. ඔයාලා කැමති ගානක් දීලා ඒක අරගන්න."

"ශ්‍රී ලාල් එදාම ලක්ෂ දෙකහමාරකට, ගෙදර බඩුත් එක්ක ඒක ලියාගෙන තියෙනවා. ඒ සල්ලි අරගෙන ගියාට පස්සේ ආයෙමත් කිසිම දාක ශ්‍රී ලාල්ට විල්සන් දකින්න ලැබිලා නෑ."

"සල්ලිත් අරගෙන ගිය මනුස්සයා නිසා ශ්‍රී ලාල් හොඳටම කලබල වුණා. ශ්‍රී ලාල් විල්සන් ආශ්‍රය කරපු මිතුරන් කීපදෙනෙක්ගෙන් විල්සන් ගැන විපරම් කරලා තියෙනවා. ඒ ගොල්ලන් කියලා තියෙන්නේ විල්සන් දවස් කිහිපයක ඉඳන් දේශන වලට සහභාගි නොවුන බව විතරයි."

"ඊට පස්සේ තමයි ශ්‍රී ලාල් නිරංජලා හමුවෙලා, ඒ ගැන විපරම් කරලා තියෙන්නේ."

"කවුද නිරංජලා කියන්නේ?"

"එයත් විල්සන් එක්ක නීති විද්‍යාලයේ ඉගෙන ගත්තු ශිෂ්‍යාවක්. ඒ දෙන්නා අතර ප්‍රේම සම්බන්ධයක් පැවතුන බව ශ්‍රී ලාල් කාලයක ඉඳලා දැනගෙන හිටියා. නිරංජලා විශාඛාගේ පවුලේ අය තරම් දුප්පත් නොවුණත්, කුලහීන නොවුනත් ශ්‍රී ලාල් ඒ දවස්වල හිතුවලු හෙක්ටර් මාමා මේ බව දැන ගත්තොත් මොනවා කරාවිද කියලා. හැබැයි ඒ මොනවා වුණත්, විල්සන්ගේ පවුලට වුණ විනාශයෙන් පස්සේ එයාගේ හිත හදන්න පුළුවන් වුනේ නිරංජලාට තමයි. ඇත්තටම නිරංජලා නොහිටියා නම් විල්සන්ගේ ජීවිතය නොරැකෙන්නත් ඉඩ තිබුනලු."

"ශ්‍රී ලාල් නිරංජලාගෙන් විල්සන් ගැන ඇහුවාම එයාගේ ඇස් කඳුලින් පිරුණා."

"සර්. මාත් මේ අනෙක් අය වගේ කිසිම දෙයක් දන්නේ නෑ" කියලා නිරංජලා අඬන්න ගත්තලු. ඒ වුණත් ශ්‍රී ලාල්ට හිතුනා නිරංජලාගේ හිත රිදෙන, එයා මතක් කරන්න අකමැති යමක් විල්සන් අතින් වෙලා ඇතිය කියලා. හැබැයි ඒක හිතන්නත් අමාරු දෙයක්. විල්සන් කුරාකුහුඹුවකුටවත් කරදරයක් කරන කෙනෙක් නොවෙයි. පස්සේ ශ්‍රී ලාල් නිරංජලා ලඟින් ඇසුරු කරපු ගෑනු ළමයි දෙතුන් දෙනෙක්ගෙන් ඒ ගැන විපරම් කරලා තියෙනවා. ඒ ගොල්ල කියපු හැටියට විල්සන් නිරංජලාට හොරෙන් වෙන ගෑනු ළමයෙක්ව බැඳලා. එක ළමයෙක් දැකලත් තියෙනවා විල්සන් ලස්සන ගෑනු ළමයෙක්ගේ අතින් අල්ලගෙන මහරගම පොලේ ඉන්නවා. ඒ මොනවා වුණත් ඉන් පස්සේ විල්සන්ට මොනවා වුණාද කියන්න ශ්‍රී ලාල් දන්නෙත් නෑ. මං දන්නෙත් නෑ."

"දැන් නිරංජලා විවාහකද?"

"මං හිතන හැටියට එයා තවම අවිවාහකයි. මට උසාවිය පැත්තේ යනකොට කිහිප වතාවක්ම නිරංජලා හමුවෙලා තියෙනවා. දවසක් මං නිකමට වගේ ඇහුවා විල්සන් ගැන මොකුත් ආරංචියක්

www.sinhalalibrary.com
SL Unlimited

එහෙම නැද්ද කියලා. එයා මා දිහා ටික වෙලාවක් බලා ඉඳලා නෑ කියලා කිව්වා."

"මං ගිහින් නිරංජලා හමුවෙලා කතා කරොත් එයාගෙන් මට යමක් දැන ගන්න පුළුවන් වේවිද?"

හැරී මඳ වේලාවක් පැට්‍රික් දෙස බලා සිටියේය.

"හොඳ අදහසක්. නිරංජලාගෙන් යම් තොරතුරක් ලබාගන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම්, ඒ ඔයා තමයි. ඒ මොකුත් නිසා නොවෙයි ඔයාලගේ නෑ කම නිසා. ඒ වුණත් ඒක හරියාවිද කියලා මට සහතික වෙන්න බෑ. ඒ ඔක්කොම පැට්ගේ දක්ෂතාවය උඩ තමයි රඳා පවතින්නේ."

"මං කොහොමද එයාව හමුවෙන්නේ?"

"මා ගාව නිරංජලාගේ ඔෆිස් එකේ ෆෝන් නම්බර් එක ඇති."

"මට ඒක දෙන්න. මං හිතනවා මට එයාගෙන් යමක් දැන ගන්න පුළුවන් වේවි කියලා."

"මං හෙට නුවර යනවා පැට්‍රික්. ඇමති තුමා කියනවා නන්දනටයි ජයදේවටයි පොලිස් ආරක්ෂාව දෙන්න කියලා ඒ දෙන්නට මොනවා හරි වුණොත් ඉඳලා ඉවරයි."

"කවුද ජයදේව කියන්නේ?"

"ආ.. ඒ සුරනිමලගේ එකම පුතා. ඒ පවුලේ අයගෙන් දැන් ජීවතුන් අතර ඉන්නේ ඒ දෙන්නා විතරනේ."

●●●

පසු දින හැරිසන් නුවර සිට පැමිණෙන තුරු පැට්‍රික් රාත්‍රී ආහාරය නොගෙන බලා සිටියේය. රාත්‍රී නවයට පමණ පැමිණි හැරී ඇඟපත සෝදාගෙන පැට්‍රික් හා එකතු විය.

"කොහොමද අංකල් ගිය වැඩේ?"

"උන් දෙන්නා නම් නියම මිනිස්සු දෙන්නෙක්. ඔය තරම් අකරතැබ්බක් වෙලා තියෙද්දිත් පොලිස් ආරක්ෂාවක් ඕන නෑ කිව්වනේ."

"ඒ මොකද?"

"තියෙන දරදඬු කමනේ, වෙන මොකක්ද? පසුගිය අවුරුදු විස්ස තුළ පොලීසිය මොනවද කළේ කියල නන්දන මගෙන් ඇහුවා. පොලීසිය හොඳටම දන්නවා රන්දෙණිගල සිංහ පැටියෙකුගෙන් එයාලට විපත්තියක් වෙන්න ඉඩ තියෙන බව, අපේ පවුලේ එක එක්කෙනා ඌ බිලිගත්තා. පොලීසිය නිදාගෙන හිටියා. අන්තිමේදී බොඩිගාඩ්වරයෙක්

වගේ හිටපු අයියවත් ඌ බිලිගත්තා. දැන් කාව ආරක්ෂා කරන්නද? අපි දන්නවා ආරක්ෂා වෙන හැටි. ඌ මගේ හැටි දන්න නිසා තමයි මා ගාවට කිට්ටු වෙන්නේ නැත්තේ. අපි අපේ ආරක්ෂාව බලා ගන්නම්. ඔයාලා ඔයාලගෙ රාජකාරිය "හරියට" කරන්න. එයා "හරියට" කියන එක ටිකක් බර කරලා කිව්වා. ජයදේව නම් නිස්සද්දව හිටියා. මං නන්දනට කිව්වා මීට අවුරුදු කීපයකට ඉස්සරවෙලා සුරනිමලට ආරක්ෂාව දෙන්න මං අහපු බව. එතකොට සුරනිමල කිව්වා අපට වින කළ යකා අපි අපායට යැව්වා කියලා. ඒකයි මං එහෙම දෙයක් ගැන මෙතෙක් කතා නොකළේ කියලා."

"එතකොට එයාලා මොනවද කිව්වේ?"

"අපි ඔය කතා විශ්වාස කරන්නෙ නැහැ කිව්වා. මමත් ඒක ඒගොල්ලන්ට ඒත්තු ගන්වන්න උත්සාහ කළේ නැහැ. මං පස්සේ පොලිස්පතිටයි, ඇමති තුමාටයි ඒ විස්තර දැනුම් දුන්නා. ඒ ගොල්ලෝ කීවෙ ව්‍යාඝ්‍රයාගේ ඊළඟ පහර දීමට ඉස්සර වෙලා කොහොම හරි කොටු කර ගන්න කියන එක තමයි."

දෙදෙනා මඳ වෙලාවක් නිහඬව ආහාර අනුභව කරන්නට වූහ.

"කොහොමද ඔයාගේ රාජකාරිය? තිරංජලාට කතා කළා ද?"

"ඔව්. මං අංකල්ගේ නමත් කියලා පෞද්ගලික වුවමනාවකට නිවාඩු පාඩුවේ එයාව හම්බවෙන්න ඕනේ කිව්වා. සිකුරාදාට එයාට වැඩ නෑ කියලා එදා දහයට විතර ගෙදරට එන්න කිව්වා. මට එයාගේ ගෙදර ඇඩ්රස් එකත් දුන්නා."

"ජයන්තගෙන් කෝල් එකකුත් ආවා. පොලිස් පරීක්ෂණ වාර්තා සැහෙන ප්‍රමාණයක් එයා එකතු කර ගත්තා කිව්වා. හෙට හවසට එයා ඒවත් අරගෙන අපි හමුවෙන්න ඒවි."

"එහෙනම් හෙට බොහොම වැදගත් දවසක් වේවි නේද?"

"ඔව්. අපි බලමුකෝ. අපට ඕන කරන පොඩි හෝඩුවාවක්වත් ඒවායින් ගන්න පුළුවන් නම් ඒක හොඳ ආරම්භයක්."

●●●

SL-Unlimited

# 4

"මම ප්‍රමාද වුණාද දන්නේ නෑ"යි අසමින් හැරී කාර්යාලයට ඇතුළු විය.

"ඒකට කමක් නෑ අංකල්. ජයන්තත් දැන් තමයි ආවේ."

"එහෙනම් අපි කෙලින්ම වැඩට බහිමු නේද?"

"ඔව් ජයන්ත. එහෙනම් ඔයා හොයා ගත්තු විස්තර අපට කියන්න."

ජයන්ත ලිපිගොනු කිහිපයක් මේසය මත තබා ඉන් එකක් අතට ගත්තේය.

"මේ ලිපිගොනුවල තියෙන්නේ සර් මට එකතුකර ගෙන එන්න කියපු පොලිස් වාර්තාවල පිටපත්. මං ඒ හැම එකකින්ම වැදගත් කොටස් එකතු කරලා පරීක්ෂණයට අවශ්‍ය වන විදිහට වාර්තාවක් හැදුවා. ඒ වාර්තාවේ අඩංගු කරුණු මං ඉදිරිපත් කරන්නම්. වැඩි විස්තර අවශ්‍ය නම් ඒවා මේ ලිපි ගොනුවල තියෙනවා."

"බොහොම අගෙයි ජයන්ත."

•••

"ඒ 1977 මාර්තු මාසේ දවසක්. ඒ මාසේ අග හරියේ පැවැත්වෙන මහා මැතිවරණයට කවුරුත් සූදානම් වෙනවා. රම්‍යා, ඒ කිව්වේ සුරනිමල මුදලාලිගේ බිරිඳ. මේ කාලයේ බුත්තල ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාර්යාලයක් පවත්වාගෙන යනවා. රම්‍යා තමයි ඒ ප්‍රදේශයේ සංවිධායිකාව. මේ මරණය වෙන්න සතියකට විතර කලින් ජයසුමන කියලා අවුරුදු 27-28ක විතර පෙනුම තියෙන, අඩි පහමාරක් විතර උස, උසේ තරමට මහත තිබුණ, කඩවසම් තරුණයෙක් එයාගේ කාර්යාලයට ඇවිත් තියෙනවා. එතකොට කාර්යාලයේ ඉඳලා තියෙන්නේ ලේකම් පියදාස විතරයි."

"මට රම්‍යා වාසලමුදලි මැතිණිය හමුවෙන්න පුළුවන්ද?" ඔහු බොහොම බයාදු විදිහට ඇහුවලු.

"රම්‍යා නෝනා මැතිවරණ කටයුත්තකට දිග්ගලට ගිහින්. හවස තුන විතර වෙයි ආපහු එනකොට."

"මං නෝනා එනකං ඉඳියට කමක් නැද්ද?"

SL Unlimited

"ආ ඒකට කමක් නෑ. ඔහේගේ පදිංචිය කොහේද?"

"අපි මේ ළඟපාත උදවිය මහත්තයො. මං රමනා නෝනා හමුවෙන්න ආවේ බොහොම වැදගත් වුවමනාවකට. මං එහෙනම් නෝනා එනකල් මේ හරියේ ඉන්නම්."

"දවල් කෑමට ඒ ළඟ කඩේකට ගියා ඇරුණාම, දවසේ මුළු කාලයම, මැතිවරණ කටයුතු වලට ගෙනැවිත් තිබුණ දැන්වීම් පත්‍රිකා ආදිය කියවමින් ඒ තරුණයා කාර්යාලයට තුළටම වෙලා හිටියා."

"රමනා කාර්යාලයට එනකොට තුනහමාරත් පහුවෙලා. අර තරුණයා කරේ දමාගෙන හිටි ලේන්සුවත් අතට අරගෙන බොහොම ගරු සරු ඇතිව "ආයුබෝවන් නෝනා" කියලා ඔළුවත් පහත් කරලා ආචාර කළා. රමනත් එයාට ආචාර කරලා, කාර්යාලයට ඇතුළු වුණා. ටික වෙලාවකින් ආපු තරුණයාගේ නමත් අහගෙන කාර්යාලයේ ලේකම් ගිහින් රමනාට කිව්වලු ජයසුමන කියන ඒ තරුණයා උදේ ඉඳන්ම රමනා හමුවෙන්න බලාගෙන ඉන්න විත්තිය. රමනා එයාව කාමරේට කතා කරලා "වාඩිවෙන්න" කිව්වා. ජයසුමන තුනට හතරට නැමිලා "නෑ මෙහෙම හොඳයි නෝනා" කියලා පුටුවක ඉඳ නොගෙනම හිටියා."

"ජයසුමන කොයි පළාතේද?"

"මගේ ගම මිල්ලකැටිය නෝනා. බුත්තල ඉඳලා කතරගමට යන පාරේ හැතැක්ම පාළොහක් විතර ගියාම අපේ ගමට යන්න පටු කරත්ත පාරක් තියනවා. සමහර තැන් වලදී ඒක අඩි පාරක් වෙනවා. නෝනා අපේ ගමට ඇවිත් නෑ නේද?"

"නෑ ජයසුමන. ඒත් මං මිල්ලකැටිය ගැන අහලා තියෙනවා. මං ළඟදීම ඒ පැත්තෙත් යන්න සූදානමින් ඉන්නේ. ඉතිං ඇයි ජයසුමන මාව හමුවෙන්න ආවේ?"

"අනේ නෝනා. අපේ ගමේ ඉන්නේ ගොඩමඩ ගොවිතැන්බත් කරලා ජීවත්වෙන දුප්පත් ගොවි පිරිසක්. චන්දෙ දාන්න සුදුසුකම් තියෙන එකසිය පනහක් විතර ඒ අතර ඉන්නවා. වැඩිය ඉන්නේ බවලත් උදවිය. අපට තියෙන ප්‍රශ්නේ තමයි ගමනක් බිමනක් යන්න හරි පාරක් නැති එක. අපි දුක්මහන්සි වෙලා වගා කරන දේවල් හොඳ ගානකට අපට විකුණගන්න බෑ. ලොරි කාරයෝ ඇවිත් කුණු කොල්ලෙට අපේ බඩු අරගෙන යනවා. හරි පාරක් ගමට තිබුණානම් මෙහේ පොළට ගෙනල්ලා හරි අපේ දේවල් විකුණලා හොඳ ආදායමක් ගන්න පුළුවන් නෝනා. අපේ ගමට පාරක් දාගන්න නෝනාගෙන් වත් උදව්වක් ඉල්ලගන්න හිතාගෙන ගමේ අය තමයි මාව මෙහාට එව්වේ."

SL-Unlimited

"මේ වගේ කතා රමනාට හොඳට අහලා පුරුදුයි."

"හොඳයි. ජයසුමන ගිහින් ගමේ තරුණ සමිතියක්, එහෙම නැතිනම් ගොවි සාමජයක් පිහිටුවා ගන්න. ඒ අයට කියන්න අපට චන්දය දෙනවා නම්, මහ චන්දෙන් පස්සේ ගමට පාරක් හදලා දෙන්න මං පොරොන්දු වුණා කියලා."

"නෝනලට ඇරෙන්න වෙන කාටවත් අපේ චන්ද යන්නේ නෑ නෝනා. මේ ආණ්ඩුවේ වැඩපිළිවෙළ නිසා අපට හැබැවටම හොඳක් වුණා. ඉස්සර වගේ අපේ අලබතල මඩිගොක්කා විකුණගන්න අපට දැන් අමාරු නෑ. ඒත් ලැබෙන මුදල නම් ප්‍රමාණවත් මදි. ඒ ඇරත් අපේ ගමේ බවලත් විදවිය නෝනා ගැන බොහොම ගෞරවේකින් ඉන්නේ. මං මේ නෝනා ඉන්න දැන්වීම් ටිකකුත් අරගන්නා ගමට ගිහින් බෙදන්න කියලා. එහෙනම් මං ගිහින් එන්නම්."

"එහෙම ගිය ජයසුමන ඊට දවස් පහකට හයකට විතර පස්සේ ආපහු ආවා. ඒ එනකොට කලින්දාට වඩා හොඳට පිළිවෙළකට ඇඳුම් ඇඳගෙන හිටියාලු. එතකොට රමනා කාර්යාලයේ ඉඳලා තියෙනවා."

"ආ.. ජයසුමන කොහොමද? මොකද ආයෙත් මේ පැත්තේ?"

"වැඩේ හරි නෝනා. ගමේ අය කිව්වා "ඇයි අපි ගොවි සමිතියක් දාන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සමිතියක් දාමු" කියලා. මං මේ ආවේ ඒක විවෘත කරන්න නෝනට ආරාධනා කරලා යන්න."

"මේ දවස්වල හරියට වැඩ ජයසුමන. මං අපේ ලේකම් මහත්තයව එවන්නම්."

"අනේ නෝනා. නෝනා ආවොත් ඒක අපට ලොකු ගෞරවයක්. අපේ ගමේ බවලත් විදවිය නෝනා දකින්න හරි ආසාවෙන් ඉන්නේ. ඒ අය නෝනාට පක්ෂ වුණත් දේවි. නෝනට පහසු දවසක, පහසු වෙලාවක් කියන්න. නෝනම ඇවිත් අපේ ශාඛාව විවෘත කරලා තියොත් හොඳයි."

"රමනා එයාගේ දිනපොත අරගෙන බැලුවේ චන්ද එකසිය පනහක් කියන්නේ පොඩි ගණනක් නොවන නිසා. ඇරත් ඒ දවස්වල තිබුණ ජනමතය හැටියට එක චන්දයක්වත් අහක දාන එක හොඳ නෑ."

"හොඳයි. මේ මාසේ නවවෙනිදා තමයි මට එන්න පුළුවන් ළඟම දවස. එදාට මම එන්නම්. හැබැයි මට එදාට වැල්ලවායේ තව ශාඛා හතරකට යන්නත් තියෙනවා. හවස් වුණාට කමක් නෑ නේද?"

SL-Unlimited

"ඒකට කමක් නෑ නෝනා. මාත් මෙහාට එන්නද නෝනව එක්කරගෙන යන්න."

"හොඳයි එහෙනම් හවස හතරට විතර මෙතෙන්ට එන්න. අපට පැයකින් හමාරකින් ආපහු එන්න පුළුවන්නේ."

"ඔව් නෝනා. නෝනා ගියා. පොල්තෙල් පහන පත්තු කළා. පොඩි කතාවක් කළා. පාර හදලා දෙනවා කිව්වා. අපි නෝනාව කරපිටින් ආපහු මෙතෙන්ට ගෙනත් ඇරලවනවනේ" සතුටෙන් ඉපිලී ගිහින් ජයසුමන කිව්වා.

"එදා රම්‍යා මැතිවරණ කටයුතු වලට වැල්ලවායට ගිහින් එනකොට හවස හතරත් පහුවෙලා."

"මැඩම්, මෙච්චර වෙලා ජයසුමන මැඩම් එනකම් බලං ඉඳලා, තේ එකක් බීලා එන්නම් කියලා ගියා. තව විකකින් එවි" ලේකම් පියදාස කිව්වා.

"රම්‍යාටත් එදා හරි මහන්සි වුණ දවසක්. එයා කාර්යාලයට වෙලා ටික වේලාවක් විවේකයෙන් හිටියා. ජයසුමන පැය බාගයකින් විතර ආපහු ආවා."

"නෝනා. අපේ ගමේ අය නෝනාව පිළිගන්න බොහොම ආසාවෙන් බලං ඉන්නවා" රම්‍යාව දැකපු ගමන් ජයසුමන කිව්වා.

"එහෙනම් අපි දැන්මම පිටත් වෙමු" කියපු රම්‍යා ඉස්සර වුණා.

"මැඩම්. මාත් එන්නද?" ලේකම් ඇහුවා.

"නෑ පියදාස. පියදාස තව පැය බාගයක් විතර ඉඳලා කාර්යාලේ වහලා දාලා යන්න. මං සැම් අයියා එක්ක යන්නම්."

"සැම් අයියා කියලා රම්‍යා කිව්වේ වාහනේ රියදුරාට."

"ඒ ගොල්ල පිටත්වෙලා තියෙන්නෙ හවස පහට විතර. ජයසුමන පිටිපස්ස සීට් එකට නැගලා පාර කියනවා. ඔහොම සැතපුම් පහලොවක් විතර ගියා."

"ඩ්‍රයිවර් මහත්තයෝ. ඔය ඉස්සරහ තියෙන මිල්ල ගහ ගාව කාරෙක නවත්තන්න. ඔතන ඉඳලා කෙටි අඩිපාරක් තියෙනවා අපේ ගමට යන්න. විනාඩි දහයේ දුර නෝනා."

"ඩ්‍රයිවර් එතන කාරෙක නැවැත්තුවා."

"ඔය අඩිපාර කරත්ත පාරක් කරන්න අපි කොච්චර මහන්සි ගත්තද නෝනා. ගමේ ඉන්න දුප්පත් මිනිසුන්ගේ ඉඩම් පාරට දෙන්න කැමති වුණා. ඒත් ගමේ ඉන්න වලව්වේ හාමු එක අඟලක් දෙන්න බෑ කිව්වනේ. මේ වලව්කාරයින් ගැන කතා කරලා වැඩක් නෑ නෝනා."

www.sinhalelibrary.com
SL-Unlimited

"වලව් කාරයින්ගේ හැටි ඔහොම තමයි" කියමින් රම්‍යා කාරෙකෙන් බැස්සා.

"හැබැයි අපට සැර පෙන්නන්න ආපු වලව්කාරයෙක්ව පවුලත් එක්කම අපි දන්න ගැස්සුවා."

"ඩ්‍රයිවර් කාරෙකෙන් බැස්සත් යන්න ටිකක් අදිමදි කළා."

"පැය බාගෙන් වැඩේ ඉවරයනේ මහත්තයෝ. විවෘත කළා. කතාවක් පැවැත්තුමා. ආපහු ආවා."

"යමු යමු පැමි අයියේ. මේ වගේ අහිංසක ගොවියන්ට තමයි අපි උදව් කරන්න ඕනේ" කියලා රම්‍යා කිව්වාම සැමීත් ගමනට එකතු වුණා."

"විනාඩි දහයක් විතර අඩි පාර දිගේ ඒ අය ඉදිරියට ඇවිත් තියෙනවා."

"සොරගොත් පොල තෝනා" ජයසුමන කිව්වලු.

"එතකොටම ගැඟෑනු කෙනෙක් "හිං හිං හිං" කියලා හිනාවෙන හඬක් දසත පැතිරිලා තියෙනවා. ඒ හඬට ඩ්‍රයිවර්ගෙත් රම්‍යාගේත් ඇඟ කිලිපොලා ගියා."

"කවුද? කවුද? ඒ" රම්‍යා වෙව්ලන, තැති ගැන්වුණ ස්වරයකින් විමසුවා.

"ඒ තමයි තොපේ මාරයා" කියපු ජයසුමන රෙමතක් ගංගාගෙන හිටපු පිස්තෝලයක් රම්‍යා දිහාවට එල්ල කළා.

"එකෙක් කෑ ගහන්නේ නෑ. කෑ ගැහුවොත් තියනවා මළ කුඩු වෙන්න. අත් උස්සපල්ලා."

"හිනාවේ බියකරු බව එන්න එන්නම වැඩි වුණා. ඒ දෙන්නාම හොඳටම බය වෙලා අත් ඉස්සුවා."

"අනෙක් පැත්තට හැරියල්ලා."

"අනෙක් පැත්තට හැරෙන කොට ඩ්‍රයිවර්ගේ බෙල්ලට යකඩ කඳකින් දුන්නා වගේ පාරක් එල්ල වුණා. ඩ්‍රයිවර්ට මතක එච්චරයි."

●●●

"සාමාන්‍යයෙන් මැතිවරණ කටයුතු වලට කොහේ ගියත් රෑ හත අට වෙනකොට ගෙදර එන එක රම්‍යාගේ පුරුද්දක්. ඒත් එදා රෑ නවය වනතුරුත් රම්‍යා ගෙදර ආපු නැති නිසා පුරනිමල ලේකම් පියදාසගේ ගෙදර ගිහින් තියෙනවා ඒ ගැන විපරම් කරන්න. ගැන්දෑවේ පහට විතර තරුණ සමිති ශාඛාවක් විවෘත කරන්න

මිල්ලකැටිය ගම්මානයට රමනා ගිය බවත්, ඒ අය කතා කළ හැටියට මෙතරම් ප්‍රමාද වීමට කිසිම හේතුවක් නැති බවත් පියදාස කියලා තියෙනවා. ඒ වසරේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා බහුලව සිදුවෙලා තිබුණ නිසා සුරනිමල වහාම ඒ බව පොලිසියට දැනුම් දුන්නා."

"පොලිසියත්, සුරනිමලත්, නන්දන ඇතුළු එයාගේ හිතමිතුරන් කිහිප දෙනෙකුත් ඒ වෙලාවෙම මිල්ලකැටිය ගම්මානය බලා පිටත් වුණා."

"පාර අයිනේ නවත්තලා තිබුණ රමනාගේ වාහනේ ළඟ ඒ ආපු අය වාහන පේළියට නැවැත්තුවා. වාහනේ ඇතුලේ කවුරුවත් නෑ. කලබලයක් වුණ බව පේන්න ලකුණක් වත් නෑ. ඒ අවට ටිකක් හෝදිසි කළාට පස්සේ ඒ අය හිතුවා ඒ ළඟ තිබුණ අඩි පාර දිගේ තමයි ඒ ගොල්ල යන්න ඇත්තේ කියලා. ඒ අඩිපාර දිගේ ටික දුරක් යනකොට ඒ අයට කෙඳිරිලි හඬක් ඇහුණා."

"ඒ වෙනකොට ඩ්‍රයිවර්ට සිහිය ඇවිත් පැයක් හමාරක් විතර ගිහින්. ටෝච් එළියි, හුළු අතු එළියි දැක්කාම ඒ අය හොයනවා ඇත්තේ තමන්ව බව ඩ්‍රයිවර්ට තේරුණා. ඒ අඩි පාරේ ඉඳන් අඩි දහයක් විතර බැද්දට වෙන්න ගහක ගැටගහලා හිටිය ඩ්‍රයිවර් තමයි ඒ කෙඳිරිලි හඬ නගලා තියෙන්නේ. ඒ අය වහාම ගිහින් අතපය හා කට බැඳලා තිබුණ බැමි කපාදාලා ඩ්‍රයිවර්ව මුදා ගත්තා. ඩ්‍රයිවර් එයා දන්න හැටියට වෙච්ච දේ කෙටියෙන් කීවාම ඒ ගොල්ල තව දුරටත් රමනා සෙවීමේ කාර්යයේ නියුතු වුණා."

"සොහොන්පිටිය මැදින් ඒ ගම්මානෙට යන්න විනාඩි විස්සක් විතර ගිහින් තියෙනවා. එදා ඒ ගමේ තරුණ සමිතියක් විවෘත කරන උත්සවයක් තිබිලා නෑ. ජයසුමන කියලා තරුණයෙක්වත්, ඒ වගේ හැඩි රූව තියෙන තරුණයෙක්වත් ඒ ගමේ නෑ. ගමේ තරුණ පිරිසකුත් රමනා හොයන්න උදව් කරන්න ඇවිත් තියෙනවා. පහුවදාට එළිය වැටීගෙන එනකොට තමයි ඒ තරුණ පිරිසට සොහොන් පොලට නොදුරු වනාන්තරයේ ගහක එල්ලලා මරලා තිබුණ රමනාගේ සිරුර හොයාගන්න පුළුවන් වුනේ. ගම්මුන්ගේ උදව්වත් ඇතිව පොලිසිය මිනිය බිමට අරගෙන තියෙනවා. එයාගේ සිරුරේ කැපුම්, සීරීම් තුවාල රාශියක් තිබුණා. කර හරහා දමලා තිබුණ ලනුවකින් එල්ලා තිබුණ කාඩ්බෝඩ් කෑල්ලක රතු පාටින් "රන්දෙණිගල වහාල්ලයා" කියලා ලියලා තිබුණා. ඒ කාඩ්බෝඩ් එකෙත් සෑහෙන්න ලේ තිබුණා."

"සුරනිමලගේ පවුලේ අය මේ මරණය පිළිබඳව සැක කළේ එවකට විරුද්ධ පක්ෂයට වැඩ කළ පිරිසක්. මේක දේශපාලන හේතු මත කළ පළිගැනීමක් විදිහට සැක කරලා පොලිසියත් කීප දෙනෙක්ව

SL Unlimited

අත් අඩංගුවට ගත්තා. ඒත් එයාලට විරුද්ධව ක්‍රියා කරන්න ප්‍රමාණවත් සාක්ෂි නොතිබුණ නිසා ඒ අයව නිදහස් කරලා යවන්න පොලීසියට සිද්ධ වුණා."

"ජයසුමනගේ හැඩරුව තිබුණ තරුණයෙක් එදා දහවල් අර අඩිපාර තිබුණ ශරීරයෙන් තමුන්ගේ බස් එකට ගොඩ වුණ බවත්, ඔහු බුත්තලට ටිකට් එකක් ගත් බවත් ඒ පාරේ වැඩ කරන බස් එකක කොන්දොස්තර කෙනෙක් පොලීසියට ඇවිත් කිව්වා. එදා ඒ බසයෙන් ගිය කීප දෙනෙක්ම ඊට පස්සේ පොලීසියට ඇවිත් එයාගේ විස්තර කියලා තියෙනවා. එයා ඇඳගෙන හිටිය සරමේ පාට විතරක් නොවෙයි දමාගෙන හිටිය සෙරෙප්පු දෙක ගැන විස්තර පවා පොලීසියට ලැබුනාම, එතකින් බසයට ගොඩවෙලා තියෙන්නේ ජයසුමන කියන පුද්ගලයාම බව පොලීසියට ඒත්තු ගියා. ඊට පස්සේ පොලීසිය ඒ අවට වනරොද පරීක්ෂාවට ලක් කළා."

"වනරොද ඇතුලේ වැලි තලාවක තිබුණ පොඩිවෙලා ගිය පඳුරක් පොලීසිය විසින් සොයා ගත්තා. එතැන මෝටර් සයිකලයක රෝද සලකුණු හා සපත්තු අඩියක් සටහන් වෙලා තිබුණා. ජයසුමන මෝටර් සයිකලයකින් ඇවිත්, එම ස්ථානයේ එය සඟවා තබා පස්සේ මිනී මැරුම සිදුකර, එහි නැගී පලාගිය බව පොලීසියට ඒත්තු ගියා."

"ඊට දින කිහිපයකට ඉස්සරවෙලා මෝටර් සයිකලයකින් පැමිණි පුද්ගලයකු තමන් කතරගම ප්‍රදේශයේ මුදලාලි කෙනෙකු බව පවසා ගොවි මහත්වරු කිහිප දෙනෙක් එක්ක කතා බහ කර ගොස් තියෙනවා. ඒ මුදලාලි යැයි කී පුද්ගලයාගේ හැඩරුව ජයසුමනගේ හැඩරුව හා සමාන වීම නිසා ඒ මිනීමැරුම හොඳින් සැලසුම් කර කරන ලද්දක් බව පෙනී ගියා."

"රන්දෙණිගල විනාශයා" යනුවෙන් සඳහන් වූ පුවරුව නිසා රන්දෙණිගල ප්‍රදේශයේ ඔවුන් හා තරහ කාරයෙක් ඇත් දැයි පොලීසිය සුරනිමලගෙන් ප්‍රශ්න කළා.

"රන්දෙණිගල කියන්නේ මගේ ගම. මගේ ගමේ කිසි කෙනෙක් මේ වගේ වැඩක් අපට කරන්නේ නෑ" සුරනිමලත් නන්දනත් කියලා තියෙනවා."

"ඊළඟට මේ මරණය ගැන වැදගත්ම සාක්ෂියක් ලැබිලා තියෙන්නේ කතරගම රෝහණපුත්‍ර හෝටලයේ සේවක පිරිසකගෙන්. ඒ ගොල්ලන්ගේ සාක්කි වල හැටියට මාර්තු මාසේ දෙවෙනිදා නිමල් වීරසිංහ කියලා මෝටර් සයිකලයකින් පැමිණි පුද්ගලයකු සුමාන දෙකකට කාමරයක් වෙන් කරගත්තාලු. ඒ නිමල්ගේ හැඩරුව ජයසුමනගෙ හැඩරුවට ගොඩක් දුරට සමානලු. වෙනසකට තිබිලා තියෙන්නේ කොණ්ඩේ තමයි.

ජයසුමනගේ කොණ්ඩය බුසියක් වගේ. ඒත් නිමල්ට තිබිලා තියෙන්නේ ආමි කට් එක. එයා හෝටලයේ සේවකයින් එක්ක වැඩිය කතාබහ කරලා නෑ. රෑට නිදාගන්න විතරලු හෝටලයට ඇවිත් තියෙන්නේ. දවල් දවස කොහේ ගත කළාද කියලා ඒ කවුරුවත් දන්නේ නෑ. උදේ හතට අටට විතර හෝටලෙන් පිටවෙලා යන නිමල් රෑ අට නවය වගේ වෙනකොට ආපහු එනවලු. මාර්තු නව වෙනිදා, ඒ කියන්නේ රමනාගේ මරණය සිදු වුණ දවසේ, රෑ අටට විතර කලබලෙන් වගේ ආපු නිමල් ඇඳුම් බෑග් එකත් අරගෙන හෝටලේ බිලත් ගෙවලා දාලා පිටවෙලා ගියාලු."

"පොලිසිය වහාම ක්‍රියාත්මක වෙලා එයා නැවතිලා හිටපු කාමරෙන් ඇඟිලි සලකුණු ලබාගෙන තියෙනවා. ඒ ඇඟිලි සලකුණු අතර රමනාගේ වාහනේ සටහන් වෙලා තිබුණ ඇඟිලි සලකුණක් සමාන වීම නිසා මිනීමරුවාගේ ඇඟිලි සලකුණු පොලිසියට ලබාගන්න පුළුවන් වුණා."

"ඉන් එහාට පොලිස් පරීක්ෂණ ගෙනයාමට තරම් ඔත්තු ලැබුණේ නැති නිසා ඒ මිනීමැරුම නොවිසඳුන මිනීමැරුම් ගොන්නට එකතු වුණා."

"පැට්රික් මොකද මේ මිනීමැරුම ගැන හිතන්නේ?"

"මට හිතෙන විදිහට පොලිසිය මිනීමරුවා ළඟටම ගිහින් තියෙනවා. ඒත් අවසාන මොහොතේදී පොඩ්ඩක් උදාසීන වුණ බවක් පෙනෙන්න තියෙනවා. තව ටිකක් මහන්සි වුණානම් මිනීමරුවා අල්ලගන්න තිබුණා."

"ඒ කියන්නේ කොතනදීද පොලිසියේ උදාසීන බව පෙනෙන්නේ?"

"දැන් බලන්න. මිනීමරුවා ඇවිත් තියෙන්නේ මෝටර් සයිකලයක. පොඩ්ඩක් උනන්දු වුණා නම් ඒකේ නොම්මරය හොයා ගන්න තිබුණා. ඊට පස්සේ අයිතිකාරයව හොයා ගත්තා නම් මොකක් හරි හෝඩුවාවක් ලබා ගන්න තිබුණා."

"ඇත්තටම පොලිසියට මෝටර් සයිකලයේ අංකය හොයා ගන්න හැකියාව ලැබුණා. හෝටලයේ හිටි සේවකයෙකුට ඒක මතක හිටලා තියෙනවා. ඒක ඊට අවුරුදු හතරකට විතර ඉස්සරවෙලා ඇක්සිඩන්ට් එකකින් විනාශ වුණ මෝටර් සයිකලයක අංකයක්. ඉතිං ඒ නිසයි මං ඒ ටික කිව්වේ නැත්තේ?"

"ඒ ඇක්සිඩන්ට් එක වෙනකොට කවුද ඒකේ අයිතිකාරයා."

"ඉන්න මං බලලා කියන්නම්" කිවූ ජයන්ත ඊට අදාල ලිපිගොනුව පරීක්ෂා කළේ ය.

"ඒකේ අයිතිකාරයා රේමණ්ඩ් ප්‍රනාන්දු කියලා කෙනෙක්. එයා

SL Unlimited

දියතලාවේ හමුදා කඳවුරේ සේවය කරපු සොල්දාදුවෙක්. එයාගෙ ගම මොරටුව. නිවාඩුවකට ගෙදර යනකොට රත්නපුරෙදි ඇක්සිඩන්ට් එකක් වෙලා එයා මැරිලා තියෙන්නෙ."

"ඇයි පැට්‍රික් ඒක හොඳ හෝඩුවාවක්ද?" පැට්‍රික්ගේ මුහුණෙහි අමුතු ඉරියව්වක් දුටු හැරී ඇසුවේය.

"මෙහෙමයි අංකල්. අපි හොයන එකම මිනීමැරුම මේක නොවෙයිනේ. සමහරවිට අනෙක් මිනීමැරුම් වලදීත් කොතනකට හරි ඕක සම්බන්ධ වෙන්න පුළුවන්. දැන් බලන්න. මිනීමරුවා හොර නොම්මර තහඩුවක් මෝටර් සයිකලයට දමාගෙන ගියා. සමහරවිට ඒක එයාගේ හිතට ආපු නොම්මරයක් වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් එයාට මතක හිටිය නොම්මරයක් වෙන්න පුළුවන්. මතක හිටිය නොම්මරයක් නම් යාළුවෙක්ගේ මෝටර් සයිකලයක නොම්මරයක්. ගමේදි නිතර දැකපු නොම්මරයක් වෙන්න පුළුවන්."

"එතකොට අපට ඒකෙන් ගන්න පුළුවන් හෝඩුවාව මොකක්ද?"

"මං කියන්නේ අංකල් හරියටම හරි යන එකක් නොවෙයි. ඒකත් සැක කරන්න පුළුවන් දෙයක්. එක්කෝ මිනීමරුවා දියතලාව ප්‍රදේශයේ හරි මොරටුවේ හරි කෙනෙක් වෙන්න පුළුවන්. සමහර විට හමුදාවේ සෙබලෙක් වෙන්නත් පුළුවන්."

"එතකොට මරන්න හේතුව?"

"මිනිහෙක් තව කෙනෙකුව මරන්නෙ විනෝදෙට, ආසාවට නොවෙයි. රමනාගේ සිරුරේ තිබුණ කැපීම්, සීරීම් තුවාල නිසා එයා දරුණු වද දීමකට යටත් වුණා බව අනුමාන කරන්න පුළුවන්. මේ විදියට වද දීලා කෙනෙක්ව මරන්නෙ නම් පළිගැනීමකට වෙන්න ඕනෙ. හුඟක් වෙලාවට පළිගැනීමට හේතුව තමන්ට කළ කරදරයක් අතවරයක් නිසා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් තමන්ගේ දෙමාපියන්ට, සහෝදරයෙක්ට, සහෝදරියක්ට, කිට්ටුම නෑදෑයෙක්ට, බිරිඳට ළඟ හිතවතෙකුට කරපු අසාධාරණයකට කරන පළිගැනීමක් වෙන්නත් පුළුවන්. මේක රමනා කළ දේකට කරපු පළිගැනීමක් වෙන්න ඕනෙ. ඉතින් රමනාගේ අතීතය පොඩ්ඩක් විපරම් කරලා බැලුවානම්, එයා අතින් වරදක් වුණ කෙනෙක් හොයා ගන්න පුළුවන් වුණා නම් ඒ පැත්තට සැකය යොමු කරලා, මිනීමරුවා ගැන හෝඩුවාවක් දැනගන්න තිබුණා."

"එතකොට බෝඩ් එක?"

"ඔව්. ඒක හොඳ ඔත්තුවක්. ඒක මං හිතන්නේ අනතුරු ඇඟවීමක්. මිනීමරුවට පෙන්වන්න ඕන කම තිබුණා ඇයි එයා රමනාව මැරුවේ

කියලා. අපට, පොලිසියට ඒක නොතේරුණත් රමනගේ පවුල්වල අයට ඒක තේරුම් යවන්න තමයි මිනීමරුවා ඒක කරන්න ඇත්තේ. එතකොට පවුලේ අනෙක් අය කැලඹෙනවා. එහෙම නැත්නම් ඒක පොලිසිය නොමඟ යවන්න, "රන්දෙණිගල වලව්ව" හා සම්බන්ධ සිද්ධිය දන්න කෙනෙක් කරපු දෙයක් වෙන්නත් පුළුවන්."

"මේ පරීක්ෂණයේ පැට්‍රික් දකින තව අඩුපාඩු මොනවා හරි තියෙනවද?"

"මේක පළිගැනීමකට කරපු අපරාධයක් බව පෙනෙන්න තියෙන නිසා රමනාගෙන් හරි ඒ පවුලේ අයගෙන් හරි අකටයුත්තක් වුණ කෙනෙක් ඉන්නවද කියලා හොයලා බලන්න තිබුණා. ඒ අනුව සමහරවිට මේ මිනීමැරුමට හේතු සාධක වූ කරුණු හොයා ගන්න තිබුණා. ඒක මිනීමරුවා වෙත පොලිසියේ ඇස් යොමුකරවන්නක් වෙන්න තිබුණා. හැබැයි එහෙම කළත් සාර්ථක ප්‍රතිඵලයක් නොලැබෙන්න ඉඩ තිබුණා. ඒත් අපි ගන්න පුළුවන් හැම උත්සාහයක්ම ගන්න ඕනේ."

"මම හිතනවා මේ පරීක්ෂණ වලට පැට්‍රික් සහභාගී ,කරගත්තු එක මං ලබපු ජයග්‍රහණයක් කියලා. ඔයා මේ මිනීමැරුම විග්‍රහ කරපු ආකාරයට අපට මාසයක් යන්න ඉස්සර වෙලා මේ මිනීමරුවා කවුද කියලා දැන ගන්න පුළුවන් වෙයි. ජයන්ත අපි එහෙනම් රිඟ එකට යමු?"

●●●

"සුරේන්ද්‍ර වාසලමුදලි කියන්නේ ඒ පවුලේ තුන්වෙනියා. එයාගේ මරණය සිද්ධ වෙලා තියෙන්නේ 1980 අවුරුද්දේ. මේ වෙනකොට සුරනිමල "වාසල ගෘප්" කියලා ව්‍යාපාර රාශියක් කරගෙන ගිහින් තියෙනවා. ප්‍රධාන වශයෙන් රෙදිපිළි නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා රාශියක් එයාලට හිමිවෙලා තියෙනවා. ඒ අංශය භාරව කටයුතු කළේ නන්දන. එයින් එක කර්මාන්ත ශාලාවක පාලනය නන්දන සුරේන්ද්‍රට දීලා තියෙනවා."

"සුරේන්ද්‍රට භාරව තිබුණ කර්මාන්ත ශාලාව පිලියන්දල ප්‍රදේශයේ තිබුණ එකක්. ඒ කර්මාන්ත ශාලාවට වැඩට ආපු නිර්මලී නම් ලස්සන තරුණියකට සුරේන්ද්‍රගේ හිත ගියා. ඒ ළමයගේ දෙමව්පියන්ට මඟුල් කපුවකුගේ මාර්ගයෙන් සුරේන්ද්‍ර මංගල යෝජනාව කළා. ඒකට ඒ දෙමව්පියන් එක පයින්ම කැමති වෙලා තියෙන්නේ සුරේන්ද්‍රගේ වත් පොහොසත් කමත්, නිහතමානී කමත් නිසයි."

"ඒත් ඒ ගෑනු ළමයා ඒකට කැමති වෙලා නෑ. ඒ සුරේන්ද්‍රගේ තිබුණ අඩුපාඩුවක් නිසා නොවෙයි. ඒ වෙනකොට එයාගේ හිත අනිල්

කියන ගමේ වෙන තරුණයකු වෙත ඇදිලා ගිහින් තිබුණ නිසයි. ඒත් අවසානයේදී ඒ තරුණියට දෙමව්පියන්ගේ තීරණයට අවනත වෙන්න සිද්ධ වුණා."

"විවාහය යෙදිලා තිබුණේ 1980 ජුලි මාසේ පස්වෙනිදට. ඊට සති තුනකට විතර කලින් ඒ ගෑණු ළමයාගේ දෙමව්පියන්ට ලිපියක් ලැබුණා. ඒකත් මේ ලිපිගොනුවේ තියෙනවා. ඒ ලිපියේ සඳහන් වෙලා තිබුණේ සුරේන්ද්‍ර වාසලමුදලිගේ සොහොයුරන් විසින් කරන ලද සාපරාධී ක්‍රියාවක් නිසා ඒ පවුලේ හැමදෙනාම "රන්දෙණිගල වනාශ්‍රයා" නම් යුක්තිය පසිඳලන පුද්ගලයකුගේ පළිගැනීමකට ලක් වී තිබෙන බවයි. ඔබගේ දුවණිය කණවැන්දුම් ස්ත්‍රියක් වනවා දැකීමට අකමැති නම් ඔය විවාහය නොකර සිටින්න කියන එක තමයි ඒ ලිපියේ තිබුණේ."

"ඒ ලිපිය ගැන ඒ දෙමව්පියන් කිසිම තැකීමක් කරලා නෑ. ඒ ගොල්ල හිතලා තියෙන්නේ මේක, ඒ ගෑණු ළමයාගේ පරණ පෙම්වතා වන අනිල්ගේ ප්‍රයෝගයක් හැටියටයි."

"විවාහ උත්සවය කොළඹ තැප්‍රොබේන් හෝටලයේ බොහෝම ජයට පැවැත්තුනා. පවුල්වල ඥාති මිත්‍රාදීන් බොහෝමයක් ඒකට සහභාගී වුණා. ඉන් පස්සේ නව යුවළ මධු සමය ගත කරන මාතර වෙරළබඩ හෝටලයට ගියා."

"එදා හවස, නව යුවළ මුහුදු වෙරළේ මඳ වේලාවක් ගත කරලා නැවත හෝටලයට පැමිණියා. ඒ දෙන්නා බොහෝම සතුටින් ප්‍රබෝධයෙන් හිටි බවට හෝටලයේ සේවක පිරිස සාක්ෂි දරනවා. රාත්‍රී අටට විතර ආහාර ගන්නට පස්සේ ඒ දෙන්නා ඒ ගොල්ලන්ගේ කාමරයට ගියා. ඒ ගිහින් සුළු මොහොතකට පස්සේ සුරේන්ද්‍ර හෝටලේ කළමනාකරුට දුරකතනයෙන් අමතලා තියෙනවා."

"කවුද අපේ කාමරේට අල්ලපු කාමරේ ඉන්න ගෑණි. ඒ ගෑණිට පිස්සු හැදිලාද කොහේද මර විකාරෙන් හිනාවෙනවා" සුරේන්ද්‍ර පැමිණිල්ලක් කළා.

"සුරේන්ද්‍ර මහත්තයා. මහත්තයා ඉන්න කාමරේ දෙපැත්තෙන් තියෙන කාමරවල කිසිම කෙනෙක් නෑ. ඒත් ඉන් එහා පැත්තේ කාමරේ නම් මහත්මයෙක් ඉන්නවා. කෝකටත් මං දැන්ම සේවකයෙක්ව යවලා ඒ හිනා හඬ ගැන හොයලා බලන්නම්."

"සේවකයින් දෙදෙනෙක් ඒ දෙපැත්තේම කාමර පරීක්ෂා කර බැලුවා. ඒ කාමර දෙකෙහිම දොරවල් අගුලුලා තිබුණ බවත්, තමන් විසින් ඒ කාමරවලට ඇතුළු වී පරීක්ෂා කරන ලද බවත, සැක

SL-Unlimited

කිරීමට කිසිම දෙයක් නැති බවත් ඔවුන් පැවසුවා."

"ඊට පස්සේ තමන්ට නුවරට කෝල් එකක් ගත යුතු බව සුරේන්ද්‍ර කියා තියෙනවා. ඒ වෙලාවේ සුරේන්ද්‍ර කතා කරලා තියෙන්නේ සුරනිමලට. හිතට ලොකු බයක් ඇති වී තිබෙන බැවින් හැකි නම් තමන් නැවතී සිටින හෝටලයට පැමිණෙන්න කියලා එයා සුරනිමලට කිව්වා. සුරනිමල ඒ වෙලාවෙම නන්දනත් එකතු කරගෙන මාතර බලා පිටත් වෙලා තියෙනවා. ඒ ගොල්ල හෝටලේට එනකොට පාන්දර දෙකට විතර ඇතිලු. එනකොට නව යුවළට හොඳටම නින්ද ගිහින්. ඉන් පස්සේ සුරේන්ද්‍ර මහත්මයා තමන්ට කතා නොකළ බව කළමනාකරු කියා තියෙනවා. ඉතින් ඒ දෙන්නත්, තමන්ගේ සහෝදරයට කරදර නොකර දෙපස තිබුණ කාමර දෙකේ නවාතැන් ගත්තා."

"නමුත් සුරනිමලලා එන්න ඉස්සර වෙලා, සුරේන්ද්‍ර හිටපු කාමරේ ලොකු කලබලයක් වෙලා. හිටි හැටියෙම කාමරේ විදුලි පහන් දැල් වුනා. කලුපාට රෙද්දකින් මුහුණ වසාගත් මිනිහෙක් ඒ දෙන්නට පිස්තෝලයක් එල්ල කරගෙන ඉන්නවා. ඒ දෙන්නට හීන් දාඩිය දාන්න ගත්තා."

"කෑ ගැහුවොත් ඔළු කුඩු වෙන්න වෙඩි තියනවා" දාමරිකයා තර්ජනය කළා.

"ඇස් දෙක ගාව තිබුණ සිදුරු දෙකත්, කට ගාව තිබුණ සිදුරත් ඇරුණාම එයාගේ මුළු ශරීරයම කළු පාට රෙදි වලින් වැහිලා."

"ඒ දෙන්නට ඇඳෙන් බැහැලා, මිනිහට පිටුපාලා ඉන්න කිව්වලු. ඒ එක්කම නිර්මලීගේ හිසට වැදුණ තදබල පහරක් නිසා එයා සිහිය නැතිව ඇඳට වැටුනලු. එයා අවදි වෙනකොට එයාගේ අතපය ඇඳට තද කරලා බැඳලා තියෙන බව තේරුණා. ඒ විතරක් නොවෙයි කටත් බැඳලා. හෙලවෙන්නවත්, කෑ ගහන්නවත් විදිහක් නෑ. සුරේන්ද්‍රට මොනවා වුණාද කියලා එයා කල්පනා කරන්න වුණා. වරින් ගොසින් එළිය වැටීගෙන එන කොට තමයි එයාට පෙනුනේ සුරේන්ද්‍ර කාමරේ නැති පිය්තිය."

"උදේ අට වෙනකලුත් නව යුවළ කාමරෙන් එළියට ආපු නැති නිසා සුරනිමලයි නන්දනයි කාමරේට දුර කතන ඇමතුම් තුන හතරක්ම දුන්නා. ඒත් ඒ එකකටවත් උත්තර දෙන්න කෙනෙක් ආව නැති නිසා ඒ ගොල්ල හෝටලයේ කළමනාකරුත් එක්ක ඇවිත් දොරට තට්ටු කරලා තියෙනවා. කවුරුවත් දොර අරින්න ඇවිත් නෑ. කළමනාකරු අතිරේක යතුරෙන් දොර ඇරියා. ඒ ගොල්ල කාමරේට ඇතුළු වුණා."

SL-Unlimited

"මනමාලියගේ අතපය බැඳලා ඇඳ උඩ. සුරේන්ද්‍ර පේන්න නෑ. නන්දන නිර්මලීගේ බැම් ලිහන අපාර් සුරනිමල නාන කාමරයට ගියා. එයා නගපු විලාපය නිසා හෝටලයේ සේවකයෝ වහාම එතනට දුවගෙන ගියා. නාන කාමරේ සුරේන්ද්‍රව එල්ලලා මරලා තිබුණා. ඇගේ කිසිම තුවාලයක් නෑ. ඒත් "රන්දෙණිගල වනාන්තය" කියන බෝඩ් එක එයාගෙ බෙල්ලෙත් එල්ලලා තිබුණා."

"පොලිසියෙන් ඇවිත් පරීක්ෂණයක් පැවැත්තුවා. ඒ ඊඟ කාමරයේ හිටියයි කියපු මහත්මයා පැදුරටත් නොකියා පිටවෙලා ගිහින්."

"කලින්දා හවස එයා ඔළුව කැක්කුමයි කියලා රෑ කෑම කාමරේටම ගෙන්න ගෙන තියෙනවා. පස්සේ සේවකයෙකුට කියලා පැනඩෝල් දෙකකුත් ගෙන්න ගෙන කිසිම හේතුවක් නිසාවත් එයාට කරදර කරන්න එපා, මගේ ඔළුව හොඳටම රිදෙනවා, ෆෝන් කෝල් එකක් ආවත් දෙන්න එපා කියලා තමයි එයා නින්දට ගිහින් තියෙන්නේ. ඒ ගැන්දෑවේ හතට විතර."

"එයාට බොන්න ගෙනාපු පැනඩෝල් පෙති දෙක මේසය උඩ තිබුණා. වතුර වීදුරුවෙන් බාගයක් විතර තමයි එයා බීලා තියෙන්නේ."

"ඒ වතුර වීදුරුවේත්, කාමරේ තැන් කිහිපයකත් තිබුණ ඇඟිලි සලකුණු, සුරේන්ද්‍ර හිටිය කාමරයේත්, නාන කාමරයේත තැන් කිහිපයකම තිබුණ නිසා මිනීමරුවා ඒ කාමරයේ හිටිය තැනැත්තාම බව පොලිසියට ඒත්තු ගියා. ඒ අනුව පොලිසිය හේමන්ත පෙරේරා කියන එම පුද්ගලයා පිළිබඳව සොයන්නට වුණා."

"එදා රාත්‍රියේ දහයට එකොළහට පමණ හොඳින් ඇඳ පැලඳ ගත්තු, උස මහත්මයෙක වැල්ලේ ඇවිදගෙන යනවා දැකපු කීප දෙනෙක්ම ඉඳලා තියෙනවා. ඒත් ඒක වැල්ලේ අයට නොපුරුදු දර්ශනයක් නොවෙයි. ඒ නිසා කවුරුත් ඒක ගණං අරගෙන නෑ."

"එදා රෑ වෙරළාසන්නයේ පදිංචි වෙලා හිටිය ත්‍රීරෝද රථ රියදුරෙකු විසින් මාතර රුවන් මහල් හෝටලයට රැගෙන ගිය පුද්ගලයා හා හේමන්ත පෙරේරා අතර තිබුණ සමානකම් බොහොමයක්ම වූ නිසා රහස් පරීක්ෂකවරයෙකු රුවන් මහල් හෝටලය වෙත ගියා."

"හේමන්ත පෙරේරා රුවන් මහල් හෝටලයට නවතින්න ඇවිත් තියෙන්නේ ඊට දවස් පහකට කලින්. හෝටලයේ සේවකයෙකු කාමරය දීමට පෙර ජාතික හැඳුනුම් පත පරීක්ෂා කරලා තියෙනවා. ඒකේ තිබුණ පින්තූරයයි හේමන්තගේ පෙනුමයි හුඟාක් දුරට වෙනස් නිසා සේවකයා සැකෙන් වගේ එයා දිහා බලනකොට "ඕක මං අවුරුදු දහයකට විතර ඉස්සර ගත්තු එකක් හලෝ" කියලා හේමන්ත කිව්වලු."

SL-Unlimited

"මිනීමැරුම වෙන්න දවස් දෙකකට කලින් රුවන් මහල් හෝටලයේ කළමනාකරු හමුවෙලා හේමන්ත මෙහෙම කියලා තියෙනවා."

"මං යාලුවෙක් හම්බ වෙන්න යනවා. අදම එන්න වෙන එකක් නෑ. ඒත් මගේ කාමරේ එහෙම තියන්න. මගේ බඩුත් කාමරේ තියෙනවා. මං ඒ දවස් වලටත් එක්ක කාමරේට ගෙවන්නම්. මගේ මෝටර් සයිකලෙත් බලාගන්න."

"එහෙම කියලා රුවන් මහල් හෝටලයෙන් පිටවෙලා ගිය හේමන්ත, තුරෝද රථයකින් නැවත ඇවිත් තියෙන්නේ ඔය මිනීමැරුම වුණ දා මහ රාත්‍රියේ. ඒ ආපු ගමන්ම හෝටලයේ බිල ගෙවලා දාලා, මෝටර් සයිකලෙත් පිටත්ව ගිහින් තියෙනවා."

"රථවාහන ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් කරන ලද විමසීමකදී, එම මෝටර් සයිකලය ජයන්ත ද සිල්වා නම් යුධ හමුදා නිලධාරියකුට අයත් එකක් බවත්, ඔහු හෝමාගම හමුදා කඳවුරෙහි සේවය කරන අයකු බවත් සොයා ගෙන තිබෙනවා."

"ජයන්ත ද සිල්වා හමු වූ විට, තමන් එම මෝටර් සයිකලය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පාවිච්චි කරන බවත්, මතක ඇති කාලයක කොළඹින් පිට එයින් ගමන් නොගත් බවත් ඔහු කියා තිබෙනවා. එය සත්‍යයක් බව පොලිසිය විසින් කරන ලද සොයා බැලීම් වලින් හෙළි වී තිබෙනවා. හැඩ රුව අතින් බැලුවාමත් ජයන්ත ද සිල්වා හා හේමන්ත පෙරේරා යනු දෙදෙනෙකුත් බවත් පොලිසිය සටහන් කරලා තියෙනවා."

"පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ කාර්යාලයෙන් විමසා බැලූ විට හේමන්ත පෙරේරා යුධ හමුදා නිලධාරියකු බවත්, මීට දෙවසරකට පමණ ඉහතදී උතුරේ හමුදා මෙහෙයුමකදී ජීවිතක්ෂයට පත්ව ඇති බවත් දැන ගන්නට ලැබී තියෙනවා."

"හේමන්ත පෙරේරා යයි සැක කළ පුද්ගලයාගෙන් ලබා ගත් ඇඟිලි සලකුණුත්, මීට පෙර රමනා ඝාතනය කළ ජගසුමනාගෙන් ලබා ගත් ඇඟිලි සලකුණුත් සමාන වීම නිසාත්, "රන්දෙණිගල වනාන්තයා" නමින් ලියා ඇති අකුරු පරීක්ෂණයට භාජනය කළ විට ඒ අකුරු වල බොහෝ සමානකම් තිබුණ නිසාත් මිනීමැරුම් දෙකම එකම පුද්ගලයකු විසින් කරන ලද ඒවා බවට පොලිසියට හොඳටම පැහැදිලි වුණා."

"නිර්මලීගේ දෙමාපියන්ට එවා තිබූ ලිපියෙහි අකුරු, තමන්ගේ පැරණි පෙම්වතා වූ අනිල්ගේ අත් අකුරු වලට සමාන බැව් නිර්මලී කියා තිබූ බැවින් ඔහුගෙන් පොලිසිය ප්‍රශ්න කළා. සුරේන්ද්‍රගේ පවුලේ අය ඝාතනයට ලක් වූ පිරිසක් බව ඔහු දැන ගත්තේ කෙසේද යන ප්‍රශ්නය ඊට කලින් ගොඩක්ම ඔහුගෙන් ප්‍රශ්න කරලා තියෙන්නේ. අනිල්

ඒ ප්‍රශ්නය මග හරින්න උත්සාහ කළත් අවසානයේදී ඔහු හමුවීමට පැමිණි අභිරහස් පුද්ගලයකු ගැන ඔහුට කියන්න සිද්ධ වුණා."

"ඔහු කී හැටියට නිර්මලී හා සුරේන්ද්‍රගේ විවාහයට මසකට පමණ පෙර හොඳ උස මහත පුද්ගලයකු ඔහු හමුවීමට පැමිණ තියෙනවා."

"නිර්මලී හරි සවුත්තු වැඩේ නේද කළේ?" ඔහු කිව්වාලු.

"ඔහේ කොහොමද නිර්මලී ගැන දන්නේ?"

"මං නිර්මලී ගැන නම් වැඩිය දන්නේ නෑ. ඒත් සුරේන්ද්‍රගේ පවුලේ අය ගැන නම් හොඳට දන්නවා. මට කනගාටු අන්තිමට නිර්මලීට අල්ලපු අත්තයි පයගහපු අත්තයි දෙකම නැති වෙන එක ගැන."

"මොකක්ද ඒ කතාවේ තේරුම?"

"ඔය සුරේන්ද්‍රගේ පවුලේ අය වලව්වක කුමාරිහාමි කෙනෙක් පැහැරගෙන ගිහින් දූෂණය කරලා මරලා දාලා තියෙනවා. ඒ කුමාරිහාමි යකෙක් වෙලා ඉපදිලා ඒ පවුලේ හැම කෙනෙක්ගෙන්ම පළිගන්නවලු. දැනටමත් ඒ අවතාරේ එක්කෙනෙක්ව වලපල්ලට යවලයි තියෙන්නේ. කොයි වෙලේ හරි අනෙක් අයටත් ඒ ඉරණම තමයි වෙන්නේ."

"එහෙම කියලා ඒ මනුස්සයා ගියාලු. ඒත් ඊට පසුවෙනිදාත් අනිල් අර පුද්ගලයා බස් නැවතුම් පළ ළඟ ඉන්නවා දැකලා තියෙනවා. අනිල් එයාගෙන් වරණ විස්තර දැන ගෙන තමයි අර ලියුම නිර්මලීගේ දෙමව්පියන්ට ලියලා එවලා තියෙන්නේ. අනිල් කියපු විදිහට ඒ මනුස්සයා දවස් කීපයක්ම නිර්මලීගේ ගෙවල් පැත්තෙත් කැරකිලා තියෙනවා. ඒ මනුස්සයා හැඩ රුව අතින් බලපුවාම හේමන්ත පෙරේරාට වඩා වෙනස්. ඔහුගේ මුහුණේ සීරීම් කැළැල් කිහිපයක් තිබුණ බවත් අනිල් කියා තියෙනවා. ඒ විස්තර කියලා දවස් දෙකක්වත් ගියේ නෑ. අනිල් ආ ගිය අතක් හොයා ගන්න බැරි වුණා."

"ඒකත් හේමන්තගේ වැඩක් කියලා සමහරු කියනවා. සුරනිමලගේ පවුලේ කට්ටිය කරපු වැඩක් කියලත් සමහරු කියනවා. ඒත් අනිල් එදා වැඩට ගිහින් ගෙදර එන අතරතුර තමයි මොකක් හරි වෙලා තියෙන්නේ. ගෙදරට කිට්ටු තැනකදී එයා වාහනයක් ළඟ දෙදෙනෙක් එක්ක කතා කර කර ඉන්නවා දැකපු කෙනෙක් ඉන්නවා. සුරේන්ද්‍රගේ හැඩහුරුකමට සමාන පුද්ගලයෙකුත් ඒ කාරෙකේ හිටි බව එයා කියලා තියෙනවා. ඒ නිසා සුරේන්ද්‍රගේ හැඩරුව හා සමාන එයාගේ කොහොඹුරු ගනයගෙන් පොලීසිය ප්‍රශ්න කරලා තියෙනවා.

SL-Unlimited

ඒත් යම් කිසි හේතුවක් නිසා ඒ පරීක්ෂණයත් අතරමග නතර කර දමලා."

"අනිල් සුරේන්ද්‍රගේ මරණයට වගකියන්න ඕන පුද්ගලයෙක් නිසා, පොලිසියට බයෙන් පැනලා ගියාද යන සැකයකුත් පොලිසියට තිබුණා. ඒ කොහොම වෙතත් අනිල් ගැනවත්, හේමන්ත ගැනවත් ඊට පස්සේ ආරංචියක් ලැබුණේ නෑ."

"පැට්‍රික්ට මේ මිනීමැරුමෙන් ගන්න පුළුවන් හෝඩුවාවක් තියෙනවද?"

"ඔව් අංකල්. සමහරවිට මං කලින් හිතාගෙන හිටියට වඩා වෙනසක් මට පෙනෙනවා. හැබැයි ඒක වෙන්නේ අනිල්ගේ සාක්කියේ දුබලතම විධියි. එයාගේ සාක්ෂිය පිළිගන්න පුළුවන් එකක්ද? එයා වෙන කවුරුහරි වෙනුවෙන් බොරු සාක්කි දුන්නද? කියන එක තමයි තියෙන සැකය?"

"ඇත්තටම අනිල් කියපු හැඩහුරුකම තියෙන පුද්ගලයව දැකපු දෙතුන් දෙනෙක්ම ගමේ ඉඳලා තියෙනවා. විවාහයට සති දෙක තුනකට කලින් නිර්මලීගේ ගෙදර අලුත් වැඩියා කරලා තියෙනවා. ඒ වැඩ කරපු බාස් කෙනෙක් පොලිසියට කියලා තියෙනවා, අනිල් කියපු හැඩහුරුකම තියන පුද්ගලයෙක් එයත් එක්ක කතා කරපු බවක්. වැඩපලේ යාළුවෙකුත්, එවැනි හැඩ හුරුකම තියෙන පුද්ගලයෙක් එක්ක අනිල් යැහෙන වෙලාවක් කතාකරමින් ඉන්නවා දැකලා තියෙනවා."

"එහෙනම් මං හිතන විදියට මේක තනි පුද්ගලයකු කරපු දෙයක් නොවෙයි. පුද්ගලයින් දෙන්නෙක් මේකට සම්බන්ධ බව පේන්න තියෙනවා. එක්කෙනෙක් ඔත්තු බලන්න ආපු කෙනෙක් වෙන්න පුළුවන්."

"මට ප්‍රශ්නයක් අහන්න තියෙනවා පැට්‍රික්. මේ මිනීමැරුම් දෙකම වෙන්න කලින් ආපු අර "මර හීනාව" මොකක් කියලද ඔයා හිතන්නේ?"

"ඒක හිතේ ඇති වුණ හිතිවිල්ලක් වෙන්න ඇති. ඔය කියන හඬ නිර්මලීට ඇහිලා තියෙනවද?"

"ඔව්. එයාටත් ඇහුනලු. එයත් හොඳටම බයවෙලා තියෙනවා."

"ඒ ගැන දැන්ම මට හරියට මුකුත් කියන්න බෑ. සමහර විට සුරනිමලගේ පවුලේ අයව බය කරවන්න ඒ වගේ මර හීනාවක් රෙකෝඩ් කරගෙන ඇවිත් දාන්නත් පුළුවන්. හැබැයි මට එකක් තේරුම් ගියා. මිනීමරුවා කවුද කියන එක ගැන වැටහීමක් සුරනිමලලාට ඇති වෙලා තියෙනවා. සමහර විට ඒක ආවේ අනිල්ගේ සාක්කියෙන් වෙන්න ඕනේ. අංකල් විල්සන් දැකලා තියෙනවනේ. එයාගේ මුහුණේ

www.sinhalalibrary.com
SL-Unlimited

සීරීම් කැලැල් එහෙම තිබුනද?"

"නෑ. එයාගේ නම් එහෙම තිබුනේ නෑ. මට මතක හැටියට ටික්කුංගේ මුහුණේ නම් එහෙම කැලැල් වගයක් තිබුණා."

"මං හිතුවා හරි. ඒ ගොල්ල ටික්කුංට සැක කළා. අංකල් කීවිවේ පස්සේ දවසක හමුවුණාම වජාලියාව අංකල්ලාට කවදාවත් අල්ලගන්න ලැබෙන්නේ නෑ කියලා සුරනිමල කියපු බව. ඒ කියන්නේ මේ මිනීමැරුමෙන් පස්සේ සුරනිමලයි නන්දනයි ටික්කුංව අල්ලගන්න ඇති. සමහර විට අනිල්වත් අල්ලගන්න ඇත්තේ එයාලම වෙන්න ඇති. ඒ ගොල්ල හිතන්න ඇති ටික්කුං මැරුවාම ප්‍රශ්නේ ඉවරයි කියලා. නමුත් නියම වජාලියා ටික්කුං නොවෙයි."

"එතකොට එහෙනම් විල්සන් තමයි වජාලියා?"

"නෑ. මං හිතන්නේ නෑ. විල්සන් වජාලියා නම්, ජයසුමන විදිහට ආවේන විල්සන් වෙන්න ඕනේ. එහෙමනම් රම්‍යා විල්සන්ව අඳුන ගන්නවා. ඒ නිසා ඒ විල්සන් වෙන්න බෑ. තවත් කේස් තියෙන නිසා ඒ කවුද කියලා අපට දැන ගන්න පුළුවන් වේවි. අපි එහෙනම් ඊළඟ කේස් එක ගනිමු."

•••

"සනත් කියන්නේ සුරේන්ද්‍රට බාල සහෝදරයා. එයා සුරනිමල මුදලාලි අනතුම් ව්‍යාපාරයට බහින්න ඉස්සරවෙලා කරපු ව්‍යාපාරය භාරගෙන තියෙනවා. වැල්ලවාය - කොළඹ මාර්ගයේ වැලිපන්න කියන නගරයේ තේ හා සිල්ලර කඩය එයා බොහොම කැමැත්තෙන් භාරගෙන කරගෙන ගිහින් තියෙනවා."

"1983 අගෝස්තු දහසය වෙනිදා, රාත්‍රී දහයාමාරට විතර හම්බන්තොට යන අන්තිම බස් එක කඩය ඉඟ නතර කරල පිටත් වෙලා ගිහින් තියෙන්නේ. කඩේ වැඩට උදව් කරන ගමේම මිනිහෙක් වෙන ප්‍රේමදාස කඩේ අස්පස් කරනවා. සනත් එදා දවසේ කඩේ ගණන් හිලව් බලන්න එයාගේ කාමරේට ගියා."

"කඩේ බිම හෝදලා දැම්මට පස්සේ, පහළ තියෙන ළිඳ ගාවට ගිය ප්‍රේමදාස මූණකට හෝදගෙන, සිගරට් එකකුත් බීලා, එයාගේ කාමරේට ගියා නිදාගන්න. එයාට එක සැරේටම සනත් කෑ ගහන සද්දේ ඇහුනා."

"ප්‍රේමදාස.. ප්‍රේමදාස.. යකෝ ප්‍රේමදාස.."

"ඒ හඬේ ගැබ් වෙලා තිබුනේ හරිම භීතියක්. ප්‍රේමදාස සනත් හිටපු කාමරේට දුවගෙන ගියාලු. සරමක් විතරක් ඇඳගෙන, උඩු කය විවෘතව හිටිය සනත්ගේ ඇඟෙන් ෂෝ ගාලා දාඩිය දානවා. ඇය

SL Unlimited

දෙකත් ලොකු වෙලා. හරියට හොල්මනක් දැකපු කෙනෙක් වගේ."

"ඇයි මුදලාලි?"

"උඹට ඇහුනද යකෝ අර මර හිනාව?"

"හිනාව? කාගේ හිනාවද?"

"අර ගෑණියෙක්ගේ මර හිනාව?"

"නෑ මුදලාලි මට නම් ඇහුනේ නෑ."

"කඩුවත් අරගෙන පොඩ්ඩක් කඩේ වටේ ගිහිං බලපං."

"හදිසියෙන් වත් එන්න පුළුවන් හොර හතුරු උවදුරකට මුහුණ දෙන්න කියලා ප්‍රේමදාස එයාගේ කාමරේ කඩුවකුත් හංගගෙන ඉන්නවා. මිනිහා කාමරේට ගියා කඩුව ගන්න. එයාගේ කාමරේ තියෙන්නේ කඩේ පිටිපස්සට වෙන්න. එයාට එතනට යන්න ලැබුණේ නෑ. බෙල්ලට වැදුන පාරක් නිසා මිනිහට සිහිය නැති වුණා. කොච්චර වෙලා සිහිය නැතිව හිටියද කියන්න එයා දන්නේ නෑ. සිහිය එනකොට මිනිහා හිටියේ මිනිහගේ කාමරේමයි. අතපය බැඳලා. හෙලවෙන්නවත් විදිහක් නෑ. එලිවෙන පාන්දර එයාට ඇහිලා තියෙනවා නොන්නෝ හාමි කතා කරන සද්දේ. නොන්නොහාමි කියන්නේ කඩේට ඉදිආප්පත් හදාගෙන එන ඒ ගමේ ගෑණු කෙනෙක්."

"මොකෝ මුදලාලි තවම ලාම්පුව වත් පත්තු කරලා නැත්තේ? දොරවලුත් ඇරලා දාලා.. තාම බුදි ද? ප්‍රේමදාස මල්ලියේ.. ප්‍රේමදාස මල්ලියේ.."

"ඒ එක්කම එයාට ඇහිලා තියෙනවා ලොකු විලාපයක්."

"මගේ අම්මෝ.. මේ මොන විපත්තියක්ද?"

"නොන්නොහාමි විලාප දීගෙන කඩෙන් එලියට පැන්නා. ටික වෙලාවකින් ඒ අහල පහල පදිංචි වෙලා හිටිය කීප දෙනෙක්ම කඩේට දුවගෙන ආවා."

"සනත්ව එයාගේ කඩේ කාමරේම එල්ලලා මරලා. ඇඟපතේ තිබුණ තුවාල වලින් ඕනෑම කෙනෙකුට කියන්න පුළුවන් එයාව එක සැරේටම එල්ලලා මරපු නැති බව."

"එයාගේ කටේ පාංකඩ ඔබලා. කරේ "රත්දෙණිගල වනාළයා" කියන බෝඩ් එක එල්ලලා තිබුනා. සනත් ගණං හිලව් ලියපු පොත එතකොටත් දිග ඇරලා දාපු ගමන්. ඒකෙත් ලේ. සනත්ව මරපු මිනිහා හොරකමකට ආපු කෙනෙක් නොවන බව පෙනුනේ තාමත් ඒ කාමරේ තිබුණ සල්ලි පෙට්ටිය කාසි වලින්, නෝට්ටු වලින් පිරිලා තිබුණ නිසා."

www.sinhalelibrary.com
SL-Unlimited

"සතප් හිටපු කාමරේ ඉඳලා ලිඳ ගාවට යනතම් ලේ සහිත අඩි පාරක් තිබිලා තියෙනවා. ලිඳ ගාව ලේ තවරුණ සරමකුත්, කමිසයකුත් තිබුණා. මිනීමරුවා වැඩේ අවසාන වුණාට පස්සේ ලිඳෙන් නාලා තියෙන බව ඒකෙන් ඒත්තු ගියා."

"කඩේට සැතපුම් භාගයක් විතර දුරකින්, පැහැපත් පෙනුමක් තියෙන, අඩි පහමාරක් පමණ උස, හැඩි දැඩි කෙනෙක් ඒ වෙලාවේ ගමන් ගත්ත ලොරියකට අතපාලා තියෙනවා."

"මං යාළුවෙක්ගෙ ගෙදර ආවා. දන්නෙම නැතුව රෑ වුණා. දහයාමාරේ අන්තිම බස් එකත් මිස් වුණා. කඩේ මුදලාලිත් එක්ක ටික වෙලාවක් කතා කර කර හිටියා. ඔය යන බඩු ලොරියක එල්ලිලා යන්න බලන්න කියලා මුදලාලිත් නිදාගන්න ගියා."

"කොහාටද මහත්තයට යන්න ඕනේ."

"හම්බන්තොටින් මාව බැස්සුවොත් ලොකු උදව්වක්."

"ලොරි රියදුරා එයාව බස්සලා තියෙන්නේ හම්බන්තොටින්. ලොරි රියදුරාටත් රුපියල් දහයක් දීලා තමයි මිනිහා ගිහින් තියෙන්නේ. මෙ පාර නම් මිනීමරුවා බොහොම කල්පනාවෙන් වැඩ කරලා තියෙනවා. කිසිම තැනක ඇඟිලි සලකුණු නෑ."

"එදා අන්තිමට ගියා යැයි කියන දහයාමාරේ බස් එකේ හිටිය මගීන්ගෙන් තවත් විස්තර ටිකක් දැනගන්න ලැබිලා තියෙනවා."

"බස් එක කඩේ ගාව නවත්තලා ටික දුරක් ගියාට පස්සේ එක මගියෙක් කොන්දොස්තරට කියලා තියෙනවා, එයාට ඉස්සරහ සීට් එකේ හිටපු උස මහත්තයා දැන් බස් එකේ නෑ කියලා."

"ඔව් ඔව්. ඒ මහත්තයා පත්තරේ බල බලම තමයි ආවේ. කඩේ ගාවදි වැසිකිලිය පැත්තට යනවත් මං දැක්කා" තවත් මගියෙක් කිව්වා.

"කලබල වෙන්න දෙයක් නෑ. ඒ මහත්තයා ටිකට් එක ගත්තේ ඒ කඩේ ගාවට තමයි" කොන්දොස්තර කිව්වා.

"පොලීසිය ඒ කියන මහත්තයා ගැන විපරම් කරලා තියෙනවා. ඒ මහත්මයා බස් එකට නැගලා තියෙන්නෙ බණ්ඩාරවෙලින්. අඩි පහමාරක් විතර උස, කොණ්ඩේ කොටට කපපු, කඩවසම් පෙනුමක් ඇති, උසට සරිලන මහතින් යුතු ඔහු නිල්පාට කමිසයක් හා කලුපාට කලිසමක් ඇඳගෙන ඉඳලා තියෙනවා. අතේ කලුපාට ට්‍රැවලින් බෑග් එකකුයි, පත්තරේකුයි තිබිලා තියෙනවා. මුණේ වත්, ඇඟපතේවත් කියන්න තරම් ලකුණක් තිබිලා නෑ. ගමේ අයගෙන් විපරම් කරලා බැලුවාම, එදා ඒ බස් එකෙන් ගමට ආපු කෙනෙක් නෑ. ලොරි

www.sinhalalibrary.com
SL-Unlimited

කාරයගෙන් විපරම් කරලා බැලුවාම, ඇඳුං හිටි ඇඳුම ඇරුණාම හැඩරුව ඒ කියපු ඒවාට මැච් වෙනවා. කලුපාට ට්‍රැවලින් බෑග් එකත් ඒ මනුස්සයා ගාව තිබිලා තියෙනවා. ළිඳ ළඟ ගුලිකරලා දාලා තිබුණ ඇඳුම් වගයක ගල් තැවරුණ කලුපාට කලිසමක් හා නිල්පාට කමිසයක් තිබුණ නිසා මිනීමරුවා ඒ මහත්මයාම බව පොලිසියට ඒත්තු ගියා. ඒ ඇරෙන්න වෙන කිසිම දෙයක් සොයා ගන්නට පොලිසියට බැරි වුණා."

"අත් අකුරු පරීක්ෂණයට භාජනය කරලා නැද්ද?"

"ආ.. ඔව්.. අත් අකුරු කලින් තිබුණ බෝඩ්වල අකුරු වලට සමාන බව වාර්තා වෙලා තියෙනවා."

"පැට්‍රික් මොකද මේ මිනීමැරුම ගැන කියන්නේ?"

"මේකත් පළිගැනීමකට කරපු එකක්. සනත් කරපු වරදකට කළ පළිගැනීමක්. සුරේන්ද්‍රගේ ඇගේ කිසිම තුවාලයක් තිබුණේ නැහැනේ. ඒහෙන් මං හිතන්නේ එයාගේ මරණය, එයා කරපු වරදකට වුණ දෙයක් නොවෙයි. හැබැයි මේක නම් සනත් කරපු දරුණු වරදකට කළ පළිගැනීමක්. මට හිතෙන්නේ නම් මේකත මියුරියෙල්ට කළ දේට කළ පළිගැනීමක් කියලා. සමහර විට අනිල්ට කළ දෙයට කරපු පළිගැනීමක් වෙන්නත් පුළුවන්. ඒකට සනත්ව සැක කරලා තිබුණානේ. එහෙම නැත්නම් අපි නොදන්න වෙනත් වරදක් හින්දා කළ පළිගැනීමක් වෙන්නත් පුළුවන්. ඒ එක්කම මිනීමරුවා කිසි කලබලයකින් තොරව එයාගේ කාර්යයෙහි යෙදිලා තියෙන බව පෙනෙනවා. මිනීමැරුමෙන් පස්සේ නාපු බවත් පෙනෙන නිසා හොඳ පලපුරුදු, දැඩි හිතක් ඇති කෙනෙක් කියලා හිතන්න පුළුවන්."

"පොලිසියට ඊට වඩා යමක් කරන්න පුළුවන් කම තිබුණාද?"

"ඔව්. මං හිතන්නේ දැන් මිනීමැරුම් තුනක්ම මේ එක සැක කටයුතු පුද්ගලයකු අතින් සිදු වුණ නිසා, මියුරියෙල්ගේ පවුලේ අය ගැන සොයන්න තිබුණා. ඒ අයගේ අනුදැනුමකින් තොරව මෙහෙම දෙයක් වෙච්ච කියලා හිතන්න අමාරුයි. ඒත් ඒක සැකයක් විතරයි. දැන් අපි ඊළඟ එක බලමු."

●●●

"හොඳයි ඊලඟට තියෙන්නේ නිමලසිරිගේ මරණය පිළිබඳ වාර්තාව. නිමලසිරි තමයි සුරනිමලගේ පවුලේ බාලයා. එයත් සුරනිමලගේ ව්‍යාපාර කටයුතු වලට උදව් කරගෙන හිටි කෙනෙක්. 1990 අප්‍රේල් මාසේ අවුරුද්දට වාර්ෂිකව පැවැත්වෙන නිමි ඇඳුම් පිටරට යවන නිෂ්පාදකයින්ගේ රැස්වීම පැවැත්වුණා. ඒ අයට තියෙන ප්‍රශ්න

SL-Unlimited

ගැනත්, ව්‍යාපාරය තවත් දියුණු කරගෙන යා හැකි ක්‍රම පිළිබඳවත්, රජයෙන් ලබා ගත හැකි ආධාර ආදිය ගැනත් සාකච්ඡා කෙරෙන රැස්වීමට, සුරනිමලයේ ව්‍යාපාර වෙනුවෙන් නිමලසිරි සහභාගි වෙලා තියෙනවා."

"රැස්වීම අවසානයේ නිමලසිරි, සුනන්ද කියන තවත් ව්‍යාපාරිකයකු එක්ක කතා කර කර ඉන්න වෙලාවේ නිමලසිරිව දැකපු හොඳට ඇඳ පැළඳ ගත්තු මහත්මයෙක් "හා..ලෝ.." කියාගෙන ළඟපාතට ඇවිත් තියෙනවා."

"කොහොමද ඉතිං? අද අයියා ආවේ නැද්ද?" කියලා තමයි එයා කතාව පටන් අරං තියෙන්නේ. එයාගේ නම හේමචන්ද්‍ර බවත්, එයාගේ ව්‍යාපාරික කටයුතු අරඹන්න සුරනිමල හුඟක් උදව් කළ බවත් එයා කියලා තියෙනවා. ඒ දෙන්නගේ කතාව යන අතරතුර සුනන්ද ඒ අයගෙන් සමුගෙන පිටත්ව ගිහින් තියෙනවා."

"ඊට පහුවෙනිදා උදේ හොරණ ග්ලෙන්බරින් රබර් වත්තට කිරි කපන්න ගිය ගැහැණු කෙනෙක්, මිනියෙක් ගහක එල්ලලා තියෙනවා දැකලා පොලිසියට වාර්තා කරලා තියෙනවා. පොලිසියෙන් ඇවිත් මරණ පරීක්ෂණ කටයුතු ආරම්භ කළා. එයාගේ කරේ දාලා තිබුණ "රන්දෙණිගල ව්‍යාඝ්‍රයා" කියන බෝඩ් එක දැකපු ගමන්, ඒ පිළිබඳව විස්තර ටිකක් කලින් දැනගෙන හිටපු ඉන්ස්පෙක්ටර් වරයා සුරනිමලට ඒ බව දැනුම් දීලා තියෙනවා. එතකොටත් ඒ ගොල්ල නිමලසිරිව හොයනවා. අවිවාහකයෙක් වුණ නිමලසිරි ඉඳලා තියෙන්නේ සුරනිමල එක්ක. එයා ඇවිත් ඒ නිමලසිරි බව අඳුනගෙන තියෙනවා. බෙල්ල හිරකරලා මරලා තමයි එයාව එල්ලලා තියෙන්නේ."

"ඇඟපතේ සීරීම් ලකුණක්වත් නැති නිසා මැරෙන්න ඉස්සර ඔහු කා එක්ක හරි අරගලයක් නොකරපු බව මරණ පරීක්ෂක වරයා නිරීක්ෂණය කරලා තියෙනවා. රුධිරයේ තිබුණ මත්පැන් ප්‍රතිශතය අනුව නිමලසිරි හොඳටම බීලා තිබෙන බවත් ඔහු ප්‍රකාශ කළා. එයාගේ කාර් එක දෙහිවල ස්ටේෂන් එක ගාව නතර කරලා තිබිලා පොලිසිය හොයා ගත්තා. ඒ කාර් එකේ තිබුණ ඇඟිලි සලකුණු අතර කලින් මිනීමැරුම් කළ පුද්ගලයාගේ ඇඟිලි සළකුණු තිබීම නිසා මෙයත් එයාගේම වැඩක් බව පොලිසිය තීරණය කළා."

"එදා පවත්වපු මේ සම්මන්ත්‍රණය වීඩියෝ ගත කරපු කෙනෙක් ඉඳලා තියෙනවා. පොලිසියට ඒක ආරංචි වුණාම ඒ වීඩියෝ ගත කරපු පුද්ගලයව මුණ ගැහිලා වීඩියෝ පටිය ඉල්ලලා තියෙනවා. නමුත් ඒක වෙනත් පුද්ගලයකු විසින් සෑහෙන මුදලක් ගෙවා එයාගෙන් ගත් බව ඒ තැනැත්තා ප්‍රකාශ කරලා තියෙනවා. ගත්තු පුද්ගලයා

විශ්ණුගෙන් එයා සඳහන් කලේ නන්දන තමයි. නන්දනගෙන් ඒක පොලිසිය ඉල්ලගන්න ගියාම තමන් අතින් එය නැති වුණ බව එයා ප්‍රකාශ කළා. ඒක තිබුණා නම්, හේමචන්ද්‍ර කියන පුද්ගලයාව දුටු සුනන්දට එය පෙන්වා, පළමුවරට මිනීමරුවාගේ ගැඩරුව නිසි පරිදි දැක ගන්නට තිබුණා. නමුත් ඒ චාන්ස් එක නන්දන කළ වැඩේ නිසා පොලිසියට අහිමි වුණා."

"සුනන්ද නිමලසිරිගෙන් සමුගෙන ගියාට පස්සේ ඒ හමු වුණ අභිරහස් පුද්ගලයත් සමඟ හෝටලයේ බාර් එකට ගිහින් තියෙනවා. ඒ දෙන්නා එතනින් පිටත්වෙලා තියෙන්නේ හොඳටම බීමත්ව. නිමලසිරිව වාත්තුකරගෙන ගිය අභිරහස් පුද්ගලයා නිමලසිරිගේ කාරෙකට නගිනවා දැකපු මුරකාරයෙකුත් ඉන්නවා. නමුත් ඒ ඇරෙන්න ඒ පුද්ගලයා ගැන වැඩි තොරතුරක් හොයා ගන්න බැරි වුණා."

"එච්චර තමයි මේ පසුගිය කාලේ සිදුවුණ මිනීමැරුම් ගැන මට හොයා ගන්න පුළුවන් වුණ විස්තර තියෙන්නේ?"

"බොහොම හොඳට ජයන්තගේ රාජකාරිය කරලා තියෙනවා. දැන් ජයන්ත නුවර ගිහින් සුරනිමලගේ මරණය පිළිබඳව කෙරෙන පොලිස් පරීක්ෂණ කටයුතු කරන අයත් එක්ක සහයෝගයෙන් වැඩ කරන්න. ඒ පිළිබඳව සාක්ෂි දෙන අය ගැන හෙමිල්ලෙන් ඉන්න. ඒ ගොල්ල සාක්කි දෙන ආකාරය ගැන විමසිලිමත් වෙන්න. නොයෙකුත් හේතු නිසා සත්‍යය වසන් කරන අය ඉන්න පුළුවන්. ඒ ගොල්ල වචන වලින් නොකියන දේවල් ඉරියව් වලින් කියවෙන්න පුළුවන්. ඒ හැම දෙයක්ම සටහන් කරගන්න. මේ මරණය වෙන්න දින දෙක තුනකට විතර ඉස්සරවෙලා සිදුවුණ දේවලින් සමහර විට මේ මරණය සිදුවීමට හේතුවක් හොයා ගන්න පුළුවන්. ඒ නිසා ඒ දින කිහිපයත්, විශ්ණුගෙන් අවසාන දිනය එයා ගත කළ ආකාරය ගැනත් හොඳින් හොයලා බලන්න. සැක කටයුතු දෙයක් සිදුවෙන බව පෙනෙනවා නම්, එහෙම නැත්නම් සැක කටයුතු ආකාරයට හැසිරෙන පුද්ගලයෙක් ඉන්නවා නම් ඒ ගැන කෙළින්ම වාර්තා කරන්න. මේ ගැන සම්පූර්ණ වාර්තාවක් තව දින තුනකින් විතර මට ලැබෙන්න සලස්වනවා නම් හොඳයි."

ජයන්ත ඔවුන්ගෙන් සමුගෙන පිටවී ගියේය.

"පැට්‍රික් හෙට නිරංජලා හමුවෙන්න යනවා නේද?"

"ඔව් අංකල්. එයාගෙනුත් අපට වැදගත් තොරතුරක් හොයා ගන්න පුළුවන් වේවි."

●●●

SL-Unlimited

# 5

පසු දින දිවල් දහය පමණ වන විට ගංගොඩවිල පිහිටි නිරංජලා වික්‍රමසිංහ මෙනෙවියගේ නිවෙස වෙත පැට්‍රික් පැමිණියේය. නිවසට ඇතුළුවන ගේට්ටුව විවෘතකර තිබුණ නමුත් ඔහු මහා මාර්ගය අයිනෙහි මෝටර් සයිකලය නතර කර නිවෙස දෙස සුපරීක්ෂාකාරීව බැලුවේය.

වසර පනහක් පමණ පැරණි යැයි සිතිය හැකි එම නිවස, අසළ තිබූ අනෙක් නිවාස වලට වඩා පැරණි බවක් ඉසිලීය. එසේ වුවද සුවඳ මිලින් එම ගෙවත්ත අලංකාර වී තිබුණි. නිවසට සෙවන දෙන විශාල වෘක්ෂයන් කිහිපයක්ම තිබුණ අතර මාර්ගයෙහි සිට නිවසට ඇතුළුවන ඉස්තෝප්පුව දක්වා වූ මාර්ගය සුදු වැලි අතුරා සකස් කර තිබුණි. පැට්‍රික් සිය මෝටර් සයිකලය එම මාර්ගයට යොමු කළ විට, සුදු වැලි එතරම් ඝනට අතුරා නැති බව අවබෝධ කර ගත්තේය.

වයස අවුරුදු හතලිස් පහක පමණ යැයි සිතිය හැකි, ඉතා හොඳට හැඳ පැළඳ සිටි කාන්තාවක් නිවස තුළ සිට ඉස්තෝප්පුවට පැමිණියා ය. ඉතා සුහද සිනහවකින් මුව සරසා ගත් ඇය ඇසි පිය නොහෙලා මඳ වේලාවක් ඔහු දෙස බලා සිටියේ ඔහු කොහෙනකදී හෝ මීට පෙර හමු වී තිබුණත් ඒ කොහෙනද්දැයි තීරණය කිරීමට නොහැකිව බව පැට්‍රික් නොදැන සිටියේය.

"ඔබ පැට්‍රික් වෙන්නට ඇතැ"යි ඇය ඇසුවා ය.

"ඔව්. මම පැට්‍රික්. ඔබ නිරංජලා නේද?"

"ඔව්. එන්න පැට්‍රික්. අපි කන්තෝරු කාමරයට ගිහින් කතා කරමු."

එහි යොස් අසුන්ගත් වහාම "අපි එහෙනම් යාකච්ඡාවට බහිමු නේද? මොකක්ද මිස්ටර් පැට්‍රික්ට මගෙන් කෙරෙන්න ඕන උදව්ව?" කියා නිරංජලා ඇසුවාය.

මඳ වේලාවක් නිහඬව ඈ දෙස බලා සිටි පැට්‍රික් ඇගේ ඉරියව් අධ්‍යයනයට ලක් කළේ ය.

"මට මිස් නිරංජලාගෙන් බොහෝම වැදගත් ආරංචියක් දැන

ගන්න ඕනේ. පහුගිය අවුරුදු විස්සක විතර කාලයක් තිස්සේ කෙරීගෙන යන මිනීමැරුම් මාලාවක් තියෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණ කටයුතු කරන්න මට භාර වෙලා තියෙනවා. කවුරු කළාද කියලා ඔප්පු කරන්න සාක්ෂි නැතත්, මේ මිනීමැරුම් මාලාවට සම්බන්ධ ප්‍රධාන සැකකරු විදිහට අපි හිතාගෙන ඉන්න පුද්ගලයා .. "

"පැට්රික්. මට බොහොම කනගාටුයි. ඒ ගැන කතා කරන්න මම කැමති නෑ. ඒත් මං එකක් කියන්නම්. පොලිසිය ගමන් කරන්නේ වැරදි පාරක. ඔබ කියන්න යන පුද්ගලයා ගැන මං දන්නවා. මං හොඳට දන්නවා. එයා ගැන හොඳට දන්න ඕනම කෙනෙක් කවදාවත් එයා ඔය වගේ දේකට සම්බන්ධයි කියලා හිතන්නේ නෑ. මට වැඩියම කනගාටු ඒකයි."

"හොඳයි නිරංජලා. අපි යන පාර වැරදියි කියලා ඔබ කියනවා නම් මාත් ඒක පිළිගන්න සතුටුයි. ඔයා නීතිඥවරියක් නේ. ඉතිං ඔයාට ඒක ඔප්පු කරන්න පුළුවන්ද?"

"මං ඒ ගැන කතා කරන්න කැමති නෑ."

"ඒ කියන්නේ ඔයාට ඒ ගැන කතා කරන්න එපා කියලා ඒ පුද්ගලයා නීතියක් දාලා තියෙනවද?"

"නෑ පැට්රික්. මං මගේ අතීතය දිහා හැරිලා බලන්න කැමති නෑ."

"ඒ වුනත් ඔයා දෙන හෝඩුවාවකින් අනාගතයේදී සිදුවිය හැකි මිනීමැරුම් කිහිපයක්ම වළක්වා ගන්න පුළුවන් නිරංජලා."

"විල්සන් කියන්නේ මැස්සෙක්වවත් මරන්න නොහිතන, හරිම කරුණාවන්ත හදවතක් ඇති පුද්ගලයෙක්. මට හිතා ගන්න බැරි එයා ගැන හොඳට දන්න හැරිසන් ජයසුන්දරවත් ඇයි එයාගේ නම නිදොස් කරන්න ඉදිරිපත් නොවුනේ කියලයි."

"මට විතරක් නොවෙයි නිරංජලා, හැරීටත් ඕනේ විල්සන් සූරියබණ්ඩාර නිදොස් පුද්ගලයෙක් බව ලෝකයාට පෙන්නලා දෙන්න තමයි. ඒක කරන්න ඔයා මට උදව් කරන්න ඕනේ. ඔයා ඒ ගැන දන්න දේවල් මට කිව්වොත්, අපට ඉතාම පහසුවෙන් එයාගේ නම සුද්ද කරන්න පුළුවන්. අන්න ඒ නිසාම තමයි මං නිරංජලා හමුවෙන්න ආවේ."

"බොහොම කනගාටුයි පැට්රික්. මට ඒ උදව්ව කරන්න බෑ."

"නිරංජලා. මට බෑ කියන්න එපා. පොලිසියේ රාජකාරියටත් වඩා මේක මගේ පෞද්ගලික වුවමනාවක්. මට ඕනේ මගේ පරම්පරාවේ, රන්දෙණිගල සිංහයාගෙන් පැවත එන ඒ සූරියබණ්ඩාර පරපුරේ

SL Unlimited

නාමය නිර්දෝෂ කරන්න."

"ඔයා කවුද? " ඒ වදන් වලින් තැති ගැන්වුන නිරංජලා ඇසුවාය. ඇය ඒ සමයම ඔහු දෙස බලා සිටියේ ඔහු දුටු විට හොඳට දැක පුරුදු මුහුණක් බව සිහියට නැගුනේ මක් නිසාද යැයි යන්නද යලි සිහියට නගමින්. පැට්රික් කිසි කලබලයක් නැතිව ඇයට මදක් සිතන්නට අවකාශ දුන්නේ ය.

"මට ඇත්ත කියන්න පැට්රික්. ඔබ කවුද?"

ඇගේ මුහුණෙහි වූ දැඩි බව දැන් පහ වී ගොස් ඇත. පැට්රික් බලා සිටියේ එම අවස්ථාව උදාවන තුරුය. දැන් ඇයටද ඔහු පිළිබඳව දැන ගැනීමට අවශ්‍යතාවයක් ඇති වී තිබේ. එය ඔහුගේ මේ ගමනේ සාර්ථකත්වය උදාකරලීමට ඉවහල් වන බව ඔහු දුටුවේ ය.

"විල්සන්ට හිටි වැඩිමහල් සහෝදරයෙක් පිළිබඳව ඔහු ඔබට කියලා ඇති නේද?"

"ඔව්. එයාට නෙල්සන් කියලා සහෝදරයෙක් හිටි බව එයා මට කියලා තිබුණා."

"මම තමයි ඒ නෙල්සන් සූරියබණ්ඩාරගේ පුතා. පැට්රික් සූරියබණ්ඩාර."

නිර්මලා කුමක් කියන්නදැයි නොදැන ඔහු දෙස මඳ වේලාවක් බලා සිටියේය. ඔහුට ඇය දැන් පෙනෙන්නේ විල්සන් ලෙසටමය. සැබවින්ම විල්සන්ට බොහෝ සෙයින් සමාන රූ සපුවක් ඔහුට හිමි වූයේ කෙසේදැයි දැන් ඇයට වැටහේ. පැට්රික් ද ඇයට සිතන්නට මඳ වේලාවක් ඉඩ දුන්නේ ය.

"හොඳයි මං මේ කියන කිසිම දෙයක් වෙන කිසිම කෙනෙකුට නොකියන බවට පොරොන්දු වෙනවා නම් මං ඔයා අහන ප්‍රශ්න වලට දන්න හැටියට උත්තර දෙන්නම්."

"බොහොම ස්තූතියි නිරංජලා. මට දැන ගන්න ඕනේ විල්සන් අංකල් නීති විද්‍යාලයෙන් ඉවත් වුණේ ඇයි කියන එකත්, ඉන් පස්සේ ඔබත් ඔහුත් අතර යම් අදහස් හුවමාරු කර ගැනීමක් වුණා නම් ඒ පිළිබඳ විස්තරයකුත් තමයි."

"මං ඒකට උත්තර දෙන්නම්. හැබැයි මම කියපු පොරොන්දුව ඔබ දෙන්න ඕනේ."

"ඔව්. මේ ගැන කිසි දෙයක් කිසිම කෙනෙකුට නොකියන බවට මං පොරොන්දු වෙනවා."

www.sinhalaelibrary.com
SL Unlimited

"මං කොතනින්ද පටන් ගන්නේ? ඔයාගේ අප්පච්චී දුර දිග නොහිතා කරගත්ත විවාහය නිසා සීයාගේ පවුලට සිදු වුණ විපත ඔයා දන්නවාද?"

"ඔව් මං ඒ ගැන දන්නවා."

"මං එහෙනම් ඉන් පස්සේ වෙච්ච දේවල් වලින් කතාව පටන් ගන්නම්" කී නිර්මලා මොහොතක් නිහඬව සිටියේ ඒ කතාව සිහි ගන්වා ගැනීමටය.

●●●

"අම්මගෙත්, අප්පච්චීගෙත් අවසාන කටයුතු වලින් පස්සේ විල්සන්ගේ ජීවිතේ හුඟාක් වෙනස් වුණා. මට විල්සන් කීප වතාවක්ම කිව්වා "ඔයා නොහිටියානම් මං මොනවා කරන්නද කියලා මට හිතා ගන්න බෑ" කියලා. මමත් පුළුවන් තරම් එයාගේ හිත හදන්න නොයෙකුත් දේවල් කිව්වා."

"විල්සන් කොහොමටත් ආගමට දහමට හුඟක් ලැදි කෙනෙක්, අපි ඒ කාලේ ආසාවෙන් නවකතා පොත් කියවනවා වාගේ එයා ආසාවෙන් කියවන්නේ ධර්මය පිළිබඳ පොත පත තමයි. අර සිද්ධියෙන් පස්සේ එයා තව තවත් දහමට සමීපව කටයුතු කරන්න වුණා. හැම පෝයදාකටම සිල් ගන්නත් එයා පෙළඹුනා."

"විල්සන් කැළණිය පැත්තේ, ඒ ගොල්ලන්ට දුර නෑ කමක් තියෙන ගෙදරක නැවතිලා හිටියේ. දෙමව්පියන් අහිමි වුණාට පස්සෙත් එයා ඒ ගෙදරම හිටියා. වෙනසකට වුණේ නිවාඩුවකටවත් ගමට නොගිය එකයි, එයාට වෙන වියහියදම් පියවා ගන්න තවත් වරුවක සුළු රැකියාවක් කරපු එකත් විතරයි."

"ඒ දවස්වල නීති විද්‍යාලයේ දේශන ඉවර වුණාට පස්සේ අපි දෙන්නා පයින්ම පිටකොටුවට එනවා. මගේ බස් එක එනතුරු මහරගම බස් හෝල්ට් එකට වෙලා, මා එක්ක කතා කර කර ඉඳලා මං බස් එකට ගොඩ වුණාට පස්සේ එයා පිටවෙලා යනවා."

ඈ ඒ දිනවල කෙතරම් සතුටකින් පසු වන්නට ඇද්දැයි පැට්රික් සිතන්නට වූයේ ආරම්භයේදී මලානිකව තිබූ ඇගේ මුහුණ දැන් ප්‍රබෝධමත් වී ඇති නිසාය. කටහඬෙහි වූ ඇල් මැරුණ ස්වභාවයද දැන් නැත.

"අදත් එයයි මමයි පුරුදු විදිහට නීති විද්‍යාලයේ ඉඳලා පිටකොටුව දිහාවට එනවා" ඇගේ කටහඬ එකවරම ශෝකී බවකින් යුක්ත විය. මුහුණෙහි තිබූ පිබිදීමද තුරන්ව ගියේය. තත්පර කිහිපයක් ඇතුළත වූ ඒ වෙනස් වීම පැට්රික් මවිතයට පත් කළේය.

දිඟ සුසුමක් හෙළූ ඇය නැවත කතා කරන්නට වුවාය.

"මං ඇහැඳිම දැක්කා අපි දිහාවටම නෙත් හෙලාගෙන හිටිය, විල්සන් තරමටම උස, ඒ වුණත් එයාට වඩා ටිකක් වයස යැයි හිතන්න පුළුවන්, කඩවසම් පෙනුමක් තිබුණ ඒ පුද්ගලයව. එයාගේ ඇස් දෙක රතු වෙලා. එයා විල්සන් දිහා උනන්දුවෙන් බලා හිටියත් විල්සන් එයාව දැක්කේ නෑ. අපි එයා හිටි තැන පසු කරගෙන ගියා. ඒත් මට ඉවෙන් වගේ තේරුණා ඒ මිනුස්සයා අපි පස්සෙන් එනවා කියලා. එයා විල්සන්ට අනතුරක් කරන්න එන පුද්ගලයෙක් හැටියට මං සැක කළා. මං මගේ අතේ තිබුණ පොත් දෙක තුනක් හිතා මතාම බිම වැටෙන්න ඉඩ ඇරියා. එතකොට අපි දෙන්නම නැවතුනා. විල්සන් පොඩි විහිළුවකුත් කරලා පොත් ටික මට අහුලලා දුන්නා. ඒ අතරවාරයේ අර මිනුස්සයා අපිව පසුකරගෙන ගියා. මටත් ඕන වෙලා තිබුණේ ඒක කරගන්න තමයි: මට පොඩි සහනයක් හිතට ඇති වුණා. අපි ආපහු ඉදිරියට යන්න වුණා. ඒත් අපි පසුකරගෙන ගිය අර මිනුස්සයා ආයෙමත් පාර අයිනේ තිබුණ ගහක් යටට වෙලා විල්සන් දිහා බලාගෙන ඉන්න වුණා. මගේ හිතේ බය ආයෙමත් අලුත් වුණා."

"විල්සන්. අර අර ඉස්සරහ ගහ ගාව ඉඳන් ඔයා දිහා බලං ඉන්න මිනිහා අපිව ෆලෝ කරනවා."

"විල්සන් එයා දිහා බැලුවා."

"ආ.. ඒ මං හොඳට දන්න ගමේ කෙනෙක්."

"ඒ මනුස්සයා විල්සන්ට ඔළුව පහත් කරලා මඳ සිනහවක් පෑවා. ඒ එක්කම එයා ළඟට එන්න කියලා අතින් සංඥාවකුත් කළා."

"එපා යන්න. එපා යන්න" මං කිව්වා.

"බයවෙන්න එපා නිරංජලා. එයා මට මගේ සහෝදරයෙක් වගෙයි. ඔයා මෙහාම ඉන්න."

"ඒ මනුස්සයා කුටු කුටු ගාලා මොනවද විල්සන්ට කිව්වා. විල්සන්ගේ මූණ ටික ටික වෙනස් වෙනවා. මුලින්ම විස්මයක් එයාගේ මුණෙන් පළ වුණා."

"නෑ..ෂ්.. " කියලා එයා කිව්වා මට යාන්තමට ඇහුණා. ඒ දෙන්නා තව ටිකක් මගෙන් ඈතට ගියා. තව තව මොනවද ඒ මනුස්සයා විල්සන්ට කිව්වා. ඉත් ටික වෙලාවකට පස්සේ විල්සන් මං ගාවට ආවා."

"කිසි දේකට බය වෙන්න එපා නිරංජලා. එයා මගේ හොඳ හිතවතෙක්. මට එයා එක්ක බොහොම වැදගත් දෙයක් කතා කරන්න

SL-Unlimited

තියෙනවා. අපි හෙට හමුවෙමු. මට එයත් එක්ක යන්න ඕනෙ."

"මගේ හිතට லොකු දුකක් ඇති වුනා. වෙනදා මං එක්ක බය නැවතුම්පල ගාවට යන විල්සන්ව නවත්තන්න සමයෙක් හිටිය එක ගැන ඉරිසියාවකුත් ඇති වුනා. ඒත් විල්සන්ගේ ආයාචනාත්මක, මුහුණ දැක්කාම එයාට විරුද්ධව වචනයක් වත් කියන්න මගේ දිව නැමුනේ නෑ."

"ඊට පහුවෙනිදා සිකුරාදා දවසක්. එදා විල්සන් ලෙක්චර්ස් වලට ආවේ නෑ. මට එදා කිසිම වැඩක් හරි හිතකින් කරන්න ලැබුනේ නෑ. කොටින්ම කියනවා නම් ඒ සිකුරාදා දවසයි, සති අන්තයයි මට හරි නින්දක් තිබුනෙත් නෑ. එයා සඳුදත් ආපු නැති වුනාම මං හොඳටම බය වුනා. විල්සන්ට අනතුරක් වුනා වත් ද? මං එදා ගෙදර ගියේ ඊට පහුවෙනිදත් එයා ආවේ නැත්නම් කැලණියේ එයා නැවතිලා ඉන්න ගෙදරට ගිහින් විපරම් කරලා බලන්න හිතාගෙන."

"ඊට පහුවෙනිදත් විල්සන් ආවේ නෑ. මං කැලණියට ගියා. එයා නැවතිලා හිටපු ගෙදර ඇන්ටිවත් මං දන්නවා. මං ඊට ඉස්සරත් දවස් දෙක තුනක්ම එහේ ගිහින් තියෙනවා."

"ඇන්ටි මාව බොහොම ආදරෙන් පිළිගත්තා. මගේ දුක සැප විමසලා මට තේ එකකුත් හදලා දුන්නා. ඉන් පස්සේ එයා එක සැරේටම මගෙන් ඇහුවා "හැබෑටම නිරංජලා. මොකද මේ විල්සන්ට වෙලා තියෙන්නේ?" කියලා"

"අනේ මං දන්නේ නෑ ඇන්ටී. එයා දැන් දවස් තුනක්ම ලෙක්චර්ස් වලට ආවෙත් නෑ. එයා ගෙදර ඉන්නවද?"

"නෑ දුව. ඊයේ හවස මෙහේ ඇවිත්, මගේ ගාණත් හිලව් බේරලා, කලින් දැනුම් දෙන්න බැරි වුණ නිසා කියලා තවත් රුපියල් සීයක් වැඩිපුර දීලා ගියා. ඒත් මං වැඩිපුර දීපු සල්ලි ගත්තේ නෑ. එයා හිටියේ හරිම කලබලෙන් වගෙයි. එයා ගාව තිබුණ පසුම්බියේ තව සල්ලි ගොඩකුත් තිබුනා බව මං දැක්කා. මං ඒත් විහිළුවට ඇහුවා බැංකුවක් වත් බින්දද කියලා. එයා හිනා වුනා මිසක් උත්තර දුන්නෙත් නෑ."

"පුතා ඇයි මේ කලබලෙන් වාගේ බඩුත් අස්කරගෙන යන්නේ?" බැරිම තැන මං ඇහුවා. "මගෙන් මොකවත් අඩුපාඩුවක් එහෙම වුනා ද?"

"අනේ නෑ. මට ඇන්ටිගෙන් කිසිම කරදරයක් වුනේ නෑ. මං ගෙයක් කුලියට ගත්තා."

SL-Unlimited

"එයා කතා කරන්නේ කලබලෙන් වගේ. එයාගේ ඇස් දෙක නිතරම වගේ ගේට්ටුව දිහාවට යොමු වෙනවා. හරියට ලොකු වරදක් කරපු කෙනෙක් විදිහට. විල්සන් තරම් නිවිච්ච ළමයෙක් මං කවදාවත් දැකලා නෑ. ඒත් එදා එයා සම්පූර්ණයෙන්ම වෙනස්."

"එයා ආවේ තනියමද ඇන්ටි?"

"ඔව්. එයා ආවේ තනියම තමයි. ඒත් ගෙයක් කුලියට ගන්නා කිව්වාම මං ඇහුවා මොකද පිළිවෙළක් වෙන්න හිතේ තියෙනවද කියලා. එතකොට එයා ගැස්සිලා ගියා.

"ඇයි ඇන්ටිට කවුරුවත් එහෙම මොකවත් කිව්වද? මගේ හිතේ නම් එහෙම අදහසක් නෑ."

එයා කතා කරපු හැම වචනයක් පාසාම ගේට්ටුව දිහා බලනවා. හරි සැකෙන් බයෙන් වගේ කතා කළේ. මගේ වද්දට තේ එකකුත් බිව්වා. නැත්නම් බඩු ටිකත් පටවගෙන දුවන්නයි හැදුවේ."

"මට දුක දරාගන්න බැරිව ඇඬුනා. මට හිතාගන්න බැරි, එයාට ඒ තරම් ආදරෙන් හිටපු මටත් නොකියා එයා ගියේ ඇයි කියලා. මගේ අතින් මං දැනුවත්වම කිසිම වරදක් වුණේ නෑ."

"එදා එයාව එක්කරගෙන ගිය මනුස්සයා ගැන මට ලොකු තරහවක් ඇති වුණා. එයා ආවට පස්සෙ තමයි මේ ඔක්කොම වුණේ. ඒත් මොනවා කරන්නද?"

"මං එදා ඉඳන් හැමදාම දෙවියන්ට යාඥා කරනවා. මගේ විල්සන්ව මට මුණගස්සලා දෙන්න. මට නැවත එයාව දකින්න සලස්වන්න කියලා. ඒක තමයි මට තියෙන එකම සැනසිල්ල."

"ඒ දවස්වල ඒහි විද්‍යාලයේ කීපදෙනෙක්ම විල්සන් ගැන මගෙන් ඇහුවා. ඒත් මං මොනවා කියන්නද? එයා වෙන ගෑණියෙක්ව බැඳලා මහරගම පැත්තේ ඉන්නවා කියලා කතාවකුත් පැතිරිලා තිබුණා. මහරගම පොලේ එයා තවත් එයා තරමම උස, හොඳට ඇඟ පත තියෙන කෙනෙක් එක්ක ඉන්නවා දැකපු කෙනෙක් මට ඒ ගැන කිව්වා. මාත් ඊට පස්සේ දවස් කීපයක්ම මහරගම පොලේ රස්තියාදු වුණා. ඒත් මට එයාව හමු වුණේ නෑ."

"ඊට මාසෙකට විතර පස්සේ මගේ හොඳම යාළුවෙක් විල්සන් බඩ දරු අම්මා කෙනෙක් එක්ක ඇස්වාට්ටුව හරියෙ ඉන්නවා දැකලා තියෙනවා. ඒ ගෑණු කෙනාගේ අත බොහොම ආදරෙන් අල්ලගෙන ඒ දෙන්නා යනවා තමයි එයා දැකලා තියෙන්නේ. එයා ඒ බව මට කිව්වට මං විල්සන් ගැන හොඳට දන්නවා. බෝධිසත්වයෙක් වගේ එයා කවදාවත්ම එහෙම දෙයක් නොකරන බවට මට විශ්වාසයි."

"ඊට මාස තුනකට විතර පස්සේ මට විල්සන්ගෙන් ලියුමක් ලැබුණා. ඒක බොහොම කෙටි ලිපියක්."

"මිනිසත්බව ලැබීම කරදර රාශියකට මුහුණ දීමක්. එක ප්‍රශ්නයකට විසඳුම හොයන කොට තව ප්‍රශ්න දාහක් ගොඩ ගැහිලා. සිහි බුද්ධිය ඇතිව කෙනෙකුට වැඩ කරන්න සමාජයෙන් ඉඩක් ලැබෙන්නේ නෑ. මේ ප්‍රශ්න වලින් ගැලවෙන්න තියෙන්නේ එකම එක මාර්ගයයි. ඒ මාර්ගයට අවතීර්ණ වෙන්න සූදානම් වෙලයි මං මේ ලියුම ලියන්නේ. නැවත කිසි දාක මට ඔබව මුණ ගැසෙන එකක් නැහැ. මා ගැන බලාපොරොත්තුව ඇතිව නොඉඳ සුදුසු කෙනෙක්, ඔබට ආදරය කරන කරන කෙනෙකු හමු වුණ විට ඔහු හා විවාහ වෙන්න කියන එක තමයි ඒකෙ ලියලා තිබුණේ."

නිරංජලාගේ කට හඬ වෙව්ලන සුළු විය. ඇගේ දෙනෙත කඳුලින් බර වී තිබුණි. ඇය ලේන්සුව ගෙන දෙනෙත් පිස දමන්නට වූවාය.

"ඉතිං පැට්‍රික් ඔයා හිතනවද එයාගෙන් මේ සමාජයට වරදක් වෙච්ච කියලා."

"මටත් ඕනේ ඒක ඔප්පු කරලා බාප්පාගේ නම නිදොස් කරන්න නිරංජලා. ඊට පස්සේ එයාව ඔයාට හමු වුණේ නැද්ද?"

"මම පුරුද්දකට වගේ හැමදාම දෙවියන්ට යාඥා කරනවා මගේ විල්සන්ව මට මුණ ගස්සන්න කියලා. මෙහෙම මං හිතන්නේ අවුරුදු හත අටක්ම වගේ යන්න ඇති."

"පොලිසියෙන් ඇවිත් එක පාරටම වගේ විල්සන් ගැන තොරතුරු මගෙන් අහන්න වුණා. මට අවුරුදු ගත අටකින්ම වගේ විල්සන් හමු නොවුන බව මං කීවට ඒ ගොල්ල විශ්වාස කරපු බවක් පෙනෙන්න තිබුණේ නෑ. අපේ ගෙදර අවට සී. අයි. ඩී. කාරයො ගැවසෙනවා කියලා මට හිතුනා. ඒත් මං ඒ කිසි දෙයක් නොදන්න විදියට හිටියා. මාසයක් විතර මෙහෙම ගියා. ඒ අතර තුර තුන් හතර වතාවක්ම පොලිසියෙන් කෙනෙක් ඇවිත් මගෙන් ප්‍රශ්න කරලා යනවා. මට තේරුණ විදියට, කාගේ හරි මරණයකට විල්සන් මූලික වුණ බවට එයාලා සැක කරනවා. ඒ මැරුණ කෙනාගේ කරේ "රන්දෙණිගල ව්‍යාඝ්‍රයා" කියලා ලියලා තිබුණ බෝඩ් එකක් තිබුනලු. ඒ නිසා තමයි විල්සන් ගැන මේ ප්‍රශ්න කරලා තියෙන්නේ."

"ඊටත් අවුරුදු තුනකට විතර පස්සේ දවසක මාව හමුවෙන්න කාර් එකකින් මිනුස්සයො දෙන්නෙක් ආවා. ඒ ගොල්ලන්ගේ නඩුවකට මට පෙනී හිටින්න පුෂ්පචන්ද්‍ර කියලා විස්තර කතා කරගන්නයි ඒ

SL-Unlimited

ගොල්ල ආවේ. එතකොට රෑ හතට විතර ඇති. මායි, වැඩ කරන ගෑණු කෙනයි විතරයි ගෙදර හිටියේ. කතාව යනකොට එක සැරේටම එක මනුස්සයෙක් නැඟිටලා ඇවිත් "නෝනා. ඇත්ත කිව්වොත් අපි නෝනට අනතුරක් කරන්නේ නෑ. අපට විල්සන් හාමු ඉන්න තැන කියන්න" කියලා මගේ බෙල්ලට පිහියක් තිබ්බා. අනිත් මිනිහා ගිහින් වැඩකාර ගෑණිවත් ගැට ගහලා මං ඉන්න කාමරේට ගෙනාවා. ඒ ගොල්ල ගෙදර දොරවල් වහලා මට වද දෙන්න සූදානම් වෙන බව මට තේරුණා. නමුත් මාත් විල්සන් ඉන්න තැනක් දන්නේ නෑනේ. හැබැයි දැන ගෙන හිටියත්, මාව මැරුවත් මං ඒ ගොල්ලන්ට ඒ ගැන කියන්නේ නෑ. මගෙන් උත්තරයක් ගන්න එක ලේසි නැති බව දැනගත්තාම ඒ ගොල්ල මාව කුස්සියට ඇදගෙන ගියා. ලොකු යකඩ කූරක් කුස්සියේ ලිපට දාලා ඒ ගොල්ල රත්කරනවා. "නෝනාට වඩා අමාරු කාරයින් අපි කතා කරවලා තියෙනවා" කියලා පුරසාරම් දොඩමින් ඒ ගොල්ල බොහොම සන්සුන්ව ඒ වැඩේ කරගෙන යනවා. මාත් මැරෙන්න නම් බය නෑ. ඒත්.. ඒ ගොල්ල කරන්නෙ යන්නෙ මොකක්ද කියලා හිතෙන කොට මගේ ඇඟ හීතල වෙලා ගියා. මං ඇස්දෙක පියාගෙන දෙවියන්ට යාඥා කරනවා. මගේ විල්සන් දේවාත්මයක ඉන්නව නම් මට ඇවිත් පිහිට වෙන්න කියලත් මං යාඥා කරනවා."

"නෝනා. මං මේ අන්තිම පාරටයි අහන්නේ. අපට විල්සන් හාමු ඉන්න තැන කියනවාද නැද්ද?" කියලා මිනුස්සයෙක් හයියෙන් කතා කරන කොට මං ඇස් දෙක ඇරියා.

රත් වෙච්ච යකඩ කූර අත් මේස් එකක් දමාගෙන එක කොනකින් අල්ලගෙන ඉන්න මිනුස්සයෙක් ඒක මා ගාවට ටික ටික කිට්ටු කරනවා. මං අවසාන වතාවටත් විල්සන්ට යාඥා කළා."

"එක සැරේටම හරිම පුදුම දෙයක් සිද්ධ වුණා. අර මිනිහා මා ළඟට යකඩ කූර ළං කරන කොට එක සීමාවකට වඩා ඒක මට ළං කරන්න මිනිහට බැරි වුණා. ඒක නැමෙන්න වුණා. හරියට මා වටේ මොකක් හරි ආරක්ෂක වලල්ලක් තියෙන විදියට. ඒ මිනිහට කේන්ති ගිහින් එක සැරේටම යකඩ කූර පස්සට අරගෙන වේගයෙන් මගේ දිහාවට ළං කළා. එතකොට ඒක කොයි තරම් දුරට නැමුනද කියන්නේ අර මිනිහගේ අතත් ඒකට පිච්චුනා. ඒ මිනිහා අතින් යකඩ කූර බිම වැටුනා. මං තව තවත් විල්සන්ට යාඥා කරන්න වුණා. එයා තමයි මගේ ගැලවුම් කාරයා. අර බිම වැටුන යකඩ කූර, අපට අදෘශ්‍යමාන වෙලා ඉන්න කෙනෙක් අතට අරං වනනවා මං දැක්කා. ඒක අර මිනිස්සු දෙන්නා පිච්චෙන නොපිච්චෙන ගානට ළං වුණා.

SL-Unlimited

උං දෙන්නා කොයි තරම් බය වුණාද කිව්වොත් පණ එපා කියලා පස්ස දොරෙන් එළියට පැනලා ගියා. මම පස්සේ වැඩ කාර ගෑනු කෙනාවත් මුදවලා මේ වෙච්ච කිසිම දෙයක් කිසි කෙනෙකුට නොකියන විදියට පොරොන්දු කර ගත්තා. එදා ඉඳලා මං මොන හේතුවක් නිසාවත් දෙවියන්ට යාඥා කරන එක නැවැත්තුවේ නෑ. මගේ විල්සන්ව මට දකින්න සලස්වන්න. දෙවියෙක් වෙලා ඉන්නවා නම් මට දේව ආත්මය හෝ දැක ගැනීමට සලස්වන්න කියලා මං යාඥා කරන්න වුණා."

"මෙහෙම අවුරුදු කීපයක්ම ගියා. දවසක් මගේ යාඥාවට දෙවියෝ සවන් දෙන්න ඇති. එයාව යාඥා කරන මේ භක්තිමත් කාන්තාව ගැන එයාට අනුකම්පා හිතෙන්න ඇති. මං විල්සන්ව හීනෙන් දැක්කා. එයාගේ මුහුණ පුරා රැවුල වැවිලා. හරියට තාපසයෙක් වගේ එයා හිටියේ. "මේ සංසාර සාගරයෙන් එතෙර වෙන්න, මේ සංසාර ගමන කෙටි කර ගන්න මාර්ගයක මම ගමන් කරනවා. මා වෙනුවෙන් ඔබේ ජීවිතය කැප කරන්න එපා" ඔහු මට කිව්වා."

"මට ඒක කරන්න බෑ. මට ඔබ තුමාගේ දෙපා ළඟ වැටිලා එක විනාඩියක් ඉන්න ඉඩ දෙන්න කියලා මං යාඥා කරන්න වුණා. එතකොට සිහිනෙන් හරි පෙනුන ඒ රූපය නැති වෙලා ගියා."

"මං ආයෙමත් පුරුදු විදියට යාඥා කරන්න වුණා. පාවත් අවුරුද්දකට දෙකකට විතර පස්සේ නැවතත් මට එයාව හීනෙන් පෙනුනා. මගේ අධිෂ්ඨානය මං නැති කරගත්තේ නැති බව එයාටත් තේරෙන්න ඇති. එයාව දකින්නම ආසානම් එයා ඉන්න තැනට එන පාර මට කිව්වා. එයාව දැක්කාමවත් මගේ හිත වෙනස් වෙලා, එයා ගැන මගේ හිතේ තියෙන බලාපොරොත්තුව මං අයින් කර ගනීවි කියලා හිතාගෙන වෙන්න ඇති එයා මට එහෙම කිව්වේ."

"මට එදා රෑ හරියට නින්ද ගියේ නෑ. උදේත්ම අවදි වුණ මං, හීනෙන් කිව්ව විදියට එයා හිටපු තැන හොයා ගෙන ගියා."

මෙතෙක් අඳුරු වී තිබූ නිරංජලා ගේ මුහුණ ප්‍රීතියෙන් බබලන්නට විය. ඒ ගැන සිතීමත් ඇයට සතුට ගෙන දෙන්නක් බව පැවරීමට අවබෝධ විය.

"මට එයාව මුණ ගැහුණා. මං අර හීනෙන් දුටුවා වගේම තමයි එයා හිටියේ. මුහුණ පුරා ඝන රැවුලක් වැවිලා. මිනිස් සමාජය ගැන කලකිරීමෙන් පසුවෙන ඔහු වන ගත වෙලා ජීවත් වෙනවා. කාත් කවුරුවත් නැති මහා වනාන්තරයක තනියම ජීවත් වෙනවා. සංසාර සාගරයෙන් එතෙර වෙන මාර්ගයට අවතීර්ණ වෙන්න උත්සාහ කරමින් ඉන්නවා. මං එයාගේ දෙපා ළඟ වැටිලා කොයි තරම් වෙලා

SL-Unlimited

හිටියදද දුන්නේ නෑ. එයා මට බුදු බණ කියා දුන්නා. මං ඒවා කලිනුත් අහලා තිබුණ ඒවා තමයි. නමුත් එයාගේ මුවින් නික්මුණ ඒ වදන් කෙලින්ම මගේ හදවතට ඇතුළු වුණා. මගේ හිත සන්සුන් වුණා. මං ගෙදර ආවා. විල්සන්ට මේ සංසාර සාගරයෙන් එතෙර වෙන්න ශක්තිය ලබා දෙන්න කියලා මං තාමත් යාඥා කරනවා."

නිරංජලා මඳ වේලාවක් නිහඬව සිටියාය.

"ඉතින්. දැන්වත් ඔයා විල්සන් ගැන යම් සැකයක් තියෙනවා නම් ඒක අයින් කර ගන්න. ඔය වගේ අපරාධ වැලකට එයා සම්බන්ධ වෙන්නේ නෑ. එයා නිර්දෝෂයි."

"හොඳයි නිරංජලා. මං එහෙනම් තව එක ඉල්ලීමක් කරන්නම්. ඉන් පස්සේ එයා ගැන තියෙන සැකය සම්පූර්ණයෙන්ම ඉවත් කරගන්නම්. මට එයාව මුණ ගස්වන්න. මට එයාව දකින්න ආසයි."

"කනගාටුයි පැට්රික්. විල්සන් දැන් එක තැනක ඉන්න කෙනෙක් නොවෙයි. සිංහරාජ අඩවියේ තැන තැන ඇවිදිමින් කල් ගත කරනවා. එයා සමහර කාලෙකට ගම්මානයක් අසළ තියෙන කැලෑවක තියෙන ගල් ගුහාවකට එනවා. එහෙම ඉන්න කාලෙකට තමයි එයාව හමුවෙන්න පුළුවන්."

නිරංජලා මඳවේලාවක් පැට්රික් දෙස බලා සිටියා ය. ඇයට පැට්රික් තුළින් තරුණ වියේ වූ විල්සන්ගේ රුව මැවී පෙනෙන්නට විය.

"ප්ලීස් නිරංජලා.. ඔයාට හිත කමක් තියෙනවා නම් ඒක කරන්න පුළුවන්."

ඇය අසුනින් නැගිට කාමරය වෙත පිය නැගුවා ය. ඇය ඉන් පිටතට ආවේ විනාඩි පහකට හයකට පමණ පසුවය.

"ඔයාට ඕනෙනම් නම් හමුවෙන්න ආවාට කමක් නෑ කියලා තාපස තුමා කිව්වා."

"එහෙනම් අපි දැන්ම පිටත් වෙමු."

"පැට්රික්. එයා ඉන්න තැනට යන්න පැය හතරක වත් පා ගමනක් යන්න ඕනේ. දැන් ගිහින් එන්න වෙලාවක් නෑ. ඔයා කැමති නම් අපි හෙට උදේන්ම පිටත්වෙමු."

"හොඳයි මං කීයට විතර එන්න ද?"

"උදේ පහට විතර එන්න බලන්න. මං සූදානම් වෙලා ඉන්නම්."

•••

SL-Unlimited

## 6

රත්නපුර දිස්ත්‍රික්කයෙහි, සිංහරාජ අඩවියට මායිම්ව පිහිටි සිංහපුර නම් කුඩා ගම්මානයක් වෙයි. ඉන් ඔබ්බෙහි ඇත්තේ ශතවර්ෂ ගණනාවක් තිස්සේම මිනිස් සතාගේ පා පහසක් නොලැබූ සිංහරාජ රක්ෂිත වනාන්තරයයි. සිංහපුර, දිළිඳු ගොවි පවුල් පනහක් පමණ ජීවත් වන නොදියුණු ගම්මානයකි. ගමෙහි වූ එකම සිල්ලර හා තේ කඩය අසළ මෝටර් සයිකලය නතර කරන ලෙස නිරංජලා පැට්‍රික්ට කීවාය.

"ආ.. නෝනා. හුඟ කාලෙකින් නොවැ දැක්කේ?" බුලත් කහට නිසා රතු පැහැති වූ දසන් පා කට පුරා සිනාසෙමින් කඩයෙහි මුදලාලි නිරංජලා පිළිගත්තෙන්, ඇය මෙතැනට අමුත්තියක් නොවන බව පැට්‍රික් පසක් කර ගත්තේය.

"ඔව් මුදලාලි. අවුරුදු දෙකකට විතර පස්සේ මං ආවේ."

"තාපස තුමාව මෑතදි දැකපු කෙනෙක් නං නෑ නෝනා. පහුගිය දවස් ටිකේ තද වැස්සකුත් තිබුණා. මං දන්න හැටියට තාපස තුමා මේ පැත්තේ ඉන්න හැටියක් නෑ."

"මේ මහත්තයටත් තාපස තුමා ඉන්නවා නම් මුණ ගැහෙන්න ආසයි කිව්වා. මං එක්කරගෙන ආවා. අපි එනකල් මේ මෝටර් සයිකලේ පොඩ්ඩක් බලා ගන්න පුළුවන්ද මුදලාලි?"

"හොඳයි නෝනා."

"පැට්‍රික්. අපි මොනවා හරි කාලා යමු. ආයි කැලේට වැදුනට පස්සේ කන්න දෙයක් ලැබෙන්නේ නෑ. වතුර ටිකක් හරි බොන්න ලැබෙන්නේ දිය පාරකින් තමයි. පැට්‍රික්ට නම් මේවා පුරුදුත් නැතිව ඇති."

"නෑ. නෑ. මට ඕවා හොඳට පුරුදුයි. මං එංගලන්තේ ඉන්නදිත් අවුරුද්දකට සැරයක් නොවරදාවම බුෂ් වෝකිං යනවා. ඒත් මේ ගමන මෙහෙම එකක් බව දැන ගත්තානම් මං සූදානම් වෙලා එනවා. ඒත් කමක් නෑ."

එංගලන්තයේදී කොතරම් වනාන්තර ගතව ඇවිද තිබුණත් මෙවැනි සුවයක් එම ගමන් වලදී තමන් නොලත් බව ඔහු නිරංජලාට කීවේය. ඔහු කිසිදාක නොදුටු ගස් වර්ග හා පඳුරු වර්ග වලින් ගහන වූ මෙම වන පියසෙහි ඇවිදින විට කිසිම විඩාවක් ඔවුනට

නොදැනුනා පමණක් නොව හිරුගේ චණ්ඩ තාපයෙන්ද ඔවුනට කිසි හිරිහැරයක් නොවුණි. වරින්වර ගත දැවටෙන මන්ද මාරුතය සිතට ගෙන දෙන ප්‍රබෝධය නිසා ගමන් විඩාව නොදැනෙන බව නිරංජලා කීවාය.

තාපසතුමා සිටින ගල් ලෙන වෙතට යාමට අඩි පාරක්වත් නොතිබුණ අතර එකම මාර්ගෝපදේශකයා වූයේ ඒ සමීපයේ කඳු මුදුනක තිබූ ගල් තලාවකි. ඒ ගල්තලාව වෙත පැමිණි විට ඈතින් දිස් වූයේ සිරිපාද කන්දයි. පැට්‍රික් ඒ දැකුම්කළු දර්ශනය දෙස මඳ වේලාවක් බලා සිටියේය.

"අර ඈත පෙනෙන ගල් ගුහාවේ තමයි තාපස තුමා ඉන්නේ" ඒ කන්දෙන් එහා පැත්තෙහි වූ තවත් කන්දක මැද හරියේ තිබූ කළු ගල් කුලක් දෙසට අත දිගු කරමින් නිරංජලා කීවාය. එදෙසට යාමට තවත් පැයක් වත් ගත වනු ඇතැයි පැට්‍රික් සිතුවේ ය. එහෙත් අවට පරිසරයේ සුන්දරත්වය නිසා ඔවුන්ගේ යෑමට විඩාවක් නම් දැනුනේ නැත. කෙසේ හෝ යාන්තමින් මධ්‍යාහ්නය පසු වූ විට ඒ ගල් ලෙන වෙත ළඟා වීමට ඔවුනට හැකි විය.

ගල්ලෙන ඉදිරිපිට වූ ගල් තලාවක් මත බවුන් වඩමින් සිටි තාපස තුමා ඔවුන්ගේ දර්ශනයට හසු විය. ඔහු ඔවුන්ට පිටුපා සිටි බැවින් ඔහුගේ මුහුණ කෙබඳුදැයි පැට්‍රික්ට දැක ගත නොහැකි විය.

"තාපස තුමා භාවනා කරනවා. අපි ඒකට බාධා නොවෙන විදියට එතුමා කතා කරන තුරු බිම ඉඳ ගෙන ඉමු" ඒ අසළට ළඟා වන විට නිරංජලා සෙමින් කීවාය.

එහෙත් පසු පසින් ඔහු වෙතට ළඟා වෙත්ම තාපස තුමා ඔවුන්ට කතා කළේ ය.

"පුත. ඔය තරම් දුර බැහැර පෙදෙසක සිට පැමිණි ඔබ කුමක් නිසා ඔබේ වටිනා කාලය මෙබඳු නිරර්ථක කටයුත්තකට වැය කරන්නෙහිද?"

පැට්‍රික් මවිතයට පත් වූයේ එය ඔහු කීවේ තමාට බව තේරුම් ගත් නිසාය. තාපස තුමාට පිටුපා සිටි ඔවුන් එතුමා දුටුවේ කෙසේද? සමහර විට ඔවුන්ගේ අඩි හඬ එතුමාට ඇසෙන්නට ඇත. එහෙත් තමා දුර බැහැර රටක සිට පැමිණි බව ඔහු දත්තේ කෙසේද?

නිරංජලා තාපස තුමාට වැඳ එකත් පස්ව සිටියාය. පැට්‍රික් ද ඇය අනුව එසේ කළේ ය.

"තාපස තුමනි. මේ තරුණයාට ඔබ දැකීමට අවශ්‍යම බැව් කී හෙයිනුත්, ඔබ තුමාට කළ යාඥාවෙන් පසු, ඊට ඔබ තුමාගේ

SL-Unlimited

අකමැත්තක් නැති බව පෙනුන නිසාවෙනුත් මොහු කැඳවාගෙන පැමිණියෙමි." නිරංජලා ඉතා ගෞරව පෙරදැරිව කීවාය.

"දරුව. අනුන් ගැන සොයමින්, යටගියාව ගැන සොයමින් නිරාපරාදේ කාලය වැය කරන්නේ මන්ද? ඉදිරිය ගැන සිතා, අප ගමන් කරන මේ සංසාර සාගරයේ 'නොතිර බව සිතා කටයුතු කරන්න."

"තාපස තුමනි. මගේ නැදෑයින් එකිනෙකා ඇන කොටා ගනිමින් විනාශ වෙනවා දකින්නට මා කැමති නෑ. මට දුවමිනා ඔවුන් අතර පවතින මේ ජන්මාන්තර වෛරය සමථයකට පත් කරන්න. මගේ පියාගේ නාමයෙන් මට එකට උදව් කරන්න."

"දරුව. මේ හැම ප්‍රශ්නයකටම මුල ඔබ පියා බව මම නොකියමි. ඉන් පසුව ඇති වූ නොයෙකුත් ක්‍රියාවන් මෙයට මුල් වූ බව මම දනිමි. ඒ හැම සිදුවීමකින්ම ඔවුන් අතර ඇති වූ වෛරය එන්න එන්නම වැඩි වූ බැවින් සිදු වූ විපත බලන්න. දැන් එය කිසිවකුට නවත්වන්නට බැරි තරමට උග්‍ර වී ඇති සැටි නොපෙනේද? ඔබ නිහඬව නොසිටියොත් ඔබද ඊට ගොදුරක් වනු ඇත. ඔබ පියා විසින් උග්‍ර තත්වයට පත් කරන ලද මෙම පළිගැනීම් වැලෙහි පැටලී ඊට ගොදුරක් වෙන්න එපා."

"තාපස තුමනි. මගේ පියා රට හැරදා ගිය පසු මොවුන් සමඟ තිබූ සියළු සම්බන්ධකම් වලින් තොර වීම නිසා මේ ප්‍රශ්නය මෙතරම් දුර දිග ගිය බව දනිමි. එහෙත් ඔහු මේ බවක් දැන සිටියා නම් මෙය මේ තරම් දුර දිග නොයවා සමථයකට පත් කිරීමට මෙහි එන බව මම දනිමි. ඔහුට කළ නොහැකි වූ දෙය මා විසින් වත් කළ යුතු වෙයි. පියා නිසා ඇති වූවායැයි සිතෙන ප්‍රශ්නයක් විසඳීමට පුතෙකු ඉදිරිපත් වීම ඔබ අගය නොකරන්නේ මන්ද?"

තාපස තුමා බිම අතගා වැලි අහුරක් අතට ගෙන එය පැට්‍රික් වෙත පෑවේය.

"දරුව. මා අත ඇති මේ වැලි ස්වල්පය ඔබට පෙනේද?"

"එසේමයි තාපස තුමනි."

"ඒ තමා ඔබ දන්නා ප්‍රමාණය. මේ මහ පොළොවෙහි ඇති වැලි ප්‍රමාණය ඔබට සිතා ගත හැකිද? ඒ තමා ඔබ නොදන්නා ප්‍රමාණය."

පැට්‍රික් නිහඬව සිටියේ ඔහුගෙන් ඊට වඩා උදව්වක් නොලැබෙන බව දත් නිසාය. එහෙත් මේ තාපසයා ඔහුට නම් සැකයකි. පිටරට සිට පැමිණි තමා කවුදැයි ඔහු හඳුනා ගත්තේ කෙසේද? නිරංජලා සමඟ තමා පැමිණෙන බව ඔහු දත්තේ කෙසේද?

SL Unlimited

"තාපස තුමනි. ඔබතුමාගේ සුව දුක් කෙසේද?"යි නිරංජලා ඇසුවාය.

"මම සුපුරුදු සුවයෙන් පසුවෙනවා නිරංජලාවෙනි. වරින් වර පැමිණෙන මගේ මිය ගිය සොහොයුරිය ගේ භූතාත්මය මගේ දැහැන බිඳ දමනවා. මට පරිභව කරනවා. මා යුතුකම් පැහැර හැරිය අයකුය කියමින් මට දෝෂාරෝපනය කරනවා. ඒ හැරෙන්නට වෙනත් කිව යුතු තරම් දෙයක් නෑ."

"තාපස තුමනි. ඔබතුමාගේ සොහොයුරිය මිය ගිහින් ද?" එය පැට්රික්ට අලුත් ආරංචියකි.

"තමන්ව විනා කළවුන්ට විනා කිරීමට තරම් ශක්තියක් නොමැති බව දැන ගත් ඒ අසරණිය, මේ කෲර සමාජයෙන් සමු ගත්තා. ඔවුන් කෙරෙහි ඇති කර ගත් වෛර සිතකින් මේ ලොවෙන් සමුගත්තා. ඒ වෛරය පිරිමසා ගන්නා තුරු අන්තර භවයක දුක් විඳින ඇය පළිගැනීමෙන්ම ඇගේ සිත සුව සදා ගන්නා අතර අප දෙන අනුශාසනාවන් අදහන්නේ නැත. අප සම්මා සම්බුදු තථාගතයන් වහන්සේ දෙසූ බණ දහම් නොපිළිගන්නා ඇය වෛරයෙන් වෛරය සංසිඳවා ගැනීමට යාමෙන් තව තවත් අහිංසක ජීවිත විනාශ මුඛයට පිං කරමින්, ඔවුන්ගේ සංසාර ගමනද දීර්ඝ කරනවා."

"තාපස තුමනි. මිය ගිය අයකු ජීවත් වන අයෙකුට විනා කරන්නේ කෙසේ ද?"

"ඔබ හරි පුතා. ඇයට දැන් එසේ කළ නොහැකි වුවත්, එය කරන ක්‍රමය ජීවතුන් අතර සිටියදී ඇය දැන සිටියා. ඔබ ඒ ගැන විමසා වෙහෙසට පත් වෙන්නට එපා. ඔබ ගේ සංසාර ගමන කෙටි කර ගන්න බලන්න. බණ දහම් ලියවී ඇති පොත පත කියවා දහම් දැනුම වැඩි කර ගන්න. අනුන් ගැන නොසොයා තමන් ගැන සොයන්නට බලන්න."

"තාපස තුමනි. මධ්‍යහ්නයද පසු වෙලා. ඔබ තුමාට දිවා ආහාරය පූජා කිරීමට අවසර දෙනු මැනවි."

"ඔබට අවසර දෙමි පින්වතිය."

නිරංජලා හා පැට්රික් එකතු වී තවුසානන්ට දිවා ආහාරය සකසා පිළිගන්වන ලදී. ඔහු දිවා ආහාරය නිම කරන තුරු ඔවුහු එකත්පස්ව සිටියහ.

දිවා ආහාරයෙන් පසුව පැට්රික් තාපස තුමාගෙන් පැනයක් ඇසීමට ඇති බව කීවේය.

www.sinhalalibrary.com
SL-Unlimited

"තාපස තුමනි. ඔබ තුමා කළ කතාවකින් මගේ පියා මේ මිනීමැරුම් දාමයේ කොතැනක සිටින බවට සැකයක් පහළ කළා. ඔහු මෙරටින් පිටව ගියාට පසුව නැවත කිසිම දිනයක මෙහි පැමිණියේ නෑ. ඉතිං ඔහු මෙයට සම්බන්ධ වන්නේ කෙසේ ද?"

"දරුව. මා අන්තර්භවය ගැන කී දේ ඔබ විශ්වාස කරනවා ද?"

"නැත තාපසතුමනි."

"එසේනම් මෙයට මා දෙන පිළිතුර ද ඔබ විශ්වාස නොකරනු ඇත. එනිසා මා ඔබ පියා ගැන යමක් නොපවසමි. එහෙත් ඔබ ඔත්තු සපයන්නට යොදවා ඇති පුද්ගලයින්ගෙන්, ඔබ පියාගේ ඊට ඇති සබඳකම් ඔබට දැන ගන්නට ලැබෙනු ඇත. අන්තර්භවයක සිටින ඔබ පියාගේ හිතවතෙකු, ඔබ මාරයාගෙන් ආරක්‍ෂාකර දුන් විට ඔබ අන්තර්භවයෙහි ජීවත් වන මිනිසුන් ගැනද විශ්වාස කරනු ඇත."

"තාපස තුමනි. ඔබතුමා පීඩාවට පත් වී ඇති සෙයක් පෙනෙන්නට තිබෙනවා."

"මගේ සොහොයුරිය දැන් මෙහි පැමිණ ඔවුන් පාවා නොදෙන ලෙසට මගෙන් ඉල්ලා සිටිනවා. ඔවුන් මා වෙහෙසට පත් කරනවා."

"තාපසතුමනි. එසේ නම් අප ඔබතුමාගෙන් සමුගන්නම්."

"හොඳයි පින්වතිය."

"තාපස තුමනි. සමු ගැනීමට පෙර ඔබතුමා මේ පුතණුවන්ට අවවාදයක් දෙනවා නම් සතුටු වෙමි."

"පුත. දෙවන රාජසිංහ රජතුමාගේ කාලයේදී රන්දෙණිගල සිංහයා නමින් විරුදාවලිය ලත් අපගේ, ඔබගේ ඒ මී මුත්තාගේ ගෙන් පසුව රන්දෙණිගල වලව්වාසීන් විසින් කරන ලද සාපරාධී ක්‍රියා බොහෝ ඇත. එම වලව් බිම අසල පදිංචිව සිටි අසරණ දුගී මිනිසුන්ගේ රුධිරය, දහඩිය, කඳුළු එම වලව්වෙහි පසට එකතු වී ඇත. ඔවුන් කළ ඒ සාපරාධී ක්‍රියා නිසා එහි නිවැසියන්ට මුහුණ දීමට සිදු වූ ව්‍යසනයන්ගෙන්, ඉදිරියේදී මුහුණ දීමට සිදුවන ව්‍යසනයන්ගෙන් කිසි අඩුවක් නොවනු ඇත. ඒ සිදුවීම් වළක්වාලීමට නම් එහි අනාගත හිමිකරු වන ඔබ, එම ගමෙහි වසන දුගී දුප්පත් ගොවි ජනතාව වෙත එම ඉඩකඩම් බෙදා දෙන්න. මිය ගිය ඥාතීන්ට පින් පමුණුවා එය දන් දෙන්න. හැකි සෑම අවස්ථාවකම දන් පින් කිරීමට යුහුසුළු වන්න. එයින් මිය ගිය ඔබේ ඥාතීන්වත්, ඔබටත් යහපතක්ම වනු ඇත."

"අපට අවසර"

තාපස තුමාගෙන් සමුගත් ඔවුහු නැවත මහ මුකලාන මැදින් ගමන් කරන්නට වූහ.

"පැට්‍රික්. ඔයා තාපසතුමා ගැන සිතන්නේ මොනවාද?" මුකලාන මැදින් එන අතර නිරංජලා ඇසුවාය.

"මම හිතන දේ හරිද වැරදිද කියන්න මම දන්නේ නෑ. ඒත් තාපසතුමා තාමත් මගේ පියා සමඟ තරහින් පසුවන බව මම තේරුම් ගන්නා. ඔහු මෙසේ වනගතව දුක් විඳින්නේ මගේ පියා විසින් කරගන්නා ලද විවාහය නිසා සිදු වූ ක්‍රියාදාමයෙන් බව ඔහු සිතනවා ඇති. සමහර විට ඔහු අතින් සිදුවුන යම් වරදක් නිසා පොලිසියට හොරෙන් මෙසේ වනගතව සිටිනවා වන්නටද පුළුවන්."

"පැට්‍රික්. ඔබ මට හරි පුදුමයක්. ඔබට මේ හමුවීමෙන් පසුව වත් විල්සන් ගැන සැකයක් ඇති නොවේ යැයි මා විශ්වාස කළා."

"තරගවෙන්න එපා නිරංජලා. මං හිතන විදිය හරිමයි කියලා මං කියන්නේ නෑ. මගේ රාජකාරියේ හැටියට මම හිතන්න පුරුදු වෙලා ඉන්නේ එහෙම තමයි. නැත්නම් මට මගේ රාජකාරිය හරියට කරන්න ලැබෙන්නේ නෑ. හරි ඔත්තුවක් ලැබෙන තුරු මම සැකය තුරන් කර ගන්නේ නෑ."

"ඉතින් දැන් ඔබ කාගෙන්ද ඔය හරි ඔත්තුව බලාපොරොත්තු වන්නේ?"

"මම හිතුවා කඩේ මුදලාලිගෙන් මේ තාපසතුමා ගැන විස්තර ටිකක් දැන ගන්න. ඒකට ඔයාගේ අමනාපයක් තියෙනවද?"

"නෑ පැට්‍රික්. ඉන් පස්සේවත් ඔබේ ඔය සැකය දුරු වෙලා යාවි කියලා මං හිතනවා."

●●●

කඩය වෙත පැමිණි පැට්‍රික් තාපසතුමා ගැන දන්නා දේවල් තමන්ට පැවසිය හැකිදැයි මුදලාලිගෙන් විචාලේය.

"ඇයි මහත්තයෝ. පත්තරේකටවත් ලියන්නද? එහෙම නම් කරන්න එපා. තාපසතුමා කැමති නෑ නිතරම වගේ එතුමාට මිනිසුන් ඇවිත් කරදර කරනවාට?"

"නෑ. නෑ. එහෙම එකකට නොවෙයි. මට කැමතියි තාපසතුමා ගැන දැනගන්න. මම පත්තර කාරයෙක් නොවෙයි."

"එහෙම නම් මං කියන්නම් මහත්තයා" කී මුදලාලි එපුවත් මෙසේ පවසන්නට විය.

SL Unlimited

"මුලින්ම ඔය කියන තාපසයා දැකපු කෙනෙක් විදියට ගම්මු කියන්නේ කැලේට දර කඩන්න ගිය රන්මැණිකා කියන ගෑණු ළමයා. ඒ මීට අවුරුදු විස්සකට විතර ඉස්සර. කැලේ තියෙන වටිනා ගස් අනවසරයෙන් කපන්න කැලේට එන මිනිසුන් ඉන්නවා. එහෙම ආපු මිනිසුන් දෙන්නෙක්, කැලේ දර කඩන්න ආපු ඒ දැරිවි දැකලා ඒකිව අල්ලගන්න හදලා තියෙනවා. මේ කෙල්ල කැලේ කඩාගෙන, පණ බේරගන්න දුවලා තියෙන්නේ තව තවත් කැලේ ඇතුළටම තමයි. තාපස තුමා ඉඳලා තියෙන ගල්තලාව උඩට කෙල්ල දුවගෙන යන කොට පය පැටලිලා, වැටිලා තියෙනවා. අර මිනිස්සු දෙන්නා කෙල්ල අල්ලා ගන්න පනින කොටම කෙල්ලත් ඒ මිනිස්සු දෙන්නත් අතර ගිනි ජාලාවක් ඇති වුණාලු. ඒ ගිනි ජාලාවෙන් බේරෙන්න පස්සට පනිනකොට ඒ දෙන්නා වටේටම ගිණි ජාලා ඇතිවෙලා. ඒ දෙන්නට කරකියා ගන්න දෙයක් වෙලා නෑ. පස්සේ තාපස තුමාගෙන් සමාවත් අරගෙන ආයෙම කිසිම දාක කැලේ කපන්නත් නොඑන බවට පොරොන්දු වුණාට පස්සේ තමයි තාපස තුමා ඒ අයට යන්න දීලා තියෙන්නේ. ඒ කෙල්ල ඔය සිද්ධිය ගමට ගිහින් කිව්වාම ගමේ මිනිස්සු තාපස තුමා බලන්න ඇවිත් තියෙනවා. ඒත් ඒ කා එක්කවත් එතුමා කතා කරලා නෑ. භාවනානුයෝගීව ම ඉඳලා තියෙනවා. ඊට පස්සේ කැලේ අතරමං වෙච්ච කෙනෙක් හොයන්න ගිය පිරිසකට තාපස තුමා හමුවෙලා තියෙනවා. ඒ වෙලාවේ ඒ නැති වුණ ළමයා ඉන්න ඉසව්ව තාපස තුමා හරියටම කියලා තියෙනවා. ඒ සිද්දියෙන් පස්සේ ගමේ මිනිස්සු ප්‍රශ්නයක් ආපුවාම, කාට හරි ලොකු අසනීපයක් වුණාම තාපස තුමා ගාවට යන්න පුරුදු වෙලා තියෙනවා. එතුමා හිටියොත් පිළිසරණ වෙන බවත්, සමහරදාකට එහෙම ගියාම එතුමා මුණ නොගැහෙන බවත් ගම්මු කියනවා. සෙනඟ යනවා එනවා වැඩි වුණාම තාපස තුමා ඒ පළාතෙන් පිටවෙලා ගිහිං."

"ඉන් පස්සේ මේ නෝනා ඇවිත් තාපස තුමා හමු වුණානේ. නෝනට තාපස තුමා හමුවුණ බව දැනගත්තාම ගම්මු කිහිප දෙනෙක් ගිහින් තාපසතුමා හමුවෙලා තියෙනවා. ඉන්පස්සේ ආපහු තාපස තුමා ඈත කැලෑවට ගිහින් තියෙනවා. දැන් නම් මිනිස්සු තාපස තුමා හමුවෙන්න යන්නේ නෑ. ඒ හමුවෙන්න ගියාට එතුමාව දැක ගන්න ලැබෙන්නේ නැති නිසා. ඔන්න ඔච්චර තමයි මහත්තයෝ අපි තාපස තුමා ගැන දන්නේ"

මුදලාලිට ස්තූති කළ පැට්‍රික්, නිරංජලා සමඟ සිය මෝටර් සයිකලයට ගොඩ විය.

●●●

SL-Unlimited

"එතකොට පැට්‍රික් අපට විල්සන් ගැන සාරයෙක් විදියට සලකන්න අපහසුයි නේද?" විල්සන් පිළිබඳ විස්තරය ඇසූ හැරී විමසුවේය.

"ඔව් අංකල්."

"එතකොට විල්සන් කියපු දේවල් ගැන පැට්‍රික් හිතන්නේ කොහොමද?"

"මං එංගලන්තෙ ඉන්න කොට ඔය වගේ මූණ බලලා අනාගතය කියන කෙනෙක් ගාවට අම්මා මාව එක්කරගෙන ගියා. හිත එක ප්‍රමාණයකට දියුණු කර ගත්තාම කෙනෙකුට තමන් ඉදිරියේ ඉන්න පුද්ගලයාගේ හිත කියවන්න පුළුවන් කම තියෙනවලු. හැබැයි ඒ ගොල්ල අනාගතය ගැන කියන දේවල් සියයට සියයක්ම හරි යන්නේ නෑ. මෙයත් ඒ වගේ කෙනෙක් කියලයි මං හිතන්නේ. අනෙක මං මගේ අප්පච්චිගේ හැටිත් දන්නවා. විල්සන් මාමා තාපසයෙක් වුණාට තාම මගේ අප්පච්චිත් එක්ක තියෙන තරහව අඩුවක් වෙලා නෑ. ඒ නිසා තමයි එයා මගේ අප්පච්චී මේ ප්‍රශ්නයට සම්බන්ධ බව කිව්වේ. ඒ එක්කම මට හිතුන දෙයක් තමයි එයා වනාන්තරයට ආරක්ෂා කරන බව. ඊකයෙන් මට කිහිප සැරයක්ම කිව්වෙ මේ පරීක්ෂණ නවත්තලා දාන්න කියලා."

"පහුගිය දවස් ටිකේ මේ කරපු පරීක්ෂණ වලින් ඔයාට මොනවද හිතෙන්නේ?"

"මං මේ පරීක්ෂණය ගැන සෑහෙන දෙයක් දැනගත්තා. හෙට, ජයන්ත සුරනිමලගේ මරණ පරීක්ෂණයේ විස්තර අරගෙන එනවා. අපි මෙහාටම ඇවිත් ඒ විස්තරය කරන්න කියමු නේද අංකල්?"

"ඔව්. ඒක හොඳ අදහසක්."

•••

## 7

ජයන්ත ඉතා ප්‍රබෝධයෙන් යුතුව කාමරයට ඇතුළු විය.

"ජයන්තගේ මුහුණෙන් මට පේනවා අපට පරීක්ෂණය කරගෙන යන්න හොඳ හෝඩුවාවල් කිහිපයක්ම ලැබිලා ඇතෙයි කියලා."

"මටත් එහෙම හිතෙනවා සර්. මං එහෙනම් මට දැන ගන්න ලැබුණ දේ විස්තර කරන්නම්කෝ."

SL Unlimited

"1998 මර්තු 16 වනදා රාත්‍රී 8.00ට විතර සුරනිමල සුපුරුදු විදිහට එයාගේ රාත්‍රී ආහාරය අරගත්තා. එයාගේ ගෙදර උයන පිහන කටයුතු, අස්පස් කරන දේවල්, වත්තපිට්ටිය බලාගන්න වගේ වැඩ කරලා දෙන ජෝඩුවක් ඉන්නවා. ඒ කමලදාසයි එයාගේ පවුලයි. කමලදාස කියන්නේ සුරනිමල මුලින්ම වැල්ලවාය පැත්තේ දාපු කඩේ උදව්වට හිටපු මනුස්සයා. සුරනිමලට හැම දෙයකදීම උදව්වට හිටියේ කමලදාස තමයි. රම්‍යාගේ මරණයෙන් පස්සේ කමලදාස තවත් ටිකක් සුරනිමලට ළං වුණා. මුලදී කඩේ වැඩපලවලට විතරක් උදව් වුණ කමලදාස, පස්සේ ගෙදර දොර වැඩකටයුතු කරලා දෙන්නත් ඉදිරිපත් වුණා. කමලදාසයි එයාගේ තරුණ බිරිඳ ප්‍රේමයි කෑමෙන් පස්සේ කුස්සිය අස්පස් කරලා දාලා එයාලගේ ගෙදරට ගියා."

"ඒ දෙන්නා පදිංචි වෙලා ඉන්නේ සුරනිමලගේ ගෙදර ඉඳලා මීටර් සියක් විතර දුරින්, ඒ වත්තේම පහළින් තියෙන ගෙදරක. ඒ අය රෑ නවයට විතර නිදාගන්න සූදානම් වුණා. එතකොට කවුද දොරට තට්ටු කරනවා ප්‍රේමාට ඇහුණා."

"කමලදාස .. කමලදාස .. මේ මම.. මම.. "

"ඇයි මුදලාලි මොකවත් කරදරයක්ද? " අහමින් කමලදාස දොර ඇරියා.

"කිසි කතාබහක් නැතිව සුරනිමල ගෙදරට ඇතුළුවෙලා පුටුවක ඉඳගත්තා."

"කමලදාස. මේ ඉඩමයි වත්තයි කමලදාසට ලියන්න මං හිතාගෙන හිටියේ. මං මල්ලිටත් ඒක කියලා තිබුණා. මං හිතනවා මල්ලි ඒක කරාවි කියලා."

"මොකවද මුදලාලි මේ කතාකරන්නේ? මං කෝපි එකක් හදාගෙන එන්නද?" කියලා ප්‍රේමා ඇහුවේ වෙනදට වඩා අමුත්තක්, දැකපු නිසයි. මුදලාලි හීනයක් දැකලා බයවෙලා කියලායි ප්‍රේමා හිතුවේ."

"හොඳයි ප්‍රේමා."

"කමලදාස ඇවිත සුරනිමල ඉඳගෙන හිටිය පුටුව ගාව බිම ඉඳ ගත්තා. එයා තාමත් ඉස්සර වගේම සුරනිමලට ගෞරවයෙන් සලකනවා."

"අර ගෑණිගේ මර හීනාව.. මර හීනාව.. " සුරනිමලට කියවුණා.

"ඇයි මුදලාලි? කවුරුවත් ගෙදරට ආවාද?"

"තාම නම් ඇවිල්ලා නෑ. ඒත් කොයි මොහොතක හරි ඒවි."

SL-Unlimited

"කවුද මුදලාලි?"

මුදලාලි ටික වෙලාවක් නිස්සද්ද වෙලා හිටියා.

"මගේ මාරයා කමලදාස.. ගෙදර ඉන්න විදිහක් නෑ. අර මල ඉලව් හිනාව ඇහෙනවා."

"මුදලාලි හීනයක් දකින්න ඇති. චනාඤුයා ගැන බය වෙන්න දෙයක් නෑ කියලා නන්දන මහත්තයා කිව්වේ. දැන් ඌශ අංගෙට කිසි කරදරයක් නැතිව අවුරුදු හත අටක්ම ගියානේ."

"නෑ කමලදාස ඌ තාම ඉන්නවා. නැත්නම් කොහොමද මට අර ඉලව් මර හිනාව ඇහුනේ?"

"ප්‍රේමා කෝපි කෝප්පය මුදලාලිට දුන්නා. මුදලාලි එයාට ස්තුති කරලා ඒක අතට ගත්තා."

"මං කොයිතරම් දුක් මහන්සි වුණාද අපේ පවුල නඟා සිටුවන්න. එකෙක් දෙකෙක් කරපු පාහර වැඩක් නිසා ඒ පවුලත් ඉවරයි, මේ පවුලත් ඉවරයි" මුදලාලි කිව්වා. ඇත්තටම ඒක මුදලාලි කාගේවත් දිහා බලාගෙනවත් කාටවත් කියපු දෙයක් නොවෙයි. ඒ වදන් පෙළ මුදලාලිගේ කටින් ඉබේම පිටවුණා කිව්වා නම් තමා වඩා හරි."

"මොනවද මුදලාලි මේ කියවන්නේ?" ප්‍රේමා ඇහුවා.

"සෙල්පෙල් අද තමයි මගේ අන්තිම දවස. මං දැනුවත්ව කාටවත් වරදක් කරලා නෑ. මං වරදක් කළා නම් ඒ වැරදි කරනවුන්ට ඉඩදීලා හිටිය එක විතරයි. ඔව් මං උත්සාහ කළා නම් මට ඒ ඔක්කොම නවත්තන්න තිබුණා. ඒත් මගේ හිතෙත් කොනක පළිගැනීමේ වේතනාවක් හැංගිලා තිබුණ නිසා මං ඒක නවත්තන්න උත්සාහ කළේ නෑ. කවුද හිතුවේ මේක බය තරම් දුරදිග යන ප්‍රශ්නයක් වේවි කියලා. ඒ මාරයා අන්තිමේදී පවුලේ එක එකා බිලි ගත්තා. අද මාව බිලිගන්න එනවා. ඔව්. ඌ අද එනවා මාව බිලිගන්න. මං මැරෙන්න බය නෑ. ඒත්.. ඒත්.. මට දුක මං කරපු හැම දෙයක්ම හඟට ඉණි කැපුවා වගේ උනාටයි."

"මුදලාලි. අද අපිත් එක්ක අපේ කාමරේ නිදාගන්න" ප්‍රේමා කිව්වා.

"වැඩක් නෑ ප්‍රේමා. කවුරු හිටියත් නැතත්, මාරයා ඇවිත් එයාගේ කාරිය කරල යනවා. මීට කලිනුත් තව අය හිටියා කියලා මාරයා හැරිලා ගියේ නැහැනේ. නිකං උඹලත් අමාරුවේ වැටෙනවා. මං කරපු වරදට මං තනියම මුණ දෙනවා."

www.sinhalalibrary.com
SL-Unlimited

"මුදලාලිට එහෙම වෙන්න දෙන්න බෑ. මුදලාලි දුප්පත් මිනිස්සු කී දාහකට උදව් කරලා තියෙනවද? මුදලාලිට එහෙම වෙන්න දෙන්න බෑ."

"මහ රහතන්නාන්සෙලාටත් කරපු පව් පඩිසන් දීලා තියෙනකොට මේ පෘථග්ජන අපට ඒක වෙන එක නවත්තන්න බෑ කමලදාස."

"තව ටික වෙලාවක් ඔය වගේ දේවල් කිය කිය ඉඳලා එයා ප්‍රේමාගෙන් කඩදාසි කොලයක් ඉල්ලගෙන ලියුමක් ලිව්වා. ඒකේ කොපියක් මං මේ ෆයිල් එකට දාලා තියෙනවා. ඒකේ තියෙන්නේ කමලදාස පදිංචිවෙලා ඉන්න වත්තේ කොටසයි, ඒ ගෙයි කමලදාසට පවරන්න කියන එකයි. ඒ ලියුම ලිව්වේ නන්දන මුදලාලිට. ඊට පස්සේ එයා පුටුවෙන් නැගිට්ටා."

"මුදලාලි අද මෙහේ ඉන්න."

"ඕන නෑ කමලදාස. වෙන දෙයක් වෙද්දෙන්. කවදා හරි අපි මැරෙන්නත් එපායෑ."

"ඔහේ යන්න මුදලාලිගේ පැත්තට" ප්‍රේමා කමලදාසට කිව්වා.

"ඔව් මුදලාලි. යං මාත් එන්නම්."

"එපා කමලදාස. කමලදාස ඉන්න. හොඳට දොරවල් වහලා නිදාගන්න. එළියට පහළියට බහින්න එපා."

"එහෙම කිව්වත් කමලදාස සුරනිමල මුදලාලි පස්සෙන් එන්න සූදානම් වුණා. ඒත් සුරනිමල ඒකට ඉඩ දුන්නේ නෑ. අන්තිමට කමලදාස ඇහුවා එහෙනම් මං නන්දන මුදලාලිට කෝල් එකක් දීලා එන්න කියන්නද? කියලා."

"එපා එපා. කාටවත් මං නිසා කරදර කරන්න එපා කමලදාස" කියලා මුදලාලි ගියා. මුදලාලි එහෙම කිව්වත්, ටික වෙලාවකට පස්සේ කමලදාස නන්දනට කතා කරලා විස්තරේ කියලා තියෙනවා."

"හොඳයි කමලදාස. මං දැන්මම එනවා" කියලා නන්දන කිව්වලු.

"නන්දනට එහාට එන්න පැය බාගයක් විතර යන නිසා විනාඩි විස්සක් විසිපහක් විතර කාලයක් තමාගෙ ගෙදරම රැඳිලා හිටපු කමලදාස වත්තට ඇතුළුවන ප්‍රධාන ගේට්ටුව ගාවට ගියා. ඒ නන්දන මුදලාලි ආපු ගමන් ඒක අරින්න බලාගෙන. කමලදාස එතනට වෙලා ටික වෙලාවක් බලාගෙන හිටියා."

"වත්තට කාරෙක ඇතුළු කරන්න ලොකු ගේට්ටුවක් තිබුණා. ඒ ඇරුණාම වත්ත වටේට අඩි දහයක් විතර උස තාප්පයකුත් බැඳලා. ඊට උඩින් කටුකම්බි පටමල් තුනකුත් දාලා තිබුණා. කාටවත් ලේසියෙන්

SL-Unlimited

විත්තට ඇතුළු වෙන්න බෑ. ප්‍රධාන දොරටුවට අමතරව ඒ කට්ටුවෙන්ම තවත් පුංචි ගේට්ටුවක් තිබුණා. එහෙම නැත්නම් ගෙදරට කවුරු ආවත් ලොකු ගේට්ටුවම අරින්න එපායැ. කමලදාසගේ ඇස් එක වරම ඒ පුංචි ගේට්ටුව දිහාවට යොමු වුණා. ඒ ගේට්ටුව ඇරලා දාලා. ඒක වෙන්න බැරි දෙයක්. ඒ ගේට්ටුව කිසිම වෙලාවක එහෙම නිකං ඇරලා දාලා තියෙන්නේ නෑ. ඒ ඇරත් හැන්දෑවේ හයට විතර බඩු වගයක් ගන්න කඩේට ගිය කමලදාස, ආපහු ඇවිත් ඒ ගේට්ටුව වහපු හැටි එයාට හොඳට මතකයි. ගේට්ටුව මොන හේතුවක් නිසා ඇරියත්, ඒ ගමන්ම වහන එක කමලදාස පුරුද්දට වගේ කරන එකක්. එයා ගැහී ගැහී ගේට්ටුව ගාවට ගියා. ඒ දොරේ ඉබ්බා ගේට්ටුව ගාව බිම තියෙනවා. එයා ගේ දිහා හැරිලා බැලුවා. ඒ පැත්ත කරුවලයි. ලයිට් ඔක්කොම නිවලා දාලා. එයා ටෝච් එක ගේ පැත්තට ගැහුවත්, දුර නිසා වැඩි යමක් පෙනුනේ නෑ. මිනිහගේ ඇඟට පණ ටිකක් ආවේ ඈත එන කාර් එකක ලයිට් එළිය නිසා. ගේට්ටුව ඇරියේ කොහොමද කියලවත් එයාට මතක නෑ."

"මොකද කමලදාස අයියේ මේ ගොල්මනක් දැකලා වගේ?" ජීප් එකේ ඉස්සරහා සීට් එකේ හිටිය සුදා ඇහුවා."

සුදා කියන්නේ නන්දනගේ බොඩිගාඩ්ට.

"අර.. අර.. පොඩි ගේට්ටුවේ ඉබ්බා ඇරලා.. කවුරුහරි ඇවිත් තියෙනවා."

"ඉක්මන් නැගපන් ජීප් එකට" නන්දන කිව්වා.

"ඒ ගොල්ල ගේ ගාවට ඇවිල්ලා ජීප් එක නැවැත්තුවා. ජීප් එකේ ලයිට් එළියට පෙනුනා ගෙදර දොර ඇරලා තිබුණ බව. කමලදාස ටෝච් එකත් අරං ඉස්සර වුණා. ගෙට ඇතුළු වුණ ගමන් විදුලි පහන් දැල් වුවා. ගෙදර කිසි කලබලයක් ඇතිවුණ ලකුණක් පේන්න නෑ. ඒ ගොල්ල කෙලින්ම ගියේ සුරනිමලගේ කාමරේට. විදුලි පංකාවේ එල්ලලා තිබුණ සුරනිමලගේ සිරුරත් එක්ක විදුලි පංකාව හෙමින් හෙමින් කැරකෙනවා. බෙල්ලට දාලා තිබුණ "රන්දෙණිගල ව්‍යාඝ්‍රයා" කියන පුවරුව ඇරුණාම ඇගේ වෙන කිසිම තුවාලයක ලකුණක් වත් නෑ. නන්දන කෑ ගහගෙන ගිහින් අයියාව පහතට ගත්තා. වැඩක් නෑ. එතකොටත් එයාගේ වැඩ අවසානයි."

"නන්දන වහාම ඒ සිද්ධිය පොලිසියට දැනුම් දුන්නා. පොලිස් පරීක්ෂණ වලින් අනාවරණය කරගත් කරුණු රාශියක් තියෙනවා. අර විවෘත කර තිබුණ කුඩා දොරටුව ලඟ විශාල ලෙස වැවුණ බට පඳුරක් තියෙනවා. ඒ පඳුරේ ගස් කීපයකම තැලිලා පොඩිවෙලා

ගිහින් තියෙනවා. පසුගිය දිනවල ඒ ප්‍රදේශයේ මඳ වැසි ඇතිවෙලා තියෙනවා. ඒ නිසා පඳුරු හරිය ටිකක් තෙත සහිතයි. ඒ අතර මෝටර් සයිකල් රෝදයක සලකුණු වගයක් සටහන් වෙලා තියෙනවා. ඒ නිසා මිනීමරුවා මෝටර් සයිකලයකින් පැමිණි පුද්ගලයකු බවට පොලිසිය සැක කරනවා."

"ගේට්ටුවේ ඉබ්බා කඩා දමා තිබුණේ නෑ. ඒව දමා තිබුණ ඉබ්බා සාමාන්‍ය කෙනෙකුට පහසුවෙන් අරින්න පුළුවන් එකක් නොවෙයි. ඒ නිසා මිනීමරුවා අත එක්කෝ එහි යතුර තිබිය යුතුයි. නැත්නම් ඔහු ඒවා විවෘත කිරීමෙහි ගජයෙකු විය යුතුයි."

"සුරනිමලගේ මරණය රාත්‍රී 10.00ත් 11.00ත් අතර සිදුවී තිබෙන බව මරණ පරීක්ෂක වාර්තාවේ සඳහන් වෙනවා. ඊට ආසන්න කාලය තුළ මහා මාර්ගයේ ගමන් ගත් මෝටර් සයිකල් පිළිබඳව පොලිසිය හොයලා බලලා තියෙනවා. ඒ කාලය ඇතුලත බස් වලින් ගමන් කළ අය, පයින් ගිය අය, වෙනත් වාහන වලින් ගමන් කළ අය, පාර අයිනේ ඇති ගෙවල්වල අය, තේ කඩ වල හිටි අය මේ හැම කෙනෙකුගෙන්ම පොලිසියට ආරංචි ලැබිලා තියෙනවා. මේ අනුව මෝටර් සයිකල්කරු රන්දෙණිගල ප්‍රදේශයේ සිට පැමිණි එකක් බව පොලිසිය සැක කරනවා. ඔහු ඇඳ සිටි කළුපාට ඇඳුමත්, දමා තිබුණ හෙල්මට් එකත් නිසා ඔහු ගැන වැඩි විස්තරයක් ලබා ගැනීමට පොලිසිය හැකි වෙලා නෑ. මේ පිළිබඳ පරීක්ෂණ තවමත් පැවැත් වෙනවා. පොලිසියට සැහෙන විශ්වාසයක් තියෙනවා මිනීමරුවා ළඟදීම කොටු කර ගන්න පුළුවන් වෙයි කියලා."

"එතකොට දැනට හොයාගෙන තියෙන තොරතුරු එච්චරයි නේද?"

"තව එකක් කියන්න තියෙනවා සර්. මං සුරනිමලගේ කාරේ තිබුණ රන්දෙණිගල විනාශයා කියන පුවරුවේ අකුරු විශේෂඥයකු ලවා පරීක්ෂණයට භාජනය කෙරෙව්වා. ඒ අකුරු, කලින් පුවරුවල තිබුණ අකුරුවලට වඩා හාත්පසින්ම වෙනස්. ඒක මං හිතන්නේ සර් අපේ මේ පරීක්ෂණ වලදී ප්‍රයෝජනවත් සාක්ෂියක් වෙන්න පුළුවන්."

"ඔව් ඒක ඇත්ත. දැන් එහෙනම් ජයන්තට තියෙන්නේ රන්දෙණිගලට යන්න. සමහර විට ඔය මෝටර් සයිකල්කාරයා ගැන වැඩි යමක් එහෙන් හොයා ගන්න පුළුවන් වේවි. පොලිස් පරීක්ෂණයට ලක් වුණ ඒ කාලසීමාව තුළ රන්දෙණිගලට එපිටින් ආපු මෝටර් සයිකලයක් ගැන වාර්තා වෙලා නෑනේ. හැබැයි පාරේ යන හැම වාහනයක්ම මිනිසුන්ගේ දර්ශනයට හසු නොවෙන්නත් පුළුවන්. ඒ වගේම දැකපු හැම මිනිහෙක්ම පොලිසියට සාක්කි දෙන්න නොඑන්නත් පුළුවන්. කොහොමටත් එහේ ගියාම මොකක් හරි තොරතුරක් දැන

SL-Unlimited

ගන්න ලැබේවි."

"ඕකේ බොස්" කී ජයන්ත පුටුවෙන් නැගිට්ටේ ය.

"ජයන්ත. ඒ ගමන් රන්දෙණිගල කුමාරිහාමිගේ පැහැරගෙන යාම සම්බන්ධයෙන් පොලිස් පොතේ සටහන් වෙලා තියෙන විස්තරත්, ඒ පිළිබඳව ගම්මුන් කියන දේවලුත් විපරම් කරලා බලන්න. ඒ සිද්ධිය වෙලා දැන් අවුරුදු තිහක් විතර ගිහින් තියෙන නිසා, එදා ඒ ගැන කතා නොකරපු අය අද බය නැතිව කතා කරන්නත් පුළුවන්."

"අපේ ඉදිරි පරීක්ෂණ වලට කමලදාස කියන පුද්ගලයා ඉතා වැදගත් කෙනෙක් වෙන්න පුළුවන්. එයා සුරනිමල මුදලාලිගේ ව්‍යාපාර ආරම්භ කරපු කාලයේ ඉඳලම හිටි කෙනෙක්. ඒ නිසා මේ අපරාධවලට මුල් වූ හේතු සම්බන්ධයෙන් යම් කිසි හෝඩුවාවක් එයාගෙන් දැන ගන්න නොලැබෙන එකක් නෑ. එතකොට සුරනිමල මුදලාලි කරපු පාපොච්චාරණය අනුව, රන්දෙණිගල කුමාරිහාමි පැහැරගෙන යාමට පවුලේ අයගේ ඇති සම්බන්ධකම පෙන්නුම් කරනවා වෙන්න පුළුවන්. මඳක් උත්සාහ කළා නම් ඒක නතර කරන්න පුළුවන් බව පෙනිලත්, එයා ඒක නොසලකා හිටි බව වෙන්න ඕන එයා කියන්න ඇත්තේ. ඒ එක්කම රන්දෙණිගල ව්‍යාඝ්‍රයා වශයෙන් මිනීමැරුම් කළ පුද්ගලයන් ගැන නන්දන විමසිල්ලෙන් හිටි බවත්, ඔවුන් නන්දන අතින් විනාශ වුණ බවටත් සැකයක් ඇති කර ගන්න පුළුවන්. වීඩියෝ සජිත නන්දන මිලට ගත් නිසා සමහර විට මිනීමරුවා කවුද කියලා එයා අඳුන ගන්න ඇති. සුරනිමලගේ මරණය වුණේ ඊට අවුරුදු අටකට පස්සේ. මීට පෙර හැම මරණයක් අතරම තිබුණ පරතරය අවුරුදු තුනකට වැඩි වෙලා නෑ. ඒ නිසා මං හිතනවා රන්දෙණිගල ව්‍යාඝ්‍රයාව නන්දන විනාශ කළා කියලා, ඒ නිසා තමයි සුරනිමලගේ කරේ තිබුණ පුවරුවේ ලියා තිබුණ අත් අකුරු කලින් තිබුණ අත් අකුරු වලට සමාන නොවුණේ. එතකොට මට සැකගන්න විශ්වාසයක් තියෙනවා සුරනිමලව මරා දැමුවේ වෙන පුද්ගලයකුව බව. එහෙම බැලුවොත් මේ මිනීමැරුම් වලට කිහිප දෙනෙක්ගෙම සම්බන්ධයක් ඇති බව පෙනෙනවා. ඒක හිතන්න අමාරු දෙයක් වුණත්, ගත වුණ දීර්ඝ කාලය දිහා බැලුවාම කිසිම දෙයක් වෙන්න බැරි දෙයක් කියලා අහක දාන්නත් බෑ."

SL-Unlimited

# 8

සුරනිමලගේ අවමඟුලට සහභාගි වී, හත් දවසේ දානය දින දක්වා එහි නතර වී සිටි විමලසිරි, පසු දින හැරී සහ පැට්රික් හමුවට පැමිණ එහි දී තමන් ලබා ගත් තොරතුරු විස්තර කළේය.

"මං හිතන විදිහට සුරනිමලගේ අවමඟුලට හාරදාහක් පන්දාහක් විතර දෙනා සහභාගි වෙන්න ඇති. ඒ ආපු හැම කෙනෙක්ම වගේ සුරනිමලගේ හොඳ තමයි කිව්වේ. මිනිහා සෑහෙන පිරිසකට රස්සාවල් ලබා දීලා තියෙනවා. හැබැයි ඒ ආපු අයගෙන් හුඟ දෙනෙක්ම නන්දන ගැන බොහොම අපැහැදීමකින් තමයි කතා කළේ."

"ඒ අයගේ කතා වලින් මට තේරුණා නන්දන අයියට හුඟක් ගරු කරපු කෙනෙක් කියලා. සුරනිමලගේ ජයග්‍රහණ පිටිපස්සෙන් නන්දනගේ හෙවනැල්ල වැටිලා තියෙනවා. සුරනිමල ලබා ගත්තු සමහර කොන්ත්‍රාත් වැඩ නන්දන මැති ඇමතිවරුන්ට කරපු උදව් නිසා ලැබුණ දේවල්ල. නන්දන කරපු වැඩ නිසා සුරනිමලට බොහෝම වාසි ලැබිලා තියෙනවා. ඒ වුණත් සුරනිමල මල්ලී කරන වරදක් දැකපු ගමන්ම ඒකට අවවාද කරනවා. නන්දනත් පුතා වගේ ඒ අවවාදේ පිළිගත්ත බව අඟවනවා."

"සුරනිමලගේ බිරිඳ නැති වුණාට පස්සේ දරුවා පෞද්ගලික පාසලක නේවාසිකව නවත්වලා තියෙනවා. දරුවගේ වැඩකටයුතු හැම දෙයක්ම වගේ කෙරිලා තියෙන්නේ නන්දන අතින් තමයි. ඒ කියන්නේ නේවාසිකාගාරයට එක්කරගෙන යන්නෙත්, ආපහු ගෙදරට අරගෙන එන්නෙත් නන්දන තමයි. පොත්පත් අරං දෙන එක, නිවාඩු කාලවල පොඩි විනෝද ගමනක් යන එක මේ වගේ වැඩ ඔක්කොම කරලා තියෙන්නේ නන්දන තමයි. සුරනිමල ව්‍යාපාර කටයුතු වලට කොටුවෙලා. ඒ නිසා ජයදේව තාත්තට වඩා බාප්පාට ළං වීම අසාධාරණ නෑ. එයාගේ අලුත බැඳපු නෝනත් එක්ක ජයදේව අවමඟුලට ඇවිත් හිටියා. ජයදේව නම් ඒ තරම් කනගාටුවකින් ඉන්න බවක් පේන්න තිබුණේ නෑ. එයාගේ නෝනා හරිම ලස්සනයි සර්. කුමාරිකාවක් වගේය කිව්වට වරදක් නෑ. එයා නම් තැති ගැනීමකින් හිටි බව පේන්න තිබුණා. සුරනිමල මැරෙන්න දවස් තුනකට විතර උඩදී තමයි ජයදේව විවාහ වෙලා තියෙන්නේ. ඒ මෙයා වලව්වක හැදුන වැඩුන

දුරුවෙක්ලු. රත්මල්වත්ත කියන වලව්වේ. විවාහයෙන් පස්සේ ජයදේව බාප්පාගේ ගෙදරට පදිංචියට ගිහිං. එතකල් එයා ඉඳලා තියෙන්නේ තාත්තත් එක්ක."

"නන්දන නම් හරිම සනගාටුවෙන් ඉන්න බව පේන්න තියෙනවා. එයා පොලිසියට බණිනවා. මෙච්චර දේවල් වෙද්දිත් පොලිසිය නිහඬ වෙලා, බුදිය ගෙන ඉන්නවා. එහෙම නැත්නම් පොලිසිය මිනීමරුවන් ආරක්ෂා කරනවා කියලා කියනවා. එතකොට සමහර දෙනෙක් මිනිහගේ පස්සට කියනවලු පොලිසිය නිදාගෙන ඉන්න එක ගැන නන්දන මහත්තයා සතුටු වෙන්න එපැයි. එහෙම නැත්නම් නන්දන මහත්තයා අද ඉන්නේ හිරගෙදරනෙ කියලා."

"නන්දනත්, ජයදේවත්, ලෙලිත් ඇරුණාම ඒ තුන්දෙනාගෙම බොඩිගාඩ් එහෙම නැත්නම් ගෙවතැල්ල වගේ තව ගැටයෙක් හිටියා. මිනිහට අවුරුදු 25-26ක් විතර වයස ඇති. හොඳ උස මහත කඩවසම් ඉලන්දාරියා. සුදා කියලා තමයි නන්දන මිනිහට කතා කරේ. මිනිහා කොතන හිටියත් ඇස් දෙක හතර වටේට හරි ඉක්මනට යවනවා. බොහොම ඊනන්දුවෙන් ඒ අයව ආරක්ෂා කරන බව පෙනෙන්න තිබුණා."

"ඒ හැමදෙනාටම වඩා වේදනාවෙන් හිටියෙ කමලදාස කියන මනුස්සයා තමයි. මිනිහා වැල්ලවාය ගමේ මනුස්සයෙක්. සුරනිමලගේ කඩේ වැඩටත්, ගෙදර දොර වැඩකටයුතු වලටත් ඒ කාලේ ඉඳලම උදව්වට ඉඳලා තියෙන්නේ කමලදාස තමයි. සුරනිමල යන යන තැනට මිනිහවත් එක්කරගෙන ගියා. ගෙදර මුරකාරයා, කෝකියා උනේ කමලදාස තමයි. මෑතකදී මිනිහට කසාදයක් බන්දලා දීලා තියෙන්නෙත් සුරනිමලම තමයි. හැඩකාර තරුණ ළමිස්සියක්. මං හිතන්නේ ඒ දෙන්නගෙ වයස පරතරය අවුරුදු විස්සක්වත් ඇති. ඒ ළමිස්සිට නන්දන අතින් වරදක් සිදුවෙලා තියෙනවලු. පස්සේ ඒ දෙමවුපියෝ සුරනිමල හමුවෙන්න ඇවිත් අඬලා වැලපිලා අවනඩුව කිව්වාම සුරනිමල උන්ටත් සෑහෙන ගානක් දීලා, ළමයගේ අනාගතය මං බාර ගන්නම් කියලා, කමලදාසට බන්දලා දීලා තියෙනවා. සුරනිමල හිටපු ගෙට පහලින් පොඩි ගෙයකුත් හදලා දීලා තියෙනවා ඒ ජෝඩුවට ඉන්න. ඒ පොඩි ගේ කෑල්ලත්, ඒ අවට ඉඩම් කෑල්ලත් ඒ දෙන්නට ලියලා දෙනවා කිය කිය හිටියට ඊට ඉස්සරවෙලා තමයි මේ මරණය සිද්ධ වෙලා තියෙන්නේ."

"සුරනිමල ඔය ගෙදරට පදිංචියට ගිහින් දැන් අවුරුදු දහයක් විතර වෙනවලු. ඒ ගමේ ඉන්න සුවාරිස් කියලා මනුස්සයෙක් එක්ක කමලදාස බොහෝම යාලුවෙලා ඉන්න බව මට තෙරුණා. ඒ නිසා

මමත් කොහොම හරි සුවාරිස් එක්ක හොඳට යාළු වුණා. සමහරදාකට සුරනිමල කොළඹ වැඩ කටයුතු වලට ගිහින් දවස් තුන හතර ඉන්නවලු. ඒ දවස්වලට කමලදාස සුවාරිස් අයියා හම්බ වෙන්න යනවලු. එහෙදී හීන් අඩියක් එහෙම ගහන්නත් අවස්ථාවක් ලැබෙනවාලු. මරණ ගෙදර වැඩ කටයුතු වලටත් සුවාරිස් සෑහෙන උදව් කළා."

"අර මිසිස්ට නන්දනගෙන් වරදක් වෙලා තමන්ට භාරගන්න වුණා කියලා සුවාරිස්ගෙ ගෙදරදී කමලදාස කියලා තියෙනවා. ඒත් ඒ මිසිස් හරි හොඳ බවත් තමාට ආදරෙන් බලන බවත් එයා කියලා තියෙනවා."

"සුරනිමල කොළඹ ගිය සමහරදාට නන්දන තම නිවසට පැමිණෙන බවත්, එසේ පැමිණ තමන් කොහේ හෝ රාජකාරියකට යවා ඒ මිසිසියත් සමග කාලය ගත කරන බවත්, පහු ගිය දවසක කමලදාස සුවාරිස්ට කියලා තියෙනවා. ඒ ගෑණි ඒකට අසතුටු වුණත් ඔවුන්ගේ අහිංසක කමින් ප්‍රයෝජන ගන්න එක නන්දන නවත්වලා නෑ. බැරිම තැන කමලදාස ඒක සුරනිමලගේ කණේ තියලා. ඒ බව දැනගත්තාම සුරනිමලට හොඳටම තැගලා. ඒ මොකවත් නිසා නොවෙයි. සුරනිමල කමලදාසට සැලකුවේ තමන්ගෙම සහෝදරයෙක් විදියට. එදා සුරනිමල ගිහින් නන්දනට හොඳටම දොස් කියලා, ආයෙත් එහෙම මං ගෙදර නැති වෙලාවක ඒ පැත්තේ පය් පාගන්න එන්නත් එපා කියලා කිව්වලු. සුරනිමලගෙන් නන්දනට ඔය වගේ අවවාද අනුශාසනා ඕන තරම් ලැබිලා තියෙනවා. ඒත් එදා ඒ වෙච්ච දෙයින් පස්සේ දෙන්න අතර පොඩි නොහොඳ නෝක්කඩුවක් ඇතිවෙලා තියෙනවා. ඒ දෙන්නගේ ආස්සරේත් ටිකක් අඩුවෙලා. සුරනිමල තමාට මදි පුංචි කමක් කළා කියලා නන්දන හිතන්න ඇතිලු. ඔය සිද්දිය වෙලා තියෙන්නේ දැනට මාස හතරකට විතර කලින්."

"ජයදේව දැන් බැඳලා ඉන්න ගෑණු ළමයට තමා අකමැති බව සුරනිමල කමලදාසට කියලා තියෙනවා. සුරනිමලත් ඒ පවුල් අයත් අතර අවුරුදු ගාණක් තිස්සේ වෛරයක් තිබිලා තියෙනවලු. ඒක සුරනිමල අකමැති වෙන්න එක හේතුවක්. සුරනිමලත් එක්ක ව්‍යාපාර කටයුතු කරපු මුදලාලි කෙනෙක්ගේ ජයන්ති කියන දියණිය එක්ක ජයදේවගේ සම්බන්ධයක් තිබිලා තියෙනවා. ඒ කවුරුත් හිතලා තියෙන්නේ ජයදේව ඒ ළමයව බඳීවි කියලා. ඒක සුරනිමල ඒ විවාහයට අකමැති වුණ තවත් හේතුවක්. ඒත් ජයදේව කියලා තියෙන්නේ ජයන්තිත් තමනුත් විවාහ වීමේ බලාපොරොත්තුවෙන් ඇසුරු නොකළ බවත්, තමන් කර ගන්නා මේ විවාහය නිසා එම පවුල් උදවිය හා තිබුණ පැරණි අමනාපකම් අවසාන වෙන බවත් තමයි. මේ සම්බන්ධෙට

SL-Unlimited

නන්දන සම්පූර්ණයෙන්ම කැමති වෙලා තිබුණා විතරක් නොවෙයි. ඒ දෙන්නගේ සම්බන්ධය ඇති වෙන්න කටයුතු කරලා තියෙන්නෙත් නන්දන බව දැන ගත්තාම සුරනිමලගේ හිතේ නන්දන ගැන තිබුණ තරහව තවත් වැඩි වෙලා තියෙනවා."

"මේ අතරතුර ඒ ගෑනු ළමයගේ පවුලෙ අයට මිය සම්බන්ධෙ ගැන ආරංචි වෙලා ඒකට විරුද්ධතා ඇති කරන කොට තමයි, ජයදේව රහසින්ම විවාහ වෙලා බාප්පාගේ ගෙදරට ගිහින් තියෙන්නෙ."

"සුරනිමලගේ අවමඟුලට සහභාගි වුණ මැති ඇමතිවරු කිහිපදෙනෙක්ම මේ වනාන්තරයා කෙසේ හෝ අල්ලා ගන්නා ලෙසට පොලිස්පති තුමාට බලකර සිටින බවට පොරොන්දු වෙලා තියෙනවා."

"අවමඟුල් කටයුතු කෙරෙන අතර, නන්දන කමලදාසට කියලා තියෙනවා, එයා ඉන්න ගේයි ඉඩමයි කමලදාසට ලියන්න කියලා අයියා කියා තිබෙන ඒ පොරොන්දුව ඒ විදිහටම ඉෂ්ට කරනවා කියලා. ඒත් කමලදාස බයෙන් ඉන්නේ, එයාගේ ගෑණිව නන්දනගෙන් බේරගන්නේ කොහොමද කියලා. ඒ එක්කම එයා හරියට දුක් වෙනවා එදා සුරනිමලව අර සාහසිකයගෙන් බේරගන්න නොලැබුණ එක ගැන. මගේ ජීවිතේ දීලා හරි මට ඒක කරන්න ලැබුනනම් මං ඒක කරනවා කියලා වරින් වර කිහිප වතාවක්ම කමලදාස සුවාරිස්ට කියලා තියෙනවා."

"විමලසිරිට හුගක් විස්තර හොයා ගන්න සුවාරිස් උදව් කරලා තියෙනවා වගෙයි."

"ඔව් ඔව්. කමලදාසත් එක්ක වැඩි පුරම ගැවසුන පුද්ගලයා සුවාරිස් නිසා මං දැනගත්තා විශ්වාසදායක විදිහට ආරංචියක් ගන්නවා නම් අල්ලගන්න ඕන මිනිහා එයා කියලා. මාත් ඉතිං සුරනිමල මුදලාලිගෙන් රස්සාවක් ගත්තු කෙනෙක් විදිහට රඟපෑවා. මං මිනිහත් එක්ක අවමඟුල් ගෙදරට අවශ්‍ය කරන දේවල් ගේන්න ගියා. ඒ යනකොට එයා මගෙන් විස්තර ඇහුවා. මං කිව්වා මගේ ගෑණිටත් නන්දන නිසා ළමයෙක් ලැබුණ බව. ඒක කිව්වාම මිනිහා මං ගැන අනුකම්පා කරන්න වුණා. ඒ පාර තමයි එයා ටික ටික කිව්වෙ අර ප්‍රේමා කෙල්ලටත් නන්දනගෙන් කරදර තියෙනවා කියලා. හැබැයි අපි දෙන්නගේ ඒ කතා බහ බොහෝම කල්පනාවෙන් කරන්න මං තීරණය කරගෙනයි හිටියේ. අර සුදා කියන මිනිහා බොහොම පෙහෙවිලෙත් ඉන්නෙ. බැලූ බැල්මට සාන්තුවරයෙක් වගේ පෙනුනට, මිනිහා වෙලාවකට බැල්මක් දානවා නිකං අළු වෙලා යන සයිස් එකට. ඕං මිනිස්සු හතර පස්දෙනෙක්ම බාවලා ඉන්න, පමුණුවේ සුදා කියලා පාතාලේ විකක් ප්‍රසිද්ධ කෙනෙක්ලු."

SL-Unlimited

"හොඳයි. විමලසිරි දැන් මං විමලසිරිට පවරන්න අදහස් කරන්නේ භාරදූර කාර්යයක්. සුරනිමල මුදලාලි ධනවතෙක් බවට, බලවතෙක් බවට පත් වුණේ වැල්ලවාය ප්‍රදේශයේ ඔහු විසින් පවත්වාගෙන ගිය වෙළිඳ සැලක් නිසා. ඔහුගේ ව්‍යාපාරවල ආරම්භය, ඔහුට තිබිය මිතුරන්, සතුරන් වගේ දේවල් හොයා ගන්න ඕනෙ. රහසිගතවම පරීක්ෂණ කරන්න. විවිධ වේශ වලින් සැරසිලා, විවිධ පුද්ගලයින් විදිහට රඟපාමින් පරීක්ෂණ කටයුතු කරන්න. වැඩේ භාරදූර බව මම දන්නවා. ඒ නිසා විමලසිරිට දවස් තුනක් දෙන්නම්. ඊත් වැඩේට තවත් කල් අවශ්‍යනම් මට කියන්න. මං ඒ ගැන හිතලා බලන්නම්."

●●●

"ජයදේව විවාහ වුණ මේ රජමල්වත්ත වලව්වේ අය ගැන අංකල් දන්නවද? විමලසිරි කියපු විදිහට ඒ අය රන්දෙණිගල වලව්වට සම්බන්ධ වගෙයි මට පෙනෙන්නෙ."

"ඇයි පැට්රික් මං නොදන්නේ? මං ඔයාට කිව්වේ අර ශ්‍රී ලාල් කියලා කෙනෙක් ගැන. එයා තමයි රජමල්වත්ත පරපුරේ දැන් ඉන්න එකම කෙනා. එයාලට තිබ්බේ එකම එක දුවක් විතරයි. ඒ කෙල්ල හරි හැඩකාරියක්. මාධවී විශ්ව විද්‍යාලයට තේරුණ එකට ඒ ගෙදර පොඩි සාදයක් පැවැත්තුවා. මටත් ඒකට ආරාධනා ලැබුණා. ඇබැයි ඒ තමයි මට ඒ අයව හමු වුණ අවසාන වතාව. ඊට පස්සෙත් කීප සැරයක්ම මම එයාලාට ටෙලිෆෝන් කරලා තියෙනවා. ඒ ඇරෙන්න ළඟ සම්බන්ධයක් තිබුණේ නෑ. හැබැයි මට හිතාගන්න බෑ මේ විවාහය ශ්‍රී ලාල් කොහොම දරාගෙන ඉන්නවද කියලා."

"අපට එයාගෙන් මොනවා හරි විස්තරයක් දැනගන්න බැරිවෙන එකක් නෑ නේද අංකල්?"

"ඔව්. හොඳ අදහස. දැන් අපට ඊළඟට ආරංචි එන්න තියෙන්නේ කාගෙන් ද?"

"ජයන්ත රන්දෙණිගල ඉඳලා එන්නේ අනිද්දාට."

"හොඳයි. අපි එහෙනම් හෙට රජමල්වත්ත වලව්වටට යමු. මං දැන්ම ශ්‍රී ලාල්ට කතා කරන්නම්."

●●●

SL-Unlimited

# 9

පේරාදෙණිය මල්වත්තට නුදුරින් අවුරුදු සියයකට වඩා පැරණි වූ දෙමහල් මන්දිරයකි. පැරණි වුවත් තවමත් ඉතා ශක්තිමත් වූ මෙම මන්දිරය "රජමල්වත්ත වලව්ව" නමින් හැඳින්වෙයි. මෙහි ආදි නිවැසියෝ ශත වර්ෂ කිහිපයකට පෙර, සිංහල රජ දවස, රජතුමාට සේවය කළහ. පසුව ඉංග්‍රීසි පාලකයන් හා එකතුවී ඔවුන්ගෙන්ද තාන්න මාන්න ලබා ගත්හ. වර්තමානයේ මෙහි හිමිකරු වූයේ ශ්‍රී ලාල් ඒකනායක නම් වූ අධිනීතිඥ වරයෙකි.

සිය එකම දියණිය, තම පවුලට නොගැළපෙන තරුණයකු හා විවාහ වීම ගැන ඉතා කම්පාවට පත්ව සිටින ශ්‍රී ලාල්ට, පසු ගිය දින කිහිපයම නිදි සුව අත් විඳීමට නොහැකි විය. ඔහු ගේ බිරිඳ වූ මයුරිද එය විඳ දරා ගත්තේ ඉතා අපහසුවෙනි. තම දියණිය කෙරෙහි වූ විශ්වාසය නිසා, ඔවුන්ගේ සම්බන්ධය ගැන විපරම් කර නොබැලීම ගැන ශ්‍රී ලාල් දැන් තමාටම දොස් පවරා ගනී.

හැරී ජයසුන්දර සහ පැට්රික්, රජමල්වත්ත වලව්වට පැමිණියේ ඔවුන් මෙසේ තම දියණිය ගැන කම්පාවෙන් පසු වන අවස්ථාවෙහිය.

"ඉතිං ඉතිං ශ්‍රී ලාල්. අපි මේ බොහෝම කාලයකට පස්සේ නේද හමුවුණේ? මේ මගේ මිත්‍රයෙක් පැට්රික්."

"අඳුන ගන්න ලැබීම ගැන බොහොම සන්තෝසයි. එන්න අපි ඇතුළට ගිහින් වාඩි වෙමු. මං හිතන්නේ අපි මේ හමුවුණේ අවුරුදු පහකට විතර පස්සේ නේද හැරී?"

"නෑ. අවුරුදු හයකට පස්සේ. අපි අන්තිම වතාවට හමු වුණේ මාධවී විශ්ව විද්‍යාලයට යන්න තේරුන දවසේ මෙහේ තිබුණ පාටියෙදී" හැරී පරණ සිද්ධියක් යළි සිහිපත් කළේය.

"හැරීට හොඳ මතකයක් තියෙනවා" සුසුමක් හෙලමින් ශ්‍රී ලාල් කීවේ ය.

"ශ්‍රී ලාල් මට ඇත්ත කියන්න. ඔයයි, මයුරියි දිහා බලපුවාම මට හිතෙනවා ඔය දෙන්න බොහොම කනගාටුවෙන් ඉන්නව කියලා."

"අනේ මං දන්නේ නෑ හැරී. අපට හරි අකරතැබ්බයක් නේ වුණේ. මේවා කොහොම කටක් ඇරලා කියන්න ද?" මයුරිද කතාවට හවුල් වුවා ය.

www.sinhalanovel.com SL-Unlimited

"මං එහෙනම් ඇත්තම කියන්නම්කෝ. මටත් ටිකක් ටිකක් ඔය ගැන ආරංචි වුණා. මං ආවේ රාජකාරි වැඩකටත් එක්ක. ඉතිං මං අහන ප්‍රශ්න වලින් ඔයාලට හිතට වේදනාවක් ඇති වෙන්නත් පුළුවන්. ඒත් මට හරි උත්තරයක් ලැබෙනවා නම් මගේ රාජකාරියට ඒක ලොකු උදව්වක් වෙවි."

"අහන්න සැර්. සැර් වෙනුවෙන් අපි ඕනම උදව්වක් කරන්නම්. ඇරත් ඕවට උත්තර හංගලා, රැක ගන්න දෙයක් අපට දැන් නෑනේ."

"මේ ඉන්න පැට්‍රික් මාත් එක්ක එකතු වෙලා මිනී මැරුමක් ගැන හොයනවා. මිනී මැරුමක් කිව්වට ඒක මිනී මැරුම් වැලක්. රන්දෙණිගල ව්‍යාඝ්‍රයා ගැන ශ්‍රී ලාල්ට අලුතෙන් කියන්න ඕන නැහැනේ."

"ඔව්. ඔව්. මං ඒ ගැන දන්නවා."

"ඒ ගැන හොයන කොට අපට ආරංචි වුණා ජයදේව, මාධවී එක්ක විවාහ වෙලා ඉන්නවා කියලා."

"ඒක ඇත්ත සැර්. මං ඒකයි කිව්වෙ අපට දැන් නැති වෙන්න දෙයක් නෑ කියලා. ඒක පැත්තකින් අපට අපේ දුව නැති වුණා. අනෙක් පැත්තෙන් පරම්පරා ගානක් තිස්සේ අපට උරුම වෙලා තිබුණ රන්දෙණිගල වලව්වත් අපට අහිමි වුණා."

"ඒ කොහොමද රන්දෙණිගල වලව්ව ඔයාලට අහිමි වුණේ?"

"සැර් දන්නවනේ, විල්සන් මට එයාගේ අයිතිය පවරලා අතුරුදහන් වුණ බව. ඉන් පස්සේ මං ඒකට මුර කාරයෙක් හෙම දාලා ඒ වලව්වත් වත්ත පිටියත් බොහොම හොඳට තියාගෙන හිටියා. සමහර නිවාඩු දවස් අපි ඒ වලව්වට ගිහින් ගත කරලා එනවා. මාධවී හරි ආසයි රන්දෙණිගල වලව්වට. ඉස්කෝලෙ නිවාඩු දෙනකොට එයා අහන එකක් තමයි කවද්ද අපි රන්දෙණිගල යන්නෙ කියලා. ඇයි ඒ වත්තෙ හරියට පළතුරු ගස් තියෙනවනේ. ඇරත් ඒක ඒක ජාතියෙ කුරුල්ලො කිරිල්ලියො සිංදු කියනවා, අහං ඉන්නත් හරිම ආසයි. සැර්ට මතකද අර වත්ත පහළ තියන දිය ඇල්ල. එතනට ගිහින් නාන්න එයා හරි ආසයි. ඉතින් එයා උපාධිය ගත්තට පස්සේ මං ඇහුවා මගෙන් දුවට ලොකු තෑග්ගක්, අමතක නොවන ලොකු තෑග්ගක් දෙන්න ආසයි. ඔයාට මොකක්ද ඕනේ කියලා. එයා ගත් කටටම කිව්වෙ රන්දෙණිගල වලව්ව එයාට දෙන්න කියලා. ඒක ඉතිං කොහොමටත් ඔයාටමනේ අපි දෙන්න ඉන්නෙ කියලා මං කිව්වා. ඒක විතරක්යැ. මේ රජමල්වත්ත වලව්වත් ඔයාට තමයි කියලා මයුරි කිව්වා. එතකොට එයා බොහොම සන්තෝසෙන් හිනා වුණා. මට වලව්

SL-Unlimited

දෙයක් ඕන නෑ අම්මේ. මං රන්දෙණිගල වලව්වට හරි ආසයි එයා කිව්වා. එයා ඒක ගද්දිසි කළේ නෑ. ඒ වුණත් එයා ඉල්ලපු දේ නේද කියලා මං, රන්දෙණිගල වලව්ව එයාගෙ නමට ලියලා දුන්නා."

"ඕක මාධවීට ලියලා දෙන දවස්වලත් මාධවීගෙයි ජයදේවගෙයි සම්බන්ධය තිබුණාද?"

"නෑ මං හිතන්නේ නෑ."

"මාධවීට රන්දෙණිගල වලව්ව ලියලා දීපු බව දන්න කෙනෙක් ඉන්නව ද?"

"මං ඒක අණ බෙර ගහලා කරපු වැඩක් නම් නොවෙයි. හැබැයි මං ඊට පස්සේ නිවාඩුවකට වලව්වට ගිය වෙලාවේ, මුරකාරයට කිව්වා මේ පුංචි මැණිකේ වලව්වට හරි ආසයි නේ. ඒක නිසා මං ඒක එයාගේ නමට ලිව්වා, දැන් ඉතිං වලව් වත්ත වෙනදට වඩා හොඳට තියා ගන්න ඕනෙ කියලා මං කිව්වා. ඒ ඇරෙන්න වෙන කාටවත් මං කිව්වෙ නෑ."

"හොඳයි. ශ්‍රී ලාල්ට කියන්න පුළුවන්ද මාධවීගෙයි ජයදේවගෙයි සම්බන්ධය ගැන ඔයා දන්න දේවල්."

"ඕක වෙලා තියෙන්නෙ මෙහෙමයි. මාධවීට මුල්ම පත්වීම ලැබුණේ මහනුවර පෞද්ගලික බැංකුවකට. මං නං කැමති වුණෙත් නෑ මාධවී රස්සාවක් කරනවට. ඒත් ඉතිං එයාගේ ජීවිතෙට අනවශ්‍ය විදිහට ඇඟිලි ගහන්නත් මං කැමති වුණේ නෑ. මාධවී පොඩි දවස්වල ඉඳලම මොන වැඩේ කළත් ඒක හරියට කරනවා. ඒ නිසා වැඩි කාලයක් නොගිහින් බැංකුවේ ණය දෙන අංශයේ ප්‍රධානියා හැටියට එයා පත් වුණා. නන්දන බිස්නස් වලට ණය ගනුදෙනු කරලා තියෙන්නේ ඔය බැංකුවෙන් තමයි. දවසක් නන්දන බැංකුවට ආවාම මාධවීව දැකලා තියෙනවා. නන්දන ඇවිත් ඇහුවලු මේ රූපමල්වත්තේ කුමාරිහාමි නේද කියලා. මාධවී හිනාවෙලා කිව්වලු මට එහෙම විහිළු කරන්න එපා. ඒ පවුලේ කෙනෙක් වුණත්, ඒ විදිහට මේ වගේ තැනකදී කතා කරනවට මං කැමති නෑ කියලා. ඉතින් බොහොම ගෞරවයෙන් වගේ මාධවීට කතා කරන කොට නන්දන ගැන පුළු පැහැදීමකුත් එයාට ඇතිවෙන්න ඇති. ඊට ටික දවසකට පස්සේ ජයදේව පිලිමතලාවේ පැත්තේ අලුතෙන් ෆැක්ටරියක් දාලා තියෙනවා. ඊට පහුවෙනිදා දවල්, ජයදේවයි නන්දනයි, නුවර ප්‍රධාන හෝටලයක ඒ වෙනුවෙන් සාමාන්‍ය පාටියක් දාලා තියෙනවා. ඒකට සහභාගී වෙන්න බැංකුවට ගිහිල්ල මාධවීට ආරාධනා කරලා තියෙන්නේ ජයදේව තමයි. මට ලැබුණ ආරංචි වල හැටියට ඒ පාටිය වෙලාවේ, නන්දන සැහෙන උත්සාහයක් අරගෙන තියෙනවා ජයදේවයි මාධවීවයි

SL-Unlimited

ජිං කරන්න. අපේ එකී ඒකට අහුවුණා. ඕක වෙලා තියෙන්නේ මීට මාස හයකට විතර උඩදී. බැංකුවේ මොන සිද්ධියක් වුණත් ඒක ගෙදර ඇවිත් අම්මට කියන පුරුද්දක් මාධවීගේ තිබුණා. මයුරි මට ඒවා කියනවා. ඒ කියන කතා වල හැටියට මට හිතුනා මාධවීට ජිං වෙන්න ජයදේව උත්සාහ කරන බව. දවසක් මයුරි ලවා මං එයාට පොඩි අනතුරු ඇඟවීමකුත් කළා. ඔයා දන්නවා නේද ඔය ජයදේව කියන කෙනා සල්ලි කාරයෙක් වුණාට අපේ පවුල්වලට නොගැලපෙන කෙනෙක්. ඇරත් එයාගේ ඔය නන්දන කියන බාප්පා මහ එපා කරපු එකෙක්. ඊං ආවට වැඩිය කතා බහකට යන්න එපා කියලා. කෝ ඒ කිව්වට මාධවී ඒවා ගණං ගත්තේ නෑනේ. ඒ එක කියලා වැඩි දවසක් ගියේ නෑ ජයදේවත් එක්ක දවල් කෑමකට හෝටලේකට ගියා කියලා මට ආරංචි වුණා. එදා ගෙදර ආවාම මං එයාට හොඳට කරුණු පැහැදිලි කරලා දුන්නා. ඊං ඇහැ ගහගෙන ඉන්නේ ඔයාට නොවෙයි රන්දෙණිගල වලව්වට. ඔය නන්දන කියන එකා කියලා තියෙනවා කවදා හරි දවසක මං රන්දෙණිගල වලව්වේ උරුමක්කාරයා වෙනවා කියලා. ඒක ඌට කරන්න බැරි වුණ නිසා දැන් ඌ ඒක උගේ බෑනන්ඩියා ලවා කරගන්න හදනවා. හැබෑට කියන්න ඔය නන්දනයා මීට අවුරුදු කීපයකට ඉස්සරවෙලා මගෙන් ඇහුව නේ හාමුලට ඔය රන්දෙණිගල වලව්වෙන් ඇති ප්‍රයෝජනයක් දැන් නෑනේ. ඕක මට විකුණලා දාන්න. මං වටිනාකම වගේ දෙකක් වුණත් දෙන්නම් කියලා. මං ඒ හැම වතාවකම මිනිහට කිව්වේ ඕක ඔහෙ තිබුනාදෙන්. ඒක විකුණන්න තරම් මට අගේනියක් නෑ. ඇරත් පරම්පරාවෙන් උරුම වුණ දෙයක් අපි විකුණන්නේ නෑ කියලා. අපි කොච්චර දේවල් කිව්වත් මේ කෙල්ල අපි කියපු දේවල් විශ්වාස කළේ නෑනේ. අපට බණ කියන්නත් ආවා. අපි ජයදේවට අකමැති එයා අඩු කුලේ නිසාලු. අපි නියම බෞද්ධයින් නම් ඇයි ජන්මයෙන් මිනිසුන් මනින්නේ කියලා අපෙන් අහන්න වුණා. අපේ පරම්පරාවල යම් වෛරයක් තිබුණා නම් ඒක ඒ දෙන්නගේ විවාහයෙන් අවසන් වේවි කියලත් එයා කිව්වා."

"බැරිම තැන මං හිතුවා සුරනිමලත් එක්ක මේ ගැන කෙළින් කතා කරන්න. නන්දන වගේ නොවෙයිනේ සුරනිමල. එයාට මං හෝටලේකට දවල් කෑමට ආරාධනා කළා. මිනිහා බොහොම සන්තෝසෙන් ඒක බාරගෙන මාත් එක්ක හොඳින් කතා කළා. අපරාදේ කියන්න බෑ. කෝටි තරම් ලොකු ධනවතෙක් වුණත් මිනිහා අපට තියෙන ගෞරවයේ නම් අඩුවක් පෙන්නුවේ නෑ. කෑම කන ගමන් මිනිහට මං හමුවෙන්න අවශ්‍ය වුණ හේතුව කිව්වා. ඒක කිව්වාම එයා ටිකක් කල්පනා කරලා මෙහෙම කිව්වා."

SL-Unlimited

"හාමුලා මේ විවාහයට අකැමති නම් මමත් ඒකට කැමති නෑ. මොකද දෙමව්පියන්ගේ ආශිර්වාදය නොලැබෙන විවාහ ජීවිතයක් සාර්ථක වෙන්නේ නෑ කියලා මං අත් දැකීමෙන් දන්නවා. මගේ පුතා හාමුලට සුදුසු නෑ කියලා හාමු හිතනවා වගේම මං හිතනවා මගේ පුතාට හාමුගෙ දුව සුදුසු නෑ කියලා. අපි කටයුතු කරන්න ඕනේ අපේ මට්ටමෙන්. හැබැයි හාමු එක ප්‍රශ්නයක් තියෙනවා. ඔය හාමු කියපු කතාව මට විශ්වාස කරන්න අමාරුයි. මගේ පුතා, මං දන්න හොඳ පවුලක ගෑණු ළමයෙක් එක්ක සම්බන්ධ කමක් තියෙනවනේ. මං දන්න හැටියට ඒ දෙන්න බඳින්න බලාගෙනයි ආපසු ගෙනියන්නේ. ඉතිං මට හිතෙන්නේ නම් හාමුට කවුරු හරි ලණුවක් දීලා කියලා."

"නෑ මුදලාලි. අපේ දුවත් කියනවානේ ජයදේවව බඳිනවමයි කියලා."

"ඒක නම් අදහා ගන්නත් අමාරු දෙයක්. ඒත් ඔය තරුණ හිත වල ඇති වෙන ආදර කැක්කුම් ගැන මම දන්නේ නෑ. හාමු කියන එක ඇත්ත නම්, මට පුතාට අවවාදයක් දෙන්න පුළුවන්. මගේ පුතා වුණත්, ජයදේව මං කියන එක අහයිද දන්නේ නෑ. රත්දෙණිහල වලව්වේ හාමු හෙක්ටර් අකමැති වුණාට නෙල්සන් හාමු එයාගේ විවාහෙ කරගත්තනේ. මං නන්දන මල්ලිට කියන්නම්. මම කියන ඒවට වඩා බාප්පා කියන ඒවා පුතා අහනවා."

"එතකොට මට තේරුණා වැඩේ හරි නොයන බව. මං කිව්වා "නන්දන තමයි ඒ දෙන්නාගේ සම්බන්ධෙට උඩ ගෙඩි දෙන්නේ" කියලා. ඒ පාර එයා කිව්වා "හොඳයි. මං එහෙනම් ඒක නවත්වන්න පුළුවන් හැම උත්සාහයක්ම ගන්නම්" කියලා. ඔය කතාව වුණේ දැනට සති දෙකකට විතර උඩදී."

"මං හිතන්නේ ඔය ප්‍රශ්නෙ උඩ තාත්තයි පුතයි අතර කතාවක් ඇති වෙන්න ඇති. ඊට දවස් කීපෙකට පස්සේ තමයි මාධවී මට කතා කරලා කිව්වේ එයා ජයදේවත් එක්ක විවාහ වුණා. එයා ගැන හොයලා බලන්න එපා කියලා."

"පස්සේ මට ආරංචි වුණා තාවකාලිකව නන්දනගේ ගෙදර ඒ ගොල්ල පදිංචි වෙලා ඉන්නවා කියලා. මහ ජයට මඟුලක් ගන්න නන්දන සැලසුම් කරන බවත්, ඉන් පස්සේ ඒ ගොල්ල රත්දෙණිහල වලව්වට පදිංචියට යන්න සැරසිලා ඉන්න බවත් මට මුරකාරයාගෙන් ආරංචි වුණා."

"තාමත් ඒ මුරකාරයාමද එතන ඉන්නේ?"

"නෑ. නන්දන මුරකාරයට කිව්වලු මීට පස්සේ වෙනෙක් අයිතිකාර"

SL-Unlimited

මාධවී නෝනයි, මේ එයාව බැඳලා ඉන්න ජයදේව මහත්තයයි තමයි. ඒ නිසා කිසිම කෙනෙකුට ඒ දෙන්නගේ අවසරයකින් තොරව වලව් වත්තට ඇතුළු වෙන්න ඉඩ දෙන්න එපා කියලා. විශේෂයෙන්ම ශ්‍රී ලාල් හාමුටවත්, මැණිකෙටවත් වත්තට ඇතුළු වෙන්න දෙන්න එපා කිව්වලු. ඊට පසුවෙනිදා මුරකාරයා ඇවිත් මට ඒ විස්තරය කිව්වා. මං කොහොමද හාමු, හාමුට වත්තට ඇතුල් වෙන්න එපා කියන්නේ. මං නන්දන මහත්තයට කිව්වා වත්තට වෙන කෙනෙක් මුරට දාගන්න කියලා. මං ඒ මුරකාරයව අපේ හගුරන්කෙත වත්තට යැව්වා."

"වදැයි වෙච්ච වැඩේ. දැන් මොකක්ද ශ්‍රී ලාල්ගේ බලාපොරොත්තුව?"

"මං දැන් කොහොම හරි නෙල්සන්ව කන්ටැක්ට් කර ගන්න බලනවා. අපට වත්තේ අයිතිය තිබුණේ තුනෙන් පංගුවකට විතරයි. නෙල්සන්ට කියනවා එයාගේ ඊරුමය ඉල්ලන්න කියලා. එතකොට අපට ටින්ව පොඩ්ඩක් කොනිත්ත කොනිත්ත ඉන්න පුළුවන්. නඩුව දැම්මාම තීන්දුවක් දෙනකල් ටින්ව වලව්වෙන් එළියට ගන්නවා. ඊට පස්සේ වැඩ ටික අපට බලා ගන්න පුළුවන්. ඔය වගේ වැඩ මං ඕන තරම් කරලා තියෙනවා. කාටවත් එහෙම අනුන්ට අයිති ඉඩමක බලෙන් පදිංචි වෙලා ඉන්න නීතියෙන් ඉඩක් නෑ."

"හොඳයි ශ්‍රී ලාල්. ඔයාගේ වැඩකටයුතු ඒ විදියටම සාර්ථක වෙන්න කියලා අපි කියනවා. ඒ වගේම ඔයා දුන්න විස්තර ටිකට බොහෝම ස්තූතියි. ඒවා අපට අපේ ඉදිරි වැඩකටයුතු වලදී බොහෝම ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්" තී හැරී පුටුවෙන් නැගිට්ටේය.

"මට මිස්ටර් ඒකනායකගෙන් පොඩි ප්‍රශ්නයක් අහන්න තියෙනවා. නන්දන යාළුවෙලා හිටියා කිව්ව ගෑනු ළමයා ගැන යමක් කියන්න පුළුවන්ද?"

"ඒ ගැන නම් මම දන්නේ නෑ. හැබැයි පුරනිමල ඒ ගැන කිව්වේ බොහොම සීරියස්ලි නිසා ඒක බොරු වෙන්න බෑ."

"මිස්ටර් ඒකනායකගේ දුවගේ විවාහයෙන් පස්සේ දුව හමුවෙන්න හරි, කතාකරන්න හරි ටිනන්දු වුණේ නැද්ද?"

"මම දුවට කණිා කණිා." මයුරි පිළිතුරු දුන්නා ය.

"ඒත් එයාට කථා කරන්න ජයදේව ඉඩ දුන්නේ නෑ."

"මගේ අවසරය නැතුව කිසි කෙනෙක්ට මාධවීට කතා කරන්නත් බෑ. හමුවෙන්නත් බෑ. ඕනේ කෙනෙක් ඉන්නවා නම් ඉස්සෙල්ලා මාව හමුවෙන්න ඕනේ. මං ගැන කියලා තියෙන අපහාස කතා ඉල්ලා අස්කර ගන්න ඕනේ."

"ජයදේව කතා කළේත් ටිකක් සැරෙන්. අපට ඔහුන්ට යට

SL-Unlimited

වෙන්න පුළුවන්ද හැරී. මට ආරංචි හැටියට කිසිම කෙනෙක්ට මාධවී හමුවෙන්න ජයදේව ඉඩ දෙන්නේ නෑ."

ඔහුගෙන් සමුගත් හැරී යශ පැට්‍රික් යලි කොළඹ බලා පිටත වූහ.

●●●

## 10

"මම හිතුවට වඩා ගමන සාර්ථක වුණා. මුල් දවසේ මට හිතූ තරම් තොරතුරක් හොයා ගන්න ලැබුනේ නෑ. ඒත් එදා එකතු කර ගත්තු සුළු සුළු ආරංචි වලින්, ඊයේ හොඳ ප්‍රයෝජනයක් ගත්තා. මම සුරනිමලගෙයි නන්දනගෙයි අතීතය ගැන සෑහෙන විස්තරයක් හොයා ගත්තා. සමහර විට ඒවා අපේ ඉදිරි වැඩ කටයුතු වලට ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්." කාර්යාලයට ඇතුළුවෙමින් විමලසිරි කීවේය.

"එහෙම නම් ඔය වාර්තාව පැත්තකින් තියලා ඒකේ සඳහන් වෙලා තියෙන කරුණු අපට කියන්න. වාර්තාව පස්සේ හෙමින් සීරුවේ බලන්න බැරියැ."

●●●

"මාතර නගරයේ තිබුන "නාවිමන ස්ටෝර්ස්" කියන කඩේට බඩු කිරන රස්සාවට එනකොට සුරනිමලට වයස අවුරුදු දාහතක්වත් නෑ. තැන්පත් විනීත ගතිගුණ නිසා කඩේ මුදලාලිගේ හිත බොහොම ඉක්මනට දිනාගන්න මිනිහට පුළුවන් වුණා. ඒ කඩේ කලින් වැඩ කරපු මිනිස්සු බඩු හොරකම් කරලා, මුදල් හොරකම් කරලා මුදලාලිගේ අතටම අහුවෙලා තියෙනවා. ඒත් සුරනිමල කඩේ වැඩට ඇවිත් අවුරුදු දෙකතුනක් ගතකනුත් එහෙම දෙයක් නොවුණ නිසා සුරනිමල ගැන මුදලාලිගේ පැහැදීමක් ඇති වුණා. සුරනිමල වියහියදම් කරන්නෙත් බොහොම කල්පනාවෙන්. පඩි ගත්තු දාට මුදලාලිගෙන් අවසර ඉල්ලගෙන තැපැල් කන්තෝරුවට යන සුරනිමල, එයින් කොටසක් ගෙදරට යවනවා. එයාගේ පවුල නගා සිටුවන්න පුළුවන් හැම දෙයක්ම එයා කළා. තමන්ට ලැබෙන ආදායමෙන් විතරක් ඒක කරන්න බැරි බව එයා දැන ගෙන හිටියා. ඒ නිසාම තමයි ඒ තරම් අඩු වයසින් එයා රස්සාවක් හොයාගත්තෙත්."

www.sinhalalibrary.com
SL-Unlimited

"සුරනිමල කඩේ වැඩට ආවාට පස්සේ මුදලාලිගේ වෙළඳ ව්‍යාපාරයත් එන්න එන්නම දියුණු වුණා. සුරනිමලගේ පැමිණීම තමන්ට වාසනාව ගෙනාව බවට මුදලාලි විශ්වාස කළා. ඒ නිසා සුරනිමලට පඩියට අමතරව තව කීයක් හරි දෙන්න මුදලාලි පුරුදු වෙලා හිටියා."

"සුරනිමල ගෙදරට යවන මුදල ඇරුණාම, ඉතුරු මුදල පොතක දාලා ඉතුරු කරන්න පුරුදු වෙලා හිටියා. මුදලාලි දවසක් සුරනිමලගෙන් ඇහුවා සල්ලි එකතු කරලා මොනවා කරන්නද බලාපොරොත්තු වෙන්නේ කියලා."

"මාත් දවසක මුදලාලි වගේ කඩයක් දානවා" සුරනිමල කිව්වා.

"මුදලාලිගේ ගෙදර තිබුණොත් කඩේ කිට්ටුවම තමයි. ඒ නිසා මුදලාලිගේ බිරිඳ දවල් කෑම ඒගොල්ලන්ට කඩේට ගෙනල්ලා දෙනවා. බිරිඳට වැඩ වැඩි වුණ දවසට එයාගේ දුව තමයි කෑම අරගෙන කඩේට එන්නේ."

"ඔහොම අවුරුදු පහක් හයක් විතර ගියා. සුරනිමල මුදලාලිගේ කඩෙන් කිසිම දෙයක් හොරකම් කළේ නෑ කියලා මුදලාලිට කටපුරා කියන්න පුළුවන් කම තිබුණා තමයි. නමුත් දවසක්දා මුදලාලිට තිබුණ වටිනම වස්තුවත් අරගෙන සුරනිමල පැනලා ගියා. මුදලාලි සුරනිමලට දරුවෙක්ට වගේ ආදරෙන් තමයි හිටියේ. ඒත් මුදලාලි ගමේ වැඩි දෙනෙක් වාගේ උසස් යයි සම්මත කුලයකට අයත් කෙනෙක්. එයා ඒ ගැන ආඩම්බරයෙනුත් හිටියා. ඒ නිසා කවදාවත් මුදලාලි තමන්ගේ විවාහයට කැමති නොවන බව දැන ගෙන හිටිය නිසා තමයි සුරනිමලට ඒ විදියට යන්න වුණේ. තමන්ගේ දියණිය, එකම දරුවා වුණත් තම පවුලටත් නෑදෑයන්ටත් ලොකු අගෞරවයක් කළා කියලා මුදලාලි ඒ දුව, පවුලෙන් ඈත් කළා. මරණෙටවත් ගෙන්න ගන්නේ නෑ කියලා හැම තැනම කියන්න වුණා. තමන්ට හිමි කිසිම දෙයක් තමන්ගේ මරණින් පසුවවත් දුවට හිමි නොවන විදියට නීතියෙනුත් කටයුතු කළා."

"ඉතින් සුරනිමල රමනාත් එක්ක ඇවිත් වැල්ලවාය ප්‍රදේශයේ පදිංචි වුණා. මනහර ඇල්ල-වැල්ලවාය මහ මාර්ගය අසල තිබුණ වැලිපන්න හන්දියේ සිල්ලර කඩයක් දමා ගත්තා. එයාට මිනිසුන්ගේ හිත් දිනාගන්න පුදුම හැකියාවක් තිබුණා. වැඩි කාලයක් යන්න ඉස්සර වෙලා ඒක ඒ පළාතේ තිබුණ දියුණු කඩයක් බවට පත් වුණා. සිල්ලර බඩු වලට අමතර තැඹිලි, කුරුම්බා වගේ දේවල් එයා කඩෙන් තිබ්බෙ ප්‍රධාන මාර්ගයේ ගමන් කරන බස් මගීන්ගේ පිපාසය සංසිඳුවන්න විතරක් නොවෙයි. ඒකට බස් මගීන්ගේ ලොකු ඉල්ලුමකුත්

SL-Unlimited

තියෙන බව දැනගෙනයි. මේ වැඩ කටයුතු වලදී රම්‍යාත්, කමලදාස කියලා ගමේ තරුණයෙකුත් පූරනිමලට සෑහෙන අත හිත දීලා තියෙනවා."

"පූරනිමල විවාහ වුණාට පස්සෙත් ගෙදරට කරන සැලකිලි අඩු කළේ නෑ. තමාගේ එකම නැගෙනිය මහනුවර මැහුම් ඉගෙන ගන්න පන්තියකට දැම්මා. අනික් මල්ලිලාට හොඳට ඉගෙන ගන්න පොත් පත් නිසියාකාරව අරන් දුන්නා. තමන්ට බාල සොයුරු වූ නන්දන, නරක මිත්‍රයින්ගේ ආස්සරේට වැටිලා නොමඟ යන බව පියාගෙන් දැන ගත්තාම, එයාව විගාම කඩේ වැඩට උදව්වට ගෙන්න ගත්තා."

"පූරනිමල මේ කඩේ දාගෙන හිටිය පළාත බොහෝම සාමකාමී ප්‍රදේශයක්. දුප්පත් ගොවි ජනතාව තමයි වැඩිය මේ ප්‍රදේශයේ හිටියේ. නමුත් නන්දනගේ පැමිණීමත් සමඟ, ගමේ තිබුණ ඒ සාමකාමී වාතාවරණය ටික ටික නැති වෙන්න වුණ බව ගමේ ග්‍රාම සේවක මහත්මයාට තේරුම් ගිහින් තියෙනවා. ගමේ පළමුවෙනි වතාවට හරකෙක් නැතිවෙලා. කවුරු කවිද කියලා හොයා ගන්න බැරිවුණා. ඊට ටික දවසකට පස්සෙ තවත් හරකෙක් නැති වුණා. ග්‍රාමසේවකගෙත්, ගමේ අනෙක් අයගෙත් සැකය නන්දන දිහාවට යොමු වුයේ මේ හරක් නැති වෙන්න වුණේ නන්දන ඇවිත් වැඩි කාලයක් යන්න ඉස්සර වුණ නිසයි. මේ වෙන කොට ගමේ හිටිය තවත් තරුණයින් දෙතුන්දෙනෙක්වත් එකතු කර ගෙන නන්දන කැලෑබද තැනක කසිප්පු පෙරන බවට රාවයකුත් පැතිරිලා ගිහින් තිබුණා. ග්‍රාමසේවක පූරනිමලට තමන්ගේ සැකය ගැන කීවාම මිනිහා ඒක විශ්වාස කළේ නෑ. තමන් එක්ක තියෙන තරහකට, කවුරුහරි බොරු කතා හදනවා කියලා එයා කිව්වා. ඔහොම ඉන්නකොට තුන්වෙනි හරකත් නැති වෙන්නයි ගියේ. ඒත් ග්‍රාමසේවකයි, ගමේ තව පිරිමි හතර පස්දෙනෙකුයි මේ වෙනකොට සුදානමින් හිටිය බව නන්දන දැනගෙන හිටියේ නෑ. ඒ නිසා බඩුත් එක්කම හොරු අල්ලගන්න පුළුවන් වුණා. නන්දනව පොලිසියට ගෙනිච්චා. එතකොට තමයි පූරනිමලට මලයගෙ තරම පෙනුනේ. පූරනිමල වෙච්ච අලාබය ගෙවලා නැවත එහෙම දෙයක් වෙන්න ඉඩ නොතියන බවට ග්‍රාමසේවකටත්, පොලිසියේ සාජන්ට් මහත්තයටත් පොරොන්දුවෙලා නන්දනව එළියට ගත්තා. පොලිසියෙන් එළියට ආපු ගමන් පූරනිමල අත දිග ඇරලා හොඳ කම්මුල් පාරක් නන්දනට දුන්නා."

"ඈ යකෝ. මොකක්ද තෝ මේ කරපු බලු වැඩේ? මොනවා කරන්නද තෝ මේ පාපතර වැඩේ කරන්න හැදුවේ. මගෙන් ඉල්ලුවනම් තොට මං සල්ලි නොදී ඉන්නේ නැතේ" කියලා හොඳටම දෙහි කප කප පූරනිමල නන්දනව ගෙදර එක්කරගෙන ගියා. ගෙදරට ආවත්

SL-Unlimited

සුරනිමලගෙ කේන්තිය අඩු වුණේ නෑ. ඒත් රමණී කොහොම හරි සුරනිමලගේ හිත සන්සුන් කළා. මල්ලිටත් එයා අවවාද කළා. මල්ලිත් පොරොන්දු වුණා ආයෙත් එහෙම වැඩක් කරන්නේ නෑ කියලා. නන්දන කාට ගණංකාර කම් පෙන්නුවත් අයියට තිබුණේ ලොකු බයක්. ගෞරවයක්. අයියට ඉහලින් යමක් කරන්නවත්, කතා කරන්නවත් යන්නෙ නෑ."

"තමන්ව පොලිසියට කොටු කරලා දුන්න නිසා ග්‍රාමසේවකගේ දුව ලිස්සනවා කියලා නන්දන කියපු කතාවත් ආරංචි වෙලා ග්‍රාමසේවක කොපාවිෂ්ට වුණා. ඒත් සුරනිමල මැදිහත් වෙලා නන්දනට සමාව ගන්න කීවම ඒක යටපත් වුණා. බණ්ඩප්පු කියන මිනිහා තමයි ග්‍රාමසේවකට නන්දනව කොටු කරගන්න ඔත්තුව දීලා තියෙන්නේ. ඒ මනුස්සයා බොහොම සන්සුන්, යාන්තමට කාලා බීලා ඇඳලා ඉන්න පුළුවන් තරමට ආදායමක් ලැබුණ දුප්පත් ගොවියෙක්. දුවෙකුයි පුතෙකුයි එයාට හිටියේ. ඔය සිද්ධි වෙලා මාස හයක්වත් ගියේ නෑ බණ්ඩප්පුගේ දුව හිටි හැටියෙම අතුරුදහන් වුණා. බැද්දට ගියාලු දර කඩන්න. ඒත් ආපහු ආවේ නෑ. මිනිහා ග්‍රාම සේවක ගාවට ගියා. ඒත් පලක් වුණේ නෑ. මේ වැඩේ කරන්න ඇත්තේ නන්දන කියලා ගමේ සා අහරත් කතාවක් තිබුණා. ඒත් ඔප්පු කරන්න කිසිම සාධකයක් නෑ."

බණ්ඩප්පු සුරනිමල මුදලාලිට මේ බව කිව්වා. යාප්පු වුණා. දුව ගෙනත් දුන්නොත් ඒ ගැන කාටවත් පැමිණිලි නොකරන බවටත්, පොලිසියේ පැමිණිල්ලත් ඉල්ලා අස්කරගන්නා බවටත් එයා කන්නලව් කළා. ඒත් වැඩක් වුණේ නෑ."

"පොලිසියටත් කියලා වැඩක් නොවුන නිසා බණ්ඩප්පු ඉන් ඉහළ තැන් වලටත් දැනුම් දෙන්න යන බව ආරංචි වුණා. ඒක ආරංචි වුණාම සුරනිමල ගිහින් බණ්ඩප්පු හමුවෙලා දුව ගෙනවිත් දෙන බවටත්, මේ ගැන කාටවත් නොකියන ලෙසටත් බණ්ඩප්පු පොරොන්දු කරවාගෙන දුව ගෙනල්ලා දීලා තියෙනවා. ඒ ළමිස්සි පහු ගිය දවස් ටිකේ හිටියේ කොහෙද, කවුරු අරං ගියාද, කොහොම ආවද කියන එක අභිරහසක්. බණ්ඩප්පුගෙ කට වහන්න සුරනිමල මුදලාලි රුපියල් පන්සීයකුත් දීලා තියෙනවා. පස්සේ ඒ කෙල්ලව බන්දලා දෙන්නත් සුරනිමල මුදලාලි උදව් කරලා තියෙනවා."

"ඔයිට පස්සේ තමයි රන්දෙණිගල කුමාරිහාමි හිටිහැටියෙම පැහැරගෙන ගිහින් කියලා ලොකු ආන්දෝලනයක් ඇති වුණේ. ඒකට සැක පිට නන්දනවයි එයාගේ සහචරයො පිරිසයි පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තියෙනවා. නන්දනත්, ඒ පිරිසත් ඒ දවස්වල

SL-Unlimited

චන්ද්‍රනාථක ගිහින් තියෙනවා. ඒ ගොල්ල පැහැරගෙන යාමට සම්බන්ධ වුණා කියලා ඔප්පු කරන්න කිසිම සාක්ෂියක් ලැබිලා නෑ."

"ඊට මාස හයකට විතර පස්සේ චූටි මල්ලි, ඒ කියන්නේ නන්දනගේ සහචර පිරිසේ කෙනෙක්, සූරියවැව ප්‍රදේශයේ ඉන්න තම සොහොයුරියගේ ගෙදර ගිහින් තියෙනවා. ඊට කලින් දවසේ එයාගේ මස්සිනා ඇවිත් මොකක් හරි ප්‍රශ්නෙකට මිනිහට හොඳටම දෙබි කපලා ගිහින්. මස්සිනා ලොකු ගේනක් කරපු කෙනෙක්. ගේනේ කෙලවරකට වෙන්න මුකලානට කිට්ටුවෙන්න එයා මුලින් හදාගෙන හිටපු පැල් කොටේ තියෙනවා. අලුතෙන් ගේ හැදුවට පස්සේ කලින් පදිංචි වෙලා හිටපු ඒ පැල් කොටේ පොර, කෘෂිකාර්මික ද්‍රව්‍ය, වෙනත් උපකරණ ආදිය දාන මඩුව විදිහට එයා පාවිච්චි කරලා තියෙනවා. බීමතව මස්සිනාගේ ගෙදරට ගිය චූටි මල්ලි මස්සිනා එක්ක ආයෙමත් ලොකු අරියාදුවක් ඇති කරගෙන. පස්සේ මිනිහා අර පැලට ගිහින් ගිනි තියලා. පැල ගිනි ගන්නකොට මස්සිනයි අක්කයි ඈතට වෙලා බලා හිටියලු. මිනිහා පැලට ගිහිං තියෙන්නේ ලිහිබතුත් කරකව කරකව. ඒ නිසා බයට ඒ ගොල්ල පැලේ හටගත් ගින්න නිවන්න ගිහින් නෑ. ඊට පහුවෙනිදා තමයි ඒ ගොල්ල දන්නේ චූටි මල්ලිත් ඒ ගින්නටම දාලා අලුවෙලා ගිහින් කියලා."

"බණ්ඩප්පුගෙ දුව එක ආරංචි වුණාම "මට කරපුවට ඔය වුණා මදි" කියලා කීප දෙනෙකුටම කියලා තියෙන නිසා එයාට හදි කරපු අයගෙන් කෙනෙක් විදියට චූටි මල්ලි ගැන හිතන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. ඒ එමිස්සි හැමදාම ඌව කතරගම දෙවියන්ට පහනක් පත්තු කරලා ඊට දඬුවම් කරන්න කියලත් කියනවලු. ඔය සිද්ධි වලින් පස්සේ නන්දනත් එක්ක ගමේ ඉන්න එක, ප්‍රශ්න ගොඩකට මුණ දෙන්න වෙන වැඩක් කියලා හිතපු සුරනිමල බුත්තල ප්‍රදේශයේ අත්කම් හලක් දමාගෙන ඒ පැත්තට පදිංචියට ගියා. සුරනිමලගේ සොහොයුරෙක් වන සනත් කඩේ වැඩ බාර ගත්තා."

"අත්කම් ව්‍යාපාරයට බැහැපු සුරනිමල එන්න එන්නම දවසින් දවස දියුණුවට පත් වෙන්න වුණා. මැතිවරණ කටයුතු වලදී නන්දන බැහැලා වැඩ කරපු කෙනෙක්. සුරනිමල මුදල් හදල් වලින් මැති ඇමති ගොල්ලට උදව් කරලා තියෙනවා. ඒ නිසා ලැබුණ දේශපාලන බලය නිසා තමයි සුරනිමලගේ මේ දියුණුවට හේතුව වෙන්න ඇත්තේ."

"රජයෙන් ලැබුණ සහයෝගය නිසා පෙහෙකම්හල් ව්‍යාපාරය ටික ටික දියුණු වෙන්න වුණාම තව තවත් පෙහෙකම්හල් රටෙහි ප්‍රදේශ කීපයකම ව්‍යාප්ත කරන්න සුරනිමලට හැකියාව ලැබුණා. බොහෝ විට

SL-Unlimited

සුරනිමල අතින් සිදුවුණේ රජයේ නිලධාරීන් හා වෙනත් ව්‍යාපාරිකයින් අතර ඇති සම්බන්ධීකරණ කටයුතු තමයි. සේවක පරිපාලන කටයුතු සොයාගෙන නන්දන අතින් තමයි."

"1977 මාර්තු මාසේ දවසක රමනාව, ඒ කියන්නේ සුරනිමලගේ බිරිඳව ඉතාම අභිරහස් විදියට ඝාතනය කරලා තියෙනවා. මේ ගැන නොයෙකුත් කටකතා තියෙනවා. විරුද්ධවාදී දේශපාලකයෙකුගේ වැඩක් කියලා කියන අයත් ඉන්නවා. ඒත් වැඩි දෙනෙක් කියන්නේ රන්දෙණිගල කුමාරිහාමි යකෙක් වෙලා ඇවිත් එයාට කරපුදේට පළිගත්තා කියලයි."

"ඊට පස්සේ 1983 දවසක වැල්ලවාය කඩේ කටයුතු කරගෙන ගිය සනත්වත් දරුණු වධයට ලක්කරලා මරලා දාලා තියෙනවා. ඒ සිද්ධියෙන් පස්සේ සුරනිමල කඩේ වෙනත් පුද්ගලයකුට විකුණලා දාලා ගියා. ඉන් පස්සේ ඒ ගමත් එක්ක සුරනිමලගේ කිසිම සම්බන්ධ කමක් තිබිලා නෑ. ඒත් නන්දන වරින් වර ඇවිත් එයාගේ චක්‍රගෝලයින් හමුවෙලා තියෙනවා. විශේෂයෙන්ම මැතිවරණ කටයුත්තක් ළං වෙන කොට එයා ගමට කිට්ටු වෙන එකත්, ඒ සහචරයින් එක්ක කරන කටයුතුත් වැඩි වෙනවා. ඒ චක්‍රගෝලයින්ගෙන් කෙනෙක් වන "පොඩි මහත්තයා" කියන පුද්ගලයා තමයි ඒ දවස්වල නන්දනගේ බොඩිගාඩ්."

"1989 ඇතිවුණ භීෂණ කාලපරිච්ඡේදයේදී ගමේ හිටිය නන්දනගේ චණ්ඩි දෙන්නා, ඒ පළාතේ හිටිය අහිංසක කොල්ලන්ව හමුදාවට හා පොලිසියට අල්ලලා දීලා තියෙනවා. බණ්ඩාප්පුගේ පුතාවත් අල්ලගෙන ගියාම ග්‍රාමසේවක ඇවිත් එයා වෙනුවෙන් කතා කරලා තියෙනවා. එතකොට ඒ ප්‍රදේශය භාර හමුදා මේජර් වරයා විශයෙන් කටයුතු කරලා තියෙන්නේ රුවන් බණ්ඩාර කියලා මහත්මයෙක්. ග්‍රාම සේවක එයාව හමුවෙලා කිව්වලු ගමේ ඉන්න ජේවීපී කාරයා කවුද කියලා මං දන්නවා. ඒත් මේ සිරිමලා බොහොම අහිංසක ළමයෙක්. ඔය කවුරුහරි පරණ කෝන්තරයකට තමයි මෙයාව අල්ලන්න ඔත්තුවක් දෙන්න ඇත්තේ කියලා. ග්‍රාමසේවකගේ කීම අහලා, මේජර් රුවන් බණ්ඩාර සිරිමලාට අනතුරක් නොකර නිදහස් කරලා තියෙනවා. ඒ එක්කම "නොදන්න කමට මේ කොල්ලො කුරුට්ටෝ පෝස්ටර් එකක් අලවලා ඇති. ඒ වගේ දෙයක් ලොකුවට ගන්න එපා සර්" කියලත් ග්‍රාමසේවක කිව්වලු. ඊට පස්සෙ ගමේ කවුරුහරි පොලිසියට හරි හමුදාවට හරි අරගෙන යන්න ඉස්සරවෙලා ග්‍රාමසේවක රාලහාමිගෙන් අවසර ගන්න බවට රුවන් බණ්ඩාර පොරොන්දු වුණාලු."

"ඊට අමතරව ග්‍රාමසේවක, දවසක හවස් වරුවක මේජර් රුවන් බණ්ඩාරව ගමේ පන්සලට එන්නය කියලා, ගමේ තරුණ තරුණියන්වත් එතනට කැඳවලා දේශනයක් කරවලා තියෙනවා. ඒ

වෙලාවේ රුවන් කියලා තියෙනවා නොදැන හරි භූතවාදී වැඩකටයුතු කරන කෙනෙක් ඉන්නවා නම් අද ඉඳලා ඒ වැඩ අතාරින්න ඕනේ. අදින් පස්සෙත් ඒ වැඩ කරන අයට කිසිම සමාවක් දෙන්නේ නෑ කියලා."

"ඊට දවස් තුනකට පස්සේ ඒ ගමේ වෙල්යායකට ආසන්නව තිබුණ අම්බලමක් ළඟ, ගහක එල්ලලා මරලා තිබුණා නන්දනගේ චක්ගෝලයින් දෙන්නාගේ මිනී දෙක ගම්මු දැකලා තියෙනවා. ඒ දෙන්නගේ ඇඟේ හැම තැනම තිබුණ තුවාල නිසාත්, අම්බලම ළඟ තිබුණ ලේ පැල්ලම් නිසාත් මරන්න ඉස්සරවෙලා දරුණු වදයට භාජන කරලා තිබුණ බව පෙනෙන්නට තිබුණාලු. එදා රෑ මර විකාරෙන් යමෙකු කෑ ගහන සද්දේ අහල පහළ හිටපු කීප දෙනෙකුටම ඇහිලා තියෙනවා. ඒත් ඒ භීෂණ කාලයේ මොන සද්දයක් ආවත් කිසි කෙනෙක් හොයලා බලන කාලයක් නොවෙයි. ඒ දෙන්නා අල්ලලා දීපු කොල්ලන්ගේ යාළුවෝ එකතු වෙලා කරපු වැඩක් කියලා තමයි වැඩි දෙනෙක් ඒ ගැන කිව්වේ. ඒත් ඒක කරපු කෙනෙක් ගැන හෝඩුවාවක් වත් හොයා ගන්න ලැබුණේ නෑ. ඇරත් ඒ කාලේ ඔය වගේ දේවල් ගැන හරි පරීක්ෂණ කෙරිලත් නෑ. හැබැයි නන්දන ඒ ගැන හරි පරීක්ෂණයක් කරන්න දේශපාලන වශයෙන් සෑහෙන බලපෑමක් කරලා තියෙන බවට ගමේ කතාවක් තියෙනවා. ඒත් වැඩක් වෙලා නෑ."

"ඉන් පස්සේ නන්දනගේ චක්ගෝලයින්ගෙන් ඉතුරු වුනේ පොඩි මහත්තයා විතරයි. මීට අවුරුදු තුන හතරකට ඉස්සරවෙලා නන්දට එකතුවුණ තවත් චණ්ඩි ජගේ කොල්ලෙක් පොඩි මහත්තයා එක්කරගෙන ඇවිත් තියෙනවා. ඌට කියන්නේ සුදා කියලා. මිනිහා බොහොම හැඩි වැඩි ඇති ඉලන්දාරියෙක්. මිනිහගෙයි පොඩිමහත්තයාගේ ලොකු දුවයි අතර ප්‍රේම සම්බන්ධයක් එබිදී ඇති වෙලා. ඒකට පොඩිමහත්තයාවත් පවුලවත් අකමැති වෙලා නෑ. එහෙම ඇවිත් හිටියට සුමාන දෙක තුනකට පස්සේ මිනිහවත් නන්දන ඇවිත් එක්කරගෙන ගියා. ඊට පස්සේ මාස දෙක තුනකට විතර සැරයක්, පොඩි මහත්තයත් එක්ක සුදා ගමට ඇවිත් යනවා."

"මීට අවුරුදු දෙකකට විතර ඊඩිදී කඩුවකින් කපලා කොටලා, පස්සේ ගහක එල්ලලා මරලා දාලා තිබුණ පොඩි මහත්තයාගේ මිනිය ගමට ගෙනාවා. එයා යාලුවෙලා හිටිය ගොර ගැණියෙක්ගෙ ගෙදර යනකොට අතරමග රැකගෙන හිටපු කෙනෙක් ඒ වැඩේ කළා කියලයි කියන්නේ. ඒකට සැක පිට ඒ ගැණිගෙ මිනිහාව අත් අඩංගුවට ගත්තත් එදා රෑ එයා වැඩ පලේ ඉඳලා තියෙන නිසාත්, එයාට විරුද්ධව කිසිම සාක්කියක් නොතිබුණ නිසාත් එයාව නිදහස් කරන්න සිද්ධ වුණා. මිනිහා වැඩ කරලා තියෙන්නේ නන්දනට අයිති ප්‍රයි

SL-Unlimited

මැෂින් ෆැක්ටරියක මුරකාරයා විදියට. ගෑනීත් එතනම තමයි වැඩ කරලා තියෙන්නේ. පොඩි මහත්තයා කාලයක් තිස්සේ රෑට රෑට ඒ මිනිහා නැති වෙලාවලට ඒ ගෙදරට රිංගලා තියෙනවා කියලා පොලිසියට ආරංචි ලැබුණා. ඒ මරණයට සම්බන්ධ කෙනෙක් පොලිසියට කොටු කර ගන්න ලැබුනේ නෑ."

"එච්චර තමයි ඒ ගමේ මේ පවුලට සම්බන්ධව සිද්ධ වෙලා තියෙන්නේ."

"ඔය කතා වලින් මට තේරුම් ගියේ පුරනිමලට කොහොම වෙතත් නන්දනට නම් සැහෙන්න තරහා කාරයෝ ඉන්න පුළුවන් බවයි."

"ඔව් පැට්රික්. ඒත් මං නං හිතන්නේ නෑ මේ වගේ මුළු පවුලකින්ම පළිගන්න තරම් හේතුවක් ඒ කාටවත් ඇති වේවි කියලා."

"ඔව් අංකල් කියන කතාවත් ඇත්ත. ඒත් ඒ වැඩ නිසා එයාට තරහා කාරයෝ ගොඩක් ඇති වෙන්න පුළුවන්. එතකොට එයාගෙන් පළිගන්න අවශ්‍ය කෙනෙකුට උදව් උපකාර කරන්න සැහෙන පිරිසක් එකතු වෙන්න තියෙන ඉඩ වැඩි වෙනවා. තමන්ට පළිගන්න ශක්තියක් නැති වුණාට ශක්තියක් ඇති කෙනෙකුට උදව් කරන්න මේ වගේ සිද්ධි ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්."

"මට දැන් මෙහෙම එකක් හිතෙනවා. අර බණ්ඩප්පුගේ දුව පැහැරගෙන ගියානේ. ඒ තැනටම වෙන්න බැරිද මියුරියෙල්වත් පැහැරගෙන යන්න ඇත්තේ. ඒ ගැන ටිකක් විපරම් කරලා බැලුවොත් හොඳයි නේද?"

"ඔව්. ඒ වගේම ඒ පළාතේ ග්‍රාමසේවක. එයා නන්දන ගැන අපැහැදීමකින් ඉඳලා තියෙන්නේ. එයාගෙන් වුණත් තව තොරතුරු ටිකක් දැන ගන්න පුළුවන් වේවි. විමලසිරි ඔය පැහැරගෙන ගියා කියපු බණ්ඩප්පුගෙ දුව එක්ක කතා කරලා බැලුවෙ එහෙම නැද්ද?"

"නෑ. මම ඒ ගැන ඒ තරම් උනන්දු වුණේ නෑ."

"එහෙනම් විමලසිරි ආයෙමත් එහාට ගිහින් ග්‍රාම සේවකත්, බණ්ඩප්පුගෙ දුවත් හම්බවෙලා තව විස්තර ටිකක් ලබා ගන්න බලන්න. දැන් නම් විමලසිරි පොලිසියෙන් තිව්වට කමක් නෑ. අද පොඩි විවේකයක් අරගෙන හෙට වැඩේ පටන් ගන්න."

"ඕකේ බොස්"

"අංකල් හෙට ජයන්ත රන්දෙණිගල ඉඳලා විස්තර එකතුකරගෙන එනවා. අපි හෙට හවස තුනට ආයෙමත් මෙතනට එකතු වෙමු."

●●●

SL-Unlimited

# 11

"රන්දෙණිගල ගම්මානය හා ඒ අවට මෝටර් සයිකලයකින් ඔය කියන දවසේ ගිහින් තියෙන්නේ නන්දනගේ බොඩිගාඩ් විදියට වැඩ කරන සුදා කියන මනුස්සයා තමයි. කවුරුත් මිනිහගේ හරි නමක් දන්නේ නෑ. සුදා කියලා තමයි හැමෝම මිනිහට කතා කරන්නේ." ජයන්ත රන්දෙණිගල ප්‍රදේශයෙන් ඔහු ලත් තොරතුරු අනාවරණය කරන්නට විය.

"සුරනිමලගේ මරණය වුණු දවසේ රෑ හතට විතර සුදා මෝටර් සයිකලයකින් යනවා දැකපු මනුස්සයෙක් ඉන්නවා. හැබැයි මිනිහා ආපහු ආපු වෙලාවක් දැකපු මනුස්සයෙක් නම් හොයා ගන්න බැරි වුණා."

"දැනට මාස තුන හතරකට විතර උඩදී නන්දන සම්මන්ත්‍රණයකට සහභාගි වෙන්න එංගලන්තෙට ගිහින් තියෙනවා. හැබැයි එයා තනියම ගිහින් නෑ. සුදා එක්ක තමයි ගිහින් තියෙන්නේ. සුදා වණ්ඩි පගේ මිනිහෙක් උනාට සැහෙන උගත් කමක් තියෙන කොල්ලෙක්ලු. ඉංගිරිසිත් හොඳට කතා කරනවාලු. ඒ දෙන්නා රට ඉඳන් ආවාට පස්සේ දවසේ ඒ ගෙදර ලොකු උත්සවයක් තියලා තියෙනවා. ලොකු උත්සවයක් කිව්වට ඒකට වැඩි දෙනෙක් සහභාගි වෙලා නෑ. එදා සුරනිමල මුදලාලි මොකක් හරි ප්‍රශ්නෙකට නන්දනත් එක්ක වාද වෙලා තියෙනවා. එයා බොහොම සැරෙන් නන්දනට කතා කළාලු."

"මම කොයිතරම් දේවල් අපේ පවුල වෙනුවෙන් කරලා තියෙනවද? මට ඕන වුණේ අපි හැමදෙනාම එක වගේ ඔළුව උස්සගෙන ඉන්නවා දකින්න. උඹ මොකද කළේ? උඹ තමයි අපේ පවුලේ අයට වල කැපුවේ" කියලා සුරනිමල කියනවා ගෙදර වැඩ කරපු ගමේ මනුස්සයෙක්ට ඇහිලා තියෙනවා."

"හැබැයි නන්දනත් එදා නිකං ඇරලා නෑ. වෙනදට අයියා මොනවා කිව්වත් කට පියාගෙන ඉන්න නන්දන එදා අයියත් එක්ක වාද කරලා."

"මං නොහිටියනම් අද අයියණ්ඩිත් වගේ නොවෙයි ද? මං නොවෙයිද රන්දෙණිගල ව්‍යාපාරයන්ගෙන් පවුල ආරක්ෂා කර ගත්තේ. උඹ හිටියනං උගේ සල්ලි වලින්, බලේ අත යොදවලා අපෙන් පලිගන්න එක නතර කරන්නේ නෑ. අයියව මරන්න කියලා සුදාට සල්ලි දෙන්න ඉදිරිපත් වුණේ කවුද? මං ඔය ඔක්කොම හොයලා

SL-Unlimited

බලලා තමයි වැඩ කටයුතු කළේ. දැන් ඉතිං අපට කිසි බයක් සැකක් නැතිව පාරේ බැහැලා යන්න පුළුවන්."

"ඊට මොනවා කළත් මට කමක් නෑ. උඹ මොකක්ද අපේ එකීට කරපු අපරාදේ. ඒකිව ඉතුරු කරන්න තිබුණානේ?"

"ඒක ඒකිගේ කරුමේ. එකී මොකටද ඉස්සරහට පැන්නේ? උන් දෙන්නම මේකට වගකියන්න ඕනේ."

"උන් දෙන්නා? උන් දෙන්නා නොවෙයි උඹ කරපු වැඩේ නොවෙයිද ඒම නිස්කොටම මුල?"

"ඔව් ඉතින් අයියට මං කරපු වැරදි විතරනේ පේනන්නේ? මං කරපු හොඳ මුකුත් මතක නෑ. මං හින්දා නොවෙයිද අයියට කොන්තරාත් වැඩ ලැබෙන්න මුලක්? මේ අයියගේ බිස්නස් පටන් ගන්න මැති ඇමති ගොල්ල අයියට උදව් කළේ මං එයාලට කරපු උදව් නිසා නොවෙයිද?"

"ඒ වෙලාවේ සුදා එන අඩි සද්දේ ඇහිලා මට මේ විස්තරේ කියපු ගමේ මනුස්සයා ඉක්මනට එතැනින් අයින් වුනාලු. කතාව ඊට පස්සෙත් ටිකක් දික් ගැහිලා තියෙන බව එයාට පේනුනාලු. සුදාටත් සුරනිමල මුදලාලි බැනලා පෙන්න ඇති මූණ රතු කරගෙන ඉන්නවා ඊට පස්සේ එයා දැකලා තියෙනවා. සුරනිමල මුදලාලි ගිහින් තියෙන්නෙත් තරහෙන් වගේ."

"ඊට පස්සේ අපි ගරු කියපු නිසා රන්දෙණිගල වලව්වේ කුමාරිහාමි පැහැරගෙන ගිය එක ගැන ගමේ මිනිස්සු, විශේෂයෙන් වයසක උදවිය, කියන කතා ගැන විපරම් කරලා බැලුවා. පොලිස් පොතේ සටහන් වෙලා තිබුණ විස්තරම තමයි ඒ ගොල්ලන්ගෙනුත් දැන ගන්න ලැබුණේ. පුවානිස්ගෙ කොල්ලො ඕය වැඩේ කරන්න ඇති කියලා තමයි වැඩි දෙනෙක් විශ්වාස කරන්නේ. විශේෂයෙන් සඳහන් කරන්න තියෙන්නේ මියුරියෙල් ඉගෙන ගත්තු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෙල්ලො කොල්ලො තුන්හාරසීයක් විතර අවමඟුලට සහභාගි වුණ එක ගැන තමයි. ඒ ආපු ළමයින්ට ගමේ මිනිස්සුන්ගෙ කටකතා නිසා සුරනිමලලාගෙ පවුලේ අය මේකට සම්බන්ධ බව තේරිලා, මිනිහගෙ ගේ වට කරලා තියෙනවා. ළමයි එන බව ආරංචි වෙලා සුරනිමලයි, පවුලෙ අනිත් අයයි පැනලා ගිහින් පොලිසියට වාර්තා කරලා. පොලිසියෙන් එනකොට කොල්ලො ගෙදර තාප්පෙ කඩලා, වත්තට ඇතුළුවෙලා, ගේ කුඩු කරන්න හදනවා. පොලිසියෙන් ඇවිත් ඒ ළමයි පිරිස විසුරුවා හැරලා ඊටකදී මූලිකත්වය ගත්තු ළමයි දෙන්නව අත්අඩංගුවට අරගෙන තියෙනවා. එක්කෙනෙක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමයේ සභාපති රුවන් බණ්ඩාර. අනෙකා එහෙ උපසභාපති ප්‍රියන්ත සපරමාදු."

"ඒක හොඳ ආරංචියක්. මට රුවන් බණ්ඩාර කියලා කෙනෙක්

SL-Unlimited

ගැන මීට ඉස්සරවෙලා සඳගත් වුණා මතකයි."

"ඔව් අංකල්. මේජර් රුවන් බණ්ඩාර. හිෂණ සමයෙදී වැල්ලවාය පැත්ත භාරව හිටපු හමුදා නිළධාරියා. හැබැයි ඒ දෙන්නා එකගතාමද කියලා අපට හොයලා බලන්න වේවි."

"පස්සේ සුරනිමල පොලිසියට ඇවිත් මේ පැරැණි එමයි හැම දේටම කලබල වෙනවා. මේකට අපේ ඇති සම්බන්ධයක් නෑ. ඒ ළිමයින්ට තමන්ගේ හිතවතියකට වෙච්ච දේට කේන්ති යාමත් සාධාරණයි. තමුන්ගෙ සහෝදරී වගේ හිටපු කෙනෙක්වගේ මේක වෙලා තියෙන්නේ. නොදැන කරපු වරදක් නිසා මං කැමතියි පැමිණිල්ල ඉවත් කරගෙන සාමදාන වෙන්න කියලා. ඒ විදියට ඒ දෙගොල්ල සමාදාන වෙලා ඒ ප්‍රශ්නය නිරාකරණය කරගෙන තියෙනවා."

"ජයන්ත හොයා ගත්තු කරුණු අතර බොහොම වැදගත් දේවල් කීපයක් ගැනම කියවුණා. සුදාට සුරනිමල මරන්න කියලා සල්ලි දීපු කතාවක් කියවුණා. ඒ කියන්නේ කවුරු හරි කෙනෙක් සුරනිමල මරන්න කියලා සුදාට සල්ලි දීලා තියෙනවා. ඒකෙන් පෙනෙන්නේ සුරනිමලත් එක්ක තරහින් හිටපු තව කෙනෙක් ඉන්නවා කියන එක නේද? අනික දැනට මාස තුනකට විතර ඉස්සරවෙලා නන්දන සම්මන්ත්‍රණයකට සහභාගී වෙන්න රට ගිය එක. මේකට සුදා එක්කයි ගිහින් තියෙන්නේ. එහේදී මොකක් හරි අපරාධයක් ඒගොල්ල කරපු බවට ඉඟියක් තියෙනවා. සුරනිමල "අපේ එකීච්චත් බේරුවෙ නැත්තේ මොකද?" කියලා ඇහුවා. අපේ එකී මැද්දට ආපු නිසයි ඒක කරන්න වුණේ කියලා නන්දන කිව්වා. මේකෙන් පෙනෙන්නේ ප්‍රශ්නෙ ටිකක් ඈතට විහිදිලා යන එකක් බවයි. අපි නොදන්න දේවල් බොහෝමයක්ම මේකට සම්බන්ධ වෙලා වගෙයි මට හිතෙන්නේ."

"අනික් එක තමයි නන්දන කියලා තියෙනවා වනාත්‍යයන්ගෙන් පවුල ආරක්ෂා කර ගත්තේ එයා කියලා. එතකොට වනාත්‍යයා කියන්නේ එක්කෙනෙක් නොවෙන බවත්, ඒ හැම දෙනාම නන්දන අතින් විනාශ වුණ බවත් හිතන්න පුළුවන්. සුරනිමලත් ඒකට කිසි දෙයක් නොකිව්වෙ එයා එහෙම විශ්වාස කරපු නිසා වෙන්න පුළුවන්. එහෙම නම් සුරනිමල මරාදාන්න ආපු වනාත්‍යයා කවුද කියලා ප්‍රශ්නයක් ඇති වෙනවා."

"ඇත්ත. අපට දැන් නන්දන ගැන සැක කරන්න සිද්ධ වෙනවා. මිනිහා සුරනිමලත් එක්ක ටික ටික නොගොඩ වේගෙන ආපු බවකුත් පෙනෙන්න තියෙනවා. මිනිහා සුදා ලව්වා ඒ වැඩේ කෙරෙව්වා වත්ද? ඔය මිනීමැරුම වුණ දවසේ රෑ හතට විතර සුදා මෝටර් සයිකලයෙන් ගියේ කොහේද?"

"නන්දනයි ජයදේවයි කියන විදියට කමලදාසගේ දුරකතන ඇමතුම ලැබෙන කොට ඒ දෙන්නා සුදා එක්ක සුරනිමලගේ ගෙදර

බලා පිටත් වෙලා තියෙනවා. සුදා යනවා දැක්කයි කියපු මුදලාලි රෑ දහයාමාරට කඩේ වහලා තියෙන්නේ. නමුත් රෑ හතට ගිය සුදා එනවා නොදකින්න හේතුව මොකක්ද? එහෙකොට එයා දැකලා තියෙනවා නන්දනගේ ජීප් එක රෑ කඩේ වහන්න ඔන්න මෙන්න කියලා තියෙද්දී යනවා. එතකොට සුදා කොහොමද නන්දනට එකතු වුණේ? මුදලාලි කියන කතාව ඇත්ත නම් සුදා ඒ වෙලාවේ ගෙදර ඉන්න විදිහක් නෑ. එතකොට ජයදේවත් කියන්නේ බොරුවක්. ඇයි ජයදේව සුදා බේරගන්න හදන්නේ?"

"සමහර විට ජයදේවගේ විවාහයට පියා අකමැති වුණ නිසා ජයදේවත පියා එක්ක තරහෙන් හිටියද දන්නේ නෑ. ඒත තාත්තා කෙනෙක් එහෙම දේකට විරුද්ධ වුණා කියලා එයාට අනතුරක් වෙනවා දකින්න පුතෙක් කැමති වේවි කියලා හිතන්න අමාරුයි."

"තාත්තාගෙයි පුතාගෙයි අතර තිබුණ ප්‍රශ්නෙ ගැන අපට දැන ගන්න පුළුවන් කමලදාසගෙන් තමයි. නන්දනට තියෙන බයට මිනිහා මුකුත් නොකිය ඉන්නත් පුළුවන්. සමහර විට සුවාරිස්ගෙන් යමක් දැන ගන්න බැරි වෙන එකක් නෑ."

"ඔව් එතකොට දැන් අපි මේජර් රුවන් බණ්ඩාර ගැනත් හොයන්න ඕනේ. ජයන්තට තියෙන ඊළඟ කාර්යය තමයි රුවන් බණ්ඩාර ගැන විස්තර පුළුවන් තරම් හොයා ගන්න එක. හමුදාවේ මේජර් කෙනෙක් නිසා ඒක ඒ තරම් අමාරු වෙන්න දෙයක් නෑ."

ඔවුන් පිටත්ව ගිය පසු පැට්රික් හා හැරී මද වේලාවක් සාකච්ඡා කරමින් සිටිය හ.

"අංකල්. අපි ඇත්තටම සුදා කියන මනුස්සයා එදා රෑ ගෙදර හිටියද කියලා හරියට දැනගන්නත් ඕනේ."

"ඔව් ඒක හොඳ අදහසක්."

"ඒක දැන ගන්න තියෙන්නෙ මාධවීගෙන්ම තමයි. මයුරි කියන විදිහට කාටවත් ලේසියෙන් මාධවී හමුවෙන්න බෑ. අංකල්ට පුළුවන්ද මාධවීගේ හොඳම යෙහෙළිය කවුද කියලා හොයා ගන්න."

"මට පුළුවන්. මං ශ්‍රී ලාල්ගෙන් ඒක දැන ගන්නම්."

ඒ අනුව ශ්‍රී ලාල්ට කතා කළ හැරී මාධවීගේ කිට්ටුම හිතවතිය රිද්මා බව දැනගත්තේය. ඇගේ දුරකතන අංකයද ලබා ගැනීමට ඔහු සමත් විය.

"දැන් මම මාධවී හමුවෙන්න සැලැස්මක් හදා ගන්නම්." සතුටට පත් පැට්රික් කීවේය.

●●●

SL-Unlimited

## 12

ඉන් දෙදිනකට පසු වැල්ලවායට තොරතුරු රැස් කිරීමට ගිය විමලසිරි, හැරී ජයසුන්දර හා පැට්රික් හමුවට පැමිණියේ ය.

"සර් නියම තැනට තමයි මට යන්න කියලා යොමු කළේ" විමලසිරි කීවේය.

"මම මුලින්ම ගියා ග්‍රාමසේවකගේ ගෙදරට. මිනිහා අවුරුදු හතලිස් පහක් විතර වයස කෙනෙක්. මම පොලිසියෙන් කියලා කිව්වාම එයා කිව්වා දෙන්න පුළුවන් හිතම සහයෝගයක් දෙන්නම් කියලා. අර පරණ සිද්දි වෙනකොට මිනිහාගේ තාත්තා තමයි ග්‍රාම සේවක. එයාට දැන් අවුරුදු හැටපහක්ලු. ඒ වුණාට තාම කුඹුරු වැඩ කරනවා. පුතාට රාජකාරිය පවරලා එයා විශ්‍රාම ගත්තා කියලා කිව්වා. එයාගෙන් තමයි මම වැඩිපුරම විස්තර දැනගත්තේ."

"ග්‍රාමසේවක මහත්තයාගෙන් අපට දැන ගන්න ඕන, මීට අවුරුදු විසිපහකට විතර ඉස්සර සිදු වුණ දෙයක් ගැන ආරංචි කිහිපයක්. අර බණ්ඩිජ්ජු කියලා කෙනෙක්ගේ දුවක්, රන්දෙණිගල කුමාරිහාමි පැහැරගෙන යන්න ඉස්සරවෙලා පැහැරගෙන ගිහින් තියෙනවනේ. අන්න එයාව හංගගෙන හිටපු තැන ගැන තොරතුරු ටිකක් දැන ගන්න අපට ඕනේ. ඒකට පොඩි උදව්වක් කරන්න පුළුවන්ද?"

"මහත්තයෝ. මහත්තයා ඔහොම අහන කොට මට පරණ සිද්ධියක් මතක් වුණා. ඔය මියුරියල් කියන දැරිව පැහැරගෙන ගිහින් මාස හයකට හතකට විතර පස්සේ, ඔය මහත්තයලා ආවා වගේම මෝටර් සයිකලයකින් ආපු හොඳ කඩවසම්, පැහැපත් පෙනුමක් තියෙන මහත්තයෙක්, මගෙන් ඔය ටිකම ඇහුවානේ. ඒ මහත්තයාට එදා දුන්න උත්තරේම තමයි මට ඔය මහත්තයලටත් දෙන්න තියෙන්නේ. මාලිනී කෙල්ල නම් තාමත් මට කරපු දේට උන්ට හොඳක් වෙන්න එපා කියලා දෙවියන්ට කියනවා. හැබැයි ඒකි, ඒ ගැන කාටවත් කියන්නේ නෑ කියලා තාත්තට පොරොන්දුවක් දීලා තියෙන නිසා, ඒ ගැන වචනයක්වත් කතා කරන්නේ නෑ."

"හොඳ ගානක් දෙනවා කිව්වොත් ඒ ගැන කියාවිද?"

"අර මහත්තයත් ඔහොම ඇහුවා. මං කිව්වා හොඳයි මං හෙට ඒ ළමයව අපේ ගෙදරට ගෙන්නගන්නම්. මේ ආපු වෙලාවට වගේ මහත්තයා මෙහාට එන්න කියලා. ඒත් මාලිනී කෙල්ල කඳුළු හල හල හිටියා මිසක් කිසි දෙයක් කිව්වේ නෑ. ඒකිගේ කඳුළු අතරින් ඒ මහත්තයටත් තේරෙන්න ඇති එයාට ඒ අපරාදේ කරපු එවුන් ගැන

SL-Unlimited

තියන වෛරය. ඒ වුනාත් ඒ කෙල්ල තව දුරටත් සමාජයෙන් එන ආලුහ වලට මූණ දෙන්න සූදානම් නෑ. පස්සේ අර මහත්තයා ආපහු ගියා."

"ඊට පස්සේ ඒ හිටපු ග්‍රාම සේවක මට ඊට බැලුවේ රහසක් කියන්න සූදානමින්, වෙන කවුරුවත් ළඟ පාත ඇත්ද කියලා විමසන්න වගේ. ඊට පස්සේ එයා ඉඳගෙන හිටපු පුටුව අපි හිටිය කිට්ටුවට ඇදගෙන ඇවිත් හෙමින් කතා කරන්න වුණා."

"මහත්තයෝ දැං මං කියන්න යන එක රහසක්. කිසිම කෙනෙකුට මේ ටික කියන්න එපා. මහත්තයලා පොලිසියෙන් කියපු නිසාත්, මේ මනුස්සමැරුම් ගැන හැබෑහින්ම දිනන්නු බව පෙනෙන නිසාත් මං මේ ටික කියන්නේ."

"මාලිනී කෙල්ලට වැඩිමහල් සහෝදරයෙක් හිටියා සිරිමලා කියලා. මෝඩ පගේ හැටියෙක්. මිනිහා පාත්තට උඳුම් පදම් කරගෙන හිටියා ඉස්කෝලෙකට ගිහින් ඉගෙන ගත්තෙත් නෑ. ඒ දවස්වල මිනිහා ගාව කාසිපනම් ටිකක් ඇති බව මට තේරුණා. ගමන බීමකත් ටිකක් උපාරුවෙන් වගේ ගියේ. ඌ ගැන හොඳින් දැන ගෙන හිටි නිසා මට ඉතක් සැකයක් ඇති වුණා. මං දවසක් මිනිහගෙන් ඇහුවා, "උඹ මී හරක් බානක් ගත්තා කියලා ආරංචියි. උඹට කොයින්ද මෙච්චරම සල්ලි ලැබුණේ?" කියලා."

"ඇයි රාළහාමි. රාළහාමිට මාව හැම තිස්සෙම සැකයි. මේ පාර අපේ වගාව ජය වුණා කියලා සැමෝම දන්නවා."

"ඌ මෝඩයා. මට කිව්වේ බොරුවක් බව ඌගේ ඇස් දෙකෙන් මං තේරුම් ගත්තා. වගාව සරු වුණ එක ඇත්ත. ඒත් ඒතරම් සල්ලි ගොඩක් ඒකෙන් ලැබෙන්න විදිහක් නෑ. ඔය සල්ලි අත දිග ඇරලා වියපැහැදම් කරන්න ඉස්සර වෙලා දවසක මිනිහත් එක්ක මහත්තයෙක් කතා කර කර ඉන්නවා ගමේ කෙනෙක් දැකලා තියෙනවා. මං ඒ ගැන ටිකක් හොයලා බැලුවා. ඊට දවස් තුනකට පස්සේ මිනිහා කොළඹ ගිහින් තියෙනවා. ආපහු ආවේ දවස් දෙකකට පස්සේ. ඒ ආවට පස්සේ තමයි මිනිහා අත සල්ලි හැවෙසෙන්න වුණේ. මං හිතන්නේ අර මහත්තයාට ඌ මොනවා හරි උපකාරයක් දුන්නා. ඒ මහත්තයා වෙන්න ඇති සල්ලි දෙන්න ඇත්තේ. මං ඔය ගැන කා එක්කවත් කිව්වේ නැත්තේ ඌට කරදරයක් වෙන්න පුළුවන් බව දන්න නිසා. ඒ ගිහින් ආවට පස්සේ දවසේ තමයි අපට ආරංචි වුණේ වුට් මල්ලි, ඒ කියන්නේ අද ඔය ලක්සෙට කොඩිදාලා ඉන්න නන්දන මුදලාලි කියන හරක් හොරාගේ චක් ගෝලයෙක්, ගිනි තියාගෙන මැරිලා ඉන්නවා කියලා අපට ආරංචිය ආවේ."

"ඉතිං මහත්තයෝ දැං ඔය සිද්ධිය වෙලා අවුරුදු ගාණක් ගිහින් නිසා ඔය සිද්ධි ගැන කතා කරන්න ගමේ මිනිස්සු බය වෙන එකක් නෑ. ඇරත් ඒ කාලේ ඒ කෙරුවාවල් කරපු නන්දනගේ ගමේ හිටි

SE-Unlimited

චණ්ඩි එකෙක්වත් ඉතුරු වෙලත් නැහැනේ. මහත්තයා අද හවස පහට හයට විතර ආපහු එන්න. මං සිරිමලාට "මෙහාට එන්න" කියලා පණිවිඩයක් යවන්නම්."

"මම හවස එහාට ගියා. අවුරුදු පනහක් විතර වයස ඇති පුද්ගලයෙක් අපිව දැක්කාම තුනට හතරට නැමිලා මෝඩ පලප් හිනාවක් දැම්මා. ඒ සිරිමලා වෙන්න ඇති කියලා අපට හිතුණා."

"මහත්තෙලාට මොනවද මගෙන් දැන ගන්න ඕනේ?" මිනිහා අහිංසක විදියට ඇහුවා.

"මිනිහව සල්ලි වලට ගන්න පුළුවන් බව දැන ගෙන හිටි නිසා අපි හිතුවා ඒක ඉස්සරහට දාලා කතා කරන්න."

"මට බොහොම වැදගත් ආරංචියක් දැන ගන්න ඕනෙ. ආරංචියේ වැදගත් කම නිසා මම සිරිමලාට රුපියල් දහදාහක් දෙනවා. හැබැයි ඇත්ත හරියට කියන්න ඕනේ."

"මිනිහගේ මූණ මලක් පිපුණා වගේ වුණා."

"මහත්තෙලාට මොකද්ද දැන ගන්න ඕනේ?"

"අපි කාරණේ කිව්වා. මිනිහා ටිකක් ගැස්සිලා ගියා."

"අනේ මහත්තයෝ ඕවා ගැන කතා කරලා මට කරදරයක් වේවිද දන්නේ නෑ?"

"නෑ නෑ අපි ඔය ගැන කාටවත් කියන්නේ නෑ. කියන හැම වචනයක්ම රහසිගතව තියා ගන්නවා."

"ඒ වුණත් මහත්තයෝ... මේ.. මේ.. මං මං.., මං නං ඒ වැඩේට පොඩ්ඩක්වත් සම්බන්ධ වුණේ නෑ. ඒ කුමාරිහාමියි, ආණ්ඩු මහත්තයෙකුයි තමයි ඔක්කොම කළේ. මට නං බලාගෙන ඉන්නවත් බැරි වුණා."
"මිනිහගේ මූණ සුදු මැලි වෙලා ගිහින්. මං මිනිහට බොන්න වතුර ටිකක් ගෙනත් දුන්නා."

"සිරිමලා කිසි දේකට බය වෙන්නවත් කලබල වෙන්නවත් එපා. මේ කියන සාක්කිය සිරිමලාට විරුද්ධව අපි පාවිච්චි කරන්නෙත් නෑ. අපට ඕනෙ මේ සිද්ධියෙ අග මුල ගැටගහ ගන්න විතරයි. මේක පොලිසි පොතේ හරි විභාගයකදී හරි ප්‍රශ්න කරන දෙයක් නොවෙයි කියලා මං රුපියල් දහදාහ අතට ගත්තා. සල්ලි දැක්කාම මිනිහගේ මූණෙ තිබුණ අර බය ගතිය නැති වුණා."

"මීට අවුරුදු විසිපහකට තිහකට විතර උඩදී මහත්තයෙක් අපේ ගෙදරට මාව හොයාගෙන ආවා."

"ඔහේටද සිරිමලා කියන්නේ?" ඒ මහත්තයා මගෙන් ඇහුවා.

"ඔව් මට තමයි සිරිමලා කියන්නේ."

"මට පොඩි ආරංචියක් සිරිමලාගෙන් දැන ගන්න ඕනෙ. ඒ ආරංචිය කියලා අපට උදව් කළොත් රුපියල් දෙදාහක් දෙනවා."

SL Unlimited

"ඒ කාලේ රුපියල් දෙදාහක් කිව්වාම ලොකු ගාණක්. රුපියල් දෙදාහක් දෙනවා නම් මහත්තයෝ අපායට ගිහිල්ලා එන්නත් බැරියෑ. මං කවදාවත් එහෙම ගානක් දැකලවත් නෑ. මට ඉන්න, හිටින්න හොඳ තැනක් හදාගෙන පොළවකත් කරගන්නත් බැරියෑ කියලා මට හිතුනා."

"හොඳයි මහත්තයට මගෙන් දැන ගන්නෙ ඕනෙ මොකක්ද?"

"මගෙගෙ නංගිව දැනට අවුරුද්දකට විතර උඩදී කවුරුහරි පැහැරගෙන ගියානේ. ඒ කෙල්ලව ඊං හංගගෙන හිටපු තැන තමයි මට දැන ගන්න ඕනෙ. මං කාටවත් ඒ ගැන කියන්නෙ නෑ."

"මහත්තයට අහවල් කාරණේකටද අපේ නංගිව හංග ගෙන ඉන්න තැන දැන ගන්න ඕනේ?"

"තමුසේ දන්නවා ඇති මේ රන්දෙණිගල පැත්තේ කුමාරිහාමි කෙනෙක් අතුරුදහන් වෙලා කියලා, පොලීසියෙන් ඇවිත් මේ පැත්තත හෝදිසි කළ බව. ඒ මගෙ නංගී. මම නංගිව හොයනවා. මට හිතෙනවා මගෙ නංගිවත් තමුසෙගේ නංගිව හංගලා හිටපු තැනම හංගගෙන ඇතිය කියලා. තමුසේ ඇත්ත කියනවා. මං තමුසෙට නොසලකා ඉන්නේ නෑ."

"රුපියල් දෙදාහක් අතාරින්න බැහැනේ මහත්තයෝ. ඒ මහත්තයා ඕක අහන්න කලින් මං නංගිගෙන් ඒ ගැන අහලා තිබුණා. ඒත් නංගි මගේ දිහා බලං හිටියා මිසක් කිසි දෙයක් කිව්වේ නෑ. ඒ නිසා මට ඕකට විස්තරේ නංගිගෙන් ලබා ගන්න බැරි බව මං දැනගෙන හිටියා. ඒත් මට ඒ කාලේ ඔය ගැන පොඩි සැකයක් තිබුණා. ඒ නිසා ඒ මහත්තයට මං කිව්වා මට දවස් දෙකක් කල් දෙන්න. මං හරියට විපරම් කරලා බලලා ඒ ගැන කියන්නම් කියලා. මහත්තයා මට රුපියල් සියකුත් දීලා, මහත්තයාගේ ගෙදර ලිපිනයත් කොළේක ලියලා මට දුන්නා. හරි විස්තරයක් ලැබුණාම මං ඉන්නේ මේ ගෙදර. මෙහාට ඇවිත් කියන්න කියලා මහත්තයා ගියා."

"නන්දන මහත්තයාගේ වක්ගෝලයෙක් හිටියා මුට මල්ලි කියලා. නිකිනගේ අක්කා සූරියවැව පැත්තේ තන්නන් කරන කෙනෙක්ට කසාද දීලා හිටියා. ඔය වලව්වේ කුමාරිහාමි නැති වුණ දවස්වල සතියකට දවසක් විතර මුට මල්ලි රෑට පිරිවර කවුරුහරි එක්ක සූරියවැව යනවා. නිකිනා දුප්පත් එහෙම ගියේ නෑ. අම්බර දවස්වලට තනියමත් යනවා. මට නිකිනා ගැන පොඩි සැකයක් ඒ දවස්වල තිබුණා. මං ඉස්සර හොරෙ රහසෙම ඒ මස්සිනාගේ ගෙදරට ගියා. නිකිනගේ ගෙදර කොහොමට වෙන්න අරගෙ ගෙදර තිබුණා. එදා හැන්දෑවේ මං ඒ පාර්ශව ගෙදර අසල ලියැඳිලාටත් වෙලා හැංගිලා හිටියේ කාමරේ ලයිට් නිවුණාම එතනට ඔහොම ටිකක් විපරම් කරලා බලන්න."

"කාරැමල වැටුණා. මං ඉකිනි යෙන්නිස් ඒ ගේ පාමටට කිට්ටු වුණා. ඒත දැන් මිනිස්සු පාතිච්චියෝ නින්දේ නැති වුණාට දොර ජනෙල්

එහෙම හොඳට හයියට තිබුණා. ඒ හැම එකක්ම අගුලු දාලා. ගෙට ඇතුළු වෙන්න ගෙයි ඉස්සර පැත්තෙ තිබුණ දොරටත්, පස්සෙ පැත්තේ තිබුණ දොරටත් අගුලු දාලා. මට ඇතුළට යන්න විදිහක් නෑ. මේ ගෙදර නම් කාව හරි හිර කරගෙන ඉන්න පුළුවන් කියලා මට සැකයක් ඇති වුණා."

"මං ඒ ගෙට ඇතුළු වෙන්න විදිහක් බල බල ඉන්නකොට මං දැක්කා කවුරුහරි කෙනෙක් අලුත් ගෙදර පැත්තේ ඉඳලා ටෝච් එකකුත් පත්තු කරගෙන, පරණ ගෙදර පැත්තට එනවා. මං හනිකට මූකලානට වැදිලා පඳුරකට මුවාවෙලා බලාගෙන හිටියා. ඒ ආපු කෙනා අතේ තිබුණ පිගානක් වගේ එකකුත් තිබුණා. එයා දොර ඇරලා ඇතුළට ගිහින් ආපහු දොර වැහුවා. මට හිතුනා හිර කරගෙන ඉන්න කෙනාට කෑම ගෙනිච්චා කියලා. ඒත් මට ඒ කිට්ටුවට යන්න බය හිතුනා. අහුවුනොත් කපෝතිනේ."

"මිනිහා එතනින් ගියේ පැය බාගයකට විතර පස්සේ. ඒ ගිහිනුත් විනාඩි දහයක් පහලොවක් විතර බලං ඉඳල මං ආපහු ඒ පැලට කිට්ටු කළා. මං ගෙදර තිබුණ හැම දොරකටම ජනේලයකටම හෙමින් තාලේ තට්ටු කළා. එතකොට එක තැනකදී මට කවුරු හරි අමාරුවෙන් කෙඳිරි ගානවා ඇහුණා."

"කවුද ඇතුලේ ඉන්නේ?" මං ඇහුවා.

"ඔයා කවුද?" කෙඳිරිලි හඬ . මගෙන් ඇහුවා.

"මං මේ ගමේ කෙනෙක්. ඔහේ කවුද?"

"අනේ මාව මේ අපායෙන් බේරගෙන යන්න. මගේ අම්මයි අප්පච්චියි මං ගැන හිත හිත මැරි මැරී ඉපදිනවා ඇති."

"නෝනගේ නම මොකක්ද?"

"මියුරියෙල් සුරියබණ්ඩාර."

"නෝනා කිසි දේකට බය වෙන්නේ නැතිව ඔය හිටියා වගේ දවස් දෙක තුනක් ඉන්න. මං නෝනව බේරගෙන යන්න එනවා."

"මට ඒ නෝනා ගැන ඇති වුණේ හරිම කනගාටුවක්. එතකොට නෝනව පැහැරගෙන ගිහින් මාස හයක් විතර ඇති. මාස හයක්ම මෙහෙම හිර ගෙදරක ඉන්න වුණා කීවාම මොන තරම් වේදනාවක් විඳින්න ඇත්ද?"

"පහුවෙනිදා උදේනම මං අර ජස්ටින් මහත්තයා දීපු ලිපිනය අනුව මහත්තයා හොයාගෙන ගියා. මහත්තයා ගෙදර හිටියේ නෑ. මහත්තයා දවල් කෑමට ගෙදර එනවා කියලා, ඒ ගෙදර උදවිය කිව්වා. මට බොන්න තේ එකකුත් දුන්නා. මං මහත්තයා එනකම් හිටියා. මහත්තයාට මාව දැක්කාම සතුටු හිතුනා. මාව කාමරේට අරගෙන ගියා. ඒ ගෙදර නෝනට කියලා මටත් කෑම ලෑස්ති කරන්න කිව්වා."

"මං විස්තරේ කිව්වා. මහත්තයාගේ මූණ.. හපෝ ඒක දැක්කාම තාමත් මගේ ඇඟේ මයිල් කෙළින් වෙනවා. ඇස් දෙක රතුවෙලා. යකෙක් වුණා වගේ. කොයි තරම් කේන්ති ගියත් එයාට කෑ ගහන්න විදිහක් නෑ. අත පය මිටි කරගෙන වේදනාව මිරිකලා දාන්න බලනවා."

"මට පාව පොඩි ගමනක් යන්න තියෙනවා. මං එනකං මෙහේ ඉන්න ඕනේ. ඒ ආපුවාම මං අර පොරොන්දු වෙච්ච ගාන දෙනවා" කියලා මහත්තයා මාත් එක්ක කෑම කෑවා. මං කෑවාට මොකද මහත්තයාට නං එක බත් කටක් වත් හරියට කන්න බැරි වුණා."

"එදා රෑ හයට හතට විතර මහත්තයා තවත් මහත්තයෙක් එක්ක ආවා. ඒ ආපු මහත්තයා නම් බොහොම නිවිච්ච, අහිංසක මහත්තයෙක් කියලා මට දැකපු ගමන්ම තේරුම් ගියා. ඒ මහත්තයාත් මගෙන් විස්තර ඇහුවා. මං ඒ ටික ආපහු ඒ මහත්තයටත් කිව්වා. ඒ මහත්තයා කිව්වා අපි මේක පොලිසියට කියමු කියලා."

"මං හොඳටම බය වුණා. අනේ මහත්තයෝ පොලිසියට නම් යන්න එපා. මං මේ විස්තර කිව්ව බව දැනගත්තොත් මට ගමේ විසුමක් වෙන්නේ නෑ."

"මං හම්බුවෙන්න ගිය ජස්ටින් මහත්තයාට, අර ආපු මහත්තයා කතා කළේ ටික්කුං කියලා. ජස්ටින් ඒ මහත්තයාට කතා කළේ පුංචි හාමු කියලා."

"සිරිමලාට පුළුවන්ද ඒ හෝනාව හිර කරලා ඉන්න තැන අපට පෙන්නන්න?" ජස්ටින් ඇහුවා.

"මට පුළුවන් මහත්තයා."

"එදා රෑ අපි ඒ ගෙදර නැවතිලා හිටියා. පහුවදා උදෙන් ජස්ටින් මහත්තයාගේ ජීප් එකෙන් අපි තුන්දෙනා සූරියවැවට ආවා. අපි ඕන කමින්ම ටිකක් හෙමින් ආවේ. කලින් ගියාට වැඩක් නැහැනේ. රෑ වුණාම අපි හෙමින් හෙමින් ඒ ජීප් එකෙන්ම මුකලානෙ ටිකක් දුරට ආවා. අපි බොහොම පරිස්සම් වුණා කාටවත් ඇහැ නොගැහෙන්න. හඳ එළිය තිබුණ නිසා අපට ඒක ඒ තරම් ප්‍රශ්නයක් වුණේ නෑ."

"ඉන් පස්සේ අපි තුන්දෙනා පරණ ගේ තියෙන හරියේ මුකලානට වෙලා හැංගිලා බලාගෙන හිටියා. ජස්ටින් මහත්තයා යකඩ පොල්ලක් අරගෙන ආවත් අනික් මහත්තයා නම් නිකම්මයි හිටියේ. ජස්ටින්ට ඕන වුනේ යකඩ පොල්ලෙන් ගහලා, දොරක් හරි ජනේලයක් හරි කඩලා, ඇතුළට ගිහින් කුමාරිහාමිව බේරගන්න. ඒත් එතකොට සද්දේ ඇහිලා ගෙදර ඉන්න මිනිස්සු එන්න පුළුවන් නිසා ඇතුළට යන්නේ කොහොමද කියලා හිත හිත ඉන්න කොට අපි දැක්කා විදුලි පන්දමකුත් අරගෙන කවුරු හරි පරණ ගේ පැත්තට එනවා. අපි පඳුරකට මුවා වෙලා නිස්සද්දවම හිටියා."

SL-Unlimited

"එන මිනිහා බීලා ඉන්න බව එයාගේ ගමන් විලාසයෙන් අපි තේරුම් ගත්තා. මිනිහා දොරේ අගුල ඇරියා. ඒ වුණාට කලින් දවසේ වගේ දොර ආපහු වැහුවේ නෑ."

"යකෝ මේ පර බැල්ලි කියලා දොර ගාව ඉඳගෙනම ඌ බෙරිහන් දුන්නා."

"මාව මරපිය. මාව මරපිය. ඇයි තොපි මට මේ හැටි වද දෙන්නේ?" ගැහැණු කටහඬක් අපට යාන්තමට ඇහුණා."

"ඔව් තීව ඉවර කරලා යන්න තමයි මං ආවේ."

"ඇරලා තිබුණ දොර අහරින් ආලෝකයක් ආපු නිසා ඌ ඇතුලෙ තිබුණ ලාම්පුවක් පත්තු කරන්න ඇති කියලා අපි හිතුවා."

"යකඩ පොල්ලක් අරගෙන ජස්වින් ගෙට පැන්නා. අපි දෙන්නත් ඒ එක්කම ඇතුලට ගියා. චුටි මල්ලි අපි ආපු සද්දෙට පැරිලා බලන කොටම ජස්වින් යකඩ පොල්ලෙන් ඔළුවට ගැහුවා. ඌ බිම වැටුණා."

"මහත්තයෝ. ගමේ මිනිස්සු මට මෝඩයා කියලා කියනවා. මං එහෙම මෝඩයෙක් විදියට ගමේ ඉන්නේ මහත්තයෝ, එහෙම නොහිටියොත් අපේ දුප්පත් කම නිසා ඌං මාව කයි කියලා හිතලා. මගේ නංගිට ඒ අපරාදෙ කරපු වුන්ට මාත් හිතෙන් සාප කර කර හිටියේ. දැන් මට හොඳට තේරුණා ඒකිටත් ඒ අපරාදෙ කළේ මුන්ම තමයි කියලා. මටත් හොඳ අවස්ථාවක් ලැබුණේ මුන්ගෙන් පළි ගන්න. මාත් ජස්වින්ට උදව් වුණා ඌව අල්ලලා කණුවක ගැට ගහන්න. මියුරියෙල් නෝනා අර හාමු මහත්තයාව දැක්කාම අඬාගෙන දුවගෙන ඇවිත් එයාව බදා ගත්තා. මටත් කඳුළු ආවා මහත්තයෝ. නෝනාට කිසි දෙයක් කියන්න වචන එන්නෙ නෑ. මහත්තයාත් එහෙමයි. ඇස් දෙකේ කඳුළු පිරිලා නෝනාගේ ඔළුව පාදින් අත ගානවා. ඒ මහත්තයා හයියෙන් හුස්ම ගත්ත නිසා හිතේ තිබුණ ආවේගය කොයි තරම්ද කියලා මට හිතා ගන්න පුළුවන් වුණා. ඒ අතර තුර මං අරූට හොඳ කම්මුල් පාරවල් කීපයක්ම දුන්නා. මූව නම් ඉතුරු කරන්න හොඳ නෑ කියලා මං ජස්වින්ට කිව්වා."

"අනේ බලන්න අයියේ මුං මට කරපු දේ" කිය කියා නෝනා අඬනවා. නෝනාගේ බඩට මාස හයක්වත් ඇති කියලා මට හිතුණා. ඒ නෝනා ඌං කරපු දේවල් අඬ අඬ කියන්න වුණා. චුටි මල්ලි, සූටිං, පොඩිමහත්තයා, නන්දන, සනත් එයාට වද දුන්න හැටි, රමනා නෝනා හිනා වෙවී ඒ දිහා බලං හිටිය හැටි එයා කිව්වා."

"මහත්තයෝ මගේ සහෝදරී නොවුනත්, ඒ නෝනට දීපු වද ඇහුවාම මටත් ඒ නෝනා ගැන අනුකම්පාවක් ඇති වුණා. මගේ නංගිටත් මුං ඔය වද දෙන්න ඇති නේද කියලා මට හිතුනා. මූව නම් කෑලි කෑලි වලට කැපුවත් මදි."

"නංගියෙ, පෙර කරපු අකුසලයක් නිසා නංගිට මෙහෙම දෙයක්

SL Unlimited

වෙන්න ඇති. දැන් අපි ඒවා අමතක කරලා දාමු. මං නංගිව මෙතැනින් බේරගෙන යනවා. හෙට අලුත් ඉරක් පායාලා තියේවි. අපි අලුත් දවසකට, අලුත් විදිහකට මුහුණ දෙමු. අතීතයේ රැඳී ඉන්න ඕනේ නෑ. හෙට දවස අද දවසට වඩා සුන්දරයි" අයියා බොහෝම අමාරුවෙන් ඒ වචන ටික කිව්වා."

"අයියගේ තුරුල්ලට වෙලා, අයියව බදාගෙන හිටපු නංගී එක පාරටම එයා දිහා ඇහි පිය නොගහ බලං ඉඳලා එයාගෙන් ඈත් වුණා. කුමාරිහාමිගේ ඇස් දෙකෙන් ගින්දර පිටවෙනවා වාගේ මං දුටුවෙ."

"අයියට පිස්සුද? මට කොහින්ද අලුත් ලෝකයක්, අලුත් ඉරක්. මූං මාව දූෂණය කරන කොට, මගේ අම්මට අප්‍රචිට කරපු නිග්‍රහ අයියට ඇහුනා නම් ඔහොම කියන එකක් නෑ. මූං හැම එකාගෙන්ම පළි ගන්න ඕනේ. නිකං මරලා බෑ. මූංව කීතු කීතු වලට කපලා, දුක වඳ දීලා මරන්න ඕනේ. මූංගේ පවුල් විනාශ කරන්න ඕනේ" කුමාරිහාමි කෑගහන්න වුණා. ඒත් අයියණ්ඩි එයාව සන්සුන් කරන්න හදනවා."

"නංගි වෛරයෙන් වෛරය කිසිදාක සංසිඳෙන්නේ නෑ. හිත කලබල කරගන්න එපා. එන්න අපි යමු."

"මූව අපට මෙහෙම දාලා යන්න බෑ. මූ ගෙනාපු පෙට්‍රල් ටික මූගේ ඇඟට දාලා මූව පුච්චලා අපි යමු ජස්ටින් කිව්වා."

"එපා එපා ඕකට අනාදරක් කරන්න එපා. අපි ආපු වැඩේ කරගත්තානේ."

"එහෙම කරන්න බෑනේ හාමු. මූ ගමට ගියොත් මේ මිනුස්සයට යහතින් ඉන්න ඉඩ තියන්නේ නෑ. අපි ඉන්න තැන් හොයාගෙන ඇවිල්ලා අපටත් කරදර කරන්න පුළුවන්. හාමු එළියට වෙලා ඉන්න. මායි සිරිමලයි මේ වැඩේ ඉවර කරන්නම්. චූටි මැණිකෙත් එළියට යන්න."

"අයියා යන්න එළියට" චූටි මැණිකේ කෙන්තියෙන් කෑ ගැහුවා. " මට කරපු දේවල් වලට මමයි මූව මරන්න ඕනේ."

"හාමු එළියට ගිහින් දොර වහගෙන හිටියා. චූටි මැණිකේ අරූගේ කට බඳින්න කියලා මට කිව්වා. මං කට බැන්දා. අරූගේ බය ඇස් දෙකෙන් පේන්න වුණා. චූටි මැණිකේ කෑම කාපු බෙලෙක් තැටියක් එතන තිබුණා. එයා ජස්ටින්ට කිව්වා ඒක දෙකට කඩන්න කියලා. ඊට පස්සේ.. ඊට පස්සේ.. මං ඒ ගැන කියන්න යන්නේ නෑ මහත්තයෝ. චූටි මැණිකේ ඌට දීපු වද වලින් මං තේරුම් ගත්තේ මැණිකෙට ඌං කොයි තරම් වදයක් දෙන්න ඇද්ද කියලා."

"ඌගෙ වැඩ ඉවර වෙන කොට චූටි මැණිකෙ ලේ වලින් නෑවිලා. ඌගේ අප්‍රාණික සිරුර දිහා බලලා චූටි මැණිකේ කිව්වා, මං මගේ

SL-Unlimited

වැඩේ කළා. දැං ඕගොල්ල කැමති දෙයක් කරන්න කියලා. එයාගේ අර කලින් තිබුණ ආවේගය දැන් නෑ. බොහොම සන්සුන්."

"ඉන් පස්සේ චූටි මල්ලි ගෙනාපු පැට්‍රල් ටික පැල පුරා විසුරුවලා අපි ඒකට ගිනි තිබ්බා. ඒ පැලට ගිනි ඇවිළෙන කොට චූටි මැණිකේ හිනා වෙච්ච හැටි තාම මට මතකයි. මේ.. මේ බලන්න මහත්තයෝ. ඒක මතක් වෙනකොට මගේ ඇගේ මයිල් කෙළින් වෙනවා. හරියට යම දූතියක් වගේ මර හඬ නගලා චූටි මැණිකේ හිනා වෙන්න වුණේ. පස්සේ ඒ මහත්තුරු නෝනවත් අරගෙන ආපහු ගියා. රුපියල් දෙදාහ මට දීලා ඒ මහත්තුරු මාව හම්බන්තොටින් බැස්සුවා. මං පහුවෙනිදා උදේ පාන්දර තිබුණ බස් එකෙන් ගමට ගියා."

"ඔන්න ඔය ටික තමයි අපි සිරිමලාගෙන් දැනගත්තේ. ඊට පස්සේ අපි පොරොන්දු වුණ රුපියල් දහදාහ මිනිහට දීල ආවා."

●●●

"ඔන්න දැන් තමයි ඇත්ත ටික ටික එළිදරව් වෙගෙන එන්නේ. එතකොට මියුරියෙල්ව ඌන් මරලා නෑ. එයාව බේරගෙන ගිහින් තියෙන්නේ ටික්කුං එක්ක ආපු විල්සන් තමයි."

"ඔව්. විල්සන්ට නම් පළිගැනීමේ චේතනාවක් තිබිලා නෑ. ඒත් මියුරියෙල්ට ඌන්ගෙන් දැඩිව පළිගන්න ඕනවෙලා තියෙන බව පෙනෙනවා. ඒකට ටික්කුං හවුල් වෙලා තියෙන බවත් පෙනෙන්න තියෙනවා. ඒ නිසා දැන් අපට තියෙන්නේ ඉන්පස්සේ මියුරියෙල්ටයි ටික්කුංටයි උනේ මොකක්ද කියලා හොයන්න."

"ඔව්. ඒ අතරම අපි කමලදාසගෙන් තව සැහෙන විස්තරයක් ලබා ගන්න බලන්න ඕනේ. සමහරවිට සුවාරිස් කියන කෙනාව අල්ලගත්තා නම් එයා මාර්ගයෙන් වුණත් ඒ විස්තරය ලබා ගන්න බැරි වෙන එකක් නෑ."

"ඔව් අපි ඒ වැඩේ විමලසිරිටම බාර කරමු."

●●●

"ඔන්න දැන් නිරංජලාගේ කතාවට මේ ටික පුට්ටු කරන්න පුළුවන්. එතකොට එදා හවස නිරංජලයි විල්සනුයි ඊටකොටුව බස් නැවතුම් පළට එනකොට, එයාව හමුවෙන්න ඇවිත් තියෙන්නේ ටික්කුං තමයි. සිරිමලාගෙන් ආපු පණිවිඩේ අරගෙන තමයි මිනිහා එන්න ඇත්තේ. ඊට පස්සේ ඒ දෙන්නා සිරිමලා එක්ක ගිහිං මියුරියෙල්ව බේරගෙන ආවා. එතකොට නිරංජලාගේ යෙහෙළියක් ඇස්වාට්ටුව හරියේදී බඩ්දුරු අම්මා කෙනෙක් එක්ක විල්සන් යනවා දැක්කා කියලා කිව්වේ මියුරියෙල් එක්ක කාසල් ඉස්පිරිතාලෙට යනවා දැකලා තමයි. ඒ වගේම මහරගම පොළේදී විල්සනව දැකපු කෙනෙකුත් ඉඳලා තියෙනවානේ. ඒකෙන් මං හිතන්නේ ඒ ගොල්ල පදිංචි වෙලා

ඉන්න ඇත්තෙ මහරගම පැත්තේ ගෙදරක වෙන්න ඕනේ."

"ඔව්. සමහර විට ඒ ගොල්ල මහරගමින් ගෙයක් කුලී වලට ගන්න ඇති. විල්සන් මහගෙදර විකුණන්න ඇත්තේ නංගියගේ වැඩකටයුතු වලට සල්ලි ඕන නිසා වෙන්නත් පුළුවන්. ඔය ඔක්කොම එක දවස්වල වගේ වුණ දේවල් බවයි පෙනෙන්නේ."

"ඔව් එතනට වෙනකම් කතාව හරි. අපි බලමු ඉතුරු ටිකත් ගැට ගහගන්න."

•••

## 13

"මේජර් රුවන් බණ්ඩාර ගැන නොදන්න කෙනෙක් හමුදාවේ නෑ. උතුරේ සෑහෙන කාලයක් සේවය කළ හමුදා නිලධාරියෙක්. අනූ පහේදී කොළඹට මාරුවෙලා ඇවිත් තියෙනවා. අනූ නවයේදී වැල්ලවාය පැත්ත භාර හමුදා නිලධාරියා වශයෙන් කටයුතු කරලා තියෙනවා." පසුදින පැමිණි ජයන්ත, මේජර් රුවන් බණ්ඩාර පිළිබඳ තොරතුරු මෙසේ දිග හරින්නට විය.

"එයා ගැන විස්තර හොයාගෙන මම මාවනැල්ලට ගියා. ඒක තමයි එයාගේ උපන් ගම. එයාගේ දෙමව්පියොත් වලව් පරම්පරාවකින් පැවත එන අය. එයාගේ අප්පච්චි එයා කුඩා කාලෙම නැති වෙලා. ඔහුට බාල සහෝදරයෙකුයි සහෝදරියකුයි ඉන්නවා. අම්මා දැන් වයසයි. මම රුවන් බණ්ඩාර ගැන යමක් දැන ගන්න සීඅයිඩී එකෙන් ආවා කියලා කිව්වාම එයාගේ සහෝදරී අම්මා ඉන්න තැනක ඕවා ගැන කතා කරන්න බෑ කියලා කිව්වා."

"තව පැයකින් විතර අම්මා හාන්සි වෙන්න යනවා. මහත්මයාට පුළුවන් නම් ඒ වෙලාවට එන්න."

"මම පැයකට විතර පස්සේ එයාලගේ වලව්වට ගියා. එයා මාත් එක්ක වත්ත පහළ ගහක් යට හදලා තිබුණ බංකුවක් ළඟට ගියා. එයා කියපු දේ අපි එයාගේ වචන වලින්ම කියන්නම්කෝ."

•••

"1971 අප්‍රේල් මාසේ දවසක අයියා කලබලෙන් වගේ නුවර ගියා. ඒක හරිම කලබල කාලයක්. ඒ කාලේ කැම්පසුත් වහලයි තිබුණේ. අයියා ආපහු ආවේ බොහෝම කනගාටුවෙන්. අයියලත් එක්ක එකට ඉගෙන ගත්තු ගෑණු ළමයෙක්ට පෞද්ගලික ප්‍රශ්නයක්

නිසා යමෙක් පැහැරගෙන ගිහින්, ඒ ළමයා ආයිය අතක් නෑ කියලා අයියා අම්මට කිව්වා. පස්සේ දවසක අයියා හම්බ වෙන්න ආපු යාළුවෙක් එක්ක අයියා කතා කරන කොට මට තේරුණා ඒ නැති වුණ මියුරියෙල් කියන ගෑනු ළමයත් එක්ක අයියගේ ප්‍රේම සම්බන්ධයක් තිබිලා තියෙන බව."

"අයියා සෑහෙන කාලයක් එයා ගැන හිත හිත හිටිය බව මම දැන ගෙන හිටියා. කාලයක් ගියාට පස්සේ හිත හදාගෙන පුරුදු විදිහට කැම්පස් යන්න පටන් ගත්තා. දෙසැම්බර් මාසේ විභාගෙට උත්තර ලියලා බොහෝම සන්තෝසෙන් හිටියා. උඩින්ම පාස් වෙන බව සහතිකයි කියලා එයා කිව්වා."

"එදා මට හොඳට මතකයි. දෙසැම්බර් පහළොස් වෙනිදා. ලියුම් කාරයා ඇවිත් ලියුමක් දුන්නා. අයියගෙ නමට ඒක තිබුණේ. සාමාන්‍යයෙන් කැම්පස් නිවාඩු කාලෙදී අයියට යාළුවන්ගෙන් ලියුම් එනවා. මං ඒ ලියුම අයියට දෙන්න එනකොට අයියා පත්තරේ බල බල හිටියේ."

"අයියට ලියුමක්" මං කිව්වා.

"කාගෙන්ද නංගි" කියලා එයා ඇහුවේ පත්තරේ දිහා බලාගෙනම.

"කාගෙන්ද කියලා ලියලා නම් නෑ. හැබැයි අත් අකුරු වලින් පේන්නෙ නම් ගෑනු ළමයෙක් එවපු එකක් වගෙයි."

"මට එහෙම ලියුම් ලියන්න හිටිය කෙනා .." කියලා සුසුමක් හෙළපු අයියා පත්තරේ පැත්තකට දාලා ලියුම අතට ගත්තා. ඒත් ඒ ලියුම අතට ගත්තු හැටියෙම අයියගේ මූණ වෙනස් වුණා. කුතුහලයක්, සැකයක්, සන්තෝසයක් වගේ මේ හැම දෙයක්ම එක තත්පර කිහිපයක් ඇතුළතදී අයියගේ මුහුණෙන් ප්‍රකාශ වුණා. ලියුමත් අරගෙන අයියා කාමරේට වේගයෙන් ඇවිදගෙන ගියා."

"ටික වෙලාවකට පස්සේ අයියා ගමනක් යන්න සූදානම් වෙලා ඇඳුම් ඇඳගෙන කාමරෙන් එළියට ආවා."

"අම්මේ, යාළුවෙක්ට අසනීප වෙලා කොළඹ ඉස්පිරිතාලේ නවත්තලාලු. මං ගිහිං බලලා එන්න ඕනේ."

"පුතා අදම එනවද?" අම්මා ඇහුවා.

"ඒක කියන්න බෑ. රෑ වුණේ නැත්නම් මං එන්න බලන්නම්. මගේ හොඳ යාළුවෙක්. දවස් දෙක තුනක් මං නැවතී හිටියොත් කලබල වෙන්න එපා."

"අම්මා රුපියල් දහයක් අයියට දුන්නා. අයියා ඒකත් අරගෙන පිටවෙලා ගියා."

"දවස් දෙකකට පස්සේ අයියා ආවා. යාළුවා තාමත් ඉස්පිරිතාලේ. ඒ වුණත් ඒ තරම් ප්‍රශ්නයක් නෑ කියලා අයියා කිව්වා. ඒ වුණාත්

SL-Unlimited

අයියගේ ඇස් ඉදිමිලා තිබුණා. අම්මා ඒ ගැන ඇහුවාම කිව්වේ ටිකක් නිදිමරන්න වුණා අම්මේ කියලා."

"ඊට පස්සේ සතියෙ සෙනසුරාදාත් අයියා යාළුවා බලන්න ගියා. ඊට පස්සේ සතියෙත් ගියා. ඊත් අනිත් සතියෙ යාළුවා බලන්න ගිය අයියා ආවේ දවස් හතරකට විතර පස්සේ. අයියාගේ මූණ කවදාවත්ම නැති තරමට ඉදිමිලා. ඇස් තද රතු පාටයි. "යාළුවා මැරුණා" සුසුමකුත් හෙලමින් අයියා කිව්වා. එදා අයියා කෑමක් කෑවෙත් නෑ. ඔහේ බලාගත්තු අත බලාගෙන හිටියා. අයියා ඔළුව බිත්තියේ ගහගෙන අඬනවා මට ඇහිලා තියෙනවා. අපට ඒක හරි ප්‍රශ්නයක් වුණා. යාළුවෙක් මැරුණාම දුක තමයි. ඒත් ඔය තරම්ම දුක් වෙන්නේ ඇයි? ඊට සතියකට විතර පස්සේ කොළඹ ගිය අයියා සතියක් යනතුරුත් නෑවිත් හිටියාම අපි හොඳටම බයවුණා. දවස් දහයකට විතර පස්සේ අයියගෙන් ලියුමක් ආවා."

"අයියා යුධ හමුදාවට බැඳුනලු. අම්මා නම් ඒකට කොහෙත්ම කැමති වුණේ නෑ."

"ඇයි පුතේ අපි උඹව විශ්ව විද්‍යාලයට යැව්වේ හමුදාවට අරින්නද?" අම්මා අහලා යැව්වා.

"අම්මේ හමුදාවට උගත් කෙනෙක් බැඳුනාම ඉක්මනට උසස් වීම් ලැබෙනවා. මේජර් කෙනෙක් වෙලා මං ආවොත් එහෙම අම්මට සන්තෝස නැද්ද?" අයියා උත්තර එව්වා. අම්මා එතකොට ටිකක් පසු බෑවා. ඊට මාස හත අටකට විතර පස්සේ අයියා යුධ හමුදා ඇඳුම පිටින් අපේ ගෙදර ආවා. ඇත්තටම එදා අම්මට විතරක් නොවෙයි මටත් අයියව දැක්කාම ඇති වුණ සතුට කියන්න බෑ. ඒ ඇඳුමට අයියා පෙනුනේ බොහොම ගම්භීර විදියට."

"හැම නිවාඩු කාලයකටම වාගේ අයියා ගෙදර එනවා. ඒ ආවත් වැඩි දවසක් ගෙදර ඉන්නේ නෑ. ඉඳලා හිටලා අයියව හම්බ වෙන්න යාළුවෙක් එනවා. ඒ ආවාම අයියා එයාට හොඳට සංග්‍රහ කරනවා. හැබැයි ඒ හැම වෙලාවකම ඒ දෙන්නා කතා කරන්නේ මේන්න මේ පුටුවට ඇවිත් තමයි. ඒ කතා කරන්නෙත් වට පිට බල බල මොකක් හරි රහසිගත දෙයක් කරන විදිහටයි. මට ඒ ගැන සැක හිතිලා දවසක් අයියාගෙන් ඇහුවා මොකද රහස් කතා කරන්නේ කියලා."

"නංගී. එයා අපට ඔත්තු දෙන හොඳ විශ්වාසවන්ත කෙනෙක්. සිංහල මනුස්සයෙක්. යාපනේ දෙමළ මනුස්සයෙක් විදියට ලොකු රඟපෑමක් කරලා අපට ඔත්තු සපයනවා. ඒ වගේ උදවියට අපේ කාර්යාලවලට එන්න අපි ඉඩ තියන්නේ නෑ. මෙහෙම පෞද්ගලිකව හම්බ වෙලා තමයි තොරතුරු කතා කරන්නේ. වැදගත්ම දෙයක් කියන්න තියෙන කොට නිවාඩු කාලේ කියලා බලන්නේ නැතුව එයා මේ ගෙදරට එනවා" කියලා අයියා කිව්වා. මං ඒ කතාව විශ්වාස කළා.

SL-Unlimited

"අම්මා අයියට සුදුසු කටයුත්තක් කරලා දෙන්න බැලුවාම අයියා ඒ කිසි දේකට කැමති වුණේ නෑ. දවසක් අයියා කිව්වා මං ආපුවාම ඔය ගැන කතා කරනවා නම් ඊට පස්සේ ගෙදර එන්නේ නෑ කියලා. එයින් පස්සේ අම්මා එයාට මඟුල්තුලා කරන්න කතා කරල් නෑ."

"දවසක් අයියා අර යාළුවත් එක්ක චිත්ත පහල කතා කර කර ඉන්නකොට මං අයියගෙ කාමරේට ඇවිත් හෝදිසියක් කළා. මට ඕන වුණේ අයියත් එක්ක යාළු කවුරු හරි ගෑනු ළමයෙක් ඉන්නවද කියලා දැන ගන්න. අයියගේ කමිස සාක්කුවේ තිබුණ පොකට් එක තමයි මං මුලින්ම අරගෙන හෝදිසි කළේ. ඒකේ ලස්සන ගෑනු ළමයෙක්ගේ අතින් අල්ලගෙන, අයියා ඉන්න පින්තූරයක් තිබුණා. පින්තූරේ පිටිපස්සේ ලියලා තිබුණා මියුරියෙලුයි මමයි කියලා. 1971 ජනවාරි මාසේ දිනයක් ඒකෙ සටහන් වෙලත් තිබුණා. එතකොට මට මතක් වුණා අර අතුරුදහන් වුණ ළමයගෙ නමත් මියුරියල් පෙන්ද කියලා. එහෙනම් තාමත් අයියා එයා ගැන හිත හිත ඇති. ඒක තමයි අයියට වෙන කවුරුවත් ගැන හිත නොයන්නේ කියලා මං හිතා ගත්තා."

"89 කලබල කාලේ අයියා වැල්ලවාය ප්‍රදේශය භාරව හිටපු හමුදා නිලධාරියා වශයෙන් කටයුතු කළා. එහෙන් අයියා ආවේ 90 මැද භාගයේ. ඒ ඇවිත් වැඩි දවසක් යන්න ඉස්සරවෙලා කිව්වා එයාව යාපනේට මාරු කරලා කියලා. අයියා එහේ ගියා. යාපනේ කියන්නේ අයියට නොපුරුදු තැනකුත් නොවෙයි. 90 දෙසැම්බර් මාසෙ නිවාඩුවට අයියා ගෙදර ආවා. පොඩි වැඩකට කුරුණෑගල යනවා කියලා ගියා ගියාමයි අයියා ආපහු ආවේ නෑ. අපි පොලිසියට, හමුදාවට හැම තැනටම දැනුම් දුන්නා. යාපනේ කොටි හමුදා එක්ක අභීතව සටන් කරලා නමක් දිනාගෙන හිටි අපේ අයියා කුරුණෑගලදී අතුරුදහන් වෙලා. හිතන්නවත් බෑ."

"අයියා ගිය ආමි ජීප් එක ගමට එන පාරේ පාළු තැනක නවත්තලා තිබිලා පොලිසිය හොයා ගත්තා. එතන ආරවුලක් ඇති වුණ ලකුණු පොලිසියට පෙනිලා තියෙනවා. ලේ හොඩකුත් එතන තිබුණලු. ඒ ඇරෙන්න අද වනතුරු අයියා ගැන කිසිම තොරතුරක් නෑ."

"අර අයියව හමුවෙන්න සමහර දාකට එනවා කියපු පුද්ගලයා ගැන ටිකක් කියන්න පුළුවන්ද?"

"අයියා නැතිවෙලා මාස තුනකට විතර පස්සේ, ඒ යාළුවා, ජස්ටින් කියලා අයියා එයාට කතා කළේ, එයා ආවා. මාස දෙකතුනකින් විතර අයියා එයාට කතා කරපු නැති නිසා තමයි එයා මේ හොයලා බලන්න ඇවිත් තියෙන්නේ. අයියා ආගිය අතක් නෑ කියලා අපි කිව්වාම ජස්ටින් ගල්ගැහිලා කිසි දෙයක් කරකියාගන්න විදිහක් නැතිව

SL Unlimited

ටික වෙලාවක් හිටියා."

"සවුරු හරි එයාව ෆලෝ කරන බවක් එහෙම එයා කියලා තිබුණාද?"

"නෑ එහෙම මොකවත් කියලා තිබුණේ නෑ."

"ටින් මාමත් ෆලෝ කරනවා" එයා එයාටම කියා ගන්නවා මට ඇහුණා. ටිටත් වඩා හිමින් "අපි පරාද වෙන්නයි යන්නේ" කියලා එයා මිමිනුවා. ටික වෙලාවක් අමුතු ලෝකයක ඉඳලා එයා ආපහු හොඳ සිහියෙන් වගේ මගේ දිහා බැලුවා.

"කවුද එයාව ෆලෝ කරන්නේ" කියලා මං ඇහුවා.

"ටික වෙලාවක් නිස්සද්දව ඉඳල "කොටි" කියලා එයා මිමිනුවා"

"කොටි? කොටි? ඇයි ඔයා ඒ බවක් හමුදාවට හරි පොලීසියට හරි කියලා තිබුණේ නැත්තේ තරහා ගිහින් මං ඇහුවා."

"කොටි. යාපනේ කොටි නොවෙයි. රන්දෙණිගල කොටි" කියපු එයා ආපහු හැරිලා ආපු මෝටර් සයිකලේ නැගිලා පිටවෙලා ගියා.

"ඒ ටික තමයි අපට එයාගෙන් දැන ගන්න ලැබුණේ."

"ජයන්ත දුන්න ආරංචි ටික බොහෝම වැදගත්. දැන් ජයන්තට තියෙන්නේ ජස්ටින් සූරියගේ කියන පුද්ගලයා ගැන විස්තර ටිකක් හොයා ගන්න එක. එයා දැනට අවුරුදු විසිපහකට විතර ඉස්සර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රියදුරෙකු වශයෙන් සේවය කරපු කෙනෙක්. ටිකක් මහන්සි වෙන්න වේවි. උත්සාහ කරලා බලන්න."

●●●

"මොකද පැට්‍රික් දැන් හිතන්නේ?"

"කතාවේ අඩු තැල්ලක් පුරව ගන්න ඒ ටික ප්‍රයෝජනවත් වුණා. මියුරියෙල්ව ගෙදරට අරගෙන ආවාට පස්සේ මියුරියෙල් තමන් ගැන කියලා ලියුමක් රුවන් බණ්ඩාරට යවලා තියෙනවා. ඒ අනුව රුවන් බණ්ඩාර එයා හමුවෙන්න ගියා. නමුත් වැඩි දවසක් යන්න ඉස්සරවෙලා කුමාරිහාමි මැරුණ බවක් පෙනෙන්න තියෙනවා. රුවන් බණ්ඩාර හමුදාවට බැඳෙන්න ඇත්තේ මියුරියෙල්ට කරපු දේවල් වලට ටිංගෙන් පලිගන්න බලාගෙන වෙන්න ඕනේ. නන්දනගේ වන්ගෝලයින් දෙන්නාගේ මරණය සිදුකරන්න ඇත්තේ රුවන් බණ්ඩාර තමයි. සමහර විට රමනායකගේත්, සනත්ගේත් මරණ වලට එයා සම්බන්ධ වෙන්න පුළුවන්."

"ඒ හැම කෙනාගෙම මිනිය අසල තිබුණ පුවරුවේ එකම අකුරු බව සටහන් වෙලා තියෙන නිසා, ඒ ඔක්කොම කරන්න ඇත්තේ රුවන් බණ්ඩාර වෙන්න ඕනේ. අපි රුවන් බණ්ඩාරගේ අකුරු තියෙන යමක් අරගෙන ඇවිත් පරීක්ෂා කරන්න බලමු. එතකොට ඒක අපට සහතික වශයෙන්ම කියන්න පුළුවන් වේවි."

"ඔව්. එතකොට ඒ කතාවේ අවසානයේදී රුවන් බණ්ඩාරත්, "රන්දෙණිගල කොටි" අතින් මරණයට පත්වෙලා. ජස්ටින් "රන්දෙණිගල කොටි" කියලා කිව්වේ නන්දන ගැන වෙන්න ඕනෙ. අනුවෙන් පස්සේ ඒ පවුලේ මැරුණ එකම කෙනා සුරනිමල වීම නිසා පේන්නේ ජස්ටින්ටත් උන් මරන්න ඇති කියන එකයි. එයාවත් ගාලෝ කරනවා කියලා කියලා තියෙනව නේ. එතකොට සුරනිමලව මරන්න ඇත්තේ කවුද? වජාසුයා වෙන්න බෑ. නන්දන වරක් කියලා තියෙනවනේ එයා අතින් වජාසුයන් ඝාතනය වුණ බව. ඔය ටික තමයි දැන් අපට පුරවගන්න තියෙන්නේ."

•••

## 14

කමලදාස හෝ සුවාරිස් හමුවී නන්දන ගැන වැඩි විස්තර සොයා ගැනීමට යැවූ විමලසිරි පසු දින පැමිණියේය.

"මම ගිහිං සුවාරිස්ව හොඳට යාළු කරගත්තා. වජාසුයා අල්ලගන්න අපට උදව් කලොත් ආණ්ඩුවෙන් දෙන දසලක්ෂයේ තෑග්ග එයාට අරන් දෙන්නම් කියලත් මම කිව්වා. හැබැයි එයාට වැඩියත්ම ඕනෙ කරන්නේ එයාගේ යාළුවට, කමලදාසට උදව් කරන්න කියලා මට තේරුණා" විමලසිරි ඉතා ප්‍රබෝධයෙන් යුතුව කියන්නට විය. ඔහුගේ ගමන ඉතා සාර්ථකව ඇති බව ඔහුගේ මුහුණෙන් පැට්‍රික් සහ හැරී අවබෝධ කර ගත් හ.

"මං ඕකට උදව් කරන්න කැමතියි. නමුත් මං ඒ තරම් දෙයක් දන්නේ නෑනේ."

"සුවාරිස් නොදන්නවා වුණාට, කමලදාස මේ ගැන දන්නවා ඇති. සුවාරිස් කිව්වොත් කමලදාස අපට මේ ගැන විස්තර කියයි. එතකොට තෑග මුදල ඔය දෙන්නා අතරේ බෙදලා දෙන්න පුළුවන්."

"ඉන් පස්සේ සුවාරිස් ගිහින් කමලදාසට කිව්වලු, "මං දන්න පොලිසියේ මහත්තයෙක් ඉන්නවා. ඒ මහත්තයාගෙන් කමලදාසට ආරක්ෂාවත් ලබා ගන්න පුළුවන්. ඒ නිසා හංගගෙන ඉන්න දෙයක් තියෙනවා නම් පොලිසියට කියන්න" කියලා. "මං හංගපු දෙයක් නෑ. දන්න ඔක්කොම පොලිසියට කිව්වා" කියලා මිනිහා කිව්වලු. ඒත් ඊට පහුවෙනිදා එයා සුවාරිස් හම්බවෙලා තියෙනවා."

"අර යකා ඊයේ හවස අපේ ගෙදර ආවා. පුරණ පුරුදු විදිහට මට කිව්වා අරක්කු බෝතලයක් අරං එන්න කියලා. මොන දෙයි හාමුදුරුවන්ට කියන්නද? මගේ කතියට සුදාවත් එක්කරගෙන

SL-Unlimited

යන්න කිව්වා. මං හැදුවේ පුළුවන් තරං ඉක්මනට ඔහිං ඒක අරගෙන එන්න. ඒත් සුදා හරි කට්ටයා. "පොඩි වැඩක් තියෙනවා කමලදාස අයියේ" කියලා මාත් එක්ක තව කිහිප තැනකටම ගියා. ඒ ඔහින් අපි ආපහු ගෙදර යනකොට රෑ දහයට විතර ඇති. මේ විදියට ගියොත් නම් මට ජීවත් වෙලා පලක් නෑ. සුරනිමල මුදලාලි හිටියනං බොහොම, වෙන්න ඉඩ තියන්නේ නෑ. ගෑණි කියනවා අපි මෙහෙන් යමු කියලා. කොහේ යන්නද? අනේ සුවාරිස් අයියේ අපට මේකෙන් හැලවෙන්න උදව්වක් කරන්න. සුවරිස් අයියා දන්න තැනක් තැද්ද අපට ටික කාලයක් වහං වෙලා ඉන්න."

"ඕකට බයේ පැනලා යන්න ඕනේ නෑ කමලදාස මලයෝ. මට හිතෙනවා සුරනිමල මුදලාලිගේ මරණයට නන්දන මුදලාලිත් හවුල් ඇතිය කියලා. ඔහේ දන්න යමක් තියෙනවා නම් අර පොලිසියේ මහත්තයාට කිව්වානම් උගෙන් ලේසියෙන්ම ගැලවෙන්නත් පුළුවන්. තෑගි මුදලකුත් ලබා ගන්න පුළුවන්."

"තෑගි මුදල කොහොම වෙතත් මේ අඳුරුමීණ්වයාගෙන් බේරිලා ඉන්න ලැබුණොත් ඇති. ඒත් ඌ හරිම වසවර්තියා. අපට මොකුත් කරදරයක් කරාවිද?"

"ඒ ගැන බයවෙන්න එපා. ඒ මහත්තයා මලයෙවයි, ප්‍රේමා නගාටයි ආරක්ෂාවත් හදලා දේවි. අපි ඔහිං දැන්ම ඒ මහත්තයා හම්බ වෙමු."

එහෙම කියලා සුවාරිස් කමලදාසව මා ළඟට එක්කරගෙන ආවා."

කමලදාසගෙන් අපට ගොඩක් විස්තර දැන ගන්න ලැබුණා. එයා කියන විදියට නන්දනයි සුරනිමලයි අතර විතරක් නොවෙයි ජයදේවයි සුරනිමලයි අතරත් ටිකක් ප්‍රශ්න තිබිලා තියෙනවා. හොඳම ආරංචිය තමයි මැරෙන්න මොහොතකට කලින් සුරනිමල කරලා තියෙන පාපොච්චාරණය. එයා පොලිසියට කිව්වේ කියන්න තිබුන ඒවායින් අරික්කාලලු, නන්දනටත්, ඊටත් වඩා සුදාටත් තියෙන බය නිසාලු මිනිහා ඇත්ත නොකිව්වේ. සුරනිමල කමලදාසට කියලා තියෙන්නේ මෙන්න මේ ටිකයි."

"අර අහිංසක රන්දෙණිගල වලව්වේ කුමාරිහාමිට කරපු දේ තමයි අපට මේ පඩිසන් දුන්නේ. කමලදාස මේ මොකවත් දන්නේ නෑ. අද තමයි මගේ අන්තිම දවස. මං මේ ටික කියන්නේ මං සුදනා කියන එක උඹට අඟවන්න නොවෙයි. මෙච්චර කාලයක් මේවා හිතේ තදකරගෙන ඉඳගෙන විඳපු වේදනාව දන්නේ මං විතරයි. මං අපේ මලයන්ඩිටත්, හාමිනේටත් කොයිතරම් කිව්වද වෛරයෙන් වෛරය සන්සිඳෙන්නේ නෑ කියලා. පළිගැනීමේ චේතනාවල් හිතෙන් අයින් කර ගන්න කියලා. ඒකෝ ඒ ගොල්ල ඒ කිසි දෙයක් ගනං ගත්තේ නෑනේ.

ඒත් මාත් ඒ වෙන දේවල් වලක්වන්න ඒ තරම් උනන්දු වුයේ නෑ. නැත්නම් මට ඒවා නතර කරන්න තිබුණා. කමලදාස, ප්‍රේමා. මෙහෙ වරෙල්ලා. මං මේ මගේ හිතේ බර අඩු කරගන්න මේවා උඹලට කියන්නේ. නයි පැටියෙක් සාක්කුවේ දාගෙන හුරතල් කරලා ඇති දැඩි කළාට, සහෝදර කමට වරද කළ එකා සුද්ද කර කර, ඌ කරපු හැම අපරාදයකින්ම ඌව බේර ගත්තාට තමයි මං මේ වන්දි ගෙවන්නේ."

"රත්දෙණිගල කුමාරිහාමිව පැහැරගෙන ගිහිං මරා දැම්මෙ මල්ලී තමයි. මගේ හාමිනෙත් ඒකට උදව් කළා. මාස හය හතක්ම ඒකිව පැල් කොටේක හිරකරගෙන ඌත් ඒකිට දුක වද දුන්නලු. ඒකිට දරුවෙක් ලැබෙන්න ලං වුණාම ඒකි හිටපු පැල් කොටේට ගිනි තියලා, ඌගේ සහචරයෙක් ඒකිව මරලා දැම්මලු. ඒ පැලට ගිනි ඇවිලෙන වෙලාවේ, පැල් කොටේ අධිතිකාර සාමෙල් ඒක දිහා බලාගෙන හිටියලු. බුර බුරා නැගෙන ගින්දර අතරින් මොනැතිගෙ මර හිනා හඬ සාමෙල්වයි, පවුලවයි ඇහිලා තියෙනවා. ගිනි දළ අතරින් ඒකිගේ රූපෙත් යාන්තමට වගේ ඌට පෙනිලා තියෙනවා. ඒකි ලේ වලින් නැවිලා. මර හිනාව ඇහුනාම සාමෙල්ගේ ඇඟ හීතල වෙලා ගියාලු."

"ඒදායින් පස්සේ වුව් මල්ලී ආයිය අතක් නෑ. ඒ ගින්නටම අඟුවෙලා ඌත් මැරෙන්න ඇති. මෝඩයා. හොඳටම බිලා තමයි ගින්න තියන්න ගිහිං තියෙන්නේ. හතර වටේටම පැට්‍රල් දාලා තියපු ගින්නට ඌත මැදි වෙන්න ඇති."

"ඊට පස්සේ මගේ ගෑණුවයි, මල්ලිලා තුන්දෙනයි, කුමාරිහාමිගේ අවතාරේ බිල්ලට ගත්තා. ඒ බිල්ලට ගන්න ඉස්සරවෙලා ඌත් හැම එකාටම කුමාරිහාමිගේ මර හිනාව ඇහිලා තියෙනවා. මහ ලොකුවට අපේ ඉතුරු වෙච්ච එකා කිව්වා "මේ ඔක්කොම කරන්නේ රත්දෙණිගල ශිංඝ පැටව්. ඌත් දැන් වනාලූයො වෙලා. මං ඌත් ඔක්කොම විනාශ කළා" කියලා. එහෙනම් කොහොමද අර මර හිනාව මට ඇහෙන්නේ. වනාලූයෙක් නෑ. මැරිච්ච කුමාරිහාමි යම ලෝකෙ ඉඳන් අපෙන් පළිගන්නවා. එක එක අපව වද දීදී අපේ පවුලේ එක එකා ඩැහැ ගන්නවා. අද මගේ දවස. එක පරබල්ලෙක් කරපු බලු වැඩක් හින්දා මං අපේ පවුල නගා හිටුවන්න මං ගත්තු වෑයම නිෂ්ඵල වුණා."

"ඒ ඔක්කොමත් ඉවසන්න පුළුවන්. මූ මගේ පුතාවත් මේ විත්තැහියට වන්දි ගෙවන විදියට සෙට් කළාතේ. මොන එකකටද, දැන දැනත් වලව්වේ එකියක්ව මගේ පුතාට පංගනාත කලේ. ඌ බඳින්න ඉන්න ජයන්ති කෙල්ලටත් බොරු කරලා. හඳහනේ තියෙන හැටියට, එයා "මුලින් බඳින කෙල්ල" මාස තුනකට වඩා ජීවත් වෙන්නේ නෑ කියලා කිව්වලු. ඒක ඔප්පු කරන්න නක්ෂත්‍ර කාරයෙක්වත් සල්ලිවලට අරගෙන ජයන්ති කෙල්ලගෙ ගෙදරට එක්කර ගෙන ගියාලු. කවුද

SL-Unlimited

මැරෙන්න කැමති. බඳින්න ඉස්සර වෙලා ඔහොම රැවටිලි කරනවනම් බැන්දට පස්සේ මොනවා නොකරයිද? මං ඇහුවා බඳින්න කෙල්ලෙක් ඉන්දද්දී මොකටද මේ තව ලමාතැනියක් බඳින්න යන්නේ කියලා. ඒකිටලු වලව්ව ලියලා තියෙන්නේ. කවදා හරි වලව්ව ඌට හිමි කරගන්නවා කියලා පුරසාරම් දොඩ දොඩ හිටපු මලයන්ඩි කවදා හරි ඒක කර ගනීවි. අර කෙල්ලවත් මරලා දාවි. මෙහේදී මිනී මරලා මදි වෙලාද මන්දා රට ගිහිනුත් මිනී මරලා එනවා. ඒකිට අයිති තුනෙන් පංගුවයි කියලා දැනගත්තාම අනාගතයේදී ඒකට අයිතිවාසිකම් කියන්න හිටපු මනුස්සයාවත් මරලා දැම්මා. අවුරුදු හතරකට විතර ඉස්සරවෙලා මාව මරන්න කුලී කාරයෙක්ව යොදවපු එකට පලිගත්තා කියලා මට කියනවා. ඕවට රැවටෙයි ගොන්නු. ඒත් මට හිතාගන්න බැරි මේ ඔක්කොම කරපු ඌට කුමාරිහාමිගෙන් මුකුත් කරදරයක් වෙන්නේ නැහැනේ."

"කමලදාස, ඌගේ කරදර මතුවටත් වෙනවා නම්, ඌගේ කරදර වලින් බේරෙන්නම බැරි නම් උඹලට තියෙන්නේ මේ ගෙදරින් පිට වෙලා වෙන පළාතකට ගිහිං අලුතෙන් ජීවිතයක් පටන් ගන්න. මං මේ සූට්කේස් එක අරගෙන ආවේ උඹට දීල යන්න. කමලදාසෝ. උඹ එදා ඉඳලාම මට මගේ හෙවනැල්ල වගේ ඉඳුන්. උඹට පුළුවන් හැටියට මට රැකවරණය දුන්නා. මාව හොඳට බලාගත්තා. අසනීප වුණා හැම වෙලාවකම උඹට පුළුවන් හැටියට මට සාත්තු කළා. මේක උඹ තියා ගනිං. මෙතන ලක්ෂ පහක් තියෙනවා. මලයන්ඩි ගැන මට කිසි විශ්වාසයක් නෑ."

"ඊට පස්සේ සුරනිමල මුදලාලි ඉකි ගහන්න වුණා. අච්චර සීවු වරයෙක් වගේ ධනය තියෙන, පින් දහම් කටයුතු වලට අත දීග ඇරලා වියදම් කරපු සුරනිමල මුදලාලි ගැන මට කනගාටුවක් ඇති වුණා."

"පර බල්ලා. දැන් මගේ වස්තුවත් ටික ටික කොල්ල කන්න පටන් අරං. මං විශ්වාස කළා ඌ මං වෙනුවෙන් බාර දීපු වැඩ කටයුතු ඒ විදියට කරනවා ඇතිය කියලා. බලන කොට ඌ ඒවායේ පාලනේ ටික ටික ඌගේ අතට අරගෙන. අන්තිමට මට තිබුණ ලොකුම වස්තුව, මගේ පුතාවත් ඌ රවට්ට ගත්තා. පුංචි කාලේ ඉඳලම ඌ මගේ පුතාට ආදරෙන් හිටපු නිසා, පුතා ගැන බලන එක මං ඌට පවරලා හිටියා. ඌ ඒකෙ වාසිය අරගත්තා. පරබල්ලා. ලැජ්ජ නැතිව දැන් පුතාට අයිතිවාසිකම් කියන්නත් ආවනේ. මගේ මැරිච්ච ගෑණිටත් ඌ නින්දා කළානේ. කමලදාසයෝ. ඌ කොහොමද කියන්නේ දරුවා මගේ නොවෙයි ඌගේ කියලා.. අනේ බලන්න රම්‍යා. ඌ රත්තරං කඳක් වගේ හිටිය ඔයාවත් නිග්‍රහ කළානේ. ඔයත් ඉතිං ඌගේ බලු වැඩ වලට අත හිත දුන්න එකේ විපාකෙ දැන් තේරෙනවාද? මං ඌට ආයෙ එහෙම මගේ දෑහැට පේන්න එන්න එපා කිව්වා. සමහර

SL-Unlimited

විට වයාඝ්‍රයා කියලා අර ගෑණී එවන අවතාර ඌවට බය ඇති. ඌව ඊට වඩා දරුණු එකෙක් හින්දා, ඒ අවතාරේ ඌවට බය ඇති. ඒකයි ඌවව ඉතුරු කරලා අනික් අය එක එකා බිල්ලට ගත්තේ."

"ගුරුනිමල මුදලාලි මගෙන් ඇහුවා කමලදාසයෝ, හැද්ද බං හිතේ අමාරුවට බොන බෙහෙත් එකක් කියලා. එයා කියන්නේ මොකක්ද කියලා මට තේරුනා. ඒත් ඒක නොතේරුණා වගේ මං කිව්වා "හිතේ අමාරුවට කොයින්ද බෙහෙත් මුදලාලි?" කියලා. කමලදාසයෝ. මං සිල්පද හතරක්ම මේ තාක් කල් හොඳින් ආරක්ෂා කරගෙන හිටියා. අපේ එකාව රැක ගන්න ඕන නිසා හතරවෙනි සිල්පදය නම් මගේ අතින් කිහිප වතාවක්ම කැඩෙන්න ඇති. ඒ දුකට අද මට පස්වෙනි සිල්පදෙත් කඩන්න හිතෙන්නේ, මේ ඔක්කොම හිතේ අමාරුකං ඒකෙන්වත් මග ඇරෙයිද බලන්න. මම මැරෙන්න බය නෑ. ඒත් මගේ හිතේ වේදනාව වැඩියි."

"කවදාවත් රහමෙර පානය නොකරපු මුදලාලි, මං ඉඳ හිට චුට්ටක් ගන්න බව තේරුණාම, ඒකේ ආදීනව කියලා දෙන මුදලාලි, අද මගෙන් එයින් චුට්ටක් ඉල්ලනවා. මං ගෙදර තිබුණ අරක්කු බෝතලේකින් චුට්ටක් මුදලාලිට දුන්නා. මුදලාලි ඒක හුස්මට ඒක බිව්වා. එයාගේ මූණ ඇඹුල් වුණා. මේ දහජරාව මොකක් නිසා ඌබලා බොනවද අහනවා වගේ බැල්මක් මගේ පැත්තට හෙලුවා. ඒත් ටික වෙලාවක් යනකොට ඒ ඔක්කොම හරි ගිහිං මට තව චුට්ටක් දාන්න කිව්වා."

"එක අතකින් මං මෙහෙම මැරෙන එකත් හොඳයි. එතකොට මේ ආත්මෙදී මං කරපු පාපයට මේ ආත්මෙදීම වන්දි ගෙවනවානේ. කමලදාසයෝ. මං කරපු නරක වැඩ වලට වඩා හොඳ වැඩ වැඩියි නේද?"

"ඔව් මුදලාලි."

"රහතන්නාන්සෙලටත් කරපු පව් පල දෙන කොට අපට එහෙම නොවෙයිද? මේ ආත්මෙම ඒක පල දුන්නාම ඊළඟ ආත්මෙක හොඳින් ඉන්න පුළුවන්. මං කාටවත් වරදක් කරපු කෙනෙක් නොවෙයිනේ. දැනුවත්ව මං කාටවත් වරදක් කරලා නෑ. මට වැරදි කරපු කිසිම කෙනෙක් එක්ක මගේ තරහක් නෑ. මල්ලී ඌ එක්කත් මං තරහා නෑ. පුතා ඌ එක්කත් මං තරහා නෑ."

"මුදලාලිට ටිකක් වැඩි වෙලා බව මට තේරුණා. කියපු දේවල් පුනපුනා කියනවා. ඉන් පස්සේ "මං යනවා යන්න. දැන් මගේ හිත සුද්ද වුනා. දැන් මං මැරෙන්න බය නෑ" කියලා මුදලාලි ගියා. මං එන්න හැදුවාම මට එන්න එපා කියලා යැර කළා. මුදලාලි ගියාට පස්සේ මං නන්දන මහත්තයාට කතා කරලා කිව්වා මුදලාලි හිතේ බයෙන් ඉන්නේ. ගෑණියක්ගෙ මර හිනාවකුත් මුදලාලිට ඇහුනා කියලා කිව්වා. පුළුවන්නම් ඇවිත් යන්න එන්න කියලා."

"දැන්ද ඌට මාව ඕන වෙන්නේ. මගෙන් වැඩ ගන්න කොට මං හොඳයි. වැඩේ ඔක්කොම කරලා ඊකෙන් වාසි ගත්තට පස්සේ මං නරක මිනිහා."

"මුදලාලි නං මහත්තයට එන්න කිව්වේ නෑ. මේ මං හිතලා තමයි කියන්නේ මුදලාලි ආවොත් හොඳයි කියලා."

"හ්ම්. මං එහෙනම් එන්නම්" කියලා නන්දන මහත්තයා කිව්වා.

"කෝල් එක දුන්නට පස්සේ මං මුදලාලිගේ ගේ පැත්තට ගියා. මං පැයකට විතර පස්සේ ඒ පැත්තට ගියා කියලා පොලිසියට කිව්වේ නන්දන මහත්තයා උගන්නපු නිසා තමයි. මං දැක්කා පොඩි ගේට්ටුව ඇරලා දාලා තිබුණා. ගේට්ටුව අරින්න පුළුවන් මිනිහට ගෙදර දොර ඇරගන්න බැරිවෙන්න විදිහක් නැති බවත් මං දැන ගත්තා. මොකද පොඩි ගේට්ටුවේ යතුරක් තිබුණේ ජයදේව මහත්තයා අත විතරයි. එතකොට ජයදේව මහත්තයා අත ගෙදර යතුරකුත් තියෙනවනේ. දොර වහලා නොතිබුණේ එක්කො අමතක වීමකින්. එහෙම නැත්නම් පැනලා යන්න ලේසි වෙන්න. මට ගේ ඇතුලේ කවුරුහරි කතා කරන සද්දෙත් ඇහුණා. ඒත් මං ඈතින් හිටිය නිසා ඒ කතා කරපු දේවල් පැහැදිලිව ඇහුණේ නෑ. ඊට කලින් ඒ කියන දේවල් අහගන්න තිබුණත්, අහුවෙයි කියලා බය හිතුන නිසාත්, බයටම මගේ කකුල් මටම වාරු නොවුන නිසාත්, මං ඒ මල් පඳුර ගාවම බිම ඉඳගෙන බලාගෙන හිටියා. මං දැක්කා කාමරේ ඉඳං, උස මනුස්සයෙක් එනවා. ඌ අපේ ගේ දිහාත් ටික වෙලාවක් බලං හිටියා. ඒ එක්කම හොඳට අවට බැලුවා. ඊට පස්සේ ගේට්ටුව ගාවට ගිහිං අතේ තිබුණ යකඩයකින් ගේට්ටුවට හොඳ පාරක් දීලා ඒක කැඩුවා. ඒ ඉබ්බා කඩලා ඇතුලට ආපු බව අඟවන්න වෙන්න ඇති. ඊට පස්සේ මට ඇහුණා මෝටර් සයිකලයක් ස්ටාට් කරන සද්දේ. කරුවල නිසා ආපු කෙනාව මට අඳුන ගන්න ලැබුනේ නෑ. ඒත් මට හොඳටම විශ්වාසයි ඒ ඇවිත් ගියේ ජයදේව මහත්තයා නම් නොවෙයි කියලා. ඒ මිනිහා ඊට වඩා උසයි. ඒ වගේම ඒ මිනිහා නන්දන මහත්තයා තරම් මහතත් නෑ. මට හිතුනේ ඒ සුදා මල්ලී වෙන්න ඇති කියලා. ඌගේ උස මහත, ඌගේ ගමන තමයි මිනීමරුවට තිබුණේ. අනේ මහත්තයෝ මං මේවා කියපු බවක් ඌට නම් දැනගන්න තියන්න එපා. ඌ මාව ඉතුරු කරන එකක් නෑ."

"කමලදාස බයවෙන්න එපා. අපි මිනීමරුවා කොටුකරලා අල්ලා ගන්නකම් මේ කිසි දෙයක් එලිවෙන්න තියන්නේ නෑ. කමලදාසට තියෙන්නේ උසාවියට ඇවිත් ඔය කියපු ටික ඒ හැටියටම කියන්න. එතකොට අපට ඌව ගස් යවන හැකි. කමලදාසටයි පවුලටයි පොලිස් ආරක්ෂාව ලබාදෙන්න අපට පුළුවන්. ඒ ගැන බය වෙන්න එපා."

"අනේ හොඳයි මහත්තයෝ."

SL-Unlimited

"දැන් කමලදාස මේ ටික අපට කියන්න එනවා කියලා කවුරුවත් දන්නවද?"

"නෑ මහත්තයෝ... හැබැයි මගේ පවුල කිව්වා පොලිසියට කියලවත් අපි බේරෙන්න බලමුද කියලා."

"පවුල විශ්වාසද?"

"ඔව් මහත්තයෝ."

"හොඳයි එහෙනම් මේක රහසක් හැටියට තියාගන්න."

"ඔය ටික තමයි මිනිහා ඒ ගැන අපට කිව්වේ. ඊට පස්සේ අපට හිතුනා ඔය සුදා කියන මනුස්සයා ගැනත් විස්තර ටිකක් දැන ගන්න. නන්දන, කමලදාසගේ පවුලට වරින් වර සුදා ගැන කියපු දේවල් තියෙනවා. ඒ කියන විදියට සුදා කුලියට මිනී මරණ පාතාලේ එකෙක්."

"නන්දනට සුදා හමු වෙලා තියෙන්නේ මෙහෙමයි."

"මීට අවුරුදු පහකට හයකට වගේ උඩදී සුදා ගිහින් තියෙනවා නන්දන හමුවෙන්න. මෝටර් සයිකලේකින් ගිහින් තියෙන්නේ. එතකොට ගෙදර මුරට හිටිය මනුස්සයා කිව්වලු නන්දන, සුරනිමල මුදලාලි හමුවෙන්න ගිහින් කියලා. බොහොම වැදගත් ආරංචියකට ආවේ කිව්වාම ඒ මනුස්සයා නන්දනට ෆෝන් කරලා ඒ බව දැනුම් දීලා. නන්දන ඇහුවලු කාගෙන්ද පණිවුඩේ අරගෙන ආවේ කියලා."

"මං බම්බලපිටියේ කුරේ මහත්තයාගේ යෝලයෙක්" සුදා කිව්වලු.

"මං එන්න ටිකක් ප්‍රමාද වෙන්න පුළුවන්. සුදාට පුළුවන් නම් අපේ අයියලාගේ ගෙදරට එන්න. මං දැන් ඉන්නේ එහේ."

"ඉතිං සුදා ඒ වෙලාවේම එහාට ගිහින් තියෙනවා."

"එතකොට නන්දනගේ බොඩිගාඩ්, පොඩි මහත්තයාත් එතන ඉඳලා තියෙනවා. සුදා කිව්වලු පෞද්ගලිකව නන්දනට කතා කරන්න ඕනේ කියලා."

"මෙතන ඉන්නේ මායි, අයියයි, මගේ සහෝදරයෙක් වගේ ඉන්න පොඩි මහත්තයයි විතරයි. අපි අතර රහස් නෑ. කියන දෙයක් මෙහෙම කියන්න."

"මහත්තයා. මගේ බොස් ගැන මහත්තයාට කියන්න ඕනේ නෑනේ. කෙලින් මිනිහා. මං කුරේ මහත්තයට වැඩ කීපයක්ම කරලා දීලා තියෙනවා. කුරේ මහත්තයා අපි ලව්වා කරවන වැඩ මොනවද කියලා මහත්තයට කියන්න ඕනේ නෑනේ."

"ඒත් සුරනිමලට ඕන වුණා මොන වැඩද කරලා දුන්නේ කියලා දැන ගන්න. එයා දන්න කුරේ මහත්තයෙක් නෑ. නන්දන එයාගේ කනට කරලා කිව්වා, සල්ලි අරගෙන මිනිසුන්ව අතුරුදහන් කරන එක තමයි එයා කරන්නේ කියලා. සුරනිමල ගැස්සිලා ගියාම, නන්දන

SL-Unlimited

කලබල නොවී මෙයාට කියන්න තියෙන දේ මොකක්ද කියලා අහගමු කිව්වා."

"මහත්තයා දැන් දවස් කීපයකට උඩදී මෑන් කෙනෙක් ආවා මාව හමුවෙන්න. මිනිහා මා ගාවට එක්කරගෙන ආවේ බඹලපිටියෙ මං දන්න ටැක්සි ඩ්‍රයිවර් කෙනෙක්. මිනිහා ඒ ටැක්සි ඩ්‍රයිවර්ගෙන් අහලා තියෙනවා පොඩි කොන්තරාත් එකක් දෙන්න මනුස්සයෙක්ව රෙකමන් කරන්න පුළුවන් නම් ඒ ඩ්‍රයිවර්ටත් ගානක් දෙන්නම් කියලා. හැබැයි ඩගී අයියා කෙලින්ම මිනිහා මා ගාවට එක්කරගෙන ආවේ නෑ. ඩගී දන්නවා සීඅයිඩී කාරයොත් අපි ගැන හෙවිල්ලෙන් ඉන්න බව. ඒ නිසා මිනිහා මුලින් කිව්වලු තමුසේ හරි මිනිහෙක්නේ ඕයි. අපි දන්න කොන්තරාත් කාරයො නෑ කියලා. හැබැයි ඒ මිනිහ යාප්පු වෙච් කියන කොට ඩගීට තේරුම් ගිහින් තියෙනවා ඒ මනුස්සයා ගමක හැදුන මෝඩ පගේ මිනිහෙක් කියලා. ඒ පාර ඩගී මිනිහව මා ගාවට එක්කරගෙන ආවා."

"සුද්දා මල්ලී පොඩි කොන්තරාත් එකක්. වැඩේ කරලා දුන්නොත් පනහක් දෙන්නලු."

"කොන්තරාත් එකක් කිව්වට මං වැඩිය ගනං ගත්තේ නෑ. අහළි පහළි අයගේ කුණු කොන්තරාත් මං බාර ගන්නේ නැහැ මහත්තයා. ඒත් පනහක් කිව්වම අහක දාන්න හිතෙන්නෙත් නෑ. මට හිතුනා ලොකු මිනිහෙක්ට වෙන්න ඇති වැඩේ දෙන්න වෙලා තියෙන්නේ කියලා. මං කිව්වා මැති ඇමති ගොල්ලන්ට නම් මට බෑ. කියනවා බලන්න මං වැඩේ දෙන්න ඕන කාටද?"

"නෑ. එහෙම කෙනෙකුට නොවෙයි. අර පුරනිමල කියන වාසල ශොප් එකේ අයිතිකාර මහත්තයාට තමයි වැඩේ දෙන්න ඕන."

"මං ඒ වෙන කොට පුරනිමල මුදලාලි ගැන ටිකක් අහලා තියෙනවා. එයා හොඳ සමාජ සේවකයෙක් හැටියටයි මං අහලා තිබුණේ."

"ඒ මහත්තයා කාටවත් කරදරයක් කරන කෙනෙක් නොවෙයි නේ හලෝ. මොකද ඒ මනුස්සයා තමුසෙට මොනවා හරි විපත්තියක් කරලා තියෙනවාද?"

"නෑ නෑ. ඒ මහත්තයා නම් මට මොකුත් කරලා නෑ. ඒ වුණාට ඌගේ මලයා කෙනෙක් ඉන්නවා. ගෑණු ළමයෙක්ව ජෙන්න බෑ. මගේ නංගිවත් ඌ පැහැරගෙන ගිහින් දූෂණය කළා. අපි දුප්පත් මිනිස්සු මලයා. ඌට විරුද්ධව අපට අත හොල්ලන්නවත් බෑ. ඒත් අපට කරපු ඔය විත්තැහිය දැන ගත්තු වෙන සල්ලිකාර මහත්තයෙක් මාව හමුවෙන්න ආවා."

"තමුසෙට නන්දන මුදලාලි කරපු වැඩේට පළිගන්න ඕන නම් මං උදව් කරන්නම්. යන වියදම් ඔක්කොම මම දෙන්නම්. තමුසෙට

හොඳ ගානකුත් දෙන්නම්. ගිහින් සුරනිමලට වැඩක් දෙනවා" ඒ මහත්තයා කිව්වා.

"සුරනිමල මුදලාලිට වැඩක් දෙන්න මට ඕන කමක් නෑ. නන්දනයටයි වැඩක් දෙන්න ඕනේ" මම කිව්වා.

"සුරනිමල වැටුනාම නන්දන වැටෙනවා. ඊට පස්සේ අපි ඌව අල්ලගමු."

"ඒ මහත්තයා හොඳ වැදගත් පවුලක කෙනෙක් කියලා මට තේරුණා. ඒ මහත්තයාට මේ වගේ වැඩක් කරන්න ඕන ඇයි කියලා මට හිතා ගන්න බැරි වුණා."

"ඇයි මහත්තයාට මෙහෙම දෙයක් කරන්න ඕනේ" මං ඇහුවා.

"මගේ නංගී කෙනෙක්වත් නන්දනයා ඇහැරගෙන ගිහින් දූෂණය කළා. ඒකට පලිගන්න තමයි මේ වැඩේ කරන්න හදන්නේ."

"ඉතිං ඇයි මහත්තයා මං වගේ කෙනෙක්ට ඔය වගේ ලොකු වැඩක් පවරන්න හිතුවේ."

"මට උදව් කරන්න වෙන දෙන්නෙක් හිටියා. මං හිතන්නේ ඒ දෙන්නම නන්දනට අහුවෙලා. තමුසෙට ඕක කරන බැරි නම් තමුසේ වෙන කවුරු හරි ලව්වා වැඩේ කරලා දෙනවා. ඒ යන වියදමත්, තමුසේගේ මහන්සියත් මං බලාගන්නම්."

"කවුද ඔය කියන මහත්තයා" කියලා මං ඇහුවා.

"අපොයි මං නං ඒක කියන්නේ නෑ. මැරුවත් කියන්නේ නෑ."

"හොඳයි මං වැඩේ බාර ගන්නං. වැඩේ පටන් ගන්න මට දහයක් දෙනවා. වැඩේ කළාට පස්සේ ඉතුරු සල්ලි ටික දෙනවා."

"මං මිනිහගේ ඇඩ්රස් එක අරගත්තා. සුරනිමල මුදලාලිගේ ඇඩ්රස් එකත් මිනිහා මට දුන්නා. මොන වැඩක් කළත් කුරේ මහත්තයට නොකිය මං කරන්නේ නෑ. ඒ නිසා මං කුරේ මහත්තයාට එදා රෑ මට ලැබුණ අලුත් කොන්තරාත් එක ගැන කිව්වා."

"ඔය වැඩේ නම් කරන්න එපා පුතෝ. ඔය සුරනිමල මුදලාලි කියන්නේ මගේ හොඳ යාළුවෙක්ගේ අයියානේ. කෝ තමුසෙට දුන්නු සල්ලි."

"මං මට ලැබුණු සල්ලි පෙන්නුවා."

"කුරේ මහත්තයා නන්දන මහත්තයට කතා කරන්න බැලුවා. ඒත් ලයින් එක ගන්න බැරි වුණා."

"මං එයාගේ ගෙදර ඇඩ්රස් එක තමුසෙට දෙන්නම්. දැන්ම ගිහින් ඔය විස්තරේ එයාට කියනවා. එතකොට ඒ මහත්තයා තමුසෙට කරන්න ඕන දේ කියාවි."

"ඔන්න ඊට පස්සේ තමයි මං මේ මහත්තයා හම්බ වෙන්න මෙහාට ආවේ."

SL-Unlimited

"නන්දන මහත්තයා ෆෝන් එක අරගෙන කුරේ මහත්තයට කතා කළා. කුරේ මහත්තයා ඒ වෙච්ච සිද්දිය ඇත්ත බව ප්‍රකාශ කළා."

"දැක්කද අපේ මස්ඕනන්ඩිංග වැඩ. මුලින් බැලුවා මෙහේ හිටපු එයාගේ පවුලට සම්බන්ධ අය ලව්ව අපෙන් පළිගන්න. දැන් ඊන් ගැන ආරංචියක් නැති වුණාම වෙන මිනිස්සුන්ට සල්ලි දීලා වැඩේ කරන්න හදනවා."

"අපේ එකීත් මෙච්චර නිශ්ශබ්ද වෙලා ඉන්න එකත් වැඩේ" සුරනිමල මුදලාලි කිව්වා.

"දැන් මේ ළමයගේ නම එහෙම කොහොමද?"

"මට සුදා කියලා තමයි කවුරුත් කතා කරන්නේ. පමුණුවේ සුදා කිව්වාම බම්බලපිටියේ කවුරුත් දන්නවා."

"හොඳයි සුදා දැන් මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නේ."

"කුරේ මහත්තයා මට කිව්වේ නන්දන මුදලාලි කියන විදියට වැඩ කරන්න කියලා."

"හොඳයි සුදා. තමුසෙට බොහොම ස්තුතියි මේ ආරංචිය අපට ගෙනාවට. තමුසේ ඊං දීපු දහය තියාගන්නවා. අපි දෙන්නම් තව හතලිහක්. ඒ කොන්තරාත් එක බාර දීපු එකාට වැඩක් දෙනවා."

"ඕ.. ඕ.. මහත්තයා. ඒ වැඩේ කැතයි නේ. එයා දීපු වැඩේ මං කරන්නේ නැතුව සල්ලි ගන්න එක හරි නැහැනේ. මං ඒ සල්ලි ආපහු එයාට දීලා, ඒ වැඩේ කරන්න බෑ කියලා කියනවා. ඊට පස්සේ මහත්තයලාගේ කොන්තරාත් එක කරන්නම්."

"බොහොම හොඳයි පුතා. මං හරි කැමතියි ඔහොම කෙළින් වැඩ කරන අයට. පුතා ගිහින් මිනිහාගේ වැඩේ කරන්න බෑ කියලා සල්ලි රිටර්න් කරන්න. ඒ එක්කම මං දෙනවා වෙන කොන්තරාත් එකක්. ඒකට මං දැන් ඇඩ්වාන්ස් එකකුත් දෙන්නම්."

"මහත්තයාගෙන් මට ඇඩ්වාන්ස් එපා. කියන වැඩක් මං හිතට කරලා දෙන්නම් ඊට පස්සේ මහත්තයට සතුටු ගානක් දෙන්න."

"එහෙම කියලා පිට වෙලා ගිය සුදා ආපහු ඇවිත් තියෙන්නේ සති දෙකකට විතර පස්සේ. කියපු වැඩේ කළාලු. ඒත් නන්දන මුදලාලිගෙන් සල්ලි ගන්න එපා කියලා කුරේ මහත්තයා කියලා තියෙන නිසා සල්ලි ගත්තේ නැලු. සතියක් දෙකක් විතර එයාට ඒ පැත්තට නෑවිත් හැංගිලා වගේ ඉන්න කියලා කුරේ මහත්තයා කිව්වලු. ඒ පාර නන්දන මුදලාලි එයාව පොඩිමහත්තයාත් එක්ක ගමට පිටත් කරලා යැව්වා. සුදා ගැන මොන හේතුවක් නිසා නන්දනට පැහැදීමක් ආවද කියන්න කවුරුත් දන්නේ නෑ. පස්සේ මිනිහගේ කතා බහටත්, පොඩි මහත්තයාගේ රෙකමන්ඩේෂන් එකත් සලකලා බලලා, කුරේ මහත්තයත් එක්කත් කතා කරලා සුදාව නන්දන ගාවම තියා ගන්න කටයුතු කළා. සුදා අහල පහලක

ඉන්නකොට නන්දනට බොහොම ආරක්ෂාවක් තියෙනවා වගේ හැඟීමක් ඇති වෙන බව නන්දන කීපවතාවක්ම ප්‍රේමට කියලා තියෙනවා. ඒ වගේම සුදා, නන්දන කිව්වෙ මොකක්ද ආයෙත් ඇහිල්ලක් වැලිල්ලක් නෑ. ඒ වැඩේ කරනවා. නන්දනගේ වැඩ නිසා කතා පතුරුවපු, එයාගෙම ෆැක්ටරියෙ වැඩ කරන කිහිප දෙනෙක්ටත් සුදාගෙන් ගුටි බැට ලැබිලා තියෙනවා. සමහරු දවස් දෙක තුන ඉස්පිරිතාලෙ නැවතිලා ඉන්න තරම් ගුටි කාලා තිබුණත්, ඊට තියෙන බය නිසා කිසි දෙයක් පොලිසියට කියලා නෑ. ඒත් සුදා ප්‍රේමටවත්, කමලදාසටවත් කිසිම දාක සැරවැර වෙලාවත්, හිත රිදෙන වචනයක් කියලාවත් නෑ."

"පොඩි මහත්තයාගේ ගෙදර හිටපු කාලෙ, පොඩිමහත්තයාගේ ලොකු දුව, සුසීමා, ඒකිට අවුරුදු විස්සක් විතර ඇතිලු. ඒකිත් එක්ක සුදාගේ ප්‍රේම සම්බන්ධයක් පටන් අරං තියෙනවා. පොඩි මහත්තයත් සුදාට කැමති නිසා කිසි ප්‍රශ්නයක් වෙලා නෑ. ඊළඟදීම ඒ දෙන්නගේ විවාහය සිද්ද වෙයි කියලා කමලදාසට සුදා කියලා තියෙනවා. මීට අවුරුදු කීපෙකට ඉස්සෙල්ලා පොඩි මහත්තයට කවුරු හරි පිහියෙන් ඇනලා, කපලා කොටලා එල්ලලා මරලා දාලා තියෙනවා. ඊකෙන් පස්සේ නන්දන මුදලාලි ටිකක් බයෙන් ඉඳලා තියෙනවා. පොඩි මහත්තයා කියන්නෙ ලේසියෙන් කාටවත් මෙල්ල කරගන්න පුළුවන් කෙනෙක් නොවෙයි. මිනිහටත් වැඩක් දෙන්න කෙනෙක් හිටියනම්, තමන්ගෙ ආයුසත් අඩු වෙන්න පුළුවන් කියලා නන්දන හිතන්න ඇති. හැබැයි ඒක ගෑණු හුටපටේකට වෙච්ච දෙයක් බව දැනගත්තාම නන්දනගේ ඇඟට ටිකක් ලේ ඉනුවලු. ඊට පස්සේ එයා සුදාව ස්ථිර වශයෙන්ම තමන්ගේ ආරක්ෂකයා විදියට පත්කරගෙන තියෙනවා. සුදා දිහා බලපුවාම, මිනිහත් එක්ක කතා කරනකොට දාමරිකයෙක් කියලා හිතන්න හරි අමාරුලු. මිනිහා ඕනම කෙනෙකුට බොහොම ගරු සරු ඇතිව කතා කරනවා. කමලදාස අයියේ කියලා තමයි මටත් කටපුරා කතා කරන්නෙ. ප්‍රේමටත් මිනිහා බොහොම ආදරෙන් කතා කරන්නෙ. මට මගේ අක්කා වගේ තමයි ප්‍රේමක්කා කියලා නිතරම අපේ ගෙදර ආවාම කියනවා. දවසක් අපේ ප්‍රේමා ඇහුවා මල්ලිට අක්කා කෙනෙක් ඉන්නවද කියලා. අනේ නෑ අක්කේ. අපේ පවුලට ඉන්නේ මායි, අම්මයි මල්ලියි විතරයි කියලා එයා කිව්වාලු."

"නන්දන මුදලාලි සතියකට දෙතුන් වතාවක් සුරනිමල මුදලාලි හමුවෙන්න එනවා. එතකොට සුදා කෙලින්ම එන්නෙ අපේ ගෙදරට තමයි. "දාන්නකෝ ප්‍රේමක්කේ හොඳ ප්ලේන්ටියක්" කියාගෙන කුස්සියට ඇවිත් වංගෙඩිය උඩින් ඉඳ ගන්නවා. හරියට අපේ පවුලෙම කෙනෙක් වගෙයි."

"දවසක් ප්‍රේමා අහලා තියෙනවා මල්ලි දිහා බලපුවාම දරුණු හිතක් තියෙන කෙනෙක් කියලා පේන්නෙවත් නෑ. කොහොමද මල්ලි මේ පාතාල ලෝකෙට වැටුණේ කියලා."

SL Unlimited

"ඒක වුණේ මෙහෙමයි අක්කේ. මං ඉස්කෝලෙ යන කාලේ ගෑණු ළමයෙක් එක්ක යාළු වෙලා හිටියා. හරි අහිංසක කෙල්ල. ලස්සන කෙල්ල" සුදා ඇස් දෙක පිහදාන්න වුණා.

"මිනිහෙක් වුණාම රස්සාවක් කරන්නත් එපැයි අක්කේ. මං හමුදාවට බැඳුනා. මාව දියතලාවට පුහුණු වීමට යැව්වා. ඒ ගිහිං වැඩි කාලයක් වුණේ නෑ. මට ගමෙන් ලියුමක් ආවා. මගේ කෙල්ලට ගමේ කඩේ මුදලාලිගෙ පුතා බලහත්කාරකමක් කළා කියලා. මට ඒක ඇහුවාම ඉවසගෙන ඉන්න බැරි වුණා. මං කාටත් නොකියා ආපහු ගමට ආවා. මං කෙලින්ම ගිහිං මුදලාලියගේ පුතාගේ බෙල්ලෙන් අල්ලා ගත්තා."

"ඈ යකෝ. තෝ එහෙනම් මගේ එකීටත් බලහත්කාරකමක් කළා ඈ?"

"ඌගේ බෙල්ලෙන් අල්ලලා හොල්ලලා හොල්ලලා, පරඬැලා පතක් වගේ ඌව විසි කළා. ඌ නැගිටලා ආවේ පිහියකුත් මට ඉලක් කරගෙන. ඌ මං ගැන හරියට දැනගෙන ඉන්නෙ නැතිව ඇති. මං ඌගේ පිහි පාර වලක්වලා අත නදින් අල්ලලා මිරිකුවාම පිහිය බිම වැටුණා. වැටිච්ච පිහිය මං අරගත්තා. පත්තරේ නම් තිබුණේ පිහිපාරවල් හතලිස් හතක් ඌට වැදිලා තිබුණා කියලා. ඒත් මං හිතුවේ පිහිපාරවල් තුන්සියක්වත් අනින්න ඇතිය කියලා. ඊට පස්සේ මං හැංගි හැංගි හිටියා. පස්සේ මං අඳුනන හමුදාවේ මහත්තයෙක්ගේ මාර්ගයෙන් කුරේ මහත්තයට සෙට් වුණා. මට දැන් ඉස්සරහට ගිහින් හොඳ රස්සාවක් කරන්න බෑ ප්‍රශ්නෙනේ. කුරේ මහත්තයා ගාව ඉන්නකොට පොලිසියෙනුත් ආරක්ෂා වෙලා ඉන්න පුළුවන්නේ. ඉතිං මේක තමයි ඉතින් මට සදාකාලිකව කරන්න වෙන රස්සාව."

"ඉතිං මල්ලිගේ අර කෙල්ල?"

"ඒකි කැලණි ගඟට පැනලා දිවි නහගත්තලු"

"ඉතිං මල්ලී අනින් කී දෙනෙක් විතර පරලොව යන්න ඇද්ද?"

"ගානක් කියන්න මං කැමති නෑ. අක්කා බයවෙයි. දැන් මට ඉන්නත් දාහයි මලත් දාහයි. සුසීම කියනවා දැන් ඔය වැඩ අතෑරලා දාලා පිළිවෙළක ආදායමක් එන වෙන මාර්ගයක් හොයා ගන්න කියලා. එයා නන්දන මුදලාලිටත් කිව්වලු පුළුවන්නම් මටත් වෙන රස්සාවක් හදලා දෙන්න කියලා. මුදලාලිත් මේ ගුළ ප්‍රශ්න ටිකක් තියෙනවා. ඉන් පස්සේ මාව නිදහස් කරනවා කියලා කිව්වලු. බලමු. මටත් ඇත්තටම ආසයි ඈත කැලෑබද පැත්තකට ගිහින් හේනක් කොටලා හරි ජීවත් වෙන්න."

"ඉතිං සුසීමා නඟා ඒකට කැමති වෙයිද?"

"මාත් එක්ක එන්න කැමතිනම් ඒක තමයි එයාට කරන්න වෙන්නේ. එහෙම නැත්නම් මේ විදියට ඉන්න වෙනවා."

SL-Unlimited

"ඔය සුදාගේ ගම එහෙම කොහෙද, එයාගේ අම්මා තාත්තා කවුද?"

"ගම පමුණුව කියලා පැත්තකලු. ප්‍රේමට කියලා තියෙන විදියට එයාගේ තාත්තා නෑ. අම්මයි මල්ලියි තමයි පවුලේ ඉන්නේ. ඉඳලා හිටලා දවසක එයා මල්ලිට හරි අම්මට හරි ටෙලිෆෝන් කරනවලු. කලාතුරකින් දවසක් එයාට ගෙදරින් කතා කරනවා. ඒ ඇරෙන්න ගමේ යනවා කියලා ගිහින් තියෙන්නේ එකම එක පාරලු."

"සුරනිමල මුදලාලියි, සුදාගෙයි අතර තිබුණ සම්බන්ධකම කොහොමද?"

"සුරනිමල මුදලාලි සුදාට බොහොම ආදරෙන් ඉඳලා තියෙනවා. මුදලාලි "සුදෝ" කියලා තමයි මිනිහට කතා කරන්නේ. "මෙහෙ වරෙන් සුදෝ", "සුදෝ මේ වැඩේ ඉක්මට කරන්න පුළුවන්", "මට ඇත්ත කියපං සුදෝ" ඔන්න ඔහොම ආදරෙන්ලු සුරනිමල මුදලාලි මිනිහට කතා කරන්නේ. හැබැයි සුදා නන්දන මුදලාලිත් එක්ක එංගලන්තෙට ගියාට පස්සේ, මුදලාලි සුදා එක්ක තරහෙන් ඉන්නවා කියලා ප්‍රේමට කියලා තියෙනවා. ඒ ගැන සුදා කනගාටුවෙන් හිටියලු."

"නන්දනයි සුදායි රට ගිය එක ගැන වැඩි යමක් දන්නේ නැද්ද?"

"නන්දන මුදලාලි රට යන්න දවස් කීපෙකට ඉස්සරවෙලා සුරනිමල මුදලාලිව හම්බ වෙන්න ආවලු. එදා සුදා සුට් කේස් එකකුත් අරගෙනයි ඇවිත් තියෙන්නේ. ගෙදරට ආපු ගමන් එයා ප්‍රේමට කිව්වලු "අක්කේ මං පොඩ්ඩකට කාමරේට ගිහිං එන්නද?" කියලා.

"කාමරේට ගියාට කමක් නෑ. මොනවත් හොරකම් කරන්න එහෙම එපා" කියලා ප්‍රේමා විහිලුවක් කළාලු. සුදා එළියට ඇවිත් තියෙන්නේ හොඳ ජැන්ඩියට අත් දිග කමිසයකුයි, දිග කලිසමකුයි ඇඳගෙන, කෝට් එකක් එහෙම දාලා. ටයි එකක් දාලා."

"ෂහ්. මේ අපේ සුදා මල්ලි නිකං එංගලන්තෙන් ආපු සුද්දෙක් වගේනේ. කවුද අප්පේ මේ ඇඳුම් අරං දුන්නේ. එගොඩීම මඟුල් කන්න වගේ ඉඳන්නේ?"

"නෑ අක්කේ. නන්දන මුදලාලි මට අරං දුන්නා."

"ඒ මක්කටෙයි?"

"ප්‍රේමක්කට කිව්වාම මොකද? හැබැයි සුරනිමල මුදලාලිට හෙම දැන්ම දැන ගන්න තියන්න එපා. නන්දන මහත්තයා ඇහුවා පොඩිමහත්තයට වැඩේ දෙන්න කොන්තරාත් එක දුන්න මිනිහා ඉන්න තැන සුදා දන්නවනම් මොකද කරන්නේ කියලා."

"කියන්න මහත්තයා, ඌ ඉන්න තැනක් කියන්න. ඒකා අපායේ හිටියත් මං ඇදල්ලා ඌව බාවලා එනවා."

"ඌව ඉන්නේ අපායේ නොවෙයි දිව්‍යලෝකේ. මං මේ ඌට වැඩක් දෙන්න යනවා. උඹත් කැමති නං වරෙන්."

"මං එක පයින් කැමති වුණා. දැං මාත් නන්දන මුදලාලිත් එක්ක රට යනවා" සුදා ආඩම්බරෙන් කීවලු.

"ඊට පස්සේ මං ඇහුවා මාධවී කියලා ජයදේව එක්ක විවාහ වෙලා ඉන්න රජමල්වත්තේ කුමාරිහාමි ගැන, නන්දන හරි සුදා හරි කියපු යමක් තියෙනවද කියලා. ඒ ගැන නන්දන නම් කිසි දෙයක් කියලා නැලු. ඒත් සුදා කියලා තියෙන්නෙ හරි හොඳ නෝනා. ජයදේව මහත්තයට හරි ආදරෙයි. ඒත් මට වෙලාවකට ඒ නෝනා ගැන දුකත් හිතෙනවා. ඒ නෝනාව හිර කාරියක් වගේනේ ජයදේව මහත්තයා තියාගෙන ඉන්නේ. තනියෙන් කොහේවත් යන්න එන්න දෙන්නේ නෑ. කිසිකෙනෙක්ට ජයදේව මහත්තයගේ අවසරේ නැතිව එයාව හමුවෙන්න යන්න දෙන්නත් එපැයි කියලා මට ඕඩර් එකකුත් දීලයි තියෙන්නේ. දැන් මට තියෙන ලොකුම රාජකාරිය තමයි ඒ නෝනව ආරක්‍ෂා කරන එක."

"දැන් එහෙනම් විමලසිරිට තියෙන්නෙ කවුද මේ සුදා කියන එක හොයා ගන්න. එයා බම්බලපිටියේ කුරේ කියලා කෙනෙක් ගාව වැඩ කරලා තියෙනවා. කොහොමහරි මිනිහගේ මුල අපි හොයා ගන්න ඕනෙ. හැබැයි දැන් පුළුවන් තරම් ඉක්මන් වෙන්න ඕනේ. අදම වැඩ පටන් ගන්න බලන්න."

●●●

"බලාගෙන ගියාම අංකල් මේක පඹ ගාලක්නේ. දැන් මට හොඳට යමක් පැහැදිලි වෙනවා. මගේ අප්පච්චිවයි, අම්මවයි මරන්න ඇත්තේ මේ මිනිස්සුම තමයි" පැට්‍රික් සුසුමක් හෙළුවේ ය.

"ඔව්. මටත් ඒක දැන් ටිකක් පැහැදිලි වෙනවා."

"ඒ විතරක් නොවෙයි අංකල්. දැන් තවත් චපාලයෙක් ඉන්න බව පෙනෙන්න තියෙනවා. මට හිතෙන්නේ සුදාව යොදවල නන්දන සුරනිමල මුදලාලිව මැරුවා කියලා. ඒ සුරනිමලගේ දේපල නන්දන විසින් පැහැර ගැනීම සුරනිමල මුදලාලිට අහුවුණ නිසාත්, එයාගේ ප්‍රේම පලහිලව්වලට අයියා අත දමන එක නිසාත්, අන්තිමට රන්දෙණිගල වලව්ව පිළිබඳ ප්‍රශ්නයකුත් වගේ දේවල් නිසාත් වෙන්න ඇති."

"ඔව්. කතාවේ හැටියට ජයදේව, තමන්ගේය කියලා නන්දන කියලා තියෙනවා. ඒක සුරනිමලට ගහපු ලොකු පහරක්. එයාව මානසිකව වට්ටන්නත් බලන්න ඇති. ඒත් මට හිතාගන්න බැරි අර මර හිනාව."

"අංකල්. මිනී මැරුමක් ප්ලෑන් කරලා කරන කෙනෙක්ට ඔය වගේ දෙයක් කරන්න පුළුවන්. අංකල් "හවුන්ඩ් ඔෆ් බැස්කර්විල්" කියවලා ඇතිනේ. ඒකෙත් ඔය වගේ පරම්පරාගත වෛරයකට ඒ

SL-Unlimited

පරම්පරාවේ අයව බය කරන්න බල්ලෙක්ව යොදාගෙන තියෙනවා. මං හිතන්නේ කවුරු හරි වෙප් කරලා ගෑණියෙකුගෙ මර හිනාවක් දානවා. එයාගේ ගොදුර මානසිකව වට්ටන්න. බලමු. මට ඒක ඔප්පු කරන්න බැරි වෙන එකක් නෑ."

"දැන් ඔය කතාවෙ කොහානක හරි කියවුණා සුදා ඇවිල්ලා තියෙන්නෙ කොන්තරාත් එකකට සුරනිමලව මරන්න කියලා. එතකොට ඒ වෙලාවෙ ඒක නොකර ඇයි පස්සෙදි ඒ වැඩේ කලේ."

"ඒක පිළිතුරක් හොයා ගත යුතු ප්‍රශ්නයක් තමයි අංකල්"

"පැට්රික්. දැන් අපට හොඳටම පැහැදිලියි සුදා සුරනිමලගෙ මරණයට වගකියන්න ඕනෙ කියලා. නමුත් ප්‍රශ්නෙකට තියෙන්නේ නන්දනගෙයි ජයදේවගෙයි සාක්කිවල සටහන් වෙලා තියෙනවා එදා සුදා හිටියේ ඒ ගොල්ලන් එක්ක කියලා. එදා කමලදාසගේ කෝල් එක ආවාම සුදා එක්ක නන්දන පිටත්වුණ බවයි ඒගොල්ල කියන්නේ. අපි කොහොම හරි මෙකේ ඇත්ත නැත්ත දැන ගන්න ඕනේ. ඒගොල්ල සුදා බේරගන්න හදනවා නම් ඒ දෙන්නත් මේ මරණයට සම්බන්ධ බව අපට හිතා ගන්න පුළුවන්. මෙකේ ඇත්ත නැත්ත දැන ගන්න තියෙන්නේ එකම එක විදිහයි. පැට්රික්ට පුළුවන්ද මාධවී හම්බ වෙලා එයාගෙන් මේ ගැන දැනගන්න."

"මට ඒක කරන්න පුළුවන්. මං අදම ඒකට ගැලැස්මක් හදාගන්නම්."

පැට්රික් ඒ වෙලාවෙම රිද්මාට කථා කලේය. ඇය සිය දෙමාපියන් සමග පදිංචිව සිටියේ ගම්පහ ප්‍රදේශයේය. තමන් රහස් පොලිස් නිලධාරියෙක් බව ප්‍රකාශ කළ පැට්රික් ඉතාම වැදගත් වුවමනාවකට ඇය මුණගැසීමට අවශ්‍ය බව සැල කර සිටියේය.

ඉතාම හදිසි එකක් නම් එදින සවසම තමන් හමුවීමට එන ලෙස ඇය ඇරැයුම් කළාය.

පැට්රික් රිද්මාගේ නිවසට ගියේ හැරිසන් ජයසුන්දරද සමගය.

"ඉතින් මිස්ටර් පැට්රික්ට මගෙන් කෙරෙන්න ඕන උදව්ව මොකක්ද?"

"රිද්මා දන්නවාද ඔයාගේ හොඳම යාළුවා මාධවී ළඟදී විවාහ වුණා කියලා."

"ඔව් මට ආරංචියි. ඒත් එයා මට කිව්වෙ නෑ. මාත් හරියට පුදුම වුණා ඒක දැන ගත්තාම."

"මාධවී දැන් ලොකු අමාරුවක වැටෙන්නයි යන්නෙ. එයා විවාහ වෙලා ඉන්න කෙනා කිසිම කෙනෙකුට මාධවී හමුවෙන්න ඉඩ දෙන්නෙ නෑ. ඒත් මං හිතනවා ඔයාට නම් එහෙම ප්‍රශ්නයක් ඇති වෙන එකක් නෑ කියලා. ඉතින් මට ඕන මාධවී ඉන්න බැරෑරුම් අවස්ථාව එයාට පැහැදිලි කරලා දීලා, එයාව බේර ගන්න."

SL-Unlimited

"ඉතින් මට යන්න දුන්නාට ඔයාට යන්න දෙන එකක් නැහැනේ."

"රිද්මා. මම තමයි මේ ඉන්වෙස්ටිගේෂන් එක භාරව ඉන්නේ. මම හැරිසන් ජයසුන්දර" හැරී තමා කවුදැයි ඇයට හඳුන්වා දුන්නේය.

"මේ වෙලාවේ මාධවී වෙනුවෙන් ඔයා අපට ලොකු උදව්වක් කරන්න ඕනේ. මෙහෙම ඉල්ලීමක් ඔයාගෙන් කරන එක හරි නැහැ. ඒත් මාධවී වෙනුවෙන් මං මේ ඉල්ලීම කරන්නේ. ඔයාගේ බෝයි ෆ්‍රෙන්ඩ් හැටියට තමයි පැට්‍රික්ව එක්කරගෙන යන්න ඕනේ. නැත්නම් මෙයාට ඇතුළට යන්න හම්බ වෙන්නේ නෑ."

රිද්මා කුමක් කියන්නදැයි නොදැන මඳ වේලාවක් නිහඬව සිටියා ය.

"මං කොහොමද ඒක කරන්නේ? මට බෑ ඒක කරන්න."

"මං මේ ඉල්ලීම කරන්නේ මාධවී වෙනුවෙන්. ඔයාගේ හොඳම මිතුරිය වෙනුවෙන්. එයාගේ ජීවිතයට එල්ල වෙලා තියෙන තර්ජනයක් නිසා. එයා ජීවත් වෙනවා දකින්න කැමති නම් ඔයා මේකට එකඟ වෙන්නම ඕනේ."

"මං මහේෂ්ට කතා කරන්න ඕනේ. එයා කැමති වුණොත් මං ඒකට එකඟ වෙන්නම්."

"ඔයා මහේෂ්ට කතා කරන්න. එයා ඒකට අකමැති වුණොත් මට පොඩ්ඩක් දෙන්න. මම එයාට කරුණු පැහැදිලි කරලා දෙන්නම්."

රිද්මා මහේෂ්ට කථා කළාය. ඔහුගෙන් ඊට විරුද්ධත්වයක් ඇති නොවුණි.

"මේ වැඩේ හෙටම කරන්න ඕනේ."

"හොඳයි මං හෙට නිවාඩුවක් ගන්නම්."

පසු දින උදෑසන යළි හමුවීමට ඔවුහු තීරණය කළහ.

"රිද්මා. ඔයා කරන්නේ ලොකු උදව්වක්. මේ උදව්ව නිසා අපට මාධවී බේර ගන්න පුළුවන් වෙන බව මට විශ්වාසයි" විසිර යන විට හැරිසන් ජයසුන්දර කීවේය.

●●●

## 15

පසුදා උදෑසන දහය පමණ වන විට රිද්මා සමඟ පැට්‍රික් තන්දන මුදලාලිගේ නිවස වෙත පැමිණියහ. නිවස වටා වූ විශාල ප්‍රාකාරයකි. නිවසට ඇතුළු වීමට වූයේද විශාල ද්වාරයකි. පැට්‍රික් ඒ ද්වාරය අසල වූ බොත්තමක් තද කළේය. මඳ වේලාවකින්, එම ද්වාරයෙහිම වූ කවුළුවක් විවෘත කෙරිණ. එතුලින් හැඩි දැඩි මිනිසකුගේ

SL-Unlimited

මුහුණක් ඔවුනට දැක ගත හැකි විය. දුටු පමණින් ඒ සුදා වන්නට ඇතැයි පැට්රික් සිතුවේය.

"මහත්තයලා දෙන්නාම ගෙදර නෑ. එළියට ගිහින්." කිසිවකු කිසිවක් ඇසීමට පෙර සුදා පැවසුවේය.

"ආ.. සුදා.. මම රිද්මා. මාධවී හමුවෙන්නයි ආවෙ. මේ මගේ බෝයි ෆ්‍රෙන්ඩ්."

"පොඩ්ඩක් ඔහොම ඉන්න නෝනා" කී සුදා තම සෙල් ෆෝනය ගෙන ජයදේවට කතා කර රිද්මා සිය පෙම්වතා සමඟ මාධවී හමුවීමට පැමිණ ඇති බව දැනුම් දුන්නේය.

"මහත්තයට නෝනාට කතා කරන්න ඕනෙලු" කී සුදා ෆෝනය රිද්මාට දුන්නේය.

"හලෝ රිද්මා. මොකද මේ හදිසියෙන්ම වගේ?"

"හදිසියෙන් නොවෙයි ජයේ. මේ පැත්තෙ යාළුවෙක්ගෙ ගෙදර ආවා. ඒ ගමන් මට හිතුනා මාධවී හම්බවෙලා ටිකක් කතා කරන්න. එදා අච්චමඟුල් දවසෙදිත් හරියට කතා කරන්න ලැබුණෙ නෑනෙ."

"ඔයා ආ එක හොඳයි. මාධවීත් පාළුවෙන් ඇත්තෙ. සුදාට ෆෝන් එක දෙන්න. මං ඔයාලට යන්න දෙන්න කියන්නම්."

"මාධවී නෝනට අනතුරක් වෙයි කියලා ජයදේව මහත්තයා හෙවිල්ලෙන් ඉන්නෙ. ඒක නිසා මහත්තයාගෙ අවසරෙ නැතිව කිසි කෙනෙක්ට ඇතුළට යන්න දෙන්න එපා කියලයි මට තියෙන්නෙ" පවසමින් සුදා ද්වාරය විවෘත කළේය.

රිද්මා එනු ඇහැදීම දුටු මාධවී ප්‍රීතියෙන් පිනා ගියාය. ඇය ඉදිරියට ගොස් ඔවුන් පිළිගත්තා ය.

"රිද්මා. කොහොමද කෙල්ලෙ මං ඉන්න තැන හොයා ගත්තෙ?"

"ඒකෙන් කමක් නෑ. ඔයා අපට හොරාම මඟුල් කෑවා නේද?"

"නෑ අනේ. රෙජිස්ටර් වුණාට අපි තාම උත්සවයක් ගත්තෙ නෑ. ජයදේවගෙ තාත්තා නැති වුණානෙ. මාස තුනකින් විතර උත්සවේ ගන්නයි අපි දැන් හිතං ඉන්නෙ. එදාට මං ඔයාටත් ඉන්වයිට් කරන්නම්කො."

"දැන් ඉතිං මොකට මඟුල් කනවද? ඔයා හැම දෙයක්ම පටලවාගෙන කරන්නෙ. ඉස්සර මිනිස්සු මඟුල් කාලා කැන්දන් ගියා. දැන් කැන්දන් ගිහින් මඟුල් කනවා."

"ඒක නොවෙයි රිද්මා. මේ ඔයාගෙ කවුද?"

"ආ. අපි යමු ගෙට" කියූ රිද්මා පැට්රික්ද සමඟ නිවසට ඇතුළු විය.

"මේ තමයි මගේ ඇක්ටිං බෝයි ෆ්‍රෙන්ඩ්."

www.sinhalalibrary.com
SL-Unlimited

"මම පැට්‍රික්" අත දිගු කරමින් පැට්‍රික් කීවේය.

"හලෝ" කියා තම අත දිගු කළ මාධවී ඔවුන් දෙදෙනා දෙස වෙන වෙනම බැලුවාය.

"දැන් ඔයා හිතන්නෙ මහේෂ්ට මොකද වුණේ කියලා නේද? මහේෂ් හොඳට ඉන්නවා. මෙයා පොඩි රඟපෑමක් කරනවා. එහෙම නැතිව මෙතනට එන්න වෙන්න විදිහක් නැහැ. මේ පැට්‍රික් පොලිසියේ, නෑ ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් ඔයාගේ මාමණ්ඩිගේ මරණය ගැන පරීක්ෂණ කරන්න ආපු කෙනෙක්. එයාට ඔයා එක්ක පෞද්ගලිකව කතා කරන්න ඕනෙය කිව්වා. ඔයාගේ ජීවිතේටත් තර්ජනයක් ඇති වෙන ලකුණු පේන්න තියෙන බවට ඒගොල්ල සැක කරනවා. ඉතින් ඔයා දන්න හැම දෙයක්ම කියන්න. ඇත්තම කියන්න. තමුන්ගේ ජීවිතේ ආරක්ෂා කරලා දෙන්න මේ ගොල්ල උත්සාහ කරන්නෙ. නැත්නම් ඔයාටත් ලොකු කරදරයක් වෙන්න පුළුවන්."

"කාගෙන්ද? විජයසූර්යාගෙන්ද?"

"මට මාධවීගෙන් අහන්න තියෙන්නේ එකම එක ප්‍රශ්නයයි. මේ ප්‍රශ්නෙට ඔයා ඇත්ත උත්තරේ දුන්නොත් අපේ ප්‍රශ්නෙ විසඳෙනවා. එදා සුරනිමල මුදලාලිගේ මරණය සිදු වුණ දා රෑ කමලදාස කතාකරපු වෙලාව ඔයාට මතකද?"

"ඔවු. එතකොට රෑ දහයට එකොළහට විතර ඇති."

"ඒ වෙලාවේ ඔයාලා මොනවද කර කර හිටියේ?"

"නන්දන අංකලුයි ජයදේවයි ඒ ගොල්ල අලුතෙන් පටන් ගන්න යන ෆැක්ටරිය ගැන කතා කර කර හිටියා. මාත් ඒවට ඇහුම්කන් දීගෙන හිටියා."

"කෝල් එක ගත්තෙ කවුද?"

"නන්දන අංකල්"

"එයා කියපු දේ ඔයාට ඇහුනද?"

"ඔව්. අපි එහෙනම් දැන්මම පිටත්වෙනවා කියලා එයා කිව්වා."

"ඔයා බොරු කියනවා. බය වෙච්ච වෙලාවට, අමාරුවෙ වැටිච්ච වෙලාවට තමයි නේද අපිව ඕන වෙන්නෙ. එහෙම නැති වෙලාවට බල්ලන්ට වගේ බනිනවා කියලා කිව්වේ නැද්ද?"

මාධවී මඳක් අපහසුවට පත් වූ සෙයක් පෙනෙන්නට තිබිණ.

"ඔව්. ඒත් අන්තිමට කියපු ටික තමයි මං කිව්වේ. ඔයාට ඔය හැම එකක්ම කියන්න ඕනේයැ?"

"මාධවී. ඔයා වැටෙන්න යන අමාරුව ඔයාට තේරෙන්නේ නෑ. සීරියස්ලි මේක ගැන හිතන්න. ඒකයි මං කිව්වේ මට ඇත්තම කියන්න කියලා. එයා පිටත් වුණේ තනියමද?"

"නෑ සුදා එක්ක පිටත් වුණේ."

"ඔයා ඇත්තමද කියන්නේ?"

"ඔව් ඇත්ත තමයි. ඇයි?"

"මාධවී. මං ඇත්තම කියන්නම්. අපට පෙනෙන හැටියට මහාශ්‍රයාට එළඟට ගොදුරු වෙන්න ඉන්නේ ඔයා තමයි. ඒ නිසා තමයි මම ඔයාට ඇත්තම කියන්න කියන්නේ. ඇත්ත කියන්න. ඒ වෙලාවේ සුදා එතන හිටියේ නෑ නේද?"

"පැට්‍රික් ඔයා මට කරදර කරනවා. සුදා එතන හිටියම තමයි."

"හොඳයි එහෙනම් මට මේකට උත්තර දෙන්න. ඔය මුයෙත් රෑ දහයාමාරට විතරනේ. එදා හැන්දෑවෙ හයෙන් පස්සේ සුදා කොහේවත් ගිහින් ආවාද?"

"නෑ. එදා මුළු හවස් වරුවම සුදා හිටියේ ගෙදරම තමයි."

"මාධවී මට බොහොම සතුටුයි ඔයා ඔහොම කියනකොට. එදා රෑ හතට විතර සුදා මෝටර් සයිකලෙන් යනවා දැකපු කෙනෙක් ඉන්නවානේ. එතකොට සුරනිමල මුදලාලිගෙ ගෙට හැරෙන පාර ගාවදී සුදාගෙ පෙනුම තිබුණ කෙනෙක් මෝටර් සයිකලෙන් බැහැලා තල්ලු කරගෙන යනවා දැකපු කෙනෙකුත් ඉන්නවනේ. ඉතිං එකම සුදා කොහොමද එකම දවසේ එකම වෙලාවට දෙපලක ඉන්නේ."

"ඒක බොරුවක්. ඒක කොහොමවත් වෙන්න බෑ. සුදා අහිංසක මිනිහෙක්. ඔහොල්ල ඒ අහිංසකයව අමාරුවේ දාන්න යනවා. සුදා සුරනිමල අංකල්ට හරිම ආදරෙන් හිටියේ. එයා කවදාවත් අංකල්ට අත තියන්නේ නෑ. මට හොඳටම ඒක විශ්වාසයි."

"ඔයා ඔය අහිංසකයා කියන සුදා මිනීමරුවෙක් බව ඔයා දන්නවද?"

ඇය නිරුත්තරව සිටියාය.

"සුදා කුලියට මිනී මරණ කෙනෙක් කියලත් ඔයා දන්නව ද?"

"ඔව් ඒ වුණත් සුරනිමල අංකල්ව මරණ කොන්තරාත් එකක් එයා බාරගත්තේ නෑ."

"ඔව් මාධවී. ඒක වෙන්නේ මෙහෙමයි. කොන්තරාත් එක බාරදෙන කෙනාගේ හැටියට තමයි බාර ගැනීම හරි නොගැනීම හරි සිද්ධ වෙන්නේ."

"මට තේරෙන්නේ නෑ ඔයා කියන එක."

"සුදා නන්දනටත් හිතවත් නේද?"

"අපොයි ඔව්. පණ වගේ"

"නන්දන කිව්වොත් සුරනිමල මුදලාලිට වැඩක් දෙන්න කියලා එහෙම නොකර ඉදීවිද?"

"ඔයා මොනවද මේ කතා කරන්නේ. ඊළඟ... මට ඔයාලත් එක්ක මේ බහුබූත කතාකරන්න වෙලාවක් නෑ. මා එක්ක කතා කරන්න ඕන

SL-Unlimited

නම් ඔයා ඉන්න. පැට්රික්ට යන්න කියන්න. මට බෑ එයා අහන ඒවට උත්තර දෙන්න."

ඊද්මා පැට්රික් දෙසත්, මාධවී දෙසත් මාරුවෙන් මාරුවට බැලුවාය.

"මාධවී ඔයාට මොකක් හරි අනතුරක් වුණොත්?"

"මට අනතුරක් වුණොත් ඒක බලා ගන්න මට මිනිහෙක් ඉන්නවා. මෙයා කවුද මගේ ආරක්ෂකයා වෙන්න. හරියට මගේ මස්සිනා වගෙයිනේ මෙයා කතා කරන්නේ" මාධවී කෝපයෙන් කීවා ය.

"ඔයා හරි මාධවී. ඔයාට හොඳට ඒක තේරුණා. මං ඔයාගේ මස්සිනා නිසා තමයි ඔයාව ආරක්ෂා කරලා දෙන්න මේ තරම් මහන්සි වෙන්නේ"

"පැට්රික්. ඒ පාර ඔයා මොකාවද එන්න හදන්නේ?"

"සුරනිමල මුදලාලිට විශාකා කියලා සහෝදරියක් හිටිය බව ඔයා දන්නවද?"

"ඔව්"

"හොඳයි ඔයාගේ තාත්තට නෙල්සන් කියලා ඥාති සහෝදරයෙක් හිටියා කියලා ඔයා දන්නව ද?"

"ඔව් මං දන්නවා"

"ඒ දෙන්නගේ පුතා තමයි මම. මම පැට්රික් සූරියබණ්ඩාර."

පැට්රික් දෙස ඇය මොහොතක් ඇසි පිය නොහෙලා බලා සිටියාය. ඇගේ මුහුණෙහි වූ නොරිස්සුම් බව තමා කවුදැයි දැනගත් පසු තුරන් වෙයැයි පැට්රික් බලාපොරොත්තු වූ නමුත් එය සිදු නොවීය.

"එහෙකොට ඔයා ආවේ අප්පච්චීගේ මරණය ගැන හොයන්න වෙන්න ඇති" ඇය සැකයෙන් මෙන් ඇසුවාය.

"නෑ නෑ. ඒකට නොවෙයි මං ආවේ. නමුත් ආවාට පස්සේ මට තේරුම් ගියා ඒක කළේ කවුද කියලා. මට තේරෙනවා ඒක කරන්න හේතුව මොකක්ද කියලත්. ඒත් ඒක කිව්වට ඔයා විශ්වාස නොකරන බවත් මං දන්නවා. ඔයත් හොඳටම දන්නවා නන්දන මිනීමරුවෙක්, සුදා මිනීමරුවෙක් කියලා. ඔයාටයි ජයදේවටයි බය නැද්ද මිනීමරුවොත් එක්ක ඉන්න. කොයි වෙලාවේ හරි ඔය දෙන්නගේ ජීවිතත් අනතුරේ බව ඔයාට තේරෙන්නෙ නැද්ද? මිනී මරලා පුරුදු අයට කොයි තරම් මැරුවත් ගාණක් නෑ. අපට උදව් කරන්න මාධවී. මිනීමරුවන්ව නීතියේ රැහැනට අසුකර ගන්න අපට උදව් කරන්න."

"පැට්රික් ඔයා යන පාර වැරදියි. සුරනිමල අංකල්ව මැරුවේ රන්දෙණිගල වනාසුයා. ඔයා හොඳටම දන්නවා වනාසුයා කියන්නේ කවුද කියලා. සුරනිමල අංකල් ඊට ගොදුරු වුණ එක්කෙනෙක්

www.sinhalaelibrary.com
SL-Unlimited

විතරයි. තව කී දෙනෙක් ඊට ඉස්සරවෙලා ඒකට ගොදුරු වුණාද? මේකට නන්දන අංකල් ගාවන්න හදන්න එපා. එයා තමයි වනාශ්‍රයන්ගෙන් පවුල ආරක්ෂා කරන එක්කෙනා. මිනී මරුවන් ගෙන් බේරෙන්න නම් උංව මරන්න එපැයි."

"හොඳයි මාධවී ඒ ඔයා හිතන විදිය නේද? ඒ වුණත් ජයදේව ඔයාට කියලා ඇති නේද වනාශ්‍රයන්ට නන්දන මුදලාලි කරපු දේ. එතකොට නන්දන අංකල් අතින් වනාශ්‍රයන් පරලොව ගියා නම් කවුද සූරතිමිල අංකල්ව මැරුවේ. ඒකෙන්වත් ඔයාට යමක් හිතා ගන්න බැරිද?"

"ඔයාටයි යමක් හිතා ගන්න බැරි. අපි ඒකෙන් හිතා ගත්තේ තවත් වනාශ්‍රයෙක් ඉන්නවා කියන එකයි. අපි හිතන්නේ ඔයාගේ විල්සන් අංකල් තමයි දැන් ඉතුරු වෙලා ඉන්න වනාශ්‍රයා කියලා. එයා තමයි මේ වැඩේ කරල්."

තව දුරටත් කරුණු පැහැදිලි කරදීමෙන් පලක් නොවන බව පැට්රික් තේරුම් ගත්තේය.

"හොඳයි ඔයා කියලම හිටිනවනම් සුදා එදා ගෙදර හිටියා කියලා මං ඔයා කියන කතාව විශ්වාස කරනවා. හැබැයි මීන් ඉදිරියට ඔයාට මොනවා හරි සැක හිතෙන දෙයක් සිද්ධ වෙනවා වගේ පෙනෙනවා නම් මෙන්න මගේ ෆෝන් නම්බර් එක මට කතා කරන්න."

"ඔයාටත් බොහොම ස්තූතියි මා ගැනයි ජයදේව ගැනයි හිතුවට. මට මුලදී ටිකක් තරහා ගියා. සමාවෙන්න."

ඉන්පසු රිද්මා හා මාධවී අල්ලාප සල්ලාපයෙහි යෙදෙන්නට වූහ.

තේ පැන් සංග්‍රහයක්ද පැවැත්විණි.

"මට ටොයිලට් එකට යන්න පුළුවන්ද?" පැට්රික් ඔවුන්ගේ කතාව ඉතා තීව්‍ර අවස්ථාවකට පැමිණි විටෙක ඇසුවේය. ටොයිලට් එක තිබෙන තැන පෙන්වා මාධවී නැවත රිද්මාට එකතු වූවාය. විනාඩි දහයකට පමණ පසු පැට්රික් නැවත ඔවුනට එකතු විය.

"ඉතිං කෙල්ලේ අපි ගිහිං එන්නම්."

"මං කවුද කියලාවත්, මගේ පැමිණීම ගැනවත් ඔයාගේ අලුත් නැදෑයින්ට නොකියනවානම් මං කැමතියි" සමුගන්නා විට පැට්රික් කීවේය.

"හරි හරි පැට්රික්. මං ඒ ගැන කාටවත් කියන්නේ නෑ. මටත් ඔයා ගැන දැන ගන්න ලැබුණ එක ගැන හරි සංතෝසයි. ඒත් මට මේ ප්‍රශ්න නිසා ඔයාට හරියට කතා කරන්න බැරි වුණ එක ගැන කනගාටුයි. මේ ප්‍රශ්න ඉවර වුණාට පස්සේ දවසක අපි හමුවෙමු."

www.sinhalalibrary.com
SL-Unlimited

"බොහොම ස්තූතියි මාධවී."

"ඔය දෙන්නගේ විවාහ ජීවිතේ හිතන පතන හැම දෙයක්ම ලැබිලා සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා" කියමින් ඔවුහු මාධවීගෙන් සමු ගත්හ.

•••

## 16

"දැන් ටිකකට කලින් ඇමතිතුමා කතා කරලා අපේ පරීක්ෂණ කටයුතු ගැන ඇහුවා. මං කිව්වා බොහෝම සාර්ථකව ඒ කටයුතු කෙරිගෙන යන බව" පසු දින පැට්‍රික්ට පැමිණ හැරී කීවේය.

"මම ඊයේ රෑත් මේ ගැන මුල ඉඳලා අගට හිතලා බැලුවා. මට පෙනෙන විදිහට අපට තව සතියකින් විතර මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න බැරි වෙන එකක් නෑ. ආ, ඔය ජයන්තත් එන්නෙ. මිනිහගේ මූණ නම් ඒ තරම් හරි නෑ."

"වැඩේ සාර්ථක වුණාමය කියලා කියන්න අමාරුයි සර්. බොහෝම ටිකයි මිනිහා ගැන දැන ගන්න ලැබුණේ." කියමින් ජයන්ත පුටුවකට බර විය.

"ටික වුණාත් අපට ගුණක් වටිනවා වෙන්න පුළුවන්."

"ජස්ටින් අන්තිමට වැඩ කරලා තියෙන්නෙ දොස්තර සෙනෙවිරත්න කියලා කෙනෙක් ගාව. එයා දැන් විශේෂඥ වෛද්‍යවරයෙක්. මං ගිහින් එයාව හමු වුණා. ජස්ටින් කිව්වාම එයාට ඒ තරම් මතකයක් තිබුණේ නෑ. පස්සේ මං කිව්වා රන්දෙණිගල වලව්වේ නෙල්සන් සූරියබණ්ඩාර කියන දොස්තර කෙනෙක් කතා කරලා රස්සාවට දාපු කෙනා කියලා. එතකොට එයාට මතක් වුණා. එයා කිව්ව විස්තරය මෙකයි."

"ජස්ටින් බොහොම හොඳට අවුරුදු කීපයක්ම මා ළඟ වැඩ කළා. හරි හොඳ එකා. නිවාඩුවක් එහෙම ගන්නෙ හරි කලාතුරකින්. මෙහෙම ඉන්නකොට දවසක් මිනිහා ඇස් දෙකේ කඳුළු පුරෝගෙන මා ගාවට ආවා."

"ඇයි ජස්ටින්?"

"අනේ සර්. හරි වැඩක්නෙ වෙලා තියෙන්නෙ. අපේ නෙල්සන් හාමුගේ මුළු පවුලම විනාශ කරලනේ."

"ඈ..ඈ. කවුද?"

"කවුරු කළාද කියලා දන්නෙ නෑ සර්. මට සති දෙකක නිවාඩු

දන්න. අවසාන කටයුතු කරන්න කෙනෙක් ඉන්නවද දන්නෙත් නෑ."

"ගමට ගිය මිනිහා අවසාන කටයුතු නිම වුණාට පස්සේ ආපහු ආවා."

"සර් මගේ අතින් සරලට වරදක් වුණා නම් සමාවෙන්න එයා කිව්වා."

"නෑ ජස්ටින් අතින් අපට කිසි වරදක් වෙලා නෑ."

"සර් මං රස්සාවෙන් අස්වෙන්න තීරණය කළා."

"ඒ මොකද ජස්ටින්?"

"නෙල්සන් හාමුගේ නංගිව පැහැරගෙන ගිහින්. මට ඒක ගැන හොයන්න ඕනෙ."

"ජස්ටින් මොන වැඩේ කරන්නත් ජීවත් වෙන්න එපායැ. ජීවත් වෙන්න සල්ලි ඕනේ. සල්ලි හම්බ වෙන්න රස්සාවක් කරන්න ඕනේ. ඉතින් රස්සාවේ ඉන්න ගමන්ම ඕක කරන්න බලන්න."

"සල්ලි ප්‍රශ්නයක් නෑ සර්."

"සල්ලි ප්‍රශ්නයක් නෑ?"

"ඔව් සර්. නෙල්සන් හාමු තමයි මට ඒ රාජකාරිය පැවරුවේ. මං බොහෝම සන්තෝසෙන් ඒ වැඩේ බාරගත්තා. ඇරත් පුංචි මැණිකේ ගැන හොයන එක මගේ යුතුකමක්."

"හොඳයි ජස්ටින්. ජස්ටින් මා ගාව හොඳට වැඩ කළා, ඒ නිසා කවදා හරි දවසක ඒ නෝනව හොයා ගත්තොත් ආපහු එන්න. මං රස්සාවට ගන්නම්."

"එදා එදායින් පස්සේ මං ජස්ටින්ව දැක්කේ නෑ."

"එයාට හිටපු යාළු මිත්‍රයින් ගැන එහෙම එයා කවදා හරි කියලා තියෙනවද?"

"නෑ. මිනිහා කතා කළොත් කතා කරන්නේ නෙල්සන් ගැනයි ඒ පවුලේ උදවිය ගැනයි විතරයි."

"එයාට හිටපු යාළු ගෑනු ළමයෙක් ගැන වත් කියලා නැද්ද?"

"හ්ම්. එහෙම කෙනෙක් ගැන දවසක් කිව්වා වගේ මතකයි. ඒත් දැන් නම් මට හරියට නිච්චියක් නෑ. අවුරුදු විසිපහකට විතර ඉස්සර වෙච්ච දේවල්නේ. සුනන්දා... සුනන්දා.. පොඩ්ඩක් මෙහාට එනවද?"

"ඔයාට මතකද අපේ කාරෙසේ දැනට අවුරුදු විසිපහකට විතර උඩදී ජස්ටින් කියලා කෙනෙක් වැඩ කළා."

"ජස්ටින්.. ම්..ම්.. මට ඒ තරම් නිච්චියක් නෑ"

"අර රත්දෙණිගල වලව්ව ගැනයි, නෙල්සන් කියලා මාත් එක්ක ඉගෙන ගත්තු දොස්තර කෙනෙක් ගැනයි නිතරම කියවන හාදයා."

www.sinhalalibrary.com
SL-Unlimited

"ආ.. මට මතකයි. 'උක්කුංඳ කොහෙද කියලාතේ නෙල්සන් අපට අඳුන්නලා දුන්නේ. එයා අපෙන් අස්වෙලා ගියාතේ කා ගැනද හොයන්න තියෙනවා කියලා."

"ඔව් ඔව් මිනිහා තමයි."

"මට එයාව මතකයි"

"එයා යාළුවෙලා හිටපු කෙනෙක් ගැන මොනවා හරි දවසක් කිව්වා නේද?"

"ආ ඔව්. මං මගේ පරණ ඇඳුම් වගයක් විසි කරන්න හදනකොට එයා කිව්වා අනේ මැඩම්, මේ ඇඳුම් හරි හොඳයිනේ. අලුත් ඒවා වගේනේ. මේ ටික මේ ටික.." කියලා එයා ගොඩ ගහන්න වුණා. මං එතකොට ඇහුවා ඇයි ජස්ටින් අඳුරන ගෑණු ළමයෙක් එහෙම ඉන්නවද කියලා. මිනිහා ඇඹරි ඇඹරි ඔව් මැඩම් කියලා කිව්වා. පස්සේ මං ඒ ඇඳුම් එයාට දුන්නා ඒ ළමයට දෙන්න කියලා."

"එයාගේ නම ගම එහෙම කිව්වේ නැද්ද?"

"මං ඇහුවා. එයා මට කිව්වා. ඒත් මට හරියට දැන් නිච්චියක් නෑ. මිනිහා ඒ දවස්වල නැවතිලා හිටියේ මහරගම පැත්තේ. ඒ පළාතේ ගමක නමක් තමයි කිව්වේ, ඒත් මට හරියටම මතක නෑ."

"ඉතින් ඊට වඩා විස්තරයක් අපට හොයා ගන්න ලැබුණේ නෑ."

"හොඳයි. ජයන්තට දැන් තියෙන්නේ මාධවී ගැන හෙවිල්ලෙන් ඉන්න. මට හිතෙන හැටියට එයාගේ ජීවිතේට අනතුරක් වෙන්න හොඳටම ඉඩ තියෙනවා. නන්දනටත්, ජයදේවටත්, විශේෂයෙන් සුදාටත් සැකයක් ඇති නොවෙන විදිහට වැඩේ කරන්න බලන්න."

●●●

"සුදාගේ ගම පමුණුව. ඒකනේ මිනිහට පමුණුවේ සුදා කියලා කියන්නේ. පමුණුව තියෙන්නේ මහරගම පැත්තේ. සමහර විට ජස්ටින් යාළුවෙලා හිටිය කෙල්ලගේ ගම් පමුණුවද දන්නේ නෑ" කියූ හැරී, දොස්තර සෙනෙවිරත්න මහතාගේ බිරිඳට කතා කර ඒ ගැන විමසා බැලුවාය. එය තමාට ඒ තරම් නිච්චියක් නැතත්, එදා ජස්ටින් කීවේ එබඳු නමක් යැයි තමා සිතන බව ඇය ප්‍රකාශ කර සිටියාය.

"මට හිතෙන විදියට ජස්ටින් ඒ ගෑණු ළමයව වළලන්න ඇති. ඒ දෙන්නට ලැබුණ දරුවා සුදා වෙන්න ඕනේ. ජස්ටින්ට බැරි වුණ දේ පුතාට කරන්න කියලා බාර කරන්න ඇති."

"මට හිතෙන විදියට මුලින් කළු මිනී මැරුම් රුවන් බණ්ඩාර කරන්න ඇති. සුරනිමලයගේ මරණයට වග කියන්න ඕන සුදා තමයි.

www.sinhalalibrary.com
SL-Unlimited

සුදා ලව්ව නන්දන ඒ වැඩේ කරගන්න ඇති. හැබැයි නන්දනටත් වරදින්නේ මෙදා තමයි. එයා දන්නේ නැතිව ඇති සුදා කවුද කියලා. කොයිකටත් විමලසිරි ආවාම අපට සුදාගේ විස්තර දැන ගන්න පුළුවන් වේවි."

●●●

## 17

"මං මුලින්ම කලේ බම්බලපිටියේ පොලිසියේ රාළහාමි කෙනෙක් අල්ලගෙන කුරේ මහත්තයා ගැන විස්තර ටිකක් හොයා ගත්තු එක." පසුදින විදෑසන පැමිණි විමලසිරි, ඔහු විසින් සොයා ගන්නා ලද සුදා පිළිබඳ තොරතුරු මෙසේ පවසන්නට විය.

"කුරේ මහත්තයට අයිති බාර් එකක් බම්බලපිටියේ තියෙනවා. ඊට අමතරව එයාගේ සිකියුරිටි ඒජන්සියකුත් තියෙනවා. එතන තමයි එයාගේ මැර හමුදාව ඉන්නේ. ඕනම වැඩකට, ඕනම විදියකට හසුරුවන්න පුළුවන් විදිහේ අය එතන ඉන්නවලු. ඩගී කියලා ඒ බාර් එකට එන කස්ටමර්ස්ලා හොඳටම තට් වුණාම ගෙවල් වලට ගිහින් ඇරලවන ටැක්සි ඩ්‍රයිවර් කෙනෙක් ඉන්නවා. මිනිහව රාළහාමි මට අඳුන්නලා දුන්නා. මම සී අයි ඩී කාරයෙක් කියලා රාළහාමි කිව්වා. "මේ මහත්තයා කිසි දෙයක්, කිසිකෙනෙක්ට ලීක් කරන කෙනෙක් නොවෙයි. බය නැතිව දන්න දෙයක් තියෙනවාම් මහත්තයට කියන්න" කියලා එයා ගියා.

"මොනවද මහත්තයට දැන ගන්න ඕනේ" ඩගී ඇහුවා.

"මට දැන ගන්න ඕනේ, කුරේ මහත්තයා ගාව කාලයක් වැඩ කරපු පමුණුවේ සුදා ගැන."

"මිනිහා හරි හිත හොඳ කොල්ලා. දැන් මිනිහා මෙහේ නෑනේ. නුවර පැත්තේ මහත්තයෙක් ගාවට ගියා. ඉන් පස්සේ කිසි ආරංචියක් නෑ."

"ඒ විස්තර මං දන්නවා. මට දැන ගන්න ඕන මිනිහගේ මෙහේ විස්තර මොනවද කියලා."

"අපේ කුරේ මහත්තයාට රටේ හැම තරාතිරමක පුද්ගලයෝ එක්ක සම්බන්ධකම් තියෙනවනේ. එයා එක්ක සම්බන්ධකම් තිබුණ හමුදාවේ මහත්තුරු කීප දෙනෙකුත් හිටියා. කුරේ මහත්තයා ගාවට එන සමහරු හමුදාවෙන් පැනලා ආපු අය. ඒ ගොල්ලන් ගැන පොලිසියෙනුයි හමුදාවෙනුයි හොයනවා. නමුත් කුරේ මහත්තයා, ඒ

කවුරුත් ආරක්ෂා කරන විදිහ දන්නවා. ඒ හමුදාවේ මහත්තයෙක් තමයි සුදා මල්ලිව අරගෙන ආවේ."

"මෙයා උතුරේ කොටි එක්ක යුද්ද කරලා, ඒ ගැන කලකිරිලා, යුද්දය හිත්ත වෙලා පැනලා ආපු කෙනෙක්. කුරේට පුළුවන් නම් ටික කාලයක් මෙයාව තියාගෙන වැඩක් පලක් කර ගන්න. හැබැයි එක පාරටම ලොකු ගේම්ස් වලට දාන්න එපා. ඒ වගේම ටිකක් හංගගෙන වගේ තියා ගෙන ඉන්න." ඒ මහත්තයා කිව්වා.

"කුරේ මහත්තයා මිනිහට කැමති වුණේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි, මිනිහගේ ඇඟ පත දැකලා. යෝද පැටියෙක් වගේ හොඳ උස මහතයිනෙ. මිනිහව බාර් එකේ වැඩ වලට තමයි ගත්තේ. බාර් එකට එන කස්ටමර්ස්ලා ටිකක් දාගත්තාම සමහර වෙලාවට ඕන නැති පාට් දාන්න එනවා. සුදා ඊගට ගියාම මොන කෙරුම් කාරයත් නිකම්ම නිස්සද්ද වෙනවා. වැඩ පෙන්නන්න ඕන නෑ. ඒත් දවසක් එහාන පොඩි පාට් එකක් දාන්න ආපු කොල්ලො පස්දෙනෙක්ට සුදා මල්ලි තනියම වැඩේ දුන්නා. එදායින් පස්සේ කුරේ මහත්තයා සුදා ගැන තවත් පැහැදුනා. ඇරත් ඌ දන්නවා ඕන කෙනෙකුගේ හිත දිනාගෙන වැඩ කරන්න."

"සුදා මල්ලි මාත් එක්කත් හරි පෑල්. රෑට කෙලින් වෙන්න බැරි තරමට බීලා ඉන්න මහත්තුරු ඉන්නවා. සුදා මල්ලි උන්ව උස්සගෙන ඇවිත් මට බාර දෙනවා."

"ඩගී අයියේ. මේ අපේ හොඳ කස්ටමර් කෙනෙක්. අහවල් තැන මෙයා ඉන්නේ. අද හිතේ අමාරුවකට ටිකක් වැඩි වෙන්න බීලා. ඉතිං මං ගිහින් ඒ මහත්තුරුන්ව ඩ්‍රොප් කරලා එනවා."

"සුදා නුවර ගියේ හදිසියෙන්ම වගේ. ඒ ගිය ගමන් ආපහු ආවා. ඒ ඇවිත් සුමාන දෙකකට විතර පස්සේ ආපහු නුවර ගියා. ඒ යනකොට එයා කියලා ගියේ හරි ලස්සන පලාත. මං ඒ පැත්තට කැමතියි කියලා. පුළුවන් වුණොත් එහේම නවතිනවා කියලා කිව්වා. ඒ කිව්වා වගේම මිනිහා එහේ නැවතුනා. ඔච්චර තමයි ඉතින් සුදා ගැන මට කියන්න තියෙන්නේ."

"සුදා බාර් එකේ වැඩ කළා ඇරුනාම කොන්තරාත් වැඩ කළේ එහෙම නැද්ද?"

"නෑ නෑ, කුරේ මහත්තයා ඒ වගේ දේවල් එයාට දුන්නේ නෑ."

"කුරේ මහත්තයාගෙන් පිට වෙන කවුරු හරි එයාට එහෙම වැඩ පංගනාත කරලා තියෙනවද?"

"මං දන්න හැටියට නම් නෑ."

"එතකොට සුදා නුවර ගියේ එහෙ මහත්තයෙක්ව මරන්න ලැබුණ කොන්තරාත් එකක් ගැන කියන්න නොවෙයිද?"

SL-Unlimited

"ඒක ගැන මගෙන් අහන්න එපා. මමත් වැඩි විස්තරයක් දන්නේ නෑ. සුදා මල්ලිගේ ඕන කමට මාත් හවුල් වෙලා කරපු බොරුවක් ඒක. සුදා මල්ලි කිව්වේ එයාට ටික කාලයක් මේ පළාතෙන් වහං වෙලා ඉන්න ඕනේ නිසා, මේ බොරුව කුරේ මහත්තයට කරනවා කියලා. අපේ කුරේ මහත්තයට නම් මේ ගැන කියන්න එපා."

"මිනිහගේ හරි නම, ගම එහෙම කොහොමද?"

"මිනිහගේ නම බිම්සර. ගම මහරගම පැත්තේ පමුණුවේ. කුරේ මහත්තයා තමයි මිනිහට සුදා කියලා නම තිබ්බේ. මිනිහා අපට වඩා ගොඩක් පාටයිනේ. කලිනුත් අපි ගාව සුදා කියලා කෙනෙක් හිටියා. නම් දෙක පටලැවෙන නිසා තමයි පමුණුවේ සුදා කියලා එයාට නම තිබ්බේ."

"මිනිහාගේ ගම පමුණුව කියලා මං දැනගත්තේ කුරේ මහත්තයා සුදා ගැන කියනකොට පමුණුවේ සුදා කියලා කියන නිසා. එයා කවදාවත් පමුණුවට යනවා කියලවත්, ගමට යනවා කියලවත් ගියේ නෑ. අම්මා, තාත්තා බලන්නවත් එයා යන්න උනන්දුවක් වුණේ නෑ. මිනිහා මාත් එක්ක ගොඩක් දේවල් ගැන කතා කරලා තියෙනවා. ඒත් කිසිමදාක ගෙදර ගැන කතා කරලා නෑ. අඩුගානේ එයාගේ නම බිම්සර කියලාවත් කියලා නෑ. ඒකත් මම දැනගත්තේ ගමේ සුදා එක්ක යාළුවෙලා හිටපු ගෑනු ළමයෙක් මිනිහව හම්බවෙන්න ආපු දවසේ."

"ඒ ගැන විස්තර ටිකක් කියන්න පුළුවන්ද?"

"දවසක් දවල් දහයට එකොළහට විතර සුදා ලස්සන කෙල්ලෙක් එක්ක මගේ ටැක්සියට ආවා. මං එදා සෑහෙන්න පුදුම වුණා. මොකද කවදාවත් සුදා කෙල්ලෙක්ගේ අතින්වත් අල්ලනවා මං දැකලා නෑ. සුදා එක්ක කතාවට වැටෙන්න කැමති අයනම් බොහොම හිටියා. මිනිහා ඒ කිසි දෙයක් නොදන්නවා, නොදැක්කා වගේ තමයි හිටියේ."

"ඔහී අයියේ. මේ නංගිව ගෙදරට ඇරලවලා එන්න."

"සුළු දෙයක්නේ මල්ලි. කොහාටද නංගී යන්නේ?"

"මහරගම පමුණුවට" කියලා උත්තර දුන්නේ සුදාමයි. මං එතකොට තේරුම් ගත්තා ඒ ළමයා සුදාගේ ගමේම ළමයෙක් කියලා.

"ඊට පස්සේ සුදාම පස්ස දොර ඇරලා එයාට නගින්න කිව්වා. එයා ටැක්සියට නැග්ගේ වෙන කරන්න දෙයක් නැති නිසා බව මට තේරුණා."

"මට සමාවෙන්න මහිරි. මේක තමයි මගේ දෛවය. මාව අමතක කරන්න" කියලා සැලෙන හඬකින් කියපු සුදා අනික් පැත්තට හැරිලා යන්න වුණා. සුදා ඒ වගේ බොහොම අහිංසක විදිහට කතා කරනවා මට කවදාවත් ඇහිලා නෑ. මටත් ඒ වචන ටික එයා කියපු හැටියට දුක හිතුනා. ප්‍රේම පරාජයක්. සුදා ද පැරදුනේ. ඒ ළමයද

පැරදුනත් කියලා මට හිතා ගන්න බෑ. මං වාහනේ ස්ටාට් කරලා පිටත් වුණා."

"මං පස්ස බලන කන්නාඩියෙන් ඒ ළමයා දිහා බැලුවා. එයාගේ ඇස් කඳුලින් පිරිලා. එයා සුදා ගිය දිහාව බලනවා. සුදා පේන්න නෑ. එයාට ඉබේටම වගේ ඉකි බිඳුනා. එයා ඇස් දෙක ලේන්සුවකින් වහගෙන ටික වෙලාවක් හිටියා. මං දැක්කා එයා හිත හදාගන්න දරන වෑයම. සුදා ගැන හොඳ මොනවා හරි කිව්වොත් ඒ ළමයාගේ දුක තුනී වෙයි කියලා මං හිතුවා."

"සුදා හරි හොඳ කොල්ලා නංගි. කාගෙත් හිත් දිනාගෙන ඉන්නවා" මං කිව්වා.

"කවුද සුදා කියන්නේ?" ඒ ළමයා පුදුම වෙලා වගේ මගෙන් ඇහුවා.

"දැන් මේ නංගිව පමුණුවට ගිහින් ඇරලවන්න කියලා බාර දීපු සුදා ගැන මං කිව්වේ."

"ආනේ.. එයාගේ නමත් වෙනස් කරලා. එයාගේ නම බිම්සර. කවුද එයාට සුදා කියලා නම දැම්මේ?"

"අපේ බොස් තමයි. නංගි බය වෙන්න එපා. අපේ ජීරියා එකේ මිනිහා හොඳ නමක් තියාගෙන ඉන්නවා. පමුණුවේ සුදා කියන්නේ කවුද කියලා ඒ පැත්තේ නොදන්න කෙනෙක් නෑ."

"එයා එක්ක යාලු ගෑණු ළමයෙක් එහෙම ඉන්නවද?"

"නෑ නංගි. එයා මුළු දවසම ගෙවන්නේ ක්ලබ් එකේ තමයි. කවදාවත් ගෑණු ළමයෙක් එක්ක තනිපංගලමේ කතා කර කර ඉන්නවවත් මං දැකල නෑ."

"එයා බොනවද?"

"අපොයි නෑ"

"ඊට පස්සේ එයා කිසි කතා බහක් නැතිව ගියා. පමුණුවට ආවාට පස්සේ මං ඒ ළමයාගෙන් ඇහුවා ගෙදර කොහේද කියලා. එයා මට පාර කිව්වා. මං ගේ ගාවින් ඒ ළමයව බැස්සුවා. "ඩගී අයියට බොහොම ස්තූතියි කියලා ඒ ළමයා බැහැලා ගියා."

"මං ඉතින් ටිකක් ලොකු ගානක් දෙන්න පොරොන්දු වෙලා ඩගීව කැමති කරගත්තා ඒ ගෑණු ළමයා ඉන්න ගෙදර පෙන්නන්න කියලා. මට ඒ ළමයත් එක්ක ටිකක් කතා කරන්න ඕන කියලා මං කිව්වා."

"පසුවෙනිදා උදෙන්ම ඩගී මාත් එක්ක ඒ ළමයා ඉන්න ගෙදරට. ඩගී ගිහින් දොරට තට්ටු කළා. එයාගේ අම්මා තමයි දොර ඇරියේ."

"මට මිහිරිට කතා කරන්න පුළුවන්ද?" මං ඇහුවා.

"එයාගේ අම්මා ඩගීගේත් මගේත් හිසේ ඉඳලා පාදාන්තය දක්වා හොඳට බැලුවා. ඊත් අම්මා මුකුත් ප්‍රශ්නයක් අහන්නවත්, කතා

කරන්නවත් ඉස්සරවෙලා මිහිරි ඉස්සරහට ආවා."

"ආ ඩගී අයියේ. මොකද මේ හදිසියෙන්ම? බිම්සරට කරදරයක්ද?"

"නෑ නෑ නංගී. බිම්සර මල්ලි හොඳින් ඉන්නවා. මේ බිම්සරගේ යාළුවෙක්."

"අයියලා ඇවිත් ඉඳගන්න."

"හැබෑටම මොකද මේ බිම්සර පුතාට වෙලා තියෙන්නේ. අවුරුදු ගානකින් ගමට ආවෙත් නෑ. අම්මා බලන්නවත් අවුරුද්දකට සැරයක් එන්න එපායැ."

"බිම්සර පොඩි වැඩක් භාරගෙන තියෙනවා ඇන්ටි. ඒක තමයි එයා කරන අන්තිම පොබ් එක. ඒක ඉවර කරපු ගමන් එයා එනවා කියලා මිහිරිට කියන්න කිව්වා."

"ඔය ඇත්තමද අයියේ? එතකොට අයියලා දන්නවද බිම්සර දැන් ඉන්නේ කොහේද කියලා?"

"ඔව් නංගී. මං කොළඹ එන බව කිව්වාම බිම්සර කිව්වා නංගීවත් හමුවෙලා දුක සැප දැන ගන්න කියලා. මෙන්න මේකත් දුන්නා" කියලා අපි මහරගමින් ගත්තු සාරියක්, බිම්සර දීපු එකක් විදිහට එයාට දුන්නා.

"අනේ ඔය ඇත්තමද අයියේ" කියලා මිහිරි හරිම අහිංසක විදිහට හිනා වෙලා ඒක භාර ගත්තා. එයාව ඒ විදියට රවටන්න වෙච්ච එක ගැන මට දුකත් හිතුනා.

"ඔය ළමයින්ට තේ එකක්වත් හදාගෙන එන්නම් කියලා එයාගේ අම්මා කුස්සිය පැත්තට ගියා. එතකොට මං හඬ පාත් කරලා එයාට කිව්වා, මිහිරි, ඔයාට කියන්න වැදගත් යමක් තියෙනවා. මෙතන අම්මා ඉන්න නිසා ඒක කියන්න බෑ. මොකක් හරි කියලා පොඩ්ඩක් එළියට එන්න. අපි ඉස්සරහ නැවතිලා ඔයා එනකම් ඉන්නම් කියලා. එයා ගොළුවෙලා, භ්‍රාන්ත වෙලා වගේ මා දිහා බලාගෙන හිටියා."

"නංගී බයවෙන්න එපා. එයාට කිසි අනතුරක් වෙලා නෑ. එහෙම වෙන්න ඉස්සරවෙලා එයාව බේරගන්න තමයි අපි හදන්නේ. ඒකට නංගී උදව් කරන්න ඕනේ."

"එයාට මුකුත් කරදරයක් වෙලා නැතේ."

"නෑ නෑ. එයා හොඳින් ඉන්නවා."

"මං කතාව එතනින් නැවැත්තුවා අම්මා ආපු නිසා. බිම්සර දැන් නුවර පැත්තේ වත්තක මැනේජර් වැඩක් කරනවා. නමුත් පොඩි ප්‍රශ්න වගයක් නිසා ටික කාලයක් වහංගු වෙලා ඉන්න තියෙනවා කියලා අම්මවත් රැවැට්ටුවා. තේ එක බිව්වට පස්සේ අපි ආපහු ටැක්සියට ඇවිත් පාර ඉස්සරහ ටිකක් ඈතට වෙන්න නවත්තගෙන හිටියා. ඒ නංගී අපි ඉන්න තැනට ආවා. මං එයාට ටැක්සියට නගින්න දොර

ඇරියා. එයා ටැක්සියට නැග්ගා."

"පරක්කු වෙනකොට මං හිතුවා මිහිරි අපට බය වෙලා නැවතී හිටියවත්ද කියලා මං කිව්වේ මොනවා හරි කියන්න හිත නිසා."

"අයියලා බිම්සර ගැන දන්නවා නේද?" එයා ඇහුවා.

"ඔව්"

"බිම්සර ගැන දන්න කෙනෙක් මට හිරිහැරයක් කරන්න ඉදිරිපත් නොවෙන බව මං දන්නවා." එයා කිව්වේ ටිකක් ආඩම්බරෙන් වගේ.

"ඉන් පස්සේ එයා හොඳට හරි බරි ගැහිලා කාර් එකේ පස්ස සීට් එකේ ඉඳ ගත්තා."

"ඉතින් අයියේ? මොනවද බිම්සරගේ තොරතුරු. මට දැනගන්නකම් ඉස්පාසුවක් නෑ."

"බිම්සර හොඳින් ඉන්නවා නංගි. හැබැයි එයා කෙනෙකුගේ උගුලකට අහුවෙන්න ළං වෙලා ඉන්න බව මට පේනවා. එයාව බේරගන්න නම් අපට බිම්සර ගැන විස්තර ටිකක් දැන ගන්න ඕනේ. බිම්සර දිහා බලපුවාම, එයා එක්ක කතා කළාම එයා හරි වැදගත් පවුලක, වැදගත් ළමයෙක් බව පේනවා. එහෙම ළමයෙක්, ඔය විදියට කාගෙවත් උගුලකට අහුවෙලා අමාරුවේ වැටෙන්න ඉඩ දෙන්න බෑ. ඉතිං එයාව ඔය උගුලෙන් බේරගන්න අපට එයාගේ අතීතය දැනගන්න ඕන. එයා කාගෙ කවුද, කියලා දැන ගන්න ඕනේ. ඒ විස්තර ටික හරියට කිව්වොත් අපට බිම්සර එක්ක කතා කරලා එයාව බේරගන්න පුළුවන්."

"අයියා බිම්සරගේ යාළුවෙක් කිව්වා නේද?"

"නෑ නංගි. මං ඒ වුණත් බිම්සර ගැන ගොඩක් දේවල් දන්නවා. මං සී අයි ඩී කාරයෙක්. මං මගේ හැඳුනුම් පත එයාට පෙන්නුවා."

"නංගි උදව් කළොත් අපි බිම්සරට කිසි අනතුරක් වෙන්න නොදී එයාව ගෙදරට එක්කරගෙන එනවා."

"හොඳයි. එහෙනම් මං දන්න දේවල් කියන්නම්" ඒ ළමයා සන්සුන් වෙලා කියන්න වුණා.

"බිම්සරගේ ගෙවල් තියෙන්නෙත් අපේ ගෙවල් ගාවමයි. පුංචි කාලේ ඉඳලම මං එයාව දන්නවා. බිම්සරගෙ මල්ලි බින්දු මගේ වයසෙමයි. මාත් එක්ක එකට ගමේ ඉස්කෝලෙට ගියා. බිම්සර ඊට වඩා අවුරුදු දෙකක් වැඩිමල්. ඒත් බිම්සර අපේ ගමේ ඉස්කෝලේ නොවෙයි ඉගෙන ගත්තේ. රාජකීය විද්‍යාලයේ."

"බිම්සරත් එක්ක යාලු වෙන්න උත්සාහ නොකරපු ගෑණු ළමයෙක් ඒ අපි හිටපු පළාතේ හිටියේ නෑ. ඒ විතරක් නොවෙයි එයා ගිය ටියුෂන් පන්තියෙත් කෙල්ලො කීප දෙනෙක්ම එයත් එක්ක යාළු වෙන්න ඇවිත් තියෙනවා. එයාගේ කඩවසම් පෙනුමත්, ගති ගුණත

www.sinhalalibrary.com
SL-Unlimited

ඒකට හේතු වෙන්න ඇති. මටත් එයා එක්ක යාළුවෙන්න ඕනේ වගේ හැඟීමක් නාවා නොවෙයි. ඒත් එයා එක්ක යාළු වෙන්න ගිය කීප දෙනෙකුටම දුක වේදනාව හිමි කරගෙන අතරමඟ නවතින්න වුණ නිසා මං ඒ හැඟීම කොහොම හරි යටපත් කර ගත්තා."

"බිම්සර පවුලේ අයටත්, පවුලේ අය බිම්සරටත් හුඟක් ආදරෙන් හිටපු බව මට බින්දු කියපු දේවලින් තේරුම් ගිහින් තිබුණා. කාට හරි අසාධාරණයක් වෙනවා පේනවා නම්, එයාට බලාගෙන ඉන්න බෑ. ඒ නිසා එයා රණ්ඩුවලට පැටලුන වාර අනන්තයි."

"අපි දෙන්න යාළුවුණේ හරිම පුදුම විදිහකට. එදා විශුණත් පන්තියට ගිහිං පුරුදු වෙලාවට මං බස් හෝල්ට් එකට ආවා. බිම්සරත් ඒ වෙලාවෙ බස් නැවතුම් පලේ හිටියා. මා එක්ක එයාගේ ලොකු අඳුනුම් කමක් තිබුණේ නැතත්, මිල්ලගෙයි මගෙයි තිබුණ අඳුනුම් කම නිසාත්, ගමේ කම නිසාත් එයා මට කතා කළා. ඒ කිට්ටුව ඉන්න එයාගේ යාළුවෙක් හම්බ වෙන්න ආ බවත්, යාළුවා ගෙදර නොසිටි නිසා ආපහු යන බවත් එයා කිව්වා."

"ඒ වෙලාවෙ අපේ විශුණන් පන්තියට එන තව ළමයෙක්, සේපාල, එයාගේ යාළුවො කීප දෙනෙකුත් එක්ක බස් නැවතුම් පලට ආවා. සේපාල මා ගැන බොහොම උනන්දු බව මට තේරිලා තිබුණා. ඒත් මං එයාට කැමති නෑ. නමුත් එයා මට විහිළු කරන එකත්, පස්සෙන් එන්න හදන එකත් නැවැත්තුවෙ නෑ."

"මායි, බිම්සරයි කතා කර කර ඉන්න හැටි දැක්කාම එයාට ඉරිසියාවක් ඇති වෙන්න ඇති. "පන්තියේ ඉන්නේ නම් විසාකා මහ උපාසිකාව වගේ" සේපාල කිව්වා. ඒක කිව්වෙ මට බව මම තේරුම් ගත්තා. ඒත් බිම්සරට ඒක තේරුණේ නෑ."

"අපි ඉතිං කලුයි නේ" ටික වෙලාවකට පස්සේ එයා කිව්වා. ඒ ඉතිං බිම්සර පාට නිසා වෙන්න ඇති."

"එතන හිටපු එක ළමයෙක් දැනගෙන ඉන්න ඇති බිම්සරගේ තාත්තා මැද පෙරදිග වැඩ කරන බව. ඒ ළමයා මොකක් හරි සේපාලගේ කනට කරලා කිව්වා. ඉන් පස්සේ සේපාල කිව්වා "අපේ තාත්තලා ඉතිං ඩුබායි ගිහින් අරාබින්ට පක්කිලිකම් කරලා එන්නෙ නැනේ" කියලා. එතකොට බිම්සරගේ අවධානය එයා දිහාවට යොමු වුණා."

"තංගී. මෙයාලා මේ අපටද හින්ට් ගහන්නේ?" බිම්සර මගෙන් ඇහුවා. ඒක ඇහුවෙ මගෙන් උනාට උත්තර දුන්නේ සේපාල."

"තොට තමයි යකෝ මං කිව්වේ" කියලා එයා බය නැතිව කිව්වෙ යාලුවෝ හතරදෙනෙක් හිටි නිසා ඒ අයගේ හයියත් ඇඟට අරගෙන වෙන්න ඇති. බිම්සරගේ මූණ රතු වුණා. එයා අතේ තිබුණ සරසර බෑග් එක බිමින් තිබ්බා. එයා රණ්ඩුවට යාවි කියලා

SL-Unlimited

බයවෙලා මං එයාගේ අත් දෙකෙන් අල්ල ගත්තා."

"එපා එපා බිම්සර අයියේ" මං කිව්වා. එයා මගේ මූණ දිහා බලලා මගේ මූණේ තියෙන බය තේරුම් ගන්න ඇති. එයා ගේ මූණට හිනාවක් ආවා. පල් හිනාවක්. එයා හිනා හඬින්ම කිව්වා "බල්ලො බුරන එක ඉවසන්න පුළුවන් නංගී. ඒත් දැන් නරිත් බුරන්න පටන් අරගෙන නේ" කියලා.

"කාටද යකෝ තෝ නරියා කිව්වේ" කියලා සේපාල ඇවිත් බිම්සරගෙ කොලර් එකෙන් ඇල්ලුවා."

"එහෙම ගැහිල්ලක් මං ජීවිතේටම දැකල නෑ. බිම්සර අයියගේ අත් දෙක චට පට ගාලා එහාට මෙහාට යනවා. ඒ කිසිම පාරක් අහක ගියේ නෑ. අරුගේ උදව්වට යාලුවෝ හතර දෙනාත් ආවා. එතකොට වුණේ කකුල් දෙකත් එහාට මෙහාට විසි වෙන එකයි, ඒ විසිවෙන ගමන් දෙන පාරවල් අරුන්ගේ මූණුවල, ඇගේ කොතනක හරියි ගැටෙන එකයි විතරයි. බිම්සරගෙන් බේරෙන්න බැරි බව දැනගත්තාම අර යාළුවෝ පොතුත් අරගෙන පැනලා දිව්වා. බිම්සර බිම වැටිලා හිටපු සේපාලගේ කොලර් එකෙන් අල්ලලා ඉස්සුවා. උස්සලා බිම ඇන්නා."

"තෝ නරියෙක් නේද?" බිම්සර ඇහුවා.

"එයාට යන්න දෙන්න" මං කිව්වා.

"තෝ නරියෙක් නේද?" බිම්සර ආයෙත් ඇහුවා. සේපාලගේ මූණ කේන්තියෙන් පුපුරණවා. ඒත් එයාට කිසිම දෙයක් කරන්න හයියක් නෑ.

"මං බිම්සරව අහකට ඇදලා ගත්තේ නැත්නම් එයාගේ මූණ තව සැරයක් බිම අනින්න තිබුණා. සේපාල නැගිට්ටාම බිම්සර දීපු පා පහර නිසා ආයෙමත් විසිවෙලා ගිහින් බිම වැටුණා."

"ආයෙත් එහෙම තෝ මේ ටියුෂන් පන්තියට ඇවිත් ගෑණු ළමයින්ට විහිලු කරලා අහුවෙන්න එපා බිම්සර කිව්වා. පොත් ටිකත් අහුලගෙන එයා ගියා ගියාමයි ආයෙත් ඒ ටියුෂන් පන්තියට ආවෙත් නෑ. මං ඊට පස්සේ එයාව දැක්කෙත් නෑ."

"කමිසේ බොත්තං දෙකක් කැඩිලා තිබුණා ඇරුණාම බිම්සරගේ ඇගේ සීරීමක් වත් නෑ."

"බස් එකක් ආවාම අපි දෙන්නා බස් එකට ගොඩ වුණා. බස් හෝල්ට් එකේ හිටපු අයත් අපි නගිනකම් බලං හිටියේ හරියට වීරයෝ දෙන්නෙක් දැක්කාම කරන සැලකිල්ලක් විදියට වගෙයි. මං ඉඳගත්තාම බිම්සරත් මගේ ආසනේ ඉඩ තිබුණ පැත්තකින් වාඩිවුණා."

"නංගී අද හොඳටම බය වුණා නේද?" එයා ඇහුවා.

"නෑ. මං පොඩ්ඩක්වත් බය වුණේ නෑ. බිම්සර අයියා ළඟ පාත ඉන්නකොට ඇයි මං බය වෙන්නේ?" මම කිව්වා.

SL-Unlimited

"එයා මාව විනිවිද යන බැල්මක් හෙලුවා. කිසිම පිරිමි ළමයෙක් මා දිහා එහෙම බලලා නෑ."

"අයියා දැන් මොනවද කරන්නේ?"

"මම හමුදාවට බැඳෙන්නයි ඉන්නේ."

"හමුදාවට බැඳෙන්න? ඒ ඇයි?"

"මාමා කිව්වා දැන් හමුදාවට බැඳෙන්න කල් හරි කියලා."

"මාමට ඕන විදිහට ඇයි ඔයා වැඩ කරන්නේ?"

"නෑ මිහිරි. මාත් හරි ආසයි හමුදාවට බැඳෙන්න."

"එතකොට උතුරට යන්න වෙයිනේ. එතකොට යුද්ධ කරන්න වෙච්චනේ."

"එයා හිනා වුණා. නංගි ගුරුවරයෙක් වුණොත් උගන්වන්න වෙනවා වගේ හමුදාවට බැඳුනොත් යුද්ද කරන්න වෙනවා. යුද්ද කරන්න වෙන්නේ නැත්නම් හමුදාවට බැඳෙන්නේ මොකටද?"

"ඔයාට බය නැද්ද?"

"නෑ" එයා හිනාවෙලා කිව්වා.

"මිහිරි නංගි මගේ ළඟට වෙලා ඉන්නකොට මං යුද්ධ කරන්න බය නෑ" එයා කිව්වා. "ඔයා හැමදාම මගේ ළඟට වෙලා ඉන්නවා නේද?" එයා විහිළුවක් කළා කියලයි මං හිතුවේ.

"අයියා විහිළු කරනවා" මං එයාට කිව්වා. ඒ එක්කම එයා ඒක ඇත්තටම ඇහුවා නම් කොයි තරම් හොඳද කියලත් මට හිතුනා."

"අපේ ගේ පහුකරගෙන තමයි එයාලගේ ගෙදරට යන්න තියෙන්නේ. එයා සමුගන්න කොට මට කිව්වා අර මං බස් එකේදී අහපු ප්‍රශ්නෙට හිතලා බලලා උත්තරයක් දෙන්න කියලා. මොන ප්‍රශ්නෙද අයියේ කියලා මං ඇහුවම එයා හිනාවෙලා අත වනලා මගෙන් සමු ගත්තා. ගෙදර ගියාට පස්සේ තමයි මට එයා අහපු ප්‍රශ්නේ තේරුණේ. මට පුදුම හිතුනා. අච්චර හැඩ වැඩ ඇති ගෑනු ළමයි එයා එක්ක යාළු වෙන්න එන්න දඟලද්දී, එයාට මා ගැන හිතක් ආවේ කොහොමද කියලා."

"අපේ සම්බන්ධෙට අම්මලාගෙන් කිසිම විරුද්ධත්වයක් ආවේ නෑ. ඒ වුණත් අපේ සම්බන්ධකම වැඩි දවසක් තිබුණේ නෑ. එක පාරටම බිම්සර අයියා ආගිය අතක් නැති වුණා."

"එතකොට බිම්සරගේ තාත්තා ඉන්නේ මැදපෙරදිග."

"ඔව්. මතක ඇති කාලෙක ඉඳන් එයා හිටියේ මැදපෙරදිග. එයා හැම අවුරුද්දකට සැරයක්ම ලංකාවට එනවා. දැනට අවුරුදු ගානකට විතර උඩදී එයා රට ගිහින් ඇවිත් ආපහු ගියා. ඒ ගියා ගියාමයි එයා ගැන කිසිම ආරංචියක් නෑ. ගෙදර අය ඒ ගැන බොහොම දුකෙන් ඉන්නේ. මාමා ආ ගිය අතක් නෑ කියන ආරංචිය ඇවිත් වැඩි

www.sinhalalibrary.com
SL Unlimited

කාලයක් යන්න ඉස්සර වෙලා තාත්තා ගැනත් කිසිම ආරංචියක් නැතිව ගියා."

"කවුද එයාගේ ඔය මාමා කියන එක්කෙනා?"

"එයා යුධ හමුදාවේ මේජර් කෙනෙක්. මාමා කියලා එයා කියන්නේ, නෑ කමක් හින්දා නොවෙයි. තාත්තාගේ මිත්‍රයෙක් නිසා. ඒ අංකල් බිම්සරට හරි ආදරෙයි. බිම්සරට මාමා යමක් කිව්වොත් ඉන් එහාට කිසි දෙයක් එයා පිළිගන්නේ නෑ. මාමාම තමයි එයාට හිටපු වීරයා. එයා හමුදාවට බැඳුනෙත් මාමා නිසා වෙන්න ඕනේ."

"මාමාගේ නම ගම එහෙම දන්නවාද?"

"මාමාගේ ගම මාවනැල්ල. සමහරවිට අයියලා අහලාත් ඇති, මේජර් රුවන් බණ්ඩාර ගැන."

"පියාගේ නම?"

"ජස්ටින් සූරියගේ."

"එයාගේ තාත්තා මැදපෙරදිග හිටියා කියලා කවුද කිව්වේ?"

"බිම්සරත් කිව්වා. ගමේ කවුරුත් කියන්නේ ඒක තමයි."

"එයාගේ ගෙදර ඇඩ්රස් එක දෙන්න පුළුවන්ද?"

"ශා මම දෙන්නම් කියලා එයා ඇඩ්රස් ඒක කියලා, ඒ ගොල්ලන්ගේ ගෙදර ඉඳන් එහාට යන විදියත් මට කිව්වා. ඒ ඔක්කොම කිව්වට පස්සේ එයා කිව්වා දැන් මගේ වාරේ. මට කියන්න දැන් බිම්සර ඉන්නේ කොහේද? එයා කරදරයක් නැතිව ඉන්නවද? කියලා"

"එයා හොඳට ඉන්නවා. ඉන්න තැන කවුරුත් එයාට හොඳට සලකනවා. ඒ වුණත් එයා ඉන්න තැන හරි නෑ. නරක මිනිස්සු ඉන්න කල්ලියකට මිනිහා වැටිලා ඉන්නේ. නරක මිනිස්සුත් එක්ක ඉන්නකොට හොඳ මිනිහත් නරක් වෙනවා. නරක වැඩ කරනවා. ඒවා හැමදාම කර කර ඉන්න පුළුවන් වැඩ නොවෙයි. දැන්ම එතනින් අයින් නොවුණොත්, එයා ලොකු අමාරුවක වැටෙනවා. නංගිට පුළුවන් නම් බිම්සරට ලියුමක් ලියලා දෙන්න. එයා කරන වැඩ ගැන ආරංචියක් ලැබුණා, ඔය අයගෙන් ඈත්වෙලා ආපහු ගෙදර එන්න කියලා, මම ඒක බිම්සරට ලැබෙන්න සලස්වන්නම්."

"මං එන්නම් අයියලත් එක්ක බිම්සර ඉන්න තැනකට. මට හොඳට විශ්වාසයි එයා මං කියන එක අහවි කියලා."

"එයා ඉන්න තැනට ඔයා යන එක හරි නෑ. අපේ වැඩත් ඔක්කොම අප්සෙට් යනවා. ඔයා එදා ක්ලබ් එකට ගිය එක ගැනත් එයා ඒතරම් සතුටු නෑ නේද? ඔයා ලියුමක් ලියලා දෙන්න."

"එයා අපට ලියුමක් ලියලා දුන්නා. ඒ ලියුමත් මේ ෆයිල් එකේ. ඊට පස්සේ අපි එයාව මහරගමට ගෙනල්ලා ඇරලුවා. එයාට යන්න

දීලා ටික වෙලාවකට පස්සේ මමත් ඒ පැත්තට ගියා. මට ඕන වුණේ බිම්සරගෙ ගෙදරට ගිහින් ජස්ටින් ගැන යමක් දැනගන්න."

"මං ගිහින් ඒ ගෙදර දොරට තට්ටු කළාම ජස්ටින්ගේ නෝනා දොර ඇරියා."

"මට ජස්ටින්ව හම්බ වෙන්න පුළුවන්ද?" මම ඇහුවා.

"එයා මැද පෙරදිග ගිහින්"

"එහෙනම් එයා ඉන්න තැන ලිපිනය දෙන්න පුළුවන්ද?"

"මහත්තයා කියලා තියෙනවා ඒක කාටවත් දෙන්න එපා කියලා" එයා ගත් කටටම කිව්වා.

"එයා ඊත්තර දුන්නෙත් ඕනෑවට එපාවට වගේ. එයාගෙන් ඊට වඩා යමක් දැන ගන්න නොලැබෙන බව මට තේරුම් ගියා. මං ආපහු ආවා."

"විමලසිරි සෑහෙන වටින ආරංචි ටිකක් අරගෙන ආවේ. දැන් මං හිතන්නේ අපේ පරීක්ෂණය අවසාන වෙන්න බොහොම ළඟයි. නමුත් එතෙක් වෙන කාටවත් කදරයක් වෙන්න ඉඩ තියන්න හොඳ නෑ. මං ජයන්තව යැව්වා මාධවී ගැන හෙවිල්ලෙන් ඉන්න කියලා. එයා නුවර හෝටලයක නතර වෙලා ඉන්නවා. ඔයත් ගිහින් ජයන්තට එකතු වෙන්න. මොකක් හරි සැකයක් ඇති වෙන විදිහේ දෙයක් වුණොත් එහෙම, වහාම මට දැනුම් දෙන්න."

●●●

"දැන් ඔන්න පැට්රික් ආයෙමත් ඔයාගේ වාරේ. ඔයාට ඒ මනුස්සයාගෙන් ඇත්ත දැන ගන්න පුළුවන් වේවි. ජස්ටින් අප්පච්චිට බොහොම ලැදිව හිටියා. ඒ බව ඒ මනුස්සයත් දන්නවා ඇති. ඉතිං ඔයා අප්පච්චිගේ නම පාවිච්චි කළොත්, අපට ඒ විස්තරේ දැන ගන්න පුළුවන් වේවි. එතනින් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම නිරාකරණය කරගන්නත් බැරි වෙන එකක් නෑ."

"අංකල් හිතනවද එයා මට ඒ විස්තර කියාවි කියලා?"

"ඔව්. එයා කියාවි. මට ඒක හොඳටම විශ්වාසයි."

●●●

## 18

පැට්රික් දොරට තට්ටු කළ විට මැදිවියේ කාන්තාවක් දොර විවෘත කළා ය. ඇය විමසුම් සහිත බැල්මක් ඔහු වෙත හෙළුවා ය.

"මට මාගරට් නැන්දව හමුවෙන්න පුළුවන් ද?"

"මට නමයි මාගරට් කියන්නේ. මහත්තයා කවුද?"

"මම කවුද කියලා එමෙහෙම කියන්න බෑ. මට ඔයේ නැන්දත් එක්ක ටිකක් කතා කරන්න."

"එන්න ඇතුලට මහත්තයා."

විසිත්ත කාමරයේ අසුන් ගත් පැට්‍රික්ගේ දෙනෙත් සුළු මොහොතකින් මුළු කාමරය පුරාම දිව ගියේය. එය සාමාන්‍ය තත්වයේ කෙනෙකුගේ නිවසකට වඩා විශාල බවත්, තිබූ භාණ්ඩ පවා ඉතා අනර්ඝ තත්වයේ ඒවා බවත් ඔහු තේරුම් ගත් නමුත් වැඩි පුරම ඔහුගේ සිත ඇදී ගියේ බිත්තියේ රාමු කර එල්ලා තිබූ පවුලේ පින්තූර වෙතය. ඒ අතර සිය පියාණන් රට හැර යන දා ගත්, තම නිවසේ තිබූ ඡායාරූපයට සමාන ඡායාරූපයක්ද විය. දැන් ඔහුට තමා කවුදැයි හඳුන්වා දීම පහසුය.

"මං නැන්දා කියලා කතා කළාට කමක් නැහැනේ."

"ඒකට කමක් නෑ මහත්තයා."

"මට මහත්තයා කියලා කතා කරන්න එපා. පුතා කියන්න. නෑ කමත් එකම නේ."

"මට තේරෙන්නේ නෑ මහත්තයා. ඇත්තටම මහත්තයා කවුද කියලා මට අඳුන්නලා දෙනවද?"

"මගේ තාත්තා ජස්ටින් අංකල් ගැන හුඟාක් දේවල් කියලා තිබුණා. හැම තිස්සෙම ජස්ටින් අංකල් ගැන කියනකොට එයාගේ දෙනෙත් දීප්තිමත් වෙනවා" මාගරට්ගේ මුහුණෙහි ඇති වන ප්‍රභාවය දුටු විට, තමා බොරු කතා ගෙතීමෙහි දක්ෂයකු බව ඔහුගේ මිතුරන් කියන කියමන් බොරු නොවන බව ඔහු අවබෝධ කර ගත්තේ ය.

"ලංකාවෙදී මට හිටපු එකම හිතවතා ජස්ටින් තමයි. අපි දෙන්නා අතර පුංචි කාලේ ඉඳලම තිබුණේ පුදුම බැඳීමක්. මං රට යන දවසේ එයාට කිව්වා, අපි දෙන්නා අතරේ තියෙන්නේ බොහොම සුලු වෙනසයි කියලා. බොහොම සුලු වෙනසයි. අපි දෙන්නටම හිටියේ එකම තාත්තා කෙනෙක්. ඒ වුණාට අම්මලා දෙන්නා වෙනස් එච්චරයි" කියලා අප්පච්චි කියනවා.

"මහත්තයා කියන්නේ කවුරු ගැනද කියලා මට නිච්චියක් නෑ. මහත්තයාගේ තාත්තා කවුද?"

"නැන්දට ජස්ටින් අංකල් කියලා ඇතිනේ රත්දෙණිගල වලව්ව ගැන."

ඇය තිගැස්සුනා ය. ඇගේ දෙනෙත් දීප්තියෙන් බබලන්නටද විය.

"නැන්දා දන්නවා. එතකොට නැන්දා දන්නවා ඇති නේ නෙල්සන් සූරියබණ්ඩාර කියන්නේ කවුද කියලා. ඒ මගේ අප්පච්චි."

SL-Unlimited

"හා..ඊ. මහත්තයා. කෝ කෝ නෙල්සන් හාමු කොහෙද ඉන්නේ?"

"අප්පච්චි දැනට මාස හතරකට විතර උඩදී නැති වුණා. අපි නොදන්න කෙනෙක් එයා නිදාගෙන ඉන්නකොට වෙඩි තියලා මරලා තිබුණා."

"අනේ මහත්තයෝ මොකද අපට මේ වින්නැහිය වුණේ?"

"නැන්දේ. ඒ ගැන දුක් වෙන්න එපා. මං ආවේ නැන්දට පුළුවන් උදව්වක් කරලා යන්න. ඒ උදව්ව කරන්න නම් නැන්දා මට ඇත්ත කියන්න ඕනේ. ජස්ටින් අංකල් මැද පෙරදිග ගියේ නෑ නේද?"

"මහත්තයාගේ මූණ දිහා බලාගෙන මම කොහොමද බොරු කියන්නේ? මහත්තයා හිතුවා හරි."

"ජස්ටින් අංකල්ට මොකද වුණේ?"

"මහත්තයා හිටි ගමන් අතුරුදහන් වුණා. කොහේ හිටියත් අවුරුද්දට නෑගි බෝග පුරවගෙන එන මහත්තයා එක පාරටම ගමට නැවිත් හිටියා. හැබැයි එහෙම වෙන දවසක් එවි කියලා මට එයා කියලා තිබුණා."

"මගේ මේ කකුල් දෙකට පණ තියෙන කල්, මං ඔයාවත්, පුතාලා දෙන්නවත් බලන්න, හැම අවුරුදු නිවාඩුවකට එනවා. මට අයහපයක් වගේ තියෙනවානම් මං කලින් දැනුම් දෙනවා. එහෙම මොකවත් නැතිව මම නැවිත් හිටියොත්, මං මළා කියලා හිතාගන්න" ජස්ටින් මීට වසර කීහිපයකට පෙර කී ඒ වදන් සිහි වී ඇය කඳුළු සලන්නට වූවා ය.

"ජස්ටින් අංකල් ඒ ගමට ඇවිත් ගෙවන මාසය ඇරැනාම ඉතුරු දවස්වික මොනවද කළේ?"

"ඒ ගැන මගෙන් අහන්න එපා මහත්තයා."

"මම ඒ ගැන නොදැන අහනවා නොවෙයි. මියුරියල් නැන්දාට කරපු දේට, ඒ කරපු අයගෙන් පළිගන්න එයා වැඩ කළා. ඒත් ඇයි නැන්දේ, එයා ඒ තරම් දරුණු වැඩකට අත ගැහුවේ."

"ඇයි මහත්තයාට අප්පච්චි ඒ ගැන කියලා නැද්ද?"

"නෑ මට කිසි දෙයක් කියලා නෑ."

"මට හිතාගන්න පුළුවන්. මේවා සමහරවිට නෙල්සන් හාමු, මහත්තයලටත් කියන්නෙ නැතුව ඇති. හාමු අවසාන වතාවට ලංකාවට ආපු ගේතුව මහත්තයා දන්නෙ නැතුව ඇති. ඒ ආවේ එයාගේ දෙමව්පියන්ගේ අවමඟුලට. ඒ ඇවිත් අතුරුදහන් වෙලා හිටිය කුමාරිහාමිව හොයන්න හාමු හරි වෙහෙසක් ගත්තා. ඒත් වැඩක් වුණේ නෑ. එයා අන්තිමට ඒක ජස්ටින්ට බාර දුන්නා. ඒ වෙනුවෙන් යන වියදම් වශයෙන් හැම මාසයකට හාමු සැහෙන මුදලක් එයාගේ නමට එවන්න වුණා. ජස්ටින් නැති වුණාට පස්සෙත් නොදන්න කමට

මහත්තයා සල්ලි දිගටම එවලා තිබුණා. මට ඒ බවක් දැනුම් දෙන්න විදිහක් තිබුණෙත් නෑ. දැන් මාස තුනක විතර ඉඳලා කිසිම මුදලක් ඇවිත් තිබුණේ නෑ. එතකොට මට හිතුනා ඒ මහත්තයට අනතුරක් වෙලා ඇතිය කියලා."

"නැන්දේ. මට ඒ විස්තර ඔක්කොම දැන ගන්න ඕනෙ. කරුණාකරලා මට ඒ ගැන කියන්න පුළුවන් ද?"

"නෙල්සන් හාමු මුලින් ලක්ෂයක් දීලා ගියා. විල්සන් හාමු, වලව්ව විකුණලා ගත්තු සල්ලි, ඒවායින් එයාගේ නංගිගේ අනාගතේ ලස්සන කරන්න එයා හිතං හිටියා. ඒක වැරදුනාම ඒ සල්ලිත් අපේ මහත්තයට පුන්නා කැමැති දෙයක් කරන්න කියලා. මහත්තයා රස්සාවෙන් අස්වෙලා නෝනාව හොයන්න වුණා. මාස පහකට හයකට විතර පස්සේ නෝනාව හොයා ගන්න පුළුවන් වුණා. විල්සන් හාමුත් එක්ක ගිහින් කුමාරිහාමිව අරගෙන ආවා. එතකොට ජස්ටින් මාව බඳින්නයි හිටියේ."

"ඒ නෝනාව බලාගන්න ඕන නිසා ජස්ටින් මාව බැඳලා, නෝනාගේ වැඩ පල මට බාර කළා. නෝනට වෙලාවකට හොඳ සිහිය තියෙනවා. වෙලාවකට එයාට කරපු අපරාදේ ගැන කිය කිය පිස්සියක් වගේ සාප කරනවා. මහත්තයටයි අයියටයි කියනවා ඌන්ගෙන් පළි ගන්න ඕනේ. කෑලි කෑලි වලට කපලා, ඌංව මරන්න ඕනේ. ඌං එයාව කරපු අපරාදේ ගැන කිය කිය ඌන්ව හෙමින් හෙමින් මරන්න ඕනේ කියලා කියනවා. විල්සන් හාමු ඒකට කොහෙත්ම කැමති වුණේ නෑ. ඒත් අපේ මහත්තයා ඒ නෝනට තිබුණ ආදර ගෞරවේ නිසා ඒක කරනවා කියලා පොරොන්දු වුණා."

"ඒ නෝනා විස්ස විද්‍යාලෙ ඉගෙන ගන්න කාලේ යාලුවෙලා හිටිය රුවන් බණ්ඩාර කියලා මහත්තයෙක්ට නෝනා ලියුමක් ලිව්වා. මං තමයි ඒක තැපෑලට දැම්මේ. රුවන් මහත්තයා ආවාම, නෝනා එයාට ඒ මිලේච්ඡයො කරපු අපරාදේ ගැන පලි ගගහමින් කියන්නට වුණා. ඒ මහත්තයාට ඒක ඇහිලා යක්ෂාරූඪ වුණා. "මම මය හැම එකෙක්ගෙන්ම පළිගන්නවා." එයා වේදනාවෙන් කෑ ගහලා කිව්වා. කේන්තිය නිසා එයා එයාගේ කෙස් අතින් කොච්චර හයියෙන් ඇද්දද කිව්වොත් ඒ කෙස් ගැලවුණ තැන් වලින් ලේත් එන්න වුණා. "මම ඌන් කෑලි කෑලි වලට කපලා මරලා දානවා." එයා කේන්තියෙන් වෙවුලමින් කිව්වා. මියුරිගල් නෝනට හරිම සන්තෝසයි. "මං දැනගෙන හිටියා ඔයා මට ගැබැහින්ම ආදරේ බව. ඔයාට ඊක්කුං උදව් කරාවී. එහෙනම් ඔයාලා පළිගන්නවා කියලා මගේ ඔළුවට අත තියලා පොරොන්දු වෙන්න." කියලා එයා කිව්වා. ඒ දෙන්නම ඒක ඒ විදියට කළා."

"ඊට දවස් කීපයකට පස්සේ නෝනා එල්ලිලා මැරුණා."

"එයා රුවන් මහත්තයටයි, ජස්ටින්ටයි, විල්සන් හාමුටයි, පොලිසියටයි ලියුම් ලියලා තිබුණා. විල්සන් හාමුට නම් හොඳට බැනලා තිබුණාලු, පවුලේ අයට වෙච්ච දේ ගැන කිසිම කැක්කුමක් නෑ කියලා. නෝනගේ හත් දවසේ දානෙන් පස්සේ ඒ මහත්තයා ගියා ගියාමයි කොහේ ගියාද කියලා දන්නේ නෑ. ජස්ටින්ටයි, රුවන් මහත්තයටයි ලියපු ලියුම් පළිගන්න ඕන අයගේ නම්, උන්ට දෙන්න ඕන දඬුවම ලියලා තිබුණාලු. මං බයවෙයි කියලා, අපේ මහත්තයා, මට නම් ඒ ලියුම පෙන්නුවේ නෑ. ඒ ගොල්ලෝ ඒ නෝනා කියපු පිළිවෙලට, කිසිම කලබලයක් නැතිව, ඒ දෙන්න ඕන වද දීලා එක එක්කෙනාව මැරුවලු. මගේ මහත්තයා කළේ ඔත්තු බලන එක විතරයි. කොච්චර කිව්වත් එයාට මිනිහෙක්ව මරන්න තියා බල්ලෙක්ව පයින් ගහන්නවත් බැරි හිතක් තියෙන්නේ. එයා ඔත්තු බලලා තැන් හදලා දෙනවා. රුවන් මහත්තයා ඇවිත් වැඩේ අවසාන කරලා යනවා. හැබැයි රුවන් මහත්තයා ජස්ටින්ට කියලා තිබුණා, මේ වැඩේ මම කරගෙන යනවා, නමුත් මාව උන්ට කොටුවෙන දවසක් එයි. එදාට ඔන්න ජස්ටින් බෑ කියලා බෑ. ඒක ඉස්සරහට කරගෙන යන්න ඕනේ. ජස්ටින්ටත් කරගන්න බැරිවෙන බව පේනවා නම් පුතාට හරි කියන්න ඕනේ."

"සුරනිමල මුදලාලිවයි, නන්දනවයි, ජයදේවවයි, පොඩි මහත්තයා කියලා කෙනෙකුයි විතරයි එයාලට මරාගන්න බැරි වුණේ. අන්තිමටම මරන්න නන්දනව ඉතුරු කරන්න ඕන බව කුමාරිහාමි කියලා තිබුනලු. එතකොට ඌ බයෙන් ගැහී ගැහී ඉඳීවි. අන්තිමට එන්නේ ඌගේ වාරය නිසා දසදහස් වාරයක් මැරි මැරී උපදීවි. රුවන් මහත්තයා ඔය කතාව කිව්වාම මං කිව්වා අනේ අපේ පුතාලව නම් ඕකට ගාව ගන්න එපා කියලා."

"මං පුතාලා ඕකට සම්බන්ධ කර ගන්න හදන්නේ නෑ. මම කොහොම හරි ඕක කරනවා" කියලා එයා කිව්වා.

"පුතා රුවන් මහත්තයට හරි ආදරෙයි. තාත්තා එයාව බලන්න එන්නේ අවුරුද්දට එක සැරයයි. ඒත් රුවන් මහත්තයා, තාත්තාගේ සහෝදරයෙක් කියලා තමයි බිම්සර පුතා හිතා ගෙන හිටියේ. මාමාට හරිම ලැදියි. මාමත් එක්ක හමුදා කඳවුරු වලටත් යනවා. පුතාට අවුරුදු දහහතරේ කාලේ ඉඳලා කරාටේ, ජූඩෝ වගේ ඒවා අමතර පන්ති වලට දාලා ඉගැන්නුවේ රුවන් මහත්තයාම තමයි. එල්ලේ බලලා වෙඩිතියන්නත් පුතාට පුරුදු කළා. ජස්ටින්ටත් ඒවාට විරුද්ධ වෙන්න ශක්තියක් තිබුණේ නෑ."

"පුතාට අවුරුදු දහඅට වුණ දවසේ රුවන් මහත්තයා ඒ ගොල්ලන්ට කරන්න වුණ, ඒ භාර දූර කාර්යය ගැන කියන්න පුතාව එක්කරගෙන ගියා. ඒ ගියා ගියාමයි පුතා තාම අපි බලන්න ආවේ නෑ. ඒත් ඉඳහිට දවසක මල්ලිටත් මටත් ටෙලිෆෝන් කරනවා. අපේ

දුක සැප අහලා, එයා හොඳින් ඉන්න බව කියනවා. තාත්තා කිව්වා වගේ එයත් කියනවා අවුරුද්දක් විතර කාලයක් එයාගෙන් කෝල් එකක් ආවේ නැත්නම් එයා නොඑන ගමන් ගියා කියලා හිතා ගන්න කියලා."

"මං හිතන්නේ ජස්ටින් දැනගෙන හිටියා පුතා හිටිය තැන. ඒත් එයා අපට ඒක කිව්වේ නෑ. හිටි හැටියෙම රුවන් මහත්තයා ගැන ආරංචියක් නැතිව ගියා. ජස්ටින් ඇවිත් මට කිව්වා රුවන් මහත්තයාව ඊන්ට අහුවෙලා. දැන් මට තමයි වැඩ බාර අරගෙන කරන්න වෙන්නේ කියලා. එහෙම කියලා ගියා ගියාමයි එයා ගැන කිසි ආරංචියක් නැතිව ගියා."

"ඉතින් ඇයි ජස්ටින් මැද පෙරදිග ගියා කියලා ළමයින්වත් රවටන්නේ?"

"කරන වැඩ නිසා එයාව ඊන්ට අහුවුණොත් ඊන් මුළු පවුලන්ම පලිගන්න පුළුවන් කියලා ජස්ටින් කිව්වා. අපි මේකට වන්දි ගෙවන්න ඕන නැති නිසා, ඒ විදියට කරමු කියලා ජස්ටින්ම තමයි ඒ යෝජනාව කළේ?"

"ඒ වුණත් මට හිතා ගන්න බැරි එයාගේ යාලුවෙක්ටවත් එයාව පිට තැනකදී හමුනොවුනේ කොහොමද කියන එක."

"එයා කිසිම තැනක වැඩි කාලයක් ඉන්නේ නෑ. එක එක විදියට වෙස් මාරු කරගෙන එක එක විදිගේ ඇඳුම් පැළඳුම් ඇඳගෙන ඉන්නවා. එයා ඇඳගෙන හිටි ඇඳුම් පවා වෙනස් වුණත්, මහත්තයා කිව්වා වගේ, එක පාරක් කතරගමදී ගමේ කෙනෙක් එයාව දැකලා, මේ අපේ ජස්ටින් මලයා නේද කියලා ගිහින් කතා කරලා තියෙනවා. එයා ඒ මනුස්සයාව නොදන්න විදිහට හැසිරිලා. එයාගේ ගම අනුරාධපුරේ බවත්, වන්දනා නඩයකට එකතුවෙලා කතරගමට ආපු බවත් කියලා එතන හිටපු වන්දනා නඩයකට එකතු වෙලා හිමින්ම මාරුවෙලා තියෙනවා. එයා ඒ වැඩට දක්ෂයි."

"ඉතිං ඔය විදියට වැඩ කරන්න ගොඩක් වියදම් වෙනවානේ?"

"ඔව්. ඉතිං නෙල්සන් හාමු ඒවාට ඇති වෙන්න සල්ලි එවනවනේ. අවුරුද්දකට සැරයක් මැද පෙරදිග ඉඳලා එනවා වගේ තෑගි බෝග අරගෙන එනවා. ඒ තෑගි බෝග ඔක්කොම නෙල්සන් හාමු තමයිලු එයාට එවන්නේ."

"මට හරිම කනගාටුයි නැන්දේ මේ වෙච්ච දේවල්වලට. ඇයි මේ ගොල්ලන්ට වෙච්ච දේ වුණා. වරදක් කරපු කෙනෙක් ඉන්නවා නම් උඩ ඉන්න දෙවියෝ බලාගනීවි කියලා හිත හදාගෙන ඉන්න බැරි?"

"ඒක මහත්තයා ඉතින් මහත්තයාගේ අප්පච්චීගෙන් තමයි අහලා බලන්න වෙන්නේ."

SL-Unlimited

"අපේ අප්පච්චී දැනගෙන හිටියද මේ සල්ලි පාවිච්චි කරන්නේ පළිගැනීමේ චේතනාවකට කියලා."

"ඔවු. නෙල්සන් හාමුත් කියලා තියෙනවා නංගිට කරපු දේට ඔය හැම එකාගෙන්ම පළිගන්න ඕනේ කියලා. එයාගේ නංගිට වද දුන්නා මදිවට ඌත් මුළු පරම්පරාවටම අපහාස කරලා තියෙනවානේ. නෙල්සන් හාමුටත් සෑහෙන තරහවක් ගිහින් තියෙනව ඌත් කරලා තියෙන අපහාස වලටත්, නංගිට කරපු අතවරවලටත්. නෙල්සන් හාමු කළ දේ නිසා නේ මේ ඔක්කොම වුණේ."

"මට නම් හිතාගන්න බෑ, ඔය තරම් උගත් මගේ අප්පච්චිත් ඔය වගේ දේකට උදව් පදව් කළේ ඇයි කියලා. බලන්න ඒක නිසා තව අහිංසක ජීවිත කීයක් නැති වුණාද? තව ඉස්සරහට නැති වේවිද? ඇරත් මේක ඒ පරම්පරාවෙන්ම ඉවර කරලා දැම්මා නම් ඉවර නේ. මොකටද ඊළඟ පරම්පරාවටත් මේක යවන්න කටයුතු කළේ? දැන් බිම්සරට ඕක කරන්න බැරි වුණොත් එයාගේ මල්ලිවත් ඕකට ඇදා ගනීවි නේද?"

"නෑ මහත්තයෝ. මල්ලිව මේකට හවුල් කර ගන්නේ නෑ."

"නැන්දා කොහොමද ඒක හරියට කියන්නේ?"

"බිම්සරව මේකට හවුල් කර ගත්තේ මියුරියෙල් නෝනාගේ ඉල්ලීමට. එයා මැරෙන්න ඉස්සරවෙලා කියලා තිබුණා එයා කැමතියි මහළ්කාව බිම්සර පුතා අතින් මැරෙනවා නම් කියලා."

"කවුද මහ එකා කියන්නේ?"

"ඒ නන්දන කියන කෙනෙක්. එයා තමයිලු කුමාරිහාමිව පැහැරගෙන ගිහින් දස වද දීපු එකේ මුලිකත්වය අරං තියෙන්නේ. එයයි රමනා කියලා නෝනා කෙනෙකුයි. ඒ නෝනව තමයි මුලින්ම මැරුවේ."

"ඉතිං ඇයි මහළ්කාව මරන්න ජස්ටින්ගේ පුතාට බාර දුන්නේ. මට නම් හිතා ගන්න බෑ."

"මහත්තයා. බිම්සර මට මගේම පුතා වගෙයි. ඒත්.. ඒත්.. ඒ දරුවාගේ මව මම නොවෙයි. මියුරියෙල් නෝනා."

"ඈ..හ්"

"ඔව්. බිම්සර තමයි මියුරියෙල් නෝනට ලැබුණ දරුවා. දරුවා ඉපදුන ගමන් උගේ බෙල්ල මිරිකලා මරලා දානවා. එතනින් තමයි පළිගැනීම පටන් ගත්තේ කියලා නෝනා කිය කිය හිටියා. බබා ඉපදුනේ ගෙදරදී. අපේ ජස්ටින්ට ඉස්පිරිතාලේ වැඩ කරලා, ඒ ගැන පොඩි දැනීමක් තිබුණා. ජස්ටින් දරුවව නෝනාගේ අතට දීලා, කාමරේ දොරත් වහලා, කන් දෙකේ පුළුන් කෑලි ඔබාගෙන හිටියා. දැන් දැන් අර පොඩි දරුවගෙ බෙල්ල නෝනා ... පහුවෙනිදා ජස්ටින් නෝනාගේ කාමරේට ගිහින් බලනකොට නෝනා එල්ලිලා මැරිලා

SL-Unlimited

හිටියා. නෝනාට ඒ දරුවගේ මූණ දැක්කාම මරන්න හිතිලා නෑ."

"මට මේ අහිංසක කිරි සප්පයව මරන්න හිත දෙන්නේ නෑ. මොන වරදක් කළාටද මේ කිරි සප්පයාව මං මරන්නේ. මගේ පුතේ උඹ ජීවත් වෙයන්. උඹ ජීවත් වෙලා, උඹේ අම්මාව මේ දුකට පත් කරපු, උඹව අවජාතකයෙක් කරපු ඒ පරබල්ලා කෑලි කෑලි වලට කපලා මරලා දාපං කියලා එයා ලියලා තියෙනවා. ඒ ලියුම පුතාට අවුරුදු දහ අට උනාම දෙන්න කියලා තිබුණා. රුවන් මහත්තයා පුතාට අවුරුදු අහ අට වුණාම ඒ ලියුම පෙන්නලා තියෙනවා."

"පුතා ඒක කියවලා හරියට ඇඬුවලු. 'ගෑණියෙකුට විඳින්න පුළුවන් වදයක්ද මුන් අම්මාට දීලා තියෙන්නේ. මුන් හැම එකාවම හම ගහනවා. මගේ අම්මට කරපු දේට මං මුන් ඔක්කොමගෙන් පළි ගන්නවා" කියලා එයා වේදනාවෙන් කෑ ගැහුවලු. ඊට පස්සේ රුවන් මහත්තයා, ජස්ටින් එක්ක එකතු වෙලා මෙහෙක් කරගෙන ආපු වැඩ ටික කිව්වලු. පුතාට අවස්ථාව දෙන්නේ නන්දන කියන මහ එකාව මරන්න. අනික් වුන් ගෙන් අපට දැන් ඉතුරුවෙලා ඉන්නේ සුරනිමලයි, පොඩි මහත්තයයි, ජයදේවයි විතරයි. අපි උන්ව වැඩේ දෙන්නම් කියලා එයාට කිව්වලු. ඊට පස්සේ රුවන් මහත්තයා පුතා දැන්ම ඉඳලා ඕකට සූදානම් වුණොත් හොඳයි. ඒකට තමයි මං පුතාව එක්කරගෙන ආවේ කියලා කිව්වලු."

"මං හිතන්නේ අර ඉතුරු වුණා කියපු තුන්දෙනාටම මුකුත් කරන්න රුවන් මහත්තයටවත්, ජස්ටින්ටවත් බැරි වෙන්න ඇති. ඊට ඉස්සර වෙලා, උන් ඒ දෙන්නව බිල්ලට ගන්න ඇති. පුතා මුලින්ම පොඩිමහත්තයව මැරුවලු. මං පත්තර වල දැක්කා සුරනිමල මුදලාලිවත් මරලා කියලා තියෙනවා. ඒකත් පුතාගේ වැඩක් වෙන්න ඇති."

●●●

"ඔන්න අංකල් එයාගෙන් මම දැන ගත්තු දේ. දැන් මුළු කතාවම පැහැදිලියිනේ. අපි දැන් ඉක්මන් වෙන්න ඕනේ. සූදා කරන්නේ රඟපෑමක්. අපි ප්‍රමාද වුණොත් මිනිහා නන්දනටත්, ජයදේවටත් අනතුරක් කරන්න පුළුවන්. අංකල් අපි අපේ කට්ටියව ඒගොල්ලන්ගේ ආරක්ෂාවට දාලා සූදාව අත්අඩංගුවට ගනිමු."

"ඔව් පැට්‍රික්. මං ඒ වැඩේ කරන්නම්. එහෙනම් ඔයත් නුවර යන්න. ඔයා මාධවී ගැන හෙවිල්ලෙන් ඉන්න. පවුලට ගැහුණු හැම කෙනාක්ම මරන්නත් පුළුවන් නේ."

ඒ මොහොතෙහිම පිටත් වූ පැට්‍රික් හවස් වන විට නුවර ප්‍රින්ස් හෝටලයෙහි නැවතුණි. ඔහු හැරී ජයසුන්දරව තමා ප්‍රින්ස් හෝටලයේ නැවතී, ඔහුගේ උපදෙස් නොඉවසිල්ලෙන් බලාපොරොත්තුව සිටින බව කියා සිටියේය.

"අංකල් පුළුවන් තරම් ඉක්මනට අපට සුදාව අත්අඩංගුවට ගන්න අවසරය ලබා දෙන්න. ප්‍රමාද වීම ඒ තරම් නුවනට හුරු නෑ."

එහෙත්, එදින මුළු රාත්‍රියම ඔහු බලා සිටි එම නියෝගය ඔහුට ලැබුනේ නැත. ඔහු කනස්සල්ලට පත් විය.

පසු දින උදයෙන්ම ඔහු නැවත හැරීට කතා කළේය.

"අංකල්. මොකද අංකල් දැන් තත්වෙ?"

"තත්වෙ මෙකයි පුතා. මං අදාල පුද්ගලයන්ට කරුණු පැහැදිලි කළා. හැබැයි සුදාගේ මුල මූල කියන්න මම ගියේ නෑ. සුදාව මං අඳුන්නලා දුන්නේ සුරනිමලව මරපු කෙනා හැටියටයි. මං කිව්වා ඒක ඔප්පු කරන්න සාක්ෂිත් අපට තියෙනවා. සුදා ලවා මේ වැඩේ කරවලා තියෙන්නෙත් නන්දන බව මං කරපු කතාවෙන් ඒ අයට තේරිලා තියෙනවා. ඒක ඒ ගොල්ල බලාපොරොත්තු වුණ එකක් නොවෙයි. එයාලට බයක් තියෙනවා සුදාව මේකට කොටු කර ගත්තොත්, ඒකට සම්බන්ධ වුණ හැම කෙනෙක්ම නීතිය ඉදිරියට ගෙන එන්න පුළුවන් බව. ඒක නිසා තමයි ඒ ගොල්ලන්ගේ මේ ප්‍රමාදය. හැකි තරම් ඉක්මනින් වචනයක් කියන්නම් කියලා තමයි ඉහලින් කියන්නේ. ඒක ලැබුණ ගමන් මං ඔයාට කියන්නම්."

ඒ උත්තරය පැමිණියේ හවස පහට පමණය.

."පැට්‍රික්. මං අපේ අනික් ඔක්කොටමත් ආපසු කොළඹට එන්න කිව්වා. ඔයත් දැන්ම කොළඹට එන්න."

"ආ.. කොළඹ එන්න. එතකොට සුදාව අත්අඩංගුවට ගන්නේ නැද්ද?"

"මං කියන්නේ මට ඉහලින් ලැබුණ නියෝගය. වනාලියා අල්ලගන්න පත් කරපු කණ්ඩුව විසුරුවා හරින්න කිව්වා. අපි හොයා ගත්තු දේවල් පරීක්ෂා කරලා බලන්න වෙන කොමිටියක් පත් කරනවා කිව්වා. ඒ කොමිටිය ගන්න තීරණය ක්‍රියාත්මක කරන්න මට නියෝග කරලා තියෙනවා. ඔයාලා කරපු පරීක්ෂණ ගැන දැන් මට කිසිම වගකීමක් නෑ. මං මේ වෙනකොටත් අපේ ලියකියවිලි ඒ අයට බාර දීලා ඉවරයි."

"ඉතිං අංකල් ඒවා කෙරෙන කොට වනාලියා උගේ වැඩේ ඉවර කරලා තියෙයිනේ."

"ඒ ගැන ඔයා කලබල වෙන්න එපා පැට්‍රික්. දැන් ඒක ඔයාටවත් මටවත් අයිති වැඩක් නොවෙයි. මේක මං ඔයාට කරන නියෝගයක්. වහාම කොළඹ එන්න." කියූ හැරී සංවාදය එතනින් නිම කළේය.

"ඒ ගොල්ල පරීක්ෂණ වාර්තා කියවලා බලලා තීරණ ගන්න කොට වෙන්න ඕන දේවල් වෙලා ඉවර වේවි. සුදා කවුද කියලා අංකල් ඒ ගොල්ලන්ට කිව්වා නම් ලේසියෙන්ම අපේ වැඩේ කරගෙන

ගන්න තිබුණා. අංකල් ඒක ඕන කමින්ම නොකියා හිටියේ අංකල්ටත් සුදාගෙන් ඒ වැඩේ කෙරෙනවා දකින්න ආස නිසා වෙන්න ඇති. තම පියාටද සොහොයුරිය නිසා පළිගැනීමේ චේතනාවක් ඇති වුණා නිසා හැරීටද එසේ වීමට ඉඩ ඇතැයි ඔහු අනුමාන කළේය.

"ඒත් මට අපේ තාත්තා නන්දන අතින් මැරුණා කියලා දැන ගත්තත්, එහෙම පළිගැනීමේ චේතනාවක් ආවේ නෑනේ. සමහර විට මං හැදුන වැඩුන පරිසරය නිසා වෙන්න ඇති."

තම කාමරයට පැමිණි ඔහු සූට් කේසයෙහි පරිස්සමින් තබා තිබු වීදුරු කුට්ටිය දෙස බැලුවේය. එය ඔහු මාධවී හමු වූ දින, නන්දනගේ කාමරයට රහසිගතව වැදී ගත් පේපර් වේට් එකය.

"හොඳ වෙලාවට මං මේක පරීක්ෂණ කාමරයට දැම්මේ නැත්තේ. දැන් කරන්න තියෙන්නේ පුළුවන් තරම් ඉක්මනට මේකත් අරගෙන එංගලන්තෙට ගිහින් එහේ කෙරෙන අපේ පරීක්ෂණ වලට මේක පාවිච්චි කරන්න. මේ පේපර් වේට් එකේ තියෙන ඇඟිලි සලකුණු අප්පච්චිව මරන්න ආපු කාරයේ තිබුණ ඇඟිලි සලකුණු වලට සමාන වුණොත්, අපේ ගෙදර දොරේ තිබුණ ඇඟිලි සලකුණු වලට සමාන වුණොත්, නන්දනව ලේසියෙන්ම කොටු කර ගන්න පුළුවන්. සමහර විට නන්දන විතරක් නොවෙයි. ජයදේවත් මේ වැඩ වලට හවුල් ඇති. දැන් මාධවීගේ තත්වය කොහොමද දන්නේ නෑ. එයා මට නිකමටවත් කතා කළේ නෑනේ. එයාට ජයදේව ගැන තියෙන්නේ පුදුම විශ්වාසයක්."

●●●

පැට්රික් මාධවී ගැන සිතමින් සිටින ඒ මොහොතෙහි මාධවීද පැට්රික් ගැන සිතමින් සිය කාමරයට වී සිටියාය. එදා පැට්රික් පැමිණ ගිය දිනයේ පටන්, මාධවී ජයදේව හා නන්දන ගැනත්, සුදා ගැනත් ඉතා විමසිලිමත්ව සිටියාය. සුරනිමලගේ මරණය සිදු වූ දවසේ සුදා නිවසෙහි සිටි බව කියමින් ඒ බොරුව ඇය කළේ ජයදේවගේ ඉල්ලීම නිසාය.

"මේවට නිකං සුදාව ගාවන්න ඕන නෑ. අපි දන්නවනේ සුදා ඔය වගේ වැඩක් කරන්නේ නෑ කියලා." එදා ජයදේව කී කතාව ඇය විශ්වාස කළා ය.

"බාප්පා මිනිහව විස්කි බෝතලයක් ගේන්න වලව්වට යැව්වා. ඕවා ගැන කියලා නිකං පොලිසිවල රස්තියාදු වෙන්න ඕන නෑ." ජයදේව කී සැටි ඇයට තවම මතකය.

ඔවුන්ගේ කතා බහත්, ඉරියව් ගැනත් විමසිල්ලෙන් සිටින විට, ඒ සමහර දේවල් සැක කටයුතු බව ඇයට තේරුම් ගියාය. වරෙක ජයදේව යමක් කියා සිය බාප්පාට ඇහෙන් ඉඟි කරනුද ඇය දුටුවා ය. කෙසේ වුවත් යමෙකු ගැන සැකයෙන් සිටින විට, ඔහු කරන හැම

SL-Unlimited

වැඩ කටයුත්තක්ම ඇඳයට පෙනීමද සාධාරණය.

ඇය ජයදේව හා විවාහ වන බව දැන ගත් බැංකුවේ ඇගේ මිතුරන් ඇයට සුභ පැතුවේ "ඔයා හරි ලකී. ඔයාට නැන්දම්මා කෙනෙක් නැහැනේ" කියමිනි. අම්මිලා මෙන් නැන්දම්මලා සිටින බවත්, ජයදේවගේ මෑණියන්ගේ වියෝව තමාගේද දුකට හේතුවක් බවත් ඇය එවිට කීවාය. නැන්දම්මා නැතුවාට මේ සිටින බාප්පා ගැන නම් දැන් මාධවීට කලකිරීමක් ඇති වෙමින් එයි. ජයදේව බාප්පා කියනවාට පිටින් කිසි දෙයක් කරන්නේ නැත. බාප්පාද යන යන හැම තැනම ඔහු කැඳවා ගෙන යයි.

"බිස්නස් වැඩක්" ඒ ගැන විමසන විට ඔහු කියයි.

"ඉතින් මාවත් ඔයාගේ බිස්නස් වැඩට අරගන්නකෝ" එවිට මාධවී කියයි. "එතකොට මටත් ඔයාලා එක්ක ඔය වැඩ කරන්න පුළුවන්නේ."

"පොඩ්ඩක් ඉවසන්න මාධවී. තව ටික දවසකින් මං මේ ටෙක්ස්ටයිල්ස් බිස්නස් එක ඔයාටම බාර දෙන්න තමයි හිතාගෙන ඉන්නේ. බාප්පාත් කිව්වා පිරිමි අපට වඩා ගෑනු ඔයාලාට තමයි ඔය වැඩේ හොඳට කරන්න පුළුවන් කියලා. බාප්පා ඔයා ගැන හරි පැහැදීමකින් ඉන්නේ. අපේ මේ ප්‍රශ්න ටික විසඳුනාට පස්සේ ඔයාට ඒක බාර දෙමු කිව්වා."

"ජයේ. ඇයි අපි තාමත් බාප්පාත් එක්ක, බාප්පාගේ ගෙදරට වෙලා ඉන්නේ. අපි දැන් වෙනම පවුලක්නේ. අපි දෙන්නා යං රන්දෙණිගල වලව්වට. අපට ඒ ගෙදර ඉන්න පුළුවන්නේ."

"ඔව් මාධවී. බාප්පාට ඕන කම තියෙන්නේ ජය පාටියක් දාලා, අපි දෙන්නා එකතු වෙනවා දකින්න. තාත්තාගේ මරණය නිසානේ ඒක කල් දාන්න වුණේ. තුන්මාසේ දානේ ඉවර වුණාට පස්සේ අපි එහාට පදිංචියට යමු."

මාධවී සිටින්නේ ඒ තුන්මස ඉවර වෙනතුරු ඇඟිලි ගනිමිනි.

එහෙත් දැන් දැන් ජයදේවගේ සමහර පිළිවෙත් ඇය රුස්සන්නේ නැත. එදින රෑදේ බිස්නස් වැඩක් කියා නිවසින් බැහැරව ගිය ඔහු, දහවල් කෑමට පැමිණියේ තුනට පමණය. ඔහු නිවසින් පිටවී යන විට "අද දවල් කෑමට ගෙදර එන්න" යැයි මාධවී ඔහුගෙන් ඉල්ලීමක්ද කර තිබුණි. ඔහු එන බවට පොරොන්දුවක්ද දුන්නේය. එදා ඇය විශේෂ ආහාර වේලක්ද පිළියෙල කර තිබුණි. ඔවුන් ප්‍රමාද වූ නිසා ඇයට තනියම එහි රස බලන්නට සිදු විය.

"පොඩ්ඩක් පරක්කු වුණා මාධවී. දන්නේ නැද්ද, රාජකාරි වැඩ වලට ගියාම. ඒත් ඔයා උයපු බත් වේල කන්න ආසා නිසා අපි මගින්වත් කිසි දෙයක් කෑවේ නෑ" කියා ජයදේව කී විට ඇගේ කෝපය නිවුණාය.

www.sinhalalibrary.com
SL-Unlimited

"බඩගින්නේ බෑ කියලා මං පුතාට කිව්වා හෝටලේකින් කාලා යමු කියලා. කෝ ඉතිං හාමිනේ අද රස කෑමක් උයනවා. ඒකම කන්න ඕන කියලා කිව්වනේ" කෑමට ඉඳ ගනිමින් නන්දනද කීවේය. ඔවුන් කෑම කන අතර දුරකථනය නාද විය. ඒ කතා කළ තරුණයා සුදාට කතා කිරීමට අවශ්‍ය බව කීවෙන් මුළුතැන් ගෙයි සිටි සුදාට, මාධවී ඒ බව කීවා ය.

එසේ කිවූ ඇය තම කාමරයට ගියේ එහි දොරද මඳක් විවර කර තබමිනි. ඇය හැම දෙයක් ගැනම සෙවිල්ලෙන් සිටීමට සිතා සිටී.

"ආ මල්ලි. කොහොමද?" සුදාගේ දෙනෙත් දීප්තිමත්ව ඇත. ඔහුට ඉඳහිට සිය සොහොයුරා මෙසේ කතා කරන බව ඇය දනී. ඒ හැම විටකම ඔහුගේ මුහුණ මෙසේ ප්‍රබෝධමත් වේ.

"ආ .. කොයි වගේ කෙනෙක්ද? " ඔහුගේ මුහුණ අඳුරු විය.

"මටත් වඩා උස කෙනෙක්? වෙන මුකුත් ලකුණක් කියන්න පුළුවන්ද?"

"ආ.. රයිට්. මං දන්වා මෑන්ව. මෑන් දවසක් මෙහේ ආවා. මිනිහ කවුරු කියලද කිව්වේ?"

"ඔව්. මං දන්නවා මල්ලි. අපි වගේ අයව පොලිසියට අල්ලගන්න ලැබෙන්නේ නෑ" ඔහු සෙමින් කී නමුත් එය කතාවට සවන් යොමාගෙන සිටි නිසා මාධවීට ඇසුණි.

"ඔව් මල්ලි. මං දන්නවා. ඊට ඉස්සර වෙලා අපිව ඕන එකෙන් අයින් කරනවා. මල්ලිට බොහොම ස්තූතියි ඕක කිව්වට. අම්මා සැපෙන් ඉන්නවද?"

"මහිරි"

"මට එයා ගැන කනගාටුයි."

"හොඳයි මල්ලි. බොහොම ස්තූතියි" ඒ ඔහු සංවාදය නතර කළේය.

ජයදේව හා නන්දන කෑම ගනිමින් සිටි ස්ථානය පසු කර යන ගමන් ඔහු "මල්ලි ගෙදරින් කතා කරලා සැප දුක බැලුවා. හුග දවසකින් ගෙදරට කතා කරන්නත් බැරි වුණානේ" කීවේය.

"ඔව් ඔව් සුදෝ. ඒවා කරන්න ඕන වැඩ" නන්දන කීවේය.

"කවුරුත් සනීපෙන් ඉන්නවද?"

"ඔව් මහත්තයා" කියමින් ඔහු මුළුතැන් ගෙය දෙසට ගියේය.

මාධවී කෑම වල අඩුපාඩු බලන්නට වූයේ සුදා කළ කතාව අවබෝධ කරගන්නට උත්සාහ කරමිනි. මල්ලි කතා කර යමෙකු ගැන ඔත්තුවක් දුන් බව ඇය සිතුවාය. සුදාටත් වඩා උස පුද්ගලයෙක්. මෙහෙටත් දවසක් ආවා කිව්වා. එතකොට ඒ කතා කළේ පැට්රික් ගැන වත්දැයි ඇය සිතුවේ සුදාට වඩා උස පුද්ගලයෙකු මේ

SL-Unlimited

ගෙදරට ආවා නම්, ඒ එදා පැමිණි පැට්‍රික්ම වන බැවිනි. පොලිසිය ඔහු ගැන සෙවිල්ලෙන් සිටින බවද ඇයට සිතා ගත හැකි විය. එහෙත් සීන් එකෙනුත් අයින් කරනවා කියපු කතාව ඇයට තේරුණේ නැත.

කෑමෙන් පසු ඇය වෙත පැමිණි ජයදේව පසුදින චිත්‍රපටයක් බැලීමට යාමට ඇයට යෝජනාවක් කළේය.

"ඔයාට ගෙදරට වෙලාම ඉඳලා පාලුත් ඇති නේ. බාප්පත් කිව්වා ඔයා එක්ක ගිහිං පික්චර් එකක් බලලා එන්න කියලා."

චිත්‍රපටයක් බැලීමට ඇය කැමති වුවත් එය බාප්පා කියපු එකක් බව දැනගත් විට ඇය අසතුටට පත් වූවාය. එහෙත් ඇය ඒ බවක් ඔහුට පෙන්නුවේ නැත.

කාමරයට යමින් සිටි නන්දනගේ සෙල් ෆෝනය නාද වුණෙන් ඔහු එය කනෙහි තබා ගනිමින් මිදුල වෙත පියවර තැබුවේය. ජංගම දුරකථනයට නිවසේදී එන පණිවිඩ වලට පිළිතුරු දෙන විට එසේ මිදුලට යාම ඔහුගේ සාමාන්‍ය පුරුද්ද බව මාධවී දැන සිටියාය. එහෙත් වෙනදා ඒ කිසි දෙයක් ගැන නොසොයන ඇය, එදින නන්දනගේ ඉරියව් ගැන මඳක් විමසිලිමත් වූවාය.

ඔහුගේ මුහුණ අඳුරු වන හැටිත්, කතා කළ පුද්ගලයා හා ඔහු එකඟ නොවන බවත් මුහුණින් පළවිය. එහෙත් පසුව ඔහු සන්සුන්ව කතා කරන්නට විය. ජයදේවද බාප්පාගේ ඉරියව් ගැන විමසිලිමත්ව සිටින බව ඇය දුටුවාය.

"මාධවී මට වතුර ටිකක් ගේනවද?" කියා ජයදේව කීවේ තමාව එතැනින් මොහොතකට ඉවත් කිරීමට වන්නට ඇතැයි මාධවී සිතුවාය. ඇය මුළුතැන් ගෙය වෙත පිය නඟන අතර එක වරම හැරී බැලුවේ ඔහු කුමක් කරනවාද කියා විමසිලිමත් වීමටය. ඔහු වෙත පැමිණ සිටි නන්දන ඔහුගේ කනට කර යමක් ඔහුට පවසනු ඇය දුටුවාය.

"අනේ මන්දා. මේ ගොල්ලන්ගේ මේ ගුප්ත හැසිරීම මට තේරෙන්නේ නෑ" තමාටම කියා ගනිමින් මාධවී වීදුරුවට වතුර පුරවන්නට වූවා ය.

වතුර වීදුරුව එක හුස්මට බිවූ ජයදේව "මාධවී අපට හදිසි ගමනක් යන්න තියෙනවා" කියමින් කාමරය දෙසට යන්නට විය.

"මට ඊයේ ඉඳන් ගෙදරට වෙලා තනියම ඉඳලා පාළුයි. මාත් එන්නම්."

"ඔයා ඉන්න මාධවී. මේක හරිම වැදගත් ගමනක්."

"එතකොට මට යන්න සුදුසු නොවැදගත් ගමන් විතරද?"

"මිනුස්සයා යමක් කිව්වාම ඒකට ගරු කරන්න ඉගෙන ගත්තා නම් හොඳයි" නන්දන කාමරයේ සිට කියනු ඇයට ඇසුණි.

SL-Unlimited

"මිනිහත් එක්ක එකට එක කියන්න හොඳ නෑ. පුතා ඉක්මනට ලෑස්ති වෙලා එන්න."

"මාමා ඔය විදිහට හිතන නිසා තමයි ගෑණු කවුරුවත් මාමාට කැමති වෙන්නෙ නැතුව ඇත්තේ."

"නෑ කෙල්ලේ. ඔය වගේ ගෑණුත් එක්ක ගෙවන පවුල් ජීවිතේ මොකක්ද කියලා තමයි මං තා එක්ක වත් පවුල් වෙන්න හිතුවෙ නැත්තේ."

"බාප්පාත් එක්ක එකට එක කියන්න එපා මාධවී" ජයදේව සෙමින් කීවේය.

"අනේ ජයේ. මාවත් එක්කරගෙන යන්නකෝ."

"මේක මොන කරදරයක්ද? මං එක පාරක් කිව්වනේ. ඔයා ගෙදරට වෙලා ඉන්න" ජයදේව ඇය දෙස හැරී බලා කෝපයෙන් කීවේය. ඒ ජයදේව සැරෙන් ඇයට කතා කළ ප්‍රථම දිනය විය. ඇගේ දෙනෙත් කඳුලින් බරවිය. ඇය වහා කාමරය වෙත දිව ගියාය.

"මෙහෙම නම් ජීවත් වෙලා වැඩක් නෑ. කොහොම හරි ජයදේවත් එක්ක මේ ගෙදරින් යන්න ඕනේ. එයා වැඩ කරන්නේ බාප්පා කියන හැටියට. මං ගෑණි වෙලත් මා ගැන කිසිම තැකීමක් නෑ."

ඇය අඩක් විවර වූ දොර අතරින් බැල්මක් හෙලුවාය. නන්දන සිටින කාමරයට ඇතුළුවන දොරත්, ඉස්තෝප්පුවත් එතුලින් පැහැදිලිව දක්නට ලැබුණි. එහෙත් තම කාමරය අඳුරු බැවින් පිටත සිටින අයට තමා නොපෙනෙනු ඇතැයි ඇය සිතුවාය.

"නන්දන නැවත කාමරයට යනු ඇය දුටුවාය. ඒ යන ගමන්" සුදා ටිකත් ලෑස්ති වෙයන්. පොඩි ගමනක් යන්න තියෙනවා" කියා ඔහු කියනු ඇයට ඇසුනි.

"මදෑයි එතකොට මට තනියම තමයි ඉන්න වෙන්නේ. මං ජයදේවත් එක්ක යන්න හැදුවට දෙන දඬුවම වෙන්න ඇති."

"මං රෙඩි අංකල්" කියමින් ජයදේවද නන්දන ගේ කාමරයට යනු ඇය දුටුවාය.

"හරි යමු. මාත් රෙඩි"

"මොකක්ද බාප්පා ප්‍රශ්නේ?" ජයදේව විමසනු ඇයට ඇසුණි.

"අද මේ ඔක්කොම ඉවර කරලා දාන්න ඕනේ" ඔහු සෙමින් කීවත් ඇයට ඇසුණි.

"මොනවද ඉවර කරන්නේ?"

"යමුකො මම කියන්නම්."

"මං එහෙනම් මාධවීට කියලා එන්නම්."

"ඕන නෑ. යමු"

SL-Unlimited

මාධවීට ඇඬුම් ආවේය. තමාගෙන් සමුගැනීමටත් තම සැමියාට බාප්පාගේ අවසර අවශ්‍ය වූයා නොවේද ඈය සිතන්නට වූවය. ඒ දවස්වල එයා එහෙම නෑ. එතකොට බාප්පා කපටි කමට ඒවට ඉඩ දීලා ඉන්න ඇති. ඒත් දැන් ඇයි මේ වෙනසක්. එයා මා එක්ක යාලු වුණෙත් බාප්පා කියපු නිසාද? පැට්‍රික් කියපු කතාව ඇත්ත වෙන්න පුළුවන්ද? අංකල් ඇස ගහා ගෙන සිටින්නේ තමා සතු රත්දෙණිගල වලව්වටද?"

"එළියට ගිය නන්දන යළි කලබලයෙන් මෙන් ගෙට පැමිණෙනු ඈය දුටුවාය. නැවත කාමරයෙන් ඔහු එළියට පැමිණියේ ලිපිගොනු කිහිපයකුත් රැගෙනය. ඔහුගේ අතැඟිලි අතර හිර වී තිබුණ රතුපාට ආට්ලයින් පෑන ඈය දුටුවාය. ඇගේ සිතට බියක් ඇතිවිය. ඔහු තම කාමරය දෙසට පිය මනිනු දුටු ඇය ඇඳෙහි අනෙක් පසට හැරුණාය. ඉන් මොහොතකට පසු ඉදිරිපස දොර වැසෙන හඬ ඇයට සවනය විය.

ජනේලය වෙත පැමිණි ඇය ගේට්ටුවෙන් පිටත නවතා තිබූ සුදාගේ මෝටර් සයිකලයත්, ඈත යන නන්දනගේ ජීප් රියත් දුටුවාය. ගේට්ටුව යළි වසා දමා, සයිකලයට නැගුන සුදා කුරුල්ලෙක් සේ පියඹා ගියේය.

මාධවී ඇඳට වී එදින උදේ පටන් සිදු වූ දෑ ආවර්ජනය කරන්නට වූවාය. එවිට පැට්‍රික් විසින් පවසන ලද දෙයෙහි සත්‍යයක් ඇතැයි ඇය සිතුවාය.

ඇගේ ඇඟෙහි හිරිගඩු පිපී ගියේය. ඇඟ කිලිපොලා යන්නට විය. ඇඳෙන් නැගිටින්නට ඇය උත්සාහ කළේ නමුත් දෙපා වාරු නැති වී යළි ඇඳටම වැටුණාය. ඒ අන් කිසිවක් නිසා නොව නිවෙස පුරා පැතිරී ගිය මරලතෝනියක් නිසාය. ගැහැණියක "හිං හිං හී .. " යනුවෙන් නගන මර සිනහවකින් මුළු නිවසම දෙදරුම් කෑවේය.

"ඒ .. ඒ.. මියුරියෙල් නැන්දගේ මර හිනාවද? ජයදේවගේ පවුලේ උදවිය බිල්ලට ගන්නකොට එයා නගපු මර හිනාවද?" ඇගේ ගත දහදියෙන් තෙත් විය. "මගේ අවසානය ළං වී ඇත්ද? අප්පච්චිවිලා කියපු වචනවලට ඇහුම් කන් නොදුන්න මට වෙච්ච හොඳ පාඩම" ඇය සිතන්නට විය. ඇගේ දෙනෙතින් කඳුළු ගලන්නට විය. "අනේ අප්පච්චි ඇවිත් මාව බේර ගන්න. අනේ පැට්‍රික් ඇවිත් මාව බේරගන්න."

"ඇයට පැට්‍රික් දුන් දුරකතන අංකය සිහි විය. සිතට දිරි ගත් ඇය ඇඳෙන් නැගිටින්නට උත්සාහ කළද බිය වැඩි කම නිසා දෙපා වාරු නැති වූ හෙයින් එසේ කළ නොහැකි විය. බිත්තියේ ආධාරයද ඇතිව සෙමින් සෙමින් ඇය අල්මාරිය වෙත පිය මැන අල්මාරියෙන් සිය අත් බෑගය ගත්තාය. පැට්‍රික් දුන් දුරකතන අංකය අතට ගත් ඇය සෙමින් සෙමින් කාමරයෙන් පිටතට විත් දුරකතනය වෙත

SL-Unlimited

පැමිණියාය. හිනා හඬ එන්නේ මාමාගේ කාමරයේ සිට බව ඇය තේරුම් ගත්තාය. දුරකතනය වෙත පැමිණි ඇය රිසීවරය අතට ගත්තාය. එහි කිසි හඬක් නැත. එහි වයර කපා දමා ඇති බව ඇය දුටුවේ එවිටය.

"මං ඉවරයි. මං ඉවරයි. මුං හොඳට ප්ලෑන් කරලා කරපු වැඩක් වගෙයි. දැන් මාව මරන්න මාරයා ඒවි. ඔව් සුදා ඒවි මාව මරන්න."

ඒ සමගම ඇයට දැඩි පිපාසයක් දැනුණෙන් ඇය මුළු තැන් ගෙය දෙසට ගමන් කරන්නට වූවාය.

●●●

තම ජීප් රියට නැගුන නන්දන නිහඬවම රිය පදවන්නට විය. ඔහු පසු පසින් සුදා ගේ මෝටර් සයිකලය ඇදී එයි. ලොකු ප්‍රශ්නයකට සිය බාප්පා පත් වී ඇති බව වටහා ගත් ජයදේව, ඔහුට එසේ කල්පනා කරන්න ඉඩ හැරියේ ය.

"සුදාව සීන් එකෙන් අයින් කරන්න වෙනවා" මඳ නිහැඬියාවකට පසුව නන්දන කීවේය.

"ඒ කිව්වේ?"

"මිනිහා ගැන පොලිසියට ඉව වැටිලා. මිනිහා අයියව මරපු බව ඔප්පු කරන්න පොලිසියට සාක්කි තියෙනවලු. අපි කෑම කන වෙලාවේ කතා කළේ කුරේ මහත්තයා. එයා තමයි මට විස්තරේ කිව්වේ. ඒක නිසා දැන් සුදාව සීන් එකෙන් අයින් කරන්න කිව්වා. එයා මිනිස්සු දෙන්නෙක්ව එවලා. මගේ ඉන්ස්ට්‍රක්ෂන් බලාපොරොත්තුවෙන්. ඒ දෙන්නා හෝටලේක නතරවෙලා ඉන්නවලු."

"පව්. හරි හොඳ එකා"

"ඔව්. මටත් දුකයි. ඒත් වෙන කරන්න දෙයක් නෑ. ඌව පොලිසියට අහුවුණොත් අපි කොටුවෙනවා."

"කොහොමද ඌව පොලිසිය සැක කරන්නේ. අපි පොලිසියට කිව්වනේ එදා මුළු දවසම සුදා හිටියේ අපිත් එක්ක කියලා."

"ඔව්. ඒකෙන් අපිත් නිකම්ම බොරු කාරයෝ වුණා"

"මට නම් හිතාගන්න බෑ. අපි තුන්දෙනෙක්ම කිව්වනේ සුදා හිටියේ අපිත් එක්ක කියලා."

"තුන් දෙනාම. අපි දෙන්න විතරනේ එහෙම කිව්වේ?"

"නෑ. මාධවීත් එහෙම කිව්වා."

"ඔව් ඒක ඇත්ත. ඒත් මට ඒකිව සැකයි. ඒකි පස්සේ ඇත්ත කිව්වද දන්නේ නෑ."

"නෑ නෑ. මාධවී බොරු කියන්නේ නෑ. එදා සුදා එහෙ ගිය වෙලාවේ කමලදාසගේ ගෙදර ලයිට් පත්තුවෙලා තියෙනවා දැක්කා

කිව්වා නේද? කමලදාස සුදාව අඳුරගත්තද දන්නේ නෑ."

"ඔව් එක්කො කමලදාස කියන්න ඇති. එහෙම නැත්නම් මාධවී කියන්න ඇති."

"නෑ. මාධවී එහෙම නොකියන බව මට හොඳට විශ්වාසයි."

"ගෑනු විශ්වාස කරන්න එපා පුතා. ටිං ටිංගේ වාසියට තමයි හැම දෙයක්ම කරන්නේ. මාධවී හමුවෙන්න යාළුවෙක් ඇවිත් ඉන්නවා කිව්වාම, පුතා ඒ කොල්ලන්ට යන්න දෙන්න කියලා සුදාට කිව්වා නේද?"

"අපොයි ඔව්. එහෙම නොකර බෑනේ. රිද්මාව ඉතිං අපිත් දන්නවනේ බාප්පේ."

"රිද්මාට යන්න දුන්නාට මගේ කිසි අප්‍රසාදයක් නෑ. ඒත් රිද්මත් එක්ක ගියේ කවුද?"

"රිද්මා එයාගේ බෝයි ෆ්‍රෙන්ඩ් එක්ක ආවා කියලා මට කිව්වා. ඒ දෙන්නා විතරනේ ගියේ."

"රිද්මාට බෝයි ෆ්‍රෙන්ඩ්ස්ලා කීදෙනෙක් ඉන්නවද?"

"එහෙම නුහුරට කතා කරන්න එපා බාප්පේ. රිද්මයි මහේෂුයි ඉස්කෝලේ යන කාලේ ඉඳලම යාළුවෙලා හිටපු දෙන්නෙක්. කැම්පස් එකේත් එකටම හිටියා."

"ඉතිං එදා රිද්මා ගියේ මහේෂ් එක්කද?"

"ඔව් වෙන්න ඇති. මං ඒ වෙලාවේ ගෙදර හිටියේ නෑනේ."

"රිද්මා ගිහින් තියෙන්නේ මහේෂ් එක්ක නොවෙයි. වෙන මනුස්සයෙක් එක්ක. හොඳ ජැන්ඩියට ඇඳලා හිටපු, ළඟින් යනකොට සුවඳ හමන සෙන්ට් ජාතියකුත් දාලා හිටපු කෙනෙක් එක්ක රිද්මා ගිහින් තියෙන්නේ. සුදාටත් වඩා ටික සාදයෙක්. අනුමානයක් නෑ. ඒ නම් පොලිසියේ හරි සී අයි ඩී එකේ හරි කෙනෙක්."

"බාප්පා කොහොමද ඕවා දන්නේ? බාප්පත් ඒ වෙලාවේ ගෙදර හිටියේ නෑනේ."

"මං හිටියේ නැති වුණාට සුදා හිටියනේ. සුදා මට විස්තරේ කිව්වා. සුදා මහේෂ්වත් දැකලා තියෙනවනේ. මට සුදා තමයි කිව්වේ රිද්මා හොයාගෙන එක්ක ආපු මහත්තයා ටිකක් සැක කටයුතු කෙනෙක් විදියට එයාට පෙනුනා කියලා. මිනිහා හැම තිස්සෙම ඇස් දෙක එහාට මෙහාට යව යව කල්පනාවෙන් හිටියලු. මං ඇහුවා මහේෂ් මහත්තයත් එක්ක නොවෙයිද එයා ආවේ කියලා. පස්සේ මට සුදා තමයි අර ආපු කෙනාගේ හැඩ රුව කිව්වේ. මං ඒ වෙලාවෙම මහේෂ්ට කතා කරලා ඇහුවා කවදද එයාලගේ වෙඩිං එක ගන්නේ කියලා. ළඟදීම දවසක රිද්මලාගේ අම්මලයි එයාලගේ අම්මලයි කතා කරලා තීරණයක් ගන්න බව එයා මට කිව්වා. එතකොට මට

SL-Unlimited

තේරුණා එදමා අපට කළේ බොරුවක් කියලා. ඒ විතරක් නොවෙයි. මාධවීවත් ඒ බව අපට කිව්වේ නෑනේ."

ජයදේව නිහඬව සිටියේ ය.

"ගෑනු විශ්වාස කරන්න එපා" කියා නන්දන වාහනය නැවැත්වූයේය.

නන්දන සතු පෙහෙකම්හලක් ජේරාදෙණියට නුදුරු ගම්මානයක විය. අමු ද්‍රව්‍ය හිඟ කම නිසා මාස කිහිපයකට පෙර වසා දමා තිබූ එම පෙහෙකම්හල වෙතය ඔහු මේ වාහනයෙන් පැමිණියේ. ගේට්ටුව විවර කිරීමට යතුර සුදාට දුන් ඔහු වාහනය ඇතුළු කරන ගමන් " මට ජයදේව මහත්තයත් එක්ක පොඩි කතාවක් කරන්න තියෙනවා. සුදා පොඩ්ඩක් ඔය පාර පැත්ත ගැන සෙවිල්ලෙන් ඉන්න" කියා කීවේ ය.

ඔහු ජයදේව සමඟ පැමිණියේ කාන්තෝරු කාමරය වෙතය. එහි පුටුවක් ගසා බසා දමා එහි ඉඳ ගත් ඔහු ජයදේවටද අසුන් ගැනීමට සන් කළේය.

"දැන් මගේ ප්ලෑන් එක මේකයි. අපි ඒකිව මරන්න ඕනේ. ඒකිව බයකරන්න මං පොඩි ප්ලෑන් එකකුත් දාලයි ආවේ. අයියව බය කළා වගේ. දැනටමත් ඒකි බියවම සිහිය නැතිව ඇති. ඒකි ගාවට මං තව ටිකකින් සුදාව යවනවා. ඒකි මැරිලා හිටියේ නැත්නම් සුදා ලව්වා ඒකිව මරලා මං තැනක හංගන්නම්. ඊට පස්සේ අද රෑම සුදා ලව්වා කමලදාසවත් එලොව යවලා සුදාට වැඩේ දෙන්න අර මිනිස්සු දෙන්නට පවරනවා. කරන්න දෙයක් නෑ. ඕක තමයි මගේ ප්ලෑන් එක."

"එපා බාප්පේ. මාධවීව මරන්න එපා."

"පුතාට පිස්සුද?"

ජංගම දුරකතනය ගෙන ඔහු හෝටලයේ නැවතී සිටි සිය මැරවර සගයින්ට කතා කළේය.

"මම මේ නන්දන මුදලාලි කතා කරන්නේ. අද රෑ 10ත් 11ත් අතර මං සුදාව යවනව මේ මං කියන ඇඩ්‍රස් එක තියෙන ගෙදරට" ඔහු සිය මිය ගිය සොහොයුරා පදිංචිව සිටි නිවසේ ලිපිනය කීවේය. "ඒ යන ගෙදරට පිටිපස්සේ ගෙදර මනුස්සයෙක්ට සුදා ලව්ව වැඩක් දෙන්න මං ලෑස්ති කරනවා. ඒ වැඩේ කරලා මිනිහා එලියට එනකොට තමයි තමුසෙලා ඌට වැඩේ දෙන්න ඕනේ. තමුසෙලාට පුළුවන් නම් දැන්ම ඉඳලා ඒ පැත්තේ හොඳිසියක් දානවා. සුදාගේ හැටි දන්නවනේ. යන්තම් වත් සැකයක් ඇති වෙන වැඩක් කරන්න එපා"යි අවවාද කළ ඔහු සංවාදය එතැනින් නිම කළේය.

"සුදා කමලදාසව මරාවිද? ඌ කමලදාසත් එක්ක හරි යාළුයිනේ."

SL-Unlimited

"හැ. සුදාට කොයි තරම් හිතවත් එකෙක් වුණත්, මං කිව්වොත් වැඩේ දෙන එක දෙනවමයි. දැන් පොඩි මහත්තයට වැඩේ දුන්නෙ කවුද?"

"ඈ.. පොඩි මහත්තයාව මැරුවේ සුදාද?"

"ඔව්. මං තමයි ඕඩර් එක දුන්නෙ. දෙන්න කොහොමද හිටියේ. ආදරණීය මාමයි බෑනයි වගේ. මගේ එක වචනෙන් ඒ ඔක්කොම ඉවරයි. සුදා කවදත් හිටියේ මගේ පැත්තෙ. මං ඒක දන්නවා."

"ඇයි පොඩිමහත්තයාව මරන්න කිව්වේ?"

"ඌ මට පල්පාට් එකක් දැම්මා. මං කිව්වා ඌගේ ලොකු කෙල්ල චීඩාගේ කරලා නිකං ගෙදර ඉන්න නිසා කොළඹ මගේ හෝටලේට වැඩට එවන්න කියලා. මූ මට පල් හිනාවක් දැම්මනේ."

"මුදලාලි අපේ හිතවත් කම වෙන එකක්. ඒත් ඔය වගේ දෙයක් මං කරන්නේ නෑ."

"මට ටිකක් කේන්ති ගියා. මං ඇහුවා ඇයි උඹ හිතුවද මං ඒකිව ගනීවි කියලා."

"මුදලාලි අපි ඔය ගැන වාද කරලා වැඩක් නෑ. ඒකි තාම පුංචි කෙල්ලක් නිසයි මං එහෙම කිව්වෙ. මට තාම පුළුවන් ඒකිට කන්න අඳින්න දෙන්න. එහෙම කියපු පොඩි කෙල්ල සුදා ආවාට පස්සේ සුදා එක්ක යාළු වුණානේ. කෝ ඒකිගේ පොඩි කමට මොකද වුණේ. කොහොමහරි ඒකි සුදාව අල්ල ගත්තා නේද? ඒ වැඩ වලට පොඩි නෑ. ඒ ගැන මං හින්ට් එකක් ඇහුවාම පොඩි මහත්තයා කියපි ඉතිං මුදලාලි ඒකිත් කවදා හරි බඳින්න එපායෑ. ඌත් හොඳ නම් මට මොකෝ කියලා. සුසීමාව දැකලා ඇති නේ. හරි හැඩකාර කෙල්ල."

"පස්සේ මං සුදාට කිව්වා කැමති නම් සුසීමට හෝටලේ ජොබ් එකක් දෙන්නම් කියලා. සුදා කිව්වා මුදලාලි ගාව මට වැඩ කරන්න හොඳ නම් ඒකි වැඩ කළාම මොකද කියලා. පස්සේ ඒ ගැන කතා කරන්න මං සුදාව එහේ යැව්වා. කෙල්ල නම් කැමති බව පේනවා. ඒත් තාත්තා ඒකට කැමති නෑ කියලා ඒකි කිව්වලු. මං ඉතිං තාත්තාව සීන් එකෙන් අයින් කළා. දැන් ඔය ඒකි යස අගේට හෝටලේ වැඩ කරන්නේ. මාත් ඒකිට හොඳට සලකනවා."

"ඉතිං සුදා ඒ බව දන්නේ නැද්ද?"

"ඌ හොඳ එකා. ඌට කිසි ගානක් නෑ. මං කොළඹ යනකොට ඌත් කෙල්ලට දෙන්න කියලා මොනවා හරි පොඩි දෙයක් දෙනවා. ඒකිත් මා අතේ සුදාට ලියුම් එවනව. කිසි ප්‍රශ්නයක් නෑ."

"එහෙනම් සුදා සමලදාසට වැඩේ දෙව්. හැබැයි මාධවී මරන්න එපා. මං එයාගෙන් ඇත්ත අහලා දැන ගන්නම්."

"සුදාගෙන් අදම නිදහස් වෙන්න වෙනවා. ආයි ඒ වගේ හිතවත් කොල්ලෙක් හොයා ගන්න කල් ගත වෙනවා. ඒ නිසා අදම මේ වැඩේ

www.sinhalalibrary.com
SL-Unlimited

ඉවර කරන්න ඕනෙ."

"ඒ වුණාට මාධවී මරනවට මං කැමති නෑ."

"එතකොට ජයන්තිට මොකද්ද කියන්නෙ. පුතාට ජයන්තිව ඔය ඕංගට අමතක වුණාද? ඔයා එයාට කිව්වා නේද හඳහනේ හැටියට මුලින් බඳින කෙනා මාස තුනකින් නැතිවෙනවා කියලා. එහෙම කියලා නේද එයාව නිස්සද්ද කළේ. මාධවී මැරුවට පස්සේ ජයන්ති බඳින්න නේද ඔයා හිටියේ. ඔයා දන්නවනේ. අපි මාධවීට කළේ ප්‍රෝඩාවක්. අපට රන්දෙණිගල වලව්ව අයිති කර ගන්න ඕනෙ."

"දැනුත් ඒක අපේ නේ."

"ඒ වුණත් ඕකුන් අපේ වෛරක්කාරයෝ. ඕකුන්ගේ ලේ වලට අපේ ලේ මිශ්‍ර කරන්න දෙන්න බෑ. අපි ඒකිව මැරුවට පස්සේ ඊඹට පුළුවන් ජයන්තිව බැඳලා වලව්වට යන්න."

"මං මාධවී බැන්දේ එයාගෙන් ඉක්මනට නිදහස් වෙන්න හිතාගෙන තමයි. ඒත් මං එයාට දැන් ආදරෙයි. මට බෑ එයාව මරන්න ඉඩ දෙන්න. බාප්පේ එයාව මරන්න එපා. මං වෙනුවෙන් එයාට ජීවත් වෙන්න ඉඩ දෙන්න."

"යකෝ මුට අමු කැවිලද මන්දා? අපි මෙච්චර කාලයක් ප්ලෑන් කළේ ඕක කරන්නද? මම නරක මිනිහා කියන්න එපා පුතෝ."

"මෙච්චර කාලයක් බාප්පා කියපු හැම දෙයක්ම මං කළා. ඒත් මට ඕකට නම් ඉඩ දෙන්න බෑ. මං ඉන්නකං මාධවීට අනතුරක් වෙන්න මං ඉඩ තියන්නේ නෑ."

"මෝඩයෝ, ගෑණුන්ට ඔය තරම් ආදරේ කරන්න එපා" කී නන්දන පුටුවෙන් නැගිට්ටේය.

"මං හිතුවේ සුදාව යවලා ඒකිට වැඩේ දෙන්න. ඒත් දැන් මට හිතෙනවා මමම ගිහිං ඒක ඉවරයක් කරලා දාලා ආවානම් හොඳයි කියලා."

"එපා. ඒක කරන්න එපා" ජයදේව නන්දනට බාධා වන සේ සිට ගත්තේය.

"සුදා .. සුදා.." නන්දන මොර දුන්නේ ය.

"ඇයි මුදලාලි? " යැයි අසමින් මිදුලේ සිටි සුදා ඔවුන් සිටි දෙසට පැමිණියේය.

"මට පොඩි වැඩකට යන්න තියෙනවා. දීපන් මෝටර් සයිකලේ යතුර."

සුදා එය නන්දනට දුන්නේය.

"මං එනතුරු මේ ජයදේව මහත්තයට කොහේවත් යන්න දෙන්න එපා. ඕනෑවට වඩා දැඟලුවොත් ටිබ ගයි හත්තිය තියෙන එකානේ. එයාව මෙහෙම රඳවගෙන ඉන්න ඕනේ" කී ඔහු පිටවී ගියේය.

SE-Unlimited

ජයදේව සුදා තල්ලු කර දමා නන්දන පසු පස යන්නට උත්සාහ කලත් සුදා ඔහුගේ බෙල්ලෙන් අල්ලා ගෙතුලට තල්ලු කළේ ය. විසි වී ගොස් බිම වැටුණ ජයදේව නැගී සිටියේ කෝපයෙන් පුපුරමිනි.

"සුදා එහෙනම් උඹ මටත් පාට් එකක් දැම්මා. ආ.. පැත්තකට වෙයන්.. " නැවත නැගී සිටිය ඔහු දොර දෙසට ගමන් කරන්නට උත්සාහ කළත් සුදා ඔහුගේ පපුවට එල්ල කළ පා පහර නිසා විසි වී ගොස් බිම වැටුණේ ය.

•••

"දැන් මං මෝටර් සයිකලෙන් ගිහිල්ලා එකිව මරලා ආවාම මෝටර් සයිකලේ දැකපු කෙනෙක් හිතන්නේ සුදා තමයි මේ වැඩේ කළේ කියලා. මටත් හොඳ හොඳ අදහස් තමයි හිටපු ගමන් ඔළුවට එන්නේ" මෝටර් සයිකලයෙන් යන ගමන් නන්දන සිතන්නට විය.

"එතකොට රත්දෙණිගල වලව්වත් අපේ. හෙක්ටර් හාමු. උඹ අපේ අප්පච්චී මරපු දවසේ මං කිව්වා, මේකට වන්දිය කවදා හරි උඹලා ගෙවනවා. මම රත්දෙණිගල වලව්වේ දවසක රජවෙනවා කියලා. උඹ ඉන්න ලෝකෙක ඉඳලා බලාගනිං, මං ඒක කරන හැටි. හෙට ඉඳලා රත්දෙණිගල වලව්ව මගේ."

•••

මුළුතැන් ගෙට වී සිටින මාධවීට මෝටර් සයිකලයක් එන හඬ ඇසුණි.

"සුදා? ඒ සුදාද? මගේ මාරයා සුදාද?" ඇය වෙව්ලන්නට විය.

"එතකොට සුරනිමල මාමව මැරුවෙත් සුදා, මාව මරන්න එන්නෙත් සුදා මං පැට්‍රික්ට ඇහුම්කන් දුන්නේ නැතේ."

"මට මතකයි දවසක් සුදා මගෙන් ඇහුවා නෝනා රත්දෙණිගල වනාළුයා ගැන නොදැනද ජයදේව මහත්තයව බඳින්න කැමති වුණේ කියලා. නෑ. මං දැන ගෙන හිටියා සුදා. ඒත් දැන් ඒ වනාළුයා නැතේ. නන්දන අංකල් උන්ට වැඩේ දුන්නලුනේ මං කිව්වා."

"ඒත් සුරනිමල මාමා මැරුණ දවසේ මං බයවුණා වනාළුයා තාමත් ජීවතුන් අතර ඉන්නවා කියලා. තාමත් අපේ පස්සේ එන්නනවා කියලා. මං බයෙන් ඉන්නවා දැකපු සුදා මා ගාවට ආවා. නෝනා. නෝනා වනාළුයට බයෙන් නේද ඉන්නේ. කිසි දේකට බය වෙන්න එපා නෝනා. මේ මං ඉන්නකම් නෝනට රත්දෙණිගල වනාළුයන්ගෙන්වත් රත්දෙණිගල කොටින්ගෙන්වත් හිරිහැරයක් වෙන්න දෙන්නේ නෑ."

"ඉතින් එහෙම කියපු සුදා මාව මරන්න ඒවිද?"

නැවතත් මාරයාගේ සිනහව නිවස පුරා පැතිරී ගියේය.

දොරගුලු ඇරෙන හඬ ඇයට ඇසුණි. ඇය සැඟවෙන්නට

www.sinhalalibrary.com
SL Unlimited

තැනක් සොයන්නට වූවා ය.

●●●

නිවසට ඇතුළු වූ නන්දන සිය සිතට දිරි ගැනීමට කාමරයට ගොස් පොඩි අඩියක් ගැසුවේය.

"කෝ මේ දුව. මාධවී.. මාධවී.."

"ආ! අංකල් රෑ ඇවිත් තියෙන්නේ" මාධවීගේ සිතෙහි වූ බිය මඳක් පහ වුණි. ඇය සාලය දෙසට පැමිණියාය.

"අංකල් මං හොඳටම බයෙන් හිටියේ. අංකල්ට ඇහෙනවද අර මර හිනාවඅර අර.. "

"ඔව් මට ඇහෙනවා. ඒ හිනාව අපේ පවුලේ කෙනෙක් මාරයට බිලිවෙන කොට ඇහෙන මර හිනාව. අපේ පවුලේ කාට හරි අද මාරයා අත වනනවා" ඔහු සෙමින් සෙමින් මාධවී දෙසට පිය තඟන්නට වූයේ පිස්තෝලයද ඇය වෙත එල්ල කරමිනි. එසේ එන ගමන් "ගෙල සිර කර ඇය මරමි" යයි ඔහු සිතන්නට විය.

ඔහුගේ අතෙහි වූ පිස්තෝලයටත්, ඔහුගේ දෙනෙතින් විහිදුනු ඒ කාන්තියටත් ඇය බිය වූවාය. එය රඟපෑමක් හෝ විහිළුවක් හෝ නොවන බව දැන අවබෝධ කර ගත්තාය.

"මාමේ! මාමේ!" පසු පසට අඩි තබමින් ඇය කීවා ය. එහෙත් නන්දනගේ බැල්මෙහි වූ අන්තරාය අවබෝධ කර ගත් ඇය එක සැනින් අනික් අතට හැරී කාමරයට වැදී දොර වසාගන්නට උත්සාහ කළා ය. එහෙත් එහි දොර වැසීමට පෙර නන්දන එහි ඇතුළු විය.

"උඹේ මාරයා මම තමයි" ඔහුගේ මුවින් පිට විය.

"අනේ මාමේ! ප්ලීස්. හොඳ මාමා වගේ මට මගේ පාඩුවේ ඉන්න දෙන්න."

ඔහු මඳකට නතර වී ඇය දෙස උනන්දුවෙන් බැලුවේය.

"බය වුණාම කෙල්ලො හරි හැඩයි නෙව. හරිම හැඩයි. පුංචි මැණිකෙත් එදා ඔය වගේ ලස්සනට මට පෙනුනා. උඹත් ඒ වගේම ලස්සනයි කෙල්ලේ" අනුරාගී සිහිවිල්ලක් ඔහුගේ සිත පුරා දිව යන්නට විය.

වහා ඉදිරියට පැන ඇගේ අතකින් අල්ලා ගත් ඔහු, ඇගේ නිකට සෙමින් සෙලවූවාය.

"උඹ හරි ලස්සනයි. අන්තිම ගමන යන්න ඉස්සර වෙලා අපි පොඩ්ඩක් විනෝද වෙමු."

මාධවීගේ බිය යටපත් කරගෙන කෝපය මතු විය. ඇය මුළු වැර යොදා නන්දන තල්ලු කර දැමුවේය.

"වලා. එන්න එපා මා ළඟට. තෝ වලා."

SL-Unlimited

"හ්ග් ඝග් ගග් හග් හග් හග්" කියමින් අපෙහි වූ දුවක්බුව කණ්ණාඩි මේසට මත තැබූ නන්දන සිය කමිසය ගලවා පැත්තකට විසි කලේය. ඉන් පසු සිය ඉණ බැඳි පටිය ගැලවූ ඔහු යලි ඇය දෙසට පිය නගන්නට වූවාය.

බියපත් වූ ඒ අසරණ ස්ත්‍රියට පලායාමට පැනක් නොවීය. ඇය මුළු වැර යොදා පා පහරක් නන්දනට එල්ල කළේ ද, පහත් වී ඒ පහරින් වලකින්නට නන්දන සමත් විය. ඉන්පසු නන්දන ඇය ඔසවා ගත් විට, සිතෙහි වූ බිය ඉතා දැඩි වූ හෙයින් ඇයගේ මුළු සිරුරම අප්‍රාණිකව යනු ඇයට දැනුණි. තම අවසානය ළඟා වී ඇති බව ඇය අවබෝධ කරගත්තා ය.

"උඹ බය වෙලා. හොඳටම බයවෙලා. මං හරි කැමතියි මෙහෙම බයෙන් ඉන්න මුවැත්තියන් භුක්ති කරන්න."

නන්දන ඇය ඇඳට විසි කළේය. ඇඳට වැටුණ සැනින් ඇඳ රෙද්ද සිය සිරුර වටා දවටා ගත් මාධවී හඬන්නට විය.

"මාව මරපං. මාව මරපං. වදදෙන්නේ නැතුව මාව මරපං" කී මාධවී කොට්ටයෙන් සිය මුහුණ වසා ගත්තා ය.

දැන් දැන් ඔහු ඇඳට පැන තමාට අතවරයක් කරනු ඇතැයි බියපත් වූ ඇය සිතමින් සිටියා ය. ඇය කොට්ටය මෑත් කර, දෙනෙත් විවර කළේ යමක් බිත්තියේ වේගයෙන් වැදෙන හඬත් "මගේ අම්මේ"යි කියා නන්දන කෙඳිරි ගාන හඬත් ඇසුන බැවිණි.

"අහිංසක කෙල්ලන් අනාථ කරන වල් බල්ලා" පැට්රික් ගුගුලේය.

"පැට්රික්! පැට්රික්! හොඳ වෙලාවට පැට්රික් ඇවිත්" ඇය සැනසුම් සුසුමක් හෙළුවා ය.

ඇඳ ඇතිරිල්ල පසෙකට විසි කළ මාධවී තම ආරක්ෂකයා වෙත පැන ඔහු බදා ගෙන ඉකි බිඳින්නට වූවාය. ඒ සැනින් ප්‍රයෝජන ගත් නන්දන වහා තම පිස්තෝලය තිබූ කණ්ණාඩි මේසය මතට පිනූ නමුත් එවැන්නක් බලාපොරොත්තුවෙන් සිටි පැට්රික් දුන් වේගවත් පා පහර නිසා නැවත ඔහු විසි වී ගොස් බිත්තියේ හැපුණි.

"උඹ කරපු දේවල් ඔප්පු කරන්න දැන් අපට සාක්ෂි තියෙනවා මිනිහෝ. මාධවී ගන්න මොකක් හරි මුව බඳින්න."

මාධවී දුන් ඇඳ ඇතිරිල්ල ඉරා ඉන් සවිමත් පටියක් සාදා ගත් පැට්රික් තවමත් සිහි එළවා ගත නොහැකිව සිටින නන්දන ගේ අත පය හෙලවෙන්න බැරි තරමට තද කර බැඳ බිත්තිය මුල්ලෙහි තැබුවේය.

"පැට්රික් ඔයා නම් දෙවියෙක්. ඔයා ආවේ නැත්නම් මූ මට වද දීලා මරනවා. ඔයා කොහොමද මෙතනට ආවේ?"

"මං අද හැන්දෑවේ ඉඳලම මේ හරියේ හිටියේ මාධවී. මූං

SL-Unlimited

නන්දනා එළියට යනවත් මං දැක්කා. ඊට පස්සේ මූ තනියම මෝටර් සයිකලේ එනකොට මට හිතුනා ඔයාගේ ජීවිතේ අනතුරේ කියලා."

නැවත වරක් මාරයාගේ සිනහව නිවස පුරා පැතිර ගියේ ය.

"අනේ පැට්රික්. ඔයාට ඇහෙනවද අර මර හිනාව. ඒක ඇහෙන්නේ පවුලේ කාට හරි විපතක් වෙන කොටලු."

"මාධවී ඔයත් ඕවා විශ්වාස කරනවද? එන්න මාත් එක්ක" කියමින් පැට්රික් මාධවී සමඟ හිනහ හඬ ඇසෙන නන්දනගේ කාමරය වෙත ගියේය. දොර යතුර දමා වසා තිබුණි. එහෙත් යකඩ කූරක් ගෙන තත්පර කිහිපයකින් එම දොර විවර කළ පැට්රික්, විදුලි පහන් දල්වා කාමරය පුරා සිය දෙනෙත් විහිදුවේ ය. මාධවී තවමත් බියෙන් සලිත වී ඔහුගේ අතක් තදින් අල්ලාගෙන සිටී. පැට්රික් ඇගේ අතින් ඇදගෙන "අන්න අතනින් තමයි ඔය සද්දේ එන්නේ" කියා මේසය වෙත පැමිණියේය. එහි වූ කැසට් යන්ත්‍රය ක්‍රියා විරහිත කළේ ඔහු. "දැක්කද හිනාව කාගෙද කියලා?" අසමින් එහි වූ කැසට් පටිය අතට ගත්තේය.

"දැක්ක නේද? ඔය වගේ කැසට් එකක් දාලා තමයි මූං සුරතිමලවත් බය කළේ"

කැසට් පටිය සිය සාක්කුවෙහි රුවා ගත් පැට්රික් "මේක අපට තව වැදගත් සාක්ෂියක් මාධවී" කියමින් නන්දන සිටි කාමරය වෙත පැමිණියේය.

"උඹ බොහොම මොළ කාරයෙක් කියලා හිතා ගෙන හිටියා නේද? මෙන්න උඹෙ මර හිනා කැසට් එක මගේ සාක්කුවේ තියෙනවා. අපි උසාවියේදී හමුවෙමු."

මාධවී පැට්රික්ගේ ඉණ වටා අත දමා දැඩිව ඔහු බදාගෙන ගත්තාය, ඇය කොතරම් තදින් වෙව්ලුවාද කිවහොත් පැට්රික්ද බිම නොවැටී සිටියේ ඉමහත් වෑයමකින් පසුවය. ඔහුද අන්ද මන්ද විය. ඒ කිසිවක් නිසා නොව මුළු නිවස පුරාම පැතිරී ගිය මර හිනා හඬක් නිසාය. එය කැසට් පටයෙන් නැගුන මර හිනාවට වඩා ඉතා භයංකර විය. පැට්රික් ඊට බිය නොවූ නමුත් මවිතයට පත් විය. "තවත් කැසට් පටියක් ඇති" සිතූ ඔහු දොර දෙස බැලුවේය.

ඩිල් පිහියක්ද අතින් ගෙන ඔහු දෙසට පිය නගන සුදා ඔහු දුටුවේය.

"පැට්රික් මහත්තයා. එහෙනම් මාව පොලිසියට අල්ලලා දෙන්නයි තමුසේ හැදුවේ ආ" කී ඔහු කණ්ණාඩි මේසය මත වූ පිස්තෝලය ගෙන එය පැට්රික් වෙත එල්ල කළේය.

"සුදා. මේ මහත්තයා තමයි මාව බේරගත්තේ. මේ මහත්තයට

SL-Unlimited

මුකුත් කරන්න එපා."

"නෝනා කට වහගන්න. දෙන්නම ගිහින් ඇඳෙන් ඉඳ ගන්නවා."

සුදා තුවක්කුව පැට්‍රික් දෙසටම එල්ල කරගෙන ගොස්, නන්දන වැටී සිටි තැනට පැමිණ ඔහු ගැට ගසා තිබූ බැමි කපා දැමුවේය.

"සුද්දෝ! මගේ රත්තරන් සුද්දෝ! උඹ නම් දෙයියෙක්. මගේ අම්මපා උඹ නම් දෙවියෙක්. උඹ නොඑන්න මං එල්ලුං ගස් යන්න තිබුණා."

සුදා ඔහුගේ අත බැඳි පටියද කපා දැමුවේ ය.

"බොස් ගිහින් දැන් අරුන් දෙන්නව ගැට ගහන්න."

පැට්‍රික් වෙත ගොස් අත දිග හැර කම්මුල් පහරකින්ද ඔහුට සංග්‍රහ කළ නන්දන, ඔහු ගේ දෑත ද, දෙපය ද තද වෙන්න ඇඳට කර බැන්දේ ය.

"සුද්දෝ පොඩ්ඩක් හිටපං. මේකිව බැඳලා එල්ලන්න ඕන නෑ. මූ කරපු වැඩේට මුගේ ඉස්සරහම මේකිව .. " කියමින් ඇඳට පැන ගත් නන්දන තරයේ මාධවී වැළඳ ගත්තේය.

"බය වුණාම මුං හරිම ලස්සනයි."

එහෙත් ඔහුගේ මුවින් දැඩි වේදනාත්මක හඬක් නික්මුනේ තියුණු යමක් ඔහුගේ පිට දිගේ ඇදී ගිය බැවිනි. වහා හැරී බැලූ ඔහු, ඒ සුදා 'අත වූ පිහිය බව ඔහු දුටුවේ එයින් වැගිරෙන රුධිරය නිසාය.

ඔහු හැරෙනවාත් සමගම සුදා ඔහුගේ බෙල්ලෙන් ඇද බිත්තිය දෙසට විසි කළේ ය.

ඉතා අපහසුවෙන් සිහි එලවාගත් නන්දන "සුද්දෝ! මොකද මේ උඹ යකෙක් වගේ මා දිහා බලාගෙන ඉන්නේ. උඹට යකෙක් වැහිලද?" ඇසුවේ ය.

"මට යකෙක් වැහිලා නෑ. ඒත් මෙච්චර කාලයක් යකා වැහිලා හිටියේ උඹට. මං ඒ යකා උඹෙන් අයින් කරන්නයි හදන්නේ. එක පාරටම මට ඒක කරන්න පුළුවන්. ඒත් මට ආසයි උඹත් එක්ක ටිකක් සෙල්ලම් කරන්න. මගේ අම්මා කියපු විදියට, මගේ අම්මට දුන්න දුක වද වල හැටියට මම ටික ටික තමයි උඹව මාරයා ගාවට යවන්නේ" කියමින් සුදා එල්ල කළ වේගවත් පා පහරින් නන්දනගේ දත් දෙකක් කැඩී විසි වී ගියේය. ඔහුගේ මුවින් රුධිරය වැගිරෙන්නට විය. මඳ වේලාවකින් සිහි එලවා ගත් නන්දන ඉතා අපහසුවෙන් කතා කළේය.

"උඹේ අම්මා. කවුද උඹේ අම්මා. මං මොකක්ද උඹේ අම්මට කළේ?"

"උඹට ඇහෙනවද ඔය හීනාව. ඒ මගේ අම්මා. අද මගේ අම්මට හරිම සන්තෝස දවසක් වේවි. එයා අවුරුදු විසි අටක්

SL-Unlimited

බලාගෙන හිටියේ අද දවස එනකල් තමයි. අම්මට ඊට පස්සෙ මේ අපායෙන් මිදිලා වෙන ලෝකෙකට යන්න පුළුවන්. මගේ අම්මා මියුරියෙල් සූරියබණ්ඩාර අවුරුදු විසි අටක් තිස්සේ බලාගෙන හිටියේ අද දවස එනකල් තමයි."

"උඹ කියන්නේ බොරු. එකී මණී. එකී මණී. බබෙක් ලැබෙන්න ඉස්සර චූටි මල්ලී එකිව පුච්චලා මැරුවා."

ඔහුට තවත් පා පහරකින් සංග්‍රහ කිරීමට සුදා ඉදිරියට පියවරක් තැබුවේය.

"උඹත් මහා වීරයෙක් වගේ, වැටිලා තුවාල වෙලා ඉන්න මිනිහෙක්ට චණ්ඩිකම් පානවා. නියම මිනිහෙක් නම් මටත් පොඩ්ඩක් කෙලින් වෙන්න ඉඩ දීපන්."

"උඹ හරි වීරයෙක් නම්, එදා මගේ අම්මට ටිකක් වත් නැගිටින්න ඉඩ දෙන්න තිබුණානේ? තොපි පස් දෙනෙක්ම එකිව බිම පෙරළගෙන දස වද දෙන කොට තොපි හිතුවද එකිටත් වාරයක් දෙන්න ඕනෙයි කියලා, පර බල්ලා. මං තොගේ කෑලි කපනවා. මං තෝව.."

ඔහුගේ වදන් වෙවුලන සුළු විය. ඔහු පිහිය හැම අතටම කරකවන්නට වූ නිසා නන්දනගේ ඇගෙන් සෑම අතකටම රුධිරය විදින්නට විය. ඒ දුටු මාධවී සිහි මූර්ඡාවෙන අයුරු පැට්‍රික් දුටුවේය. ඔහුටද එම දර්ශනය බලා සිටිය හැක්කක් නොවේ. ඔහු සිය දෙනෙත් දැඩි ලෙස පියා ගත්තේ එනිසා ය.

"තෝ හිතපු විදියට නොවෙයි යකෝ වැඩේ වුණේ මගේ අප්පච්චි කියලා මං හිතාගෙන හිටපු ජස්ටින්, ගිහින් චූටි මල්ලිට වද දීලා මරලා, ඒ පැලටත් ගිනි තියලා අම්මව බේරගෙන ආවා. මැරෙන්න ඉස්සර වෙලා මගේ අම්මා ජස්ටින්ගෙනුයි, රුවන් බණ්ඩාර අංකල්, මගේ අම්මව බඳින්න හිටියේ එයා තමයි, ඒ දෙන්නව පොරොන්දු කරගත්තා තොපේ පවුලේ හැම එකෙක් ගෙන්ම පළි ගන්න බවට. එයාලට බැරි වුණ ටික තමයි මට කරන්න තිබුණේ. මං ඒ ඔක්කොම කළා. පොඩි මහත්තයාවත් මැරුවා. තොගේ අයියාවත් මැරුවා. තොගේ පුතාවත් දැන් ටිකකට කලින් මැරුවා. දැන් තෝවත් මරනවා. මගේ අම්මව ලැජ්ජාව ඉවස ගන්න බැරිව මාව ඉපදුනාට පස්සේ එල්ලිලා මැරුණා තමයි. ඒත් අපි තොපි පස්සෙන් පැන්නුවා. අම්මා වෙනුවෙන් තොපේ පවුලේ ඔක්කොම අතු ගෑවා."

නන්දන වරින් වර නගන වේදනාත්මක හඬත්, මිරු විකාර හිනහවත් හැරුණු විට වෙන කිසිම හඬක් නැඟුනේ නැත. පැයක් පමණ වූ මෙම ශබ්ද වලින් පසුව නතර වූයේ කෙඳිරිලි හඬයි. ඉන් මඳ වේලාවකට පසු මර හිනාවද නතර විය. නිශ්ශබ්දතාවය දීර්ඝ වේලාවක් පැවතුන බැවින් පැට්‍රික් සිය දෙනෙත් විවර කළේය.

SL-Unlimited

රුධිරයෙන් තෙත්ව තිබූ නන්දනගේ මළ සිරුර විදුලි පංකාවේ එල්ලන සුදා ඔහු දුටුවේය. ඔහුගේ මුළු ගතම රුධිරයෙන් නැහැවී තිබුණි. එහෙත් ඔහුගේ මුවගෙහි මඳ සිනහවක් රැඳී තිබිණි.

එම කාර්යය නිම කළ පසු, ඔහු පැට්රික් දෙසට හැරී වියරු සිනහවක් පෑවේය.

"ඌඹෙ අප්පච්චී තමයි මේ හැම එකටම වග කියන්න ඕනේ. ඒත් මං ඌඹෙ අප්පච්චීට පැනලා යන්න අවස්ථාවක් දුන්නා. ඌගේ මෝඩකමට මගේ අවවාදය ගණං ගත්තේ නෑ. එහෙම කරපු මාව, මම ඌඹෙ ඥාති සහෝදරයෙක් බව දැන දැනත්, පොලිසියට අල්ලලා දෙන්න හැදුවා. දැන් ඌඹට ඒකට වන්දි ගෙවන්න වෙනවා."

රුධිරය නිසා රතු පැහැ ගැන්වී තිබූ දෑතින් අල්ලාගෙන සිටි ඒ රුධිරය තැවරුණ පිහිය කරකවමින් සෙමින් සෙමින් ඔහු පැට්රික් වෙත සමීප වන්නට විය. තොල කට වේලී සිටි පැට්රික්ට කියන්නට යමක් සිතා ගත නොහැකි විය.

"රන්දෙණිගල සිංහයාගේ පවුලට කරපු අපහාසයට පළිගන්න හදන කොට ඌඹත් ඌන්ගේ පැත්තම ගත්තා. පොටත් තියෙන්නේ තොගේ අම්මගේ ලේ වෙන්න ඇති."

දැන් ඔවුන් අතර ඇත්තේ අඩි තුනක පමණ පරතරයකි. එක වරම ඉද්ද ගැසුවාක් සේ සුදා නැවතිනි.

"අප්පච්චී අයින්වෙන්න. මට මේක ඉවරයක් කරලා දාන්න ඔතැනින් අයින් වෙන්න" ඔහු පැට්රික්ගේ හිසට ඉඩින්, ඔහුට නොපෙනෙන කෙනෙකු දෙස බලමින් වේගවත්ව පැවසුවේය.

"එපා? අපේ පවුල විනාශ කරපු එකාගේ පුතාව මරන්න එපා? අපේ වැඩ ඔක්කොම අවුල් කරන්න ආපු එකාගේ ජීවිතේ විනාශ කරන්න එපා? ඒ මොකද අප්පච්චී? ඔතැනින් අයින් වෙන්න." කී ඔහු එක වරම අනික් පසට හැරී පිහිය ද විසි කර දෑතින් දෙනෙත් වසා ගත්තේ ය.

"මට වළින්න එපා අප්පච්චී. මමයි අප්පච්චීට වළින්න ඕනේ" ඔහු ඉකි ගසමින් සෙමින් සෙමින් පැට්රික් වෙතින් ඈත් වන්නට විය.

"අප්පච්චී නිසා මං ඌඹට සමාව දෙනවා. ඒත් මං දන්නවා. ඌඹලාගෙන් මට කවදාවත් සමාව ලැබෙන එකක් නෑ."

ඔහු මතුරන්නට විය.

ඉන් මඳ වේලාවකට පසු ජීප් රිය ස්ටාට් කරන හඬ පැට්රික්ට ඇසුනි. සිය දෙඅතෙහි වූ බැමි, ඇඳෙහි දාරයකට අතුල්ලා මුදා ගත් පැට්රික් තවමත් සිහිසුන්ව ඇඳ මත වැතිරී සිටින මාධවීද ඔසවා ගෙන විවේක කාමරය වෙත පැමිණ එහි වූ ඇඳි පුටුවක් මත ඇය හොවා මුහුණට වතුර ඉසින්නට විය.

SL-Unlimited

ඒ සමගම තම සෙල්ෆෝනය අතට ගත් ඔහු හැරීට කතා කළේ ය.

"පැට්රික්. මං මේ ඔයා ගෙදර එනතුරු බලං ඉන්නවා. මොකද ඔයාගේ මේ ප්‍රමාදය?"

"ඔක්කොම ඉවරයි අංකල්. මං අංකල්ට කිව්වනේ. අංකල් මගේ අනතුරු ඇඟවීම ගණන් ගත්තේ නෑනේ."

"මොකක්ද ඔක්කොම ඉවර වුණා කියන්නේ?"

"සුදා නන්දනව මැරුවා, ජයදේවවත් මරලා මං හිතන්නේ. ඌ පැනලා ගියා. මාවත් මරන්න හැදුවා. ඒත් පුදුම විදිහකට මං බේරුණා. ඌව අල්ල ගන්න බලන්න මෙන්න ඌ ගිය වාහනේ නොම්මරේ. ඌ තව මොන ජංජාලයක් කරාවිද දන්නේ නෑ. ඊට ඉස්සරවෙලා ඌව නවත්තන්න."

"හොඳයි. මං ඒක කරන්නම්. ඔයා දැන් කොහේද ඉන්නේ?"

"මං ඉන්නේ නන්දනගේ ගෙදර."

"මාධවීට කොහොමද?"

"එයාට අනතුරක් වුණේ නෑ. ඒත් තාම සිහිය නෑ."

"හොඳයි. මං පොලිසියට සුදාව අල්ලගන්න කියන්නම්. මාත් මේ දැන්ම එනවා."

නැවත වතුර ඉස මඳ වේලාවකට පසු මාධවී සිහි ලැබුවාය.

"පැට්රික්.. අනේ පැට්රික්.. මට බයයි. මට බයයි.. අර . පිහියේ ලේ.. සුදා නන්දන අංකල්ව මැරුවද? ජයදේවට මොකද වුණේ?"

"මාධවී කනගාටුවෙලා පලක් නෑ. ඒක දැන් අතීතයට ගිහින්. රෑ දැකපු භයානක හීනයක් කියලා හිතාගෙන ඒක අමතක කරන්න බලන්න."

"අනේ පැට්රික්.. මාව ගෙදර එක්කරගෙන යන්න.. මට ගෙදර යන්න ඕනේ. මට මගේ අම්මා ඕනේ.. " ඇය ළදැරියක සේ ඉකි බිඳින්නට වූවා ය.

"හොඳයි. මම ශ්‍රීලාල් අංකල්ට කෝල් එකක් දීලා මෙහාට එන්න කියන්නම්. එතකල් අපි ඉස්තෝප්පුවට වෙලා ඉමු."

•••

බිම්සර ජීප් රිය ඉතා වේගයෙන් ධාවනය කරන්නට විය. කොහේ යන්නදැයි තීරණයක් ගැනීමට ඔහුට නොහැකි විය. එහෙත් ඔහුගේ මනස දැන් සන්සුන්ය. අවුරුදු අටක් තිස්සේ පෙරුම් පුරා ඔහු බලා සිටි කාර්යය නිම කිරීමට ඔහුට හැකි විය. දැන් ඔහුට කරන්නට දෙයක් නැත.

පැය භාගයක් පමණ වාහනය ධාවනය කළ ඔහුට තම වාහනය

www.sinhalalibrary.com
SL-Unlimited

හඹා එන පොලිස් රියක් ඇස ගැසුනේය. ඔහුගේ මුවගෙහි මඳ සිනහවක් රැඳුණි. මෙතෙක් වේලා ඔහේ ධාවනය කළාට දැන් හේතුවක් ඇතිව ධාවනය කළ යුතු වෙයි.

මෙතෙක් වේලා වාහනයේ හිටියේ තමා පමණක් වුවත්, දැන් වාහනයේ පසු පස අසුනේ යමෙකු සිටින සෙයක් ඔහුට දැනුණි. ඔහු හිස මඳක් හරවා පසු පස අසුන දෙස නෙත් යොමු කළේ ය.

"පුතා. උඹ ගැන අපට හරි ආඩම්බරයි. උඹ අම්මාගේ ගෞරවය ආරක්ෂා කළා. උඹේ පවුලේ ගෞරවය රැක ගත්තා. අපට කරන්න බැරිව ඉතුරු වුණ ඔක්කොම උඹ ඉවර කළා" පසු පස අසුනේ දර්ශනය වී සිටි රුවන් බණ්ඩාර කීවේය.

"මට ඒක සතුටක්. මං කරපු දේවල් දකින්න මාමා හිටිය එක මට ඊටත් වඩා ලොකු සතුටක්."

"පුතා උඹ ගැන මටත් ආඩම්බරයි. උඹ වැඩකාරයා කියලා පුංචි කාලේ ඉඳන්ම මම දැන ගෙන හිටියා. උඹ බාර ගත්තු වැඩේ නිමාට කළා" රුවන් අසළම පසු පස අසුනේ දර්ශනය වී සිටි ජස්වින් කීවේ ය.

"අප්පච්චි. අප්පච්චිත් ඉන්නවද? කෝ ඉතින් මගේ අම්මා. ඇයි අම්මා අප්පච්චිලත් එක්ක ආවේ නැත්තේ?"

"අම්මා ඉන්නවා පුතා. ඔය ඉස්සරහ සීට් එකේ ඉන්නේ උඹේ අම්මා."

රූමත් කාන්තාවක්, ඉතා ආදරයෙන් ඔහු දෙස බලා සිටියා ය. රුවන් මාමා දිනයක පෙන්නු ඡායාරූපයේ සිටි විදියටම ඇය සිටියා ය.

"මගේ අම්මා. මගේ අම්මා.."

හිම්සර සිය මෑණියන් වැළඳ ගැනීමට උත්සාහ කළේ ය. ඒ වෙලාවේ තමා වාහනයක් පදවන රියදුරකු බව ඔහුට අමතක විය. ඉදිරියෙන් තිබුණ වංගුවද ඔහුට අමතක විය. වාහනය මාර්ගයෙන් ඉවතට පැන ශුළිංග පාවෙමින් විත් පහළ වූ කළු ගලක වැදී ගිනි ජාලාවක් බවට පත් වී ඉනුත් පහළට විසි වී ගියේ ය.

පොලිස් ජීප් රිය, ඒ වංගුව අසළ නවත්වා ගත් පොලිස් නිලධාරීහු, බුර බුරා ගිනි ගෙන දැවෙන ඒ වාහනය දෙස තුෂ්ණිම්භූතව බලා සිටියහ.

අවසානය

SL-Unlimited